Then, Sir, there was another meeting in Trincomalee on the 2nd of July, 2006 to which the Governor went. The Hon. Dilan Perera, Deputy Minister was there. Then the Chief Minister of the North Central Province was there. There were various Deputy Ministers. There was the Advisor of the JVP. Hela Urumaya people were there. The Hon. Abdul Majeed, M.P. and The Hon. Jayantha Wijesekara, M.P. were there. Sir, before the Conference started the Hon. Dilan Perera looked around and he found something wrong. I know him very well. I know his family very well. I know his father very well. The Hon. Thurairetnasingam, the other Tamil Member of Parliament from Trincomalee, we both were not there. We normally attend meetings. So, the Hon. Dilan Perera asked the Government Agent, the army officer who has now resumed duties as the Government Agent in Trincomalee, I do not know his name, I do not know what rank he held in the Army. – "Where is Mr. Sampanthan, where is Mr. Thurairetnasingam? They have not come." We were not invited. How can we go? We did not know that there was a meeting. We were not invited by telephone, We were not invited by letter. No letter was sent to us. The Presidential Advisor I am told was there. Deputy Ministers, the Governor, army personnel, service personnel and the other two Members of Parliament were there. The Hon. Dilan Perera asked the Governor, "Why have they not been invited?" They were invited. Utterly false. I challenge him to prove that we were invited. There is no document to show that we were invited. We were not invited.; I was not invited and the Hon. Thurairetnasingam, M.P was not invited. We have four Members of Parliament in Trincomalee. Two from the TNA, both tamils. We were not invited. They had a meeting to discuss development activities in Trincomalle. Who are these jokers? Who discussed development activities in Trincomalee? I am the first Member of Parliament for Trincomalee. Is it democracy? I polled the highest number of votes. The Hon. Thurairetnasingam polled the second highest

number of votes. We were not invited and they were having a meeting. Sir this rot must stop. This utter rot must stop. I am asking the Government, why have you posted this military man to Trincomalee? Why has he been posted to Trincomalee? A military man as the Government Agent? I will tell you now, Sir, why Mr. Leelananda, the former Government Agent, in my view, an excellent public servant was removed. A Buddhist monk went to see Mr. Leelananda and told him, "I have put up a building at Mudcove. There has been some money assigned". But he got no plan approved, nothing approved in regard to the structure of the building. He went one day and told the Government Agent, "I want money for the building.'' The Government agent told him "I cannot give you money because you must submit your plans and get the plans approved. There must be estimates. Otherwise money cannot be released." The monk was unhappy. There was Sinhalese businessman who went and told the GA, ''I want a piece of land close to the bus stand to put up a hotel". For whom? For Buddhist monks and VIPs. The Government Agent said, "You cannot be given land like that. How can we give you a land like that close to the market where there are no hotels?" These people came and told the Government in Colombo - I am told some of them have direct access to the President also - that this man - the GA is not a sinhalese. "He is Leelananda! He is a Buddhist, he is a good sinhalese and a man was taken away and an army man was sent there. I want to ask the donor countries - I am asking Japan; I am asking the USA; I am asking Canada; I am asking the European Union; I am asking all these countries - are you helping this Government, are you giving money to this Government to enable them to ill-treat the Tamils in this way? This cannot carry on, Sir. This rot this tommy-rot must come to an end. This Government Agent, military man is trying to decide things for us in Trincomalee. Who the hell is he?

Sir, there is a perception in Trincomalee that all these anti-Tamil actions in Trincomalee are taking place after the Local Authority Election results. I went to give you some of the figures. All my Friends in the Government and the Opposition, must know these figures; you must know the truth. In the Trincomalee Urban Council Illankai Tamil Arasu Kadchi, which I represent, polled 16,368 votes and won 10 out of 12 seats. I was not there. If I had been there we would have won 11 seats. I was not there when the election took place the EPDP polled 259 votes. We polled 16,368 votes and your Government Minister polled 259 votes. The JVP polled 895 votes. None of them got a single member in. This is your position.

The Tricomalee Town and Gravets Predeshiya Sebha have nine members. Illankai Tamil Arasu Kadchi polled 10,573 votes. We got six members. The EPDP, your Government Minister polled 203 votes. The JVP polled 828 votes. Neither of them got a member. This is the position, Sir. Tamils of Trincomalee are telling me, "sir we are attacked. We are being attacked in this way. They are discriminating against us in this way. We are being ill-treated because we supported your party, which has stood for a cause for our people for over half a century. We will continue to stand with you to a man, woman, and child". That is the position Sir.

Then, Sir, may I get on to another one. In Muttur, the ITAK polled 12,004 votes. The EPDP polled 34 votes. Twelve thousand and four and thirty four! And you went these people to tell us what we should do. In Kuchchaveli Pradeshiya Sabha, the ITAK polled 5,226 votes. The EPDP polled 79 votes This is the position, Sir. I will not take your time showing all these figures. In Thampalakamem Predeshiya Sabha the ITAK polled 3,351 votes. The EPDP polled 12 and they want to tell the Government what they should do in regard to my people, in regard to our prople. How can we put up with this absolute rubbish, Sir? I will not go on talking about every thing, but one thing I went to read. Seruwila adjoining Echchilampattai Pradeshiya Sabha, we won uncontested. Nobody could contest it, we won uncontested. In Seruwila, about which some people talk a lot, we polled 1,069 votes. The JVP polled 659 votes. This is the position, Sir. Therefore, what I am saying is that this type of thing. Sir, should not go on. It is not good for the country; it is not good for our people.

I want the Government to investigate those two meetings held in Trincomalee on the 18th of April where the two senior public servants, the Chief Secretary of the North-Eastern Province and the Governor's secretary, were asked to leave, thereby keeping the Tamils out and the meeting the 2nd of July 2006 when the two Tamil Members of Parliament, the first and second Members of Parliament from Trincomalee were kept out of that meeting.

ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

Remove the GA also

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

I want the Government to investigate. I want to ask you whether a Government Agent who can behave like this is fit to be the Government Agent, whether a duty is not cast upon you to remove that man. I once told a Government Agent, Sir, in Trincomalee, "Mr. so-and- so, you are polluting that chair. Get lost!" I came to Colombo and told the then President Mr. Jayewardene, "Sir, I do not want that man in Trincomalee. He is a racist." He smiled at me and told me, "Sampanthan, if you remove that man, you might get a fellow who is worse." I told him, "No, sir, I want so-and-so." He removed him immediately and gave me the man I wanted. That was the position.

Sir, it is important to know when I talk about the results of the Trincomalee Urban Council and the Trincomalee Town and gravets Pradeshiya Sabha that is the core of Trincomalee District. That is the pith and substance of the Trincomalee District. The Port City of Trincomalee is within the area, that area contains the hinterland of the valuable, natural

[ගරු ආර්. සම්පන්දන් මහතා]

Trincomalee Harbour, and the area that contains the rock on which Lord koneshwarar sits and Koneshwaram Temple lies. This is why, Sir, these people think that we should be hammered and chased out of Trincomalee.

India, Sir, has a Muslim as President, a Muslim from Rameshwaram in Tamil Nadu, if I am not mistaken. India has a Muslim population of 120 million people. It is more than Bangladesh and more than Pakistan, but less than Indonesia. It is the country with a second largest Muslim population. They have got only 12 per cent Muslims, but they have a Muslim President. The Prime Minister in India is a Sikh, Dr. Manmohan Singh. The Sikh population in India is 2 per cent. Two per cent! A Sikh Prime Minister and a Muslim Ppresident.

Here, despite our having won the Trincomalee District, you cannot have the Tamil Members of Pailiament at a meeting You cannot have Tamil public servants at a meeting. What the hell are you doing? I am asking you, what the hell are you doing? Are you fit to govern? Do we have to accept this type of governance? This is what I want to know, Sir. Now> Sir, the JVP is not merely in Trincomalee, they went to Vavuniya also recently. Is it on the basis of their electoral performance? They are now advisers to the Presidential Adviser. They are tagging along with him and going along with him all over the place. Who are these guys? Johnnies that we do not want in our areas.

ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

A total waste!

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

This must stop, Sir; this cannot go on. we hope that it will stop.

Before I conclude, Sir there is one matter I want to refer to. Our people are suffering, Sir. They have no relief; nothing has been given to them. There is no relief and our people are suffering. The US Government and the UN have condemned the attacks on the NGOs and civil society organizations. i have got the reports here, but I will not refer to it because I have no time. But, there is one matter I want to refer to, Sir, before I conclude. I may be running short of time. I would like you to accommodate me, Sir.

Sir, the 'Daily News' newspaper of 14th July 2006 published a message written by President Rajapaksa to the "Asian Tribune" about the late Mr. Amirthalingam. Mr. Amirthalingam is my one time leader, a former leader of the TULF and the Leader of the Opposition in this House. In that message, President Rajapaksa has said, I quote:

"The true measure of the man can be seen by how he, as Leader of the Opposition, strongly opposed the move by the UNP Government, to strip the SLFP leader and former Prime Minister Mrs. Sirimavo Bandaranaike of her civic rights. We in the SLFP, both within and out of Parliament, were truly impressed by his determined opposition to this crude attempt to throw out of the political arena the main opponent of the UNP government of the day.

More striking in his opposition to politically disarm Mrs. Bandaranaike was that he was defending on a matter of principle, the rights of the former Prime Minister who had placed him and his colleagues of the Federal party under house arrest for their participation in the civil disobedience campaign in 1961. When it came to matters of principle and democratic rights he was not the man to put past antagonisms before current injustice."

Sir, I also happened to be detained in the Panagoda Army Camp in 1961. We including people like Dr. E. M. V. Naganathan, Mr. M. Tiruchelvam, Sir Kandiah Vaithyanathan so on and so forth were the first occupants of that army camp. It is true that Mr. Amirthalingam defended Mrs. Bandaranaike. I remember that. I was in Parliament at that time. In fact, after the debate was over and when the UNP Members were menacingly advancing towards Mrs. Bandaranaike, it was Mr. Amirthalingam and Mr. Sivasithambaram who took her out of the Chambers up to her car. I walked behind them to ensure that Mrs. Bandaranaike was able to get into the car safely and go home.

But what happened to Mr. Amirthalingam? there was a Vote of No-Confidence bought against Mr. Amirthalingam, the Leader of the Opposition in Parliament and there were Members who spoke. What did they say? They said that he, Mr. Amirthalingam had gone to foreign countries and said, if the Sri Lankan Tamil problem is not solved that they must not support Sri Lanka. It was a very legitimate thing for him to have done. They said that he must be taken to the Galle Face Green and be split into two. It is all recorded in Hansard. Some Members said, "No! Why take him to the Galle Face Green, we will do it here." This is what they did to Mr. Amirthalingam. So there is no point in talking about former Tamil Leaders and trying to show that you are being very considerate, very kind and all that sort of thing. Please solve our problem.

In the same 'Daily News' newspaper of 14th July, 2006 there is another article which appeared. I must read it to you because it is very important. It has been written by retired Colonel, Jayantha de Silva. I do not know whether to call him an imbecile or buffoon because this is what he says, I quote :

"The concept of Eelam was the brainchild of Chelvanayakam, who had been broaching this all along. In 1975 he was a sick man, but was responsible for the idea that raised the youth gangs. As a result, the gangs used Eelam as the basis for their fight with the security forces. (To give an idea of Chelvanayakam's one-tract mind, consider that he

first tried to create a Tamil Homeland in Malaya in 1955 when that country was receiving its independence from the British, but Sir Tunku Abdul Rahaman the first PM of Malaysia chased him out of the country as *persona non grata*, and he landed back in Sri Lanka, a frustrated megalomaniac with an absurd idea. )"

This is what the 'Daily News' newspaper, a Government controlled newspaper writes about Mr. Chelvanayakam on 14th July, 2006, the same day on which Mahinda Rajapaksa writes an article praising Mr. Amirthalingam. How do you expect us to look at these two?

This is something that happened in Parliament. When Mr. Chelvanayakam died it so happened that Mr. G. G. Ponnambalam, yet anothe of our respected Tamil Leaders had also died within a very close period to each other and there was a Vote of Condolence on both those gentlemen on the same day. I was in Parliament. It was the late Mr. Lalith Athulathmudali who moved Mr. Chelvanayakam's vote of Condolence. At that Vote he Said, I quote from the Hansard of 6th September, 1977 at column 896:

"Mr. Speaker, Samuel James Velupillai Chelvanayakam was born in Ipoh in Malaysia in 1893. Ipoh is known in Malaysia as the cleanest city in that country. Perhaps it was in the fitness of things that Mr. Chelvanayakam's political life was marked with a cleanliness unknown in contemporary politics........"

He further says, I quote :

".........and passsed out as an advocate. Very quickly, starting from the Court of Requests, he moved to the District Court and to the Supreme Court. In every court, small or big, Mr. Chelvanayakam distinguished himself on the civil side. He was made a King's Counsel, as it was called then........"

''Mr. Chelvanayakam, took to politics in 1947.'' This is what Mr. Athulathmudali said about Mr. Chelvanayakam. But that imbecile says that he was in Malaysia when the man had a roaring practice in Sri Lanka as a King's Counsel and came to Parliament.

What did the late Hon. Jayewardene the Prime Minster have to say. He talked of Mr. Ponnambalam first and then he said, I quote from the Hansard of 6th September, 1977 at column:

"Mr, Chelvanayakam was a politician of quote a different caliber. He was a quiet and reticent man. He spoke in simple words. He was no orator by any standard. But I have never met anybody in my community or any other community who said that Mr. Chalvanayakam would let you down. If he said something, would say, he would stand by his word. No remark have I heard from anybody that Mr. Chelvanayakam ever did a mean or small thing."

This is what Mr. J. R. Jayewardene said about Mr. Chelvanayakam. This is what Mr. Athulathmudali said about Mr. Chelvanayakam and that imbecile writes an article about Mr. Chelvanayakam on the same day on which President Rajapaksa writes an article praising Mr. Amirthalingam. Sir, where do we stand? What is the judgement we have to make ? This is your newspaper publishing what you want to be publised. You praise Mr. Amirthalingam to the hilt, the man whom you wanted bisected, torn into two pieces in Parliament itself, in 1981, when there was a No Confidence Motion. And a man of Mr. Chelvanayakam's calibre to be written about in this – I would not say it is silly – a vicious way by some person for the "Daily News." I do not wish to take any more of your time, Sir. The Motion will have to be seconded by one of my Colleagues.

I thank you for the patience you have shown me, Sir. But I want to kindly request the Government; please, do not waste your time. Please deal with the Tamil problem in a serious way. The Tamil problem is capable of being solved through a peaceful resolution. We want a peaceful resolution. But the structure of the Government must change. There must be an entirely new structure of governance. We are prepared to help you. We are prepared to give you all the co-operation. So that must be done . Please do not play small games. Please do not play petty games. That will not take you anywhere. Please be honest. Approach it honestly, straightforwardly and with condour.

Thank you, Sir.

[පූ. භා. 11.09]

**ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා**
*(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)*
(The Hon. M. K. Shivajilingm)

*கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எமது பாராளுமன்றக் குழுத் தலைவர் மாண்புமிகு இரா. சம்பந்தன் ஐயா அவர்கள், "சமாதான நடவடிக்கைகளும் வடக்கு - கிழக்கு மாகாணங்களில் தமிழ் மக்கள் எதிர்நோக்கும் பிரச்சினைகளும் " என்ற தலைப்பிலே பல வரலாற்று ஆதாரங்களுடன் இன்றைய நடவடிக்கைகள் பலவற்றையும் குறிப்பிட்டு முன்மொழிந்த ஒத்திவைப்புப் பிரேரணையை நான் வழிமொழிந்து பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமையையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இன்று,குறிப்பாக தமிழ்ப் பிரதேசங்களில் வாழ்கின்ற எமது மக்கள் மிகவும் இக்கட்டான நிலையில் வாழ்ந்துகொண்டிருக்கின்றார்கள். அரசாங்கம் இன்று ஒரு பெரிய நாடகத்தை நடாத்திக்கொண்டிருக் கிறது. "நாங்கள் பேச்சுவார்த்தைக்குத் தயாராக இருந்துகொண் டிருக்கின்றோம்; விடுதலைப் புலிகள்தான் எங்களைச் சீண்டுகின்றார்கள்" என்று கூறிக்கொண்டு பாகிஸ்தான், சீனா போன்ற அந்நிய நாடுகளிலிருந்து கோடிக்கணக்கான ரூபா பெறுமதியான ஆயுதங்களை வாங்கிக் குவித்துக் கொண்டு,இன்றைய அரசாங்கம் ஒரு முழு அளவிலான யுத்தத்துக்குத் தயாராகிக் கொண்டிருக்கின்றது. நீங்கள் பாகிஸ்தான், சீனா போன்ற நாடுகளிலிருந்து ஆயுதங்களை வாங்கியதன் விளைவாக இன்று இந்திய அரசாங்கத்தினதும், இந்திய மக்களினதும் கருணைப்பார்வை எமது தமிழினத்துக்குக் கிட்டியிருக்கிறது. உங்களுடைய சதி வலைகளின் காரணமாக பல ஐரோப்பிய நாடுகள் தங்களுடைய கண்களை மூடிக்கொண்டாலும், இன்று நீங்கள் கொன்று குவித்துக்கொண்டிருக்கின்ற அப்பாவித் தமிழ் மக்களுடைய படுகொலைகளின் விளைவாகவும், ஆயிரக்கணக்கான எமது மக்கள் அகதிகளாக தமிழகம் நோக்கி ஓடிக்கொண்டிருந்ததைப் பார்த்ததன் விளைவாகவும், இன்னமும் மனித நேயம் செத்துவிடவில்லை என்பதைக் காட்டும் வகையில் இந்தியத் தாய்த் திருநாட்டில் 30 கிலோ மீற்றர் தூரத்திலேயுள்ள தமிழகத்திலுள்ள எங்களுடைய தொப்புள்கொடி உறவினராகிய ஆறு கோடி தமிழ் மக்கள் வீறு கொண்டு எழுகின்ற நிலைமையை ஏற்படுத்தியுள்ளீர்கள். அவர்கள் இன்று எல்லாவற்றையும் கடந்து எமக்கு ஆதரவுக்கரம் நீட்டி வருகின்றார்கள். இவற்றைக் கண்டு அச்சமடைந்த நீங்கள், இப்பொழுது மாறுவேடம் போட்டுக்கொண்டு வேறு ஏதாவது செய்ய முடியுமா? எனப் பார்த்துக்கொண்டிருக்கின்றீர்கள்.*

[ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා]

ஆனால், அதே இந்தியத் திருநாட்டின் வெளிநாட்டு விவகார அமைச்சின் செயலாளர் ஷியாம் சரண் அவர்கள், "இலங்கைப் பிரச்சினைக்கு நீங்கள் சமஷ்டி அடிப்படையிலே தீர்வைக் காணுங்கள்." என உங்களுக்கு மிகவும் தெளிவாகக் கூறிவிட்டுச் சென்றிருக்கிறார்கள். உங்களுடைய வெளிவிவகார அமைச்சர் அவர்கள் புதுடில்லிக்குச் சென்றபோது இந்தியப் பிரதம மந்திரி அவர்கள், "அப்பாவித் தமிழ் மக்களுடைய படுகொலைகள் நிறுத்தப்படவேண்டும்." என்று தெளிவாகக் கூறியிருக்கிறார். ஆனால், நீங்களோ "இவற்றை யார் செய்கிறார்களென எங்களுக்குத் தெரியாது" எனக் கூறிக்கொண்டிருக்கிறீர்கள். துணைப்படைகள், கருணாவின் படைகள், ஈபீடிபீ இயக்கத்தினர் போன்ற இன்னும் எத்தனையோ படைகளை வைத்துக்கொண்டு, நீங்கள் ஒஸ்லோவிலே சொல்லியவற்றையெல்லாம் மறந்துவிட்டு, ஜெனீவாப் பேச்சு வார்த்தையின்பொழுது "நாங்கள் துணைப்படைகளின் ஆயுதங்களைக் களைவோம்" எனக் கூறியதை மறந்துவிட்டு, இப்பொழுது "நாங்கள் அவர்களிடமிருந்து ஆயுதங்களைக் களைய முடியாது, நீங்கள் செய்கிறதைச் செய்யுங்கள்" எனக் கூறுகிறீர்கள். இப்படியானதொரு சூழ்நிலையில் தமிழினத்தவராகிய எங்களால் என்ன செய்ய முடியும்? இன்று நீங்கள் தமிழினத்தின் மீது ஒரு யுத்தத்தைத் திணித்துக்கொண்டிருக்கிறீர்கள். தமிழ் தேசிய நடவடிக்கையாளர்களையும், தமிழீழ விடுதலைப் புலிகளின் தலைவர்களையும், அவர்களின் உறுப்பினர்களையும் கொல்வதன் மூலம் தந்திரோபாயமாக வலிந்து யுத்தத்துக்கு இழுக்கின்ற நடவடிக்கையில் ஈடுபட்டுக்கொண்டிருக்கின்றீர்கள். இதற்கு தமிழ் தேசியத்தின் பதில் என்ன? உங்களுடைய இவ்வாறான யுத்தத் திணிப்பு நடவடிக்கைகளை எதிர்கொள்வதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். எங்கள் மீது யுத்தம் திணிக்கப்படுமாகவிருந்தால், சர்வதேச நாடுகள் எதிர்த்தாலும், நாங்கள் துணிவுடன் அந்த யுத்தத்தை எதிர்கொள்ளத் தயாராகிவிட்டோம் என்பதை இந்தச் சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று நீங்கள் நாடகம் போட்டுக் கொண்டிருக்கிறீர்கள் என்பதை மேதகு ஜனாதிபதி அவர்களுக்குக் கூறிக்கொள்ள விரும்புகிறோம். நீங்கள் இன்று அரசியல் தீர்வுக்காக ஆலோசனைக் குழுக்களை நியமித்திருக்கிறீர்கள் ; ஆலோசிக்கிறீர்கள். 50 வருட காலத்துக்கு முன்னர் நாங்கள் வேண்டாம் என்று கூறிய ஒற்றையாட்சியின் கீழ் தீர்வைக் காணவென இன்று நீங்கள் இருட்டறையினுள் நின்றுகொண்டு கறுப்புப் பூனையைத் தேடிக் கொண்டிருக்கிறீர்கள். உங்களுடைய மேதகு ஜனாதிபதி அவர்களுக்கு ஆலோசனை கூறுகின்ற சட்ட ஆலோசகர் யார்? [இடையீடு] எனது நண்பர் இதனை இருட்டறையில் நின்றுகொண்டு குருடர்கள் கறுப்புப் பூனையைத் தேடுவது போல என மேலும் விரிவாகக் கூறுகிறார். அந்தக் குருடர்களுக்கு என்ன பூனை வந்தாலும் தெரியாது. அவ்வாறாகவே இன்று மேதகு ஜனாதிபதி அவர்களும் அவர்களுடைய குழுவினரும் சமாதானத்துக்கான செயற்பாடுகளில் ஈடுபட்டுக்கொண்டிருக்கின்ற வேடிக்கையான, வேதனையான நிலைமையை நாங்கள் பார்த்துக்கொண்டிருக்கிறோம்.

இன்றைக்கு வடக்கு - கிழக்கைப் பிரிக்கின்ற ஒரு சதி முயற்சியாக JVP யினர் உயர் நீதிமன்றத்திலே ஒரு வழக்கைத் தாக்கல் செய்திருக்கின்றார்கள். அந்த வழக்கிலே ஜனாதிபதி சட்டத்தரணி திரு. எச். என். டி. சில்வா மற்றும் திரு. எஸ். எல். குணசேகர போன்ற இனவாதிகள் - சிங்கள பௌத்தத்தைத் தூக்கி வைத்துக் கொண்டு ஆடக்கூடியவர்கள் - ஆஜராகக்கூடிய ஒரு சூழ்நிலை இருக்கின்றது. "அந்த விடயம் எங்களுக்கு பிரச்சினை இல்லை, நாங்கள் அதைப் பாராளுமன்றத்தின் மூலம் தீர்த்துக் கொள்வோம்" என்று 'ஜாதிக ஹெல உறுமய' கூறுகின்றது. ஆனால், JVP அந்த இணைப்பை உயர் நீதிமன்றத்தின் மூலம் உடைத்தெறிய முடியுமா என்று பார்க்கின்றது. நாங்கள் ஒரு சவால் விடுக்கின்றோம். அதாவது, நீங்கள் உயர் நீதிமன்றத் தீர்ப்பினால் அதை உடைத்தெறிந்தால் என்ன, பாராளுமன்றத் தீர்மானத்தின் மூலம் உடைத்தெறிந்தால் என்ன, இந்திய - இலங்கை ஒப்பந்தத்தின் அடிப்படையிலே தற்காலிகமாக இணைக்கப்பட்ட வடக்கு - கிழக்கை உடைத்தெறிகின்ற அந்த ஆணையை தமிழ் மக்களுக்கு எதிரான யுத்தப் பிரகடனமாகவே நாங்கள் பார்ப்போம். அந்த யுத்தப் பிரகடனத்தின் மூலம் இந்த இலங்கைத் திருநாட்டிலே ஒரு தமிழீழ சுதந்திர இராச்சியம் உருவாகும். அதை உருவாக்குகின்ற கைங்கரியத்தை நாங்கள் மேற்கொள்வதற்கான சந்தர்ப்பத்தை JVP சகோதரர்களும் 'ஜாதிக ஹெல உறுமய'வினரும் எங்களுக்கு ஏற்படுத்தித் தருவதையிட்டு நாங்கள் மகிழ்ச்சியடைகின்றோம். ஐக்கிய இலங்கைக்குள் ஒரு தீர்வை நாடிக் கொண்டிருக்கின்ற எங்களை உங்களுடைய நடவடிக்கைகளின் மூலமாக "நீங்கள் இங்கு இருக்கக்கூடாது, அங்கே செல்லுங்கள்!" என்று சொல்கின்றீர்கள். "இனிமேல் திருகோணமலையிலே நாங்கள் ஓர் இராணுவ அதிகாரியைத்தான் அரசாங்க அதிபராக நியமிப்போம் ; அங்கு நடைபெறும் கூட்டங்களுக்கு உங்களுடைய பாராளுமன்ற உறுப்பினர்களை அழைக்க முடியாது ; ஒரு கடற்படை அதிகாரிதான் அங்கே ஆளுநர்!" என்றவாறாகத்தான் உங்களுடைய நடவடிக்கைகள் அமையுமென்றால் நாங்கள் என்ன செய்வது?

இன்றைக்கு வடக்கு - கிழக்கிலே என்ன நடக்கின்றது? அங்கே எல்லா இடங்களிலும் அப்பாவிப் பொதுமக்களைச் சுட்டுக் கொல்கின்றீர்கள். பேசாலையிலே கத்தோலிக்கத் தேவாலயத் திற்குக் குண்டு வீசப்பட்டது. வங்காலையிலே, இந்தியாவில் அகதிகளாக இருந்து விட்டுத் திரும்பி வந்த ஒரு சாதாரண தச்சுத் தொழிலாளியையும் அவருடைய மனைவியைப் பலாத்காரமாகக் கெடுத்து விட்டு, அவரையும் மற்றும் அவருடைய குழந்தைகளையும் கொன்று தூக்கிலே தொங்க விட்டீர்களே! இப்பொழுது உங்களுடைய இராணுவத்தினருடைய அந்த அராஜகம் - அந்த அரச பயங்கரவாதம் - எல்லை கடந்து இன்று வடக்கு - கிழக்கிலே திருகோணமலை மட்டக்களப்பு அம்பாறை, வவுனியா, மன்னார், யாழ்ப்பாணம் என்று எல்லா இடங்களிலும் தலைவிரித்தாடிக் கொண்டிருக்கின்றது. யாழ்ப்பாணத்திலே இராணுவம் யாழ்ப்பாண மேலதிக நீதவானது காரைத் துரத்திச் சென்று அவருக்குக் கொலைப் பயமுறுத்தல் விடுத்திருக்கின்றது. அதைப் பற்றி நாங்கள் இன்னோர் ஒத்தி வைப்புப் பிரேரணையிலே விரிவாகப் பேசவிருக்கின்றோம். நீதிபதிக்கே இந்த நிலையா? அன்றொரு நாள் நான் யாழ்ப்பாணம் நகரில் நின்றிருந்தபோது நடந்த ஒரு சம்பவத்தைக் குறிப்பிட வேண்டும். அங்கு இராணுவத்தினர் திடீரென்று 'விசில்' ஊதுகின்றார்கள். அப்பொழுது வீதியில் போகின்ற எல்லோரும் ஓடி ஒளிக்க வேண்டும் ; ஒழுங்கைகளிலே பதுங்கியிருக்க வேண்டும் ; வாகனங்களைப் பாதை ஓரமாக நிறுத்த வேண்டும். அங்கு வருகின்ற ஒரு நான்கு பொலிஸார் அல்லது ஐந்து இராணுவத்தினர் பெரும் சாட்சாத் பிரபுக்கள்! அவர்களுக்கு எங்களுடைய மக்கள் ஆண்கள், பெண்கள் எல்லோரும் சைக்கிளிலே வந்தால் என்ன வேறு விதமாக வந்தால் என்ன ஒதுங்கி நிற்க வேண்டும். இப்படியான ஒரு வேடிக்கை நாடகத்தை நீங்கள் அங்கு அரங்கேற்றிக் கொண்டிருக்கின்றீர்கள்! இதுதானா உங்களுடைய நிர்வாகம்? அங்கு அவர்கள் எல்லோருடைய கைகளிலும் விசில்! இன்று அங்கு அடுத்த எடுப்பில் துப்பாக்கி வேட்டுத் தீர்க்கப்படுகின்ற ஒரு நிலைமை இருந்து கொண்டிருக்கின்றது.

எங்களுடைய மக்களை நீங்கள் இராணுவ அடக்குமுறைகளின் மூலம் அச்சுறுத்தலாம் என்று நினைத்தால், அது உங்களால் ஒருபோதும் முடியாது என்பதை வரலாறு காட்டத்தான் போகின்றது. நீங்கள் இன்றைக்குத் தவறான நடவடிக்கைகளிலே ஈடுபட்டுக் கொண்டிருக்கின்றீர்கள். இந்த வடக்கு - கிழக்கைப் பிரிக்கின்ற முயற்சி மற்றும் திருகோணமலையைச் சிங்களமயமாக்குகின்ற முயற்சி போன்றவற்றின் மூலம் எங்களுடைய தமிழ் தேச மக்களை நீங்கள் அடக்கி விட முடியாது. இன்றைக்கு நீங்கள் கிழக்கு மாகாணத்தைப் பிளவுபடுத்துவதற்கு கருணா குழுவினரை வைத்து நாடகமாடிக் கொண்டிருக்கின்றீர்கள். ஒரு யுத்தத்தை முன்னெடுத்து, கிழக்கு மாகாணத்திலே சில பகுதிகளைக் கைப்பற்றி, வடக்கு - கிழக்கிலே இருந்து கிழக்கை உடைத்து, வடக்கைத் தனிமைப்படுத்துகின்ற உங்களுடைய முயற்சி

ஒருபொழுதும் வெற்றி பெறாது என்று நாங்கள் திட்டவட்டமாகக் கூறுகின்றோம். மீண்டும் ஒரு யுத்தம் வெடிக்குமானால், உங்களுடைய கட்டுப்பாட்டில் இருக்கின்ற மேலும் பல பகுதிகளை விடுதலைப் புலிகளிடம் இழக்கின்ற மிகவும் இக்கட்டான ஒரு நிலைமை ஏற்படக்கூடும். அதனைத் தவிர்க்குமுகமாக ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் யதார்த்தத்தை உணர்ந்து இந்தப் பிர்ச்சினைக்குத் தீர்வு காண முன்வர வேண்டும். அதை விடுத்து, அவர் வெளிநாடுகளுக்கு ஏதேதோ வித்தைகளைக் காட்டிக் கொண்டு நாளும் பொழுதும் இங்கிருந்து அறிக்கைகளை விடுத்து கொண்டு எங்களுடைய மக்களை ஏமாற்ற முடியாது. நிச்சயமாக நாங்கள் ஒன்றைக் கூற விரும்புகின்றோம். அதாவது, நாங்கள் இன்னமும் சமாதானத்தில் நம்பிக்கை கொண்டிருக்கின்றோம். ஆனால், நீங்கள் எம்மீது ஒரு யுத்தத்தைத் திணிப்பீர்களாக இருந்தால், அந்த யுத்தத்தைச் சந்திப்பதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம்.

இன்றைக்கு லெபனான் மீது இஸ்ரேல் குண்டு வீசிக் கொண்டிருக்கின்றது. நீங்கள் மௌனமாக இருக்கின்றீர்கள்! வெட்கமில்லையா? இன்றைக்கு அங்கே 60 -70 ஆயிரம் இலங்கையர் இருக்கின்றார்களே! அங்கே இலங்கைப் பணிப் பெண் ஒருவர் இறந்ததாக இன்று தகவல் கிடைத்திருக்கின்றது. இன்றைக்கு அமெரிக்கா தனது வீட்டோ அதிகாரத்தைப் பாவித்து அங்கு இஸ்ரேல் குண்டு வீசுவதை ஆதரித்துக் கொண்டிருக்கின்றது. அமெரிக்காவின் ஆதரவுடன் நடக்கின்ற இஸ்ரேலின் கொடிய அடக்குமுறைக்கு எதிராக, பலஸ்தீனத்தின் பாதுகாவலர் என்று சொல்கின்ற ஜனாதிபதி அவர்களிடமிருந்து ஒரு செய்தியையும் காணவில்லையே! ஏன், இங்கிருக்கின்ற முஸ்லிம் பிரதிநிதிகளிடமிருந்தும் உரத்த குரல் வரவில்லையே? ஏன் இந்த நிலைமை? இவ்விடயத்தில் அரசாங்கத்தின் கொள்கை என்ன? ஆகவே, இந்த அரசாங்கம் நடத்துகின்ற இந்த நாடகங்களை நிறுத்தி, அடக்கப்பட்டு ஒடுக்கப்பட்டிருக்கின்ற மக்களுக்குச் சார்பாகக் குரல் கொடுக்க வேண்டும். அவ்வாறில்லாவிட்டால், சூழ்நிலைகளுக் கேற்றவாறு சுருதிகளை மாற்றிக்கொண்டு

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair]*

வழங்க வேண்டுமென இந்தப் பாராளுமன்றம் பிரேரிக்க வேண்டுமென்று கேட்டு, என்னுடைய உரையை நிறைவு செய்கிறேன். நன்றி.

[පූ. භා. 11.20]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (විදුලිබල නියෝජ්‍ය අමාත්‍ය)**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே - மின்வலுப் பிரதி அமைச்சர்)*
(The Hon. Mahindananda Aluthgamage - Deputy Minister of Power)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ''සාම ක්‍රියාවලිය හා ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ජීවත් වන සිවිල් ජනතාවගේ වර්තමාන තත්ත්වය'' මැයෙන් වූ යෝජනාවක් අද ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. උතුරේ සිවිල් ජනතාව වෙනුවෙන් රජය මේ වන විට කර තිබෙන විශාල කාර්ය භාරය එතුමන්ලාගේ අවධානයට යොමු කරවන්න අප බලාපොරොත්තු වෙනවා. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා පැය එකහමාරකට ආසන්න කාලයක් උතුරු නැගෙනහිර ප්‍රශ්නය පිළිබඳව එතුමාගේ අදහස් දැක්වුවා. ඒවාගේ ම ජ්ක ස්ථිර කළ මන්ත්‍රීතුමා බොහොම ආවේගශීලී ලෙස උතුරේ ප්‍රශ්නය පිළිබඳව - එතුමා දකින පැත්තෙන් - අදහස් දැක්වුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව ආවේගශීලීව කථා කරනවා නම්, පැය ගණන් කථා කරන්න, දවස් ගණන් කථා කරන්න රජය නියෝජනය කරන අය හැටියටත්, දකුණේ ජීවත්වන අය හැටියටත් අපිට පුළුවන්කම තිබෙනවා.

මේ අවස්ථාවේදී ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා මූලිකව කිව්වේ ආණ්ඩුවේ යුතුකම සාම ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වාගෙන යාම කියායි. ඒ වාගේම ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, අමතක කරන්න එපා. එල්ටීටීඊ සංවිධානයේත් යුතුකම තමයි. සටන් විරාම ගිවිසුම ආරක්ෂා කිරීම. පැයකටත් වැඩි කාලයක් ඔබතුමා අදහස් ප්‍රකාශ කරද්දී ඇමෙරිකාව කළ ප්‍රකාශය පිළිබඳව ඔබතුමා කථා කළා; ඔබතුමා යුරෝපා සංගමය කළ ප්‍රකාශය ගැන කථා කළා, ඔබතුමා ටෝකියෝ සම සභාපතිවරුන්ගේ ප්‍රකාශ ගැන කථා කළා; ඔබතුමා ඉන්දියාවෙන් ආ විදේශ ලේකම්වරයාගේ කථාව පිළිබඳව ප්‍රකාශ කළා. හැබැයි, ඒ සියලුදෙනාම කළ ප්‍රකාශයන්වල අවසාන කොටස ගැන විතරයි ඔබතුමා කථා කළේ. ඔවුන් සියලු දෙනාම - යුරෝපා සංගමය, ඇමෙරිකාව, ඉන්දියාවෙන් පැමිණි විදේශ ලේකම්තුමා ඒවාගේ ම ඇමෙරිකාවෙන් ආ උසස් නිලධාරීන් - වහාම මේ ත්‍රස්තවාදය නවත්වන්න ඕනෑය කියා එල්ටීටීඊ සංවිධානයට කළ බලපෑම පිළිබඳව මේ ගරු සභාවේදී තමුන්නාන්සේගේ අවධානය යොමු කළේ නැහැ. ඒ සියලුම රාජ්‍ය නායකයන් එහෙම නැත්නම් ඒ රටවල් විසින් කළ ප්‍රකාශවල ඇතුළත් වූ ආණ්ඩුව ද්‍රවිඩ ජනතාව ආරක්ෂා කරන්න ඕනෑය කියා දීපු කෙටි පණිවුඩයට තමයි තමුන්නාන්සේගේ අවධානය යොමු කළේ. නමුත්, ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, අමතක කරන්න එපා, මේ වන විට ඇමෙරිකාව වාගේම යුරෝපා සංගමය දැඩි ලෙස එල්ටීටීඊ සංවිධානයට අවවාද කර තිබෙනවා, මේ ත්‍රස්තවාදී ක්‍රියාවලින් ඉවත් වෙන්න ඕනෑය කියලා.

රජයේ වගකීම වන්නේ සාම ක්‍රියා දාමය අඛණ්ඩව ගෙන යාමයි. අපි ඒක පිළිගන්නවා. ඔබතුමන්ලා කියනවා වාගේම අපිත් එල්ටීටීඊ සංවිධානයට කියනවා, මේ සෙල්ලම කරන්න එපාය කියා. ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමා කිව්වා, ''කළුවර කාමරේ ඉඳලා කළු පූසෙක් අල්ලන්න හදන්න එපා'' - ය කියා. එල්ටීටීඊ සංවිධානයට අපි ඒකම කියනවා. මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේලා ආණ්ඩුවට විතරක් ඇඟිල්ල දික් කරන්න එපා. තමුන්නාන්සේලා ආණ්ඩුවට විතරක් ඇඟිල්ල දික් කරලා නොයෙකුත් දේවල් කියන්න එපා.

පසුගිය කාලයේදී එල්ටීටීඊ සංවිධානය විසින් කළ ඝාතන අද තමුන්නාන්සේලාට අමතක වෙලා ඇත. තමුන්නාන්සේලාට අමතක වෙලා ඇති, හමුදාපතිතුමා ඝාතනය කරන්න හදපු ආකාරය; පාරමී කුලතුංග මැතිතුමාගේ ඝාතනය. ඒ වාගේම කැබිතිගොල්ලෑවේ අහිංසක චූටි දරුවෝ කපා කොටා මරපු ආකාරය තමුන්නාන්සේලාට අමතක වෙලා ඇති. තමුන්නාන්සේලා අද එල්ටීටීඊ සංවිධානයේ පැත්ත අරගෙන කථා කරනවා; ආණ්ඩුව අද රාජ්‍ය ත්‍රස්තවාදයක් කරනවා කියා කථා කරනවා. කැබිතිගොල්ලෑවේ අහිංසක වැසියෝ ඝාතනය කළා. තමුන්නාන්සේලා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට ගිහින් ගොවියෝ හත් දෙනෙකුට වෙඩි තබා මැරුවා. තමුන්නාන්සේලාගේ එල්ටීටීඊ සංවිධනයට බලෙන් බඳවා ගත්ත අහිංසක ළමා සොල්දාදුවන් තමයි ඒ උදවිය මැරුවේ.

තමුන්නාන්සේලා වවුනියාවට යන බව අපි රූපවාහිනියෙන් දකිනවා. එහෙම ගිහින් තමුන්නාන්සේලා තමිල් සෙල්වන් හමුවෙනවා. ටීඑන්ඒ එකේ මන්ත්‍රීවරු ගිහින් කජු කකා ඉන්නවා. අපි දකිනවා. කජු කනවා, ටීවී එකේ පෙන්වනවා. කජු කන එකම නොවෙයි කරන්න ඕනෑ. තමුන්නාන්සේලා කජු කන ගමන් මේවා කියන්න. තමුන්නාන්සේලා මේ ආණ්ඩුවට විතරක් නොවෙයි, එල්ටීටීඊ සංවිධානයටත්, තමිල් සෙල්වන්ටත් කියන්න ඕනෑ, බලපෑම් කරන්න ඕනෑ, මේ ඝාතන නවත්වන්න ඕනෑය කියලා. තමුන්නාන්සේලා ඔය විධියට කථා කළේ නැත්නම් තමුන්නාන්සේලාට ඒ ප්‍රදේශයේ ඉන්න බැහැ. ඒ නිසා අමතක කරන්න එපා. මේකේ දෙපැත්තක් තිබෙන බව.

අද එල්ටීටීඊ සංවිධානය බරපතල ලෙස සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කර තිබෙනවා. මේ වන විට එල්ටීටීඊ සංවිධානය 4309 වාරයක් සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කර තිබෙන බව තමුන්නාන්සේලා අමතක කරන්න එපා. මේ වන විට හමුදාවේ 150 දෙනකු මරලා තිබෙනවා; 269 දෙනෙක් තුවාල ලබා තිබෙනවා; මේ වන විට නාවික හමුදාවේ 94 දෙනකු මරලා තිබෙනවා; 66 දෙනෙක් තුවාල ලබා තිබෙනවා; මේ වන විට ගුවන් හමුදාවේ 4 දෙනකු මරලා තිබෙනවා; 5 දෙනෙක් තුවාල ලබා තිබෙනවා; මේ වන විට පොලීසියේ 32ක් මරලා තිබෙනවා; 142 දෙනෙක් තුවාල ලබා තිබෙනවා; මේ වන විට ග්‍රාමාරක්ෂකයන් 23 දෙනෙකු මරලා තිබෙනවා; 12 දෙනෙකු තුවාල ලබා තිබෙනවා; මේ වන විට සිවිල් ජනතාව 252ක් මරලා තිබෙනවා; 381 දෙනෙක් තුවාල ලබා තිබෙනවා.

අද සම්පන්දන් මන්ත්‍රීතුමා කියනවා, අපිට චන්දය දුන්න නිසා උතුරේ සිවිල් ජනතාවට ජීවත් වෙන්න අයිතියක් නැහැයි කියා. අද එතුමන්ලාට සිවිල් ජනතාව කියනවාලු ''තමුන්නාන්සේලාට ඡන්දය දුන්න නිසා තමයි අද අපිට නැගෙනහිර ඉන්න බැරි වී තිබෙන්නේ'' කියා.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, අද දකුණේ ජීවත් වන ජනතාවටත් මේ ප්‍රශ්නය තිබෙනවා තමුන්නාසේ ඒක අමතක කරන්න එපා. කැබිතිගොල්ලෑවේ අහිංසක දරුවෝ ටික ඉස්කෝලේ යන විට ඝාතනය කරන්නට තරම් එල්ටීටීඊ සංවිධානය ම්ලේච්ඡ වුණා. තමුන්නාන්සේලාට අද ඒවා අමතක වෙලාද ? අද දකුණේ ජනතාව මේ ගැන කථා කරනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අතිගරු ජනාධිපතිතුමා යන එන ප්‍රදේශයේ ඉඳලා අද උදේ එල්ටීටීඊ කාන්තාවක් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. මොනවා කරන්න හිතා ගෙනද ඉඳලා තිබෙන්නේ? [බාධා කිරීමක්] ඒකට ඔයාත් සම්බන්ධයි කියා අපට ආරංචියි. මෙවැනි ඝාතන සිදු වෙමින් පවතින අවස්ථාවක තමුන්නාන්සේලා මේ පිළිබඳව කථා කරන්නේ නැත්තේ ඇයි? ආණ්ඩුව මේ ප්‍රදේශවලට මොනවාද කළේ කියා මා තමුන්නාන්සේලාට කියනවා. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන්ගේ අවධානය මේ පිළිබඳව පොඩ්ඩක් යොමු කරවන්න.

ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමනි, මේ වන විට උතුරු-නැගෙනහිර ප්‍රදේශ සඳහා රජය කරන සංවර්ධන වැඩ ගැන තමුන්නාන්සේලා වචනයක්වත් කථා කරන්නේ නැහැ. උතුරු-නැගෙනහිර ප්‍රදේශයේ ආණ්ඩුව කරන වැඩ ගැන මා තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරනවා. මේ වන විට උතුරු-නැගෙනහිර ජනතාවට විදුලිය ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. විදුලිය සඳහා පමණක් රුපියල් මිලියන 1046ක් වෙන් කර තිබෙනවා. තමුන්නාන්සේලා ඒක අමතක කරන්න එපා. විදුලිය ලබා දීමේදී වවුනියාවට රුපියල් මිලියන 16ක්, මන්නාරමට රුපියල් මිලියන 18ක්, මුලතිව්වලට රුපියල් මිලියන 9ක්, වවුනියාවට තවත් රුපියල් මිලියන 7ක්, මන්නාරමට තවත් රුපියල් මිලියන 8ක් වශයෙන් වෙන් කර තිබෙනවා. දිස්ත්‍රික්ක වශයෙන් ගත්තොත් යාපනය දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 197ක්, කිලිනොච්චිය දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 91ක්, මන්නාරම දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 105ක් හා වවුනියාව දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 60ක් විදුලිය වෙනුවෙන් ලබා දී තිබෙනවාය කියන එක මතක් කරන්න ඕනෑ. මේ වන විට යාපනය දිස්ත්‍රික්කයේ විදුලි පාරිභෝගිකයෝ 90,000ක් ඉන්නවා. යුද්ධයට කලින් සිටියේ 61,000යි.

අද දකුණේ සමහර ප්‍රදේශවලට විදුලිය දීලා තිබෙන්නේ සියයට 17යි, 18යි. අද යාපනය දිස්ත්‍රික්කයේ සියයට 65කට, 70කට විදුලිය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ, -යාපනයේ අපේ මිත්‍ර මන්ත්‍රීවරු නැහැ- අද යාපනය දිස්ත්‍රික්කයේ විදුලිය අපතේ යෑම සියයට 40ක් බව. යාපනයේ වැඩි පිරිසක් විදුලිය හොරෙනුයි, ගන්නේ. අපේ losses සියයට 40යි. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමනි, අර කජු කන ගමන් තමිල් සෙල්වන් මහත්මයාලාට කියන්න, ආණ්ඩුව විදුලිය දෙනවා, නමුත් වැඩි පිරිසක් විදුලිය ගන්නේ හොරටයි කියලා. යාපනය දිස්ත්‍රික්කයේ විදුලිය අපතේ යෑම සියයට 40යි. වවුනියාව දිස්ත්‍රික්කයේ සියයට 37යි. නමුත් අද දකුණේ සිංහල ප්‍රදේශවල විදුලිය අපතේ යෑම සියයට 16යි, සියයට 17යි. තමුන්නාන්සේලාගේ ප්‍රදේශවල මිනිස්සු ආණ්ඩුවෙන් විදුලිය ගන්නවා; නමුත් අඩු ගණනේ විදුලිය බිලවත් හරියට ගෙවන්නේ නැහැ. තමුන්නාන්සේලා ගිහින් මේවා ගැන කථා කරන්න.

ඒ විතරක් නොවෙයි. අපි මොන තරම් සංවර්ධනයක් කරනවාද? මේ වන කොට මැදවච්චිය -මන්නාරම පාර සඳහා රුපියල් මිලියන 600ක්, වවුනියාව-පරයනාලන්කුලම පාර සඳහා රුපියල් මිලියන 200ක්, පුනරින් -වවුනියාව පාර සඳහා රුපියල් මිලියන 130ක්, සිලාවතුර පාර සඳහා රුපියල් මිලියන 78ක්, මඩකලපුව- ත්‍රිකුණාමලය පාර සඳහා රුපියල් මිලියන 600ක්, පුල්මුඩ්ඩෛ පාර සඳහා රුපියල් මිලියන 180ක් වෙන් කර තිබෙනවා. අද අපේ ගම්වල මාර්ගවලට කාපට් දමා ගන්න විධියක් නැහැ. අද යාපනයේ පොයින්ට්පේද්‍රෝ පාර, මනිපායි පාර, කන්කසන්තුරේ පාර, මුලතිව් - වන්ඩුක්සුඩායි පාර යන මාර්ග කාපට් කරන්න -මුළු යාපනයේම මාර්ග කාපට් කරන්න- රුපියල් මිලිය1500ක් වියදම් කරනවා. මේවා ගැන මේ ගොල්ලෝ කතා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා මහාමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අරගෙන බලන්න. මහාමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් තුනෙන් දෙකක් සල්ලි උතුරු නැගෙනහිරට වෙන් කර තිබෙන බව තමුන්නාන්සේලා අමතක කරන්නට එපා. තමුන්නාන්සේලා මේවා ගැන කථා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා මේ කිසිම දෙයක් ගැන කථා කරන්නේ නැහැ, තමුන්නාන්සේලා බලන්න, අද තලෙයිමන්නාරම පාලම හදනවා. වැය කරන මුදල රුපියල් මිලියන දාහයි. තමුන්නාන්සේලා උපදේශක කාරක සභාවට ඇවිල්ලා මේ සියලු කටයුතු කර ගන්නවා. තමුන්නාන්සේලා උපදේශක කාරක සභාවලට ඇවිල්ලා වැඩ කර ගන්නවා. ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා නම් අහන්න. මේ කියන දෙය බොරුවක්ද?

**ගරු බිමල් රත්නායක මහතා**
*(மாண்புமிகு பிமல் ரத்நாயக்க)*
(The Hon. Bimal Ratnayake)

තුනෙන් දෙකක් නැහැයි ලු.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

එතුමාට ගණන් හදලා බලන්න කියන්න, තුනෙන් දෙක නැද්ද කියලා. මම අභියෝග කරනවා. ගරු මන්ත්‍රීතුමනි තමුන්නාන්සේ මහාමාර්ග අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අරගෙන බලන්න. මහාමාර්ග අමාත්‍යාංශයට වෙන් කර තිබෙන මුදලින් තුනෙන් දෙකක්. දැන් මේක කිව්වාම බිමල් රත්නායක මන්ත්‍රීතුමන්ලා ඕකටත් ඊළඟට පාරට බහීවි. ඔය ගණන් හිලවු කියන්නත් හොඳ නැහැ. ඊළඟට කියයි, දකුණට වැඩ කරන්නේ නැහැ කියලා. සම්පන්දන් මන්ත්‍රීතුමනි, මේ කියන්නේ තමුන්නාන්සේලාට මේ ආණ්ඩුව කරන සේවාව ගැනයි. අද තමුන්නාන්සේලා එය අගය කරන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, මම ඔබතුමාට කිව්වා තලෙයිමන්නාරම පාලම ගැන. අද දකුණට රුපියල් මිලියන දාහක් වැය කර හදන පාලම මොකක්ද? ඒ වාගේම අරුගම්බේ පාලම-

**ගරු බිමල් රත්නායක මහතා**
*(மாண்புமிகு பிமல் ரத்நாயக்க)*
(The Hon. Bimal Ratnayake)

මා හිතන්නේ තමුන්නාන්සේගේ ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නවා නම් හොඳයි. අපි එහෙම කවදාවත් දකුණට-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

නැහැ, නැහැ, පොඩ්ඩක් ඉන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
*(மாண்புமிகு பிமல் ரத்நாயக்க)*
(The Hon. Bimal Ratnayake)

පොඩ්ඩක් ඉන්න. තමුන්නාන්සේ ලොකු චෝදනාවක් ඒ කළේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

කිසිම චෝදනාවක් කළේ නැහැ. මම කාලය දෙන්නේ නැහැ. ඒ නිසා-

**ගරු බිමල් රත්නායක මහතා**
*(மாண்புமிகு பிமல் ரத்நாயக்க)*
(The Hon. Bimal Ratnayake)

අපි කිව්වා, එක් අවස්ථාවකදී-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, කෝමාරි පාලම, ඒ වාගේම කල්අඩි පාලම-

**ගරු බිමල් රත්නායක මහතා**
*(மாண்புமிகு பிமல் ரத்நாயக்க)*
(The Hon. Bimal Ratnayake)

නියෝජ්‍ය අමාත්‍යතුමනි, නිකම් මේ අපිව එක විධියකට brand කරන්න තමුන්නාන්සේට වුවමනාවක් තිබෙනවාද මම දන්නේ නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

නැහැ, නැහැ brand කිරීමක් නොවෙයි. ඔබතුමන්ලාගේ පැත්තේ කට්ටියක් ඉන්න ගමන් කියනවා-

**ගරු බිමල් රත්නායක මහතා**
*(மாண்புமிகு பிமல் ரத்நாயக்க)*
(The Hon. Bimal Ratnayake)

අපි කිව්වා සුනාමි ආධාර මුදල් උතුරු නැඟෙනහිරට විතරක් දුන්නත් කමක් නැහැයි කියලා. ඒ නිසා චෝදනාවක් තිබෙනවා නම් තමුන්නාන්සේලා ඒක වෙනම කර ගන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

බොහොම හොඳයි. Thank you. තව මුකුත් තිබෙනවාද?

**ගරු බිමල් රත්නායක මහතා**
*(மாண்புமிகு பிமல் ரத்நாயக்க)*
(The Hon. Bimal Ratnayake)

තව ගොඩාක් දේවල් තිබෙනවා, කියන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

අපි ළඟත් ගොඩාක් දේවල් තිබෙනවා. පසුව කථා කරමු. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, - [බාධා කිරීමක්] මොකක්ද? [බාධා කිරීමක්] ඒ විතරක් නොවෙයි, අර කුරුණෑගල ගණිකා මඩම ගැනත් අපි ළඟ කියන්න කරුණු තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තලෙයිමන්නාරම පාලම ගැනයි මම කථා කරමින් සිටියේ. ඒ වාගේම නයිනයාරු පාලම, අරුගම්බේ පාලම, - [බාධා කිරීමක්] මොකක්ද? අහගන්න ඕනෑ නැහැ නේ නිකම්. ඒ නිසා පොඩ්ඩක් කට වහගෙන ඉන්න. දෙකේ පන්තියේ ඉන්න. අරුගම්බේ පාලම, කෝමාරි පාලම, ඒ වාගේම කල්අඩි පාලම මේ වාගේ විශාල සංවර්ධන ක්‍රියා දාමයක් අද රට තුළ ක්‍රියාත්මක වෙද්දි, මේ වන සංවර්ධනය ගැන අද තමුන්නාන්සේලා වචනයක් කථා කරන්නේ නැහැ.

සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන බලන්න. අද යාපනය දිස්ත්‍රික්කය තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මොන තරම් විශාල සංවර්ධනයක් සිදු වෙනවාද කියලා බලන්න. අද උතුරු නැඟෙනහිර සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මොන තරම් සංවර්ධනයක් සිදු වෙනවාද? ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රතිඵල පිළිබඳව සම්පන්දන් මන්ත්‍රීතුමා අද සංඛ්‍යා ලේඛන ටිකක් අරගෙන කථා කළා. ඩග්ලස් දේවානන්ද ඇමතිතුමා අද යාපනයට ගිහිල්ලා ජනතාව හමු වෙනවා. යාපනයේ ජනතාවගේ ප්‍රශ්නවලට අද ඩග්ලස් දේවානන්ද ඇමැතිතුමා ඇහුම්කන් දෙනවා. එතුමා හමු වෙන්න හැම දාම අඩුම ගණනේ යාපනයේ පවුල් තුන්සියයක් නැත්නම් හාරසියයක් එනවා. මේ එතුමාගේ සංඛ්‍යා ලේඛන නොවෙයි, රජය ලබාගත් සංඛ්‍යා ලේඛන. පසු ගිය පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේ දී අතිගරු ජනාධිපතිතුමා අපට උපදෙස් දුන්නා සියලු මැති ඇමතිවරු වහාම යාපනයට ගිහිල්ලා යාපනයේ ජනතාවගේ ප්‍රශ්නවලට ඩග්ලස් දේවානන්ද ඇමතිතුමාත් එක්ක සම්බන්ධ වෙන්න කියලා. හෙට අනිද්දා වන කොට යාපනයට ගිහිල්ලා යාපනයේ ජීවත් වන ජනතාවගේ අඩු පාඩුකම් මොනවාද, විදුලිය දෙන්න ඕනෑ කොහේටද, හදන්න ඕනෑ පාරවල් මොනවාද, තමුන්නාන්සේලාට ලැබෙන්න ඕනෑ රක්ෂා මොනවාද, කියා සොයා බලා යාපනේ ඒ සියලු වැඩ කරන්න අපි ලැහැස්තියි. ඒ සියලු වැඩ තමුන්නාන්සේලා වෙනුවෙන් අපි කරනවා. අද සම්පන්දන් මන්ත්‍රීතුමාගේ මාතෘකාව තිබෙන්නේ උතුරේ ජන ජීවිතයට බලපාන ප්‍රශ්න පිළිබඳවයි. අද උතුරේ ජනතාවගේ ජන ජීවිතයට බලපාන ප්‍රශ්නයක් නැහැ. අද පාරවල්වල බස් දුවනවා. පාසල් පවත්වනවා. රජයේ කාර්යාල ඒ ආකාරයෙන්ම කටයුතු කරනවා. ඒ සියලු දේවල් වෙනවා. හැබැයි තමුන්නාන්සේලාගේ පැත්තේ සිදුවන ඝාතන කථා කරන ගමන් අමතක කරන්න එපා–

**ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා**
*(மாண்புமிகு ஜீ. ஜீ. பொன்னம்பலம்)*
(The Hon. G. G. Ponnampalam)

Sir, I want to just point out, abviously the respected Deputy Minister has not understood the gist of what the Hon. Sampanthan was trying to say. the entire-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

I understood the Hon. Sampanthan – [*Interruption*] No. I m sorry, Hon. Ponnambalam I do not want to give my time to you. එතුමාට මගේ කාලය දෙන්න මම සූදානම් නැහැ. තමුන්නාන්සේ මට-

**ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා**
*(மாண்புமிகு ஜீ. ஜீ. பொன்னம்பலம்)*
(The Hon. G. G. Ponnampalam)

Sir, you are not replying to what we are saying.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

සම්පන්දන් මන්ත්‍රීතුමා කියපු කාරණය පිළිබඳව–

**ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා**
*(மாண்புமிகு ஜீ. ஜீ. பொன்னம்பலம்)*
(The Hon. G. G. Ponnampalam)

You are carring out a monologue.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමනි, මගේ අවධානය යොමු වුණේ තමන්නාන්සේලාගේ මාතෘකාවටයි. අද තමුන්නාන්සේලාගේ adjournment එකේ මාතෘකාව මොකක්ද ? උතුරේ ජනතාවගේ ජන ජීවිතයට බලපාන වර්තමාන තත්ත්වයයි. මම කථා කරන්නේ උතුරේ ජනතාවගේ ජන ජීවිතය පවත්වා ගෙන යාම සඳහා ආණ්ඩුවෙන් කරන්නා වූ සංවර්ධන ක්‍රියාදාමය ගැනයි. ඉතින් අපි ඒක කියන එක වැරදිද? [බාධා කිරීම්] හරි. ඉතින් තමුන්නාන්සේ පොඩ්ඩක් ඉන්න. අපිත් කියන්න ඕනෑ. අපි තමුන්නාන්සේලා කියන එක විතරක් අහගෙන හිටියා නම් තමුන්නාන්සේලා යාපනයේ ගිහිල්ලා කජු කනවා වාගේ කියන ඒවා අපිත් අහ ගෙන තමුන්නාන්සේලා කියන එක හරි කිව්වා නම් තමුන්නාන්සේලාටත් හොඳයි. අපි කියන දේවල් අපි කියන්න ඕනෑ. තමුන්නාන්සේලා මරන ඒවා අපි කියන්න ඕනෑ. කැබිතිගොල්ලෑවේ මරපු එක කියන්න එපා කියල ද අපට කියන්නේ? පාරමී කුලතුංග මරපු එක කියන්න එපා කියලාද තමුන්නාන්සේලා කියන්නේ? තමුන්නාන්සේලා කථා කරන්නේ ත්‍රිකුණාමලයේ මරපු එක ගැනයි, රාජ්‍ය ත්‍රස්තවාදය ගැනයි. ඒකට අපි උඩගෙඩි දුන්නා නම් තමුන්නාන්සේ හරි. එහෙම කියන්න බැහැ නේ පොන්නම්බලම් මන්ත්‍රීතුමනි. අපිත් දකුණේ ජීවත් වන වැසියෝ. අද අපටත් ප්‍රශ්නයක් තිබෙනවා. අද අපට පාරේ යන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. අද අහිංසක දරුවන්ට ඉස්කෝලේ යන්න බැහැ. තමුන්නාන්සේලාට වගේ තමයි. තමුන්නාන්සේලාට මේවා කියන කොට බොහොම අම්හිරියි. තමුන්නාන්සේලාට ඒක හරිම අම්හිරියි සම්පන්දන් මන්ත්‍රීතුමා කථා කළාට තමුන්නාන්සේලා අමතක කරන්න එපා එල්ටීටීඊ සංවිධානය මෙච්චර කුරිරු ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල කර ගෙන යන ගමන් තමුන්නාන්සේලා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගැන කථා කරනවා. පොන්නම්බලම් මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට අමතකද, ඊයේ පෙරේදා දයා මාස්ටර්ගෙන් වූ සිද්ධිය. මෙච්චර දේවල් කරද්දීත් ආණ්ඩුව මානුසික පැත්තෙන් බලනවා. බලන්න, අද " දිවයින " පත්‍රයේ සම්පූර්ණ පිටුවක් ඒ පිළිබඳව තිබෙනවා. තමුන්නාන්සේලා මේවා කියවන්න. තමන්නාන්සේලා කියනවා ආණ්ඩුව සාම මාවතට එළඹෙන්න ලැහැස්ති නැහැයි කියලා. එල්ටීටීඊ සංවිධානය මෙච්චර ම්ලේච්ඡ ලෙස ඝාතන කරද්දීත්. දයා මාස්ටර් අසනීප වෙලයි කියලා අපට දැනුම් දුන් විට මානුසික හේතූන් මත අපි ඔහුව ගෙනැල්ලා ප්‍රතිකාර දුන්නා. මෙහේ එතුමාට ප්‍රතිකාර දෙන කොට අරහේ ඔළුවට දෙනවා. එතුමා මහ අරගෙන යන කොට ඔළුවට වෙඩි තියනවා. එතුමා ගිහිල්ලා මුලතිව්වලින් බහින කොට තමුන්නාන්සේලාගේ මිනිස්සු අපේ අය ඝාතනය කරනවා. තමුන්නාන්සේලාගේ කට්ටියට මානුසික මුහුණුවරක් නැද්ද? තමුන්නාන්සේලා අත් අඩංගුවට අර ගෙන ඉන්න අපේ හමුදා සෙබළුන් නිදහස් කරන්නය කියලා අපි ඉල්ලීම් කරනවා. තමුන්නාන්සේලා ඒ කිසිම දෙයක් ගැන කථා කරන්නේ නැහැ. ඒ නිසා ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලාට අපි

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

වග කීමකින් කියා සිටින්නේ මේ සාම ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න අද රජය බැඳී සිටින බවයි. අද සම්පන්දන් මන්ත්‍රීතුමා කිව්වා "මහින්ද රාජපක්ෂ මැතිතුමා හොඳ වීරයෙක්, මේ ප්‍රශ්නය විසඳයි" කියලා එතුමා විශ්වාස කළාය කියා. අපි වග කීමකින් කියනවා, එතුමා හොඳ වීරයෙක්, ඒ වාගේම එතුමා මේ ප්‍රශ්නය විසඳයි කියලා.

ත්‍රිකුණාමලයට පත් කරපු දිසාපතිවරයා ගැන සම්පන්දන් මන්ත්‍රීතුමා බය වෙලා.අද බලහත්කාරයෙන් ඔක්කොම අය කථා කරනවා ත්‍රිකුණාමලයට පත් කරපු දිසාපතිවරයා පිළිබඳව. මොකක්ද ප්‍රශ්නය ? දිසාපතිවරයා තමන්ගේ කාර්ය භාරය කරනවා.එතුමා කියනවා ත්‍රිකුණාමලයේ රැස්වීමට එතුමාට ආරාධනා කළේ නැහැයි කියලා. මම සම්පන්දන් මන්ත්‍රීතුමාට මේකත් කියනවා. මම දැනට දවස් හතරකට කලින් අපේ රාජ්‍ය උත්සවයකට සම්පන්දන් මන්ත්‍රීතුමාට ආරාධනා කළා. ඊයේ මට එතුමා ලිෆ්ට් එකේ යන ගමන් කියනවා "ඔබතුමාගේ ආරාධනය ලැබුණා. නමුත් මට එන්න බැරි වුණා" කියා. අපි ආරාධනා කරන ඒවාටත් සම්පන්දන් මන්ත්‍රීතුමන්ලා එන්නේ නැහැ. මොකක් හරි අත් වැරැද්දකින් කියන්න බැරි වුණොත් ඒක අල්ලා ගෙන කථා කරනවා. ඒක නොවෙයි සම්පන්දන් මන්ත්‍රීතුමාට තිබුණ ප්‍රශ්නය. ත්‍රිකුණාමලයට පත් කර සිටින දිසාපතිවරයායි. අපට දිසාපතිවරයා හමුදා නිලධාරිවරයෙක් වෙන්න පුළුවන්; වෙනත් යම් නිලධාරියෙක් වෙන්න පුළුවන්. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. ඒ දිසාපතිවරයා තමන්ගේ කාර්ය භාරය, රාජකාරිය හරිහැටි ක්‍රියාත්මක කරනවා නම් ඒක සම්පන්දන් මන්ත්‍රීතුමාට ප්‍රශ්නයක් නොවෙයි. අපි පසු ගිය දවස්වල අනාරක්ෂිත ගම්මානවල සංවර්ධන වැඩසටහන්වලට ගියා. ත්‍රිකුණාමලයේ දිසාපතිවරයා ඉතාම ලස්සනට ඒ වැඩ සටහන මෙහෙයවා තිබුණා. ත්‍රිකුණාමලයේ ඒ දිසාපතිවරයා රාජ්‍ය ක්ෂේත්‍රයේ පළපුරුදු නිලධාරියකුටත් වඩා හොඳින් ඒ කාර්ය භාරය ඉතා හොඳින් කරනවා අපි දැක්කා.ඒ නිසා එක එක් කෙනාට ඕනෑ විධියට නිලධාරීන් පත් කරන්න ආණ්ඩුවට බැහැයි කියන එක අපි පැහැදිලිව කියනවා. ආණ්ඩුවේ වැඩ පිළිවෙළ හරියට ක්‍රියාත්මක කර ගෙන යන පිරිසක් තමයි ආණ්ඩුව පත් කරන්නේ. එක එක් කෙනාට අවශ්‍ය නිලධාරීන් පත් කරන්න ආණ්ඩුවට අවශ්‍යතාවක් නැහැ. ඒ නිසා අපි නැවතත් කියනවා, ත්‍රිකුණාමලයේ දිසාපතිවරයාගේ කාර්යභාරය ඉතාම මැනවින් එතුමා ඉෂ්ට කරනවාය කියලා. ඒ විතරක් නොවෙයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Hon. Minister, Your time is up.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

Sorry?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Your time is up.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
*(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)*
(The Hon. Mahindananda Aluthgamage)

Just give me one more minute, Sir. ඒ වාගේම සම්පන්දන් මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රතිඵල ගැන. එතුමාගේ කථාවේදී කිව්වා, ජනතා විමුක්ති පෙරමුණ ඉතා අඩු ඡන්ද ප්‍රමාණයක්ය ගත්තේ කියලා. එතුමා කිව්වා ඒ ගොල්ලන්ගේ පක්ෂය තමයි, ඒ ප්‍රදේශයෙන් වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත්තේ කියලා. එතුමා කථා කරනවා අද අතුරේ ජනතාවගේ අවංක ඡන්ද ප්‍රතිඵලය ඒකයි කියලා. එතුමා එහෙම අභියෝග කරනවා නම්, අපි අභියෝග කරනවා උතුරේ ජනතාව වෙනුවෙන් සාධාරණ ඡන්දයක් තියලා, උතුරේ ජනතාවට ඡන්දය ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබා දෙන්නය කියලා. එහෙම අවස්ථාවක් ලබා දුන්නොත්, අද ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් මොන තරම් ඡන්ද සංඛ්‍යාවක් ආණ්ඩුව ලබා ගන්නවාද, මොන තරම් ඡන්ද සංඛ්‍යාවක් තමුන්නාන්සේලාගේ පක්ෂය ලබා ගන්නවාද කියලා මැන ගන්න අපට පුළුවන්. සංඛ්‍යා ලේඛන අනුව එතුමා වාසි ටික විතරක් කියනවා.

එතුමා පත්තර ටිකක් අරගෙන ඇමෙරිකාවේ ප්‍රකාශනය කියෙව්වා, ටෝකියෝ ප්‍රකාශනය කියෙව්වා, යුරෝපා සංගමයේ ප්‍රකාශනනය කියෙව්වා, ඉන්දියාවේ රාජ්‍ය ලේකම්ගේ ප්‍රකාශනය කියෙව්වා, ඇමෙරිකාවේ රාජ්‍ය ලේකම්ගේ ප්‍රකාශනය කියෙව්වා. හැම ලේකම්වරයාගේම ප්‍රකාශනවල අන්තිමට ආණ්ඩුව සම්බන්ධයෙන් තිබෙන ඒවා විතරයි එතුමා කියවන්නේ. මේ ජාත්‍යන්තර ප්‍රජාව එල්ටීටීඊ සංවිදානයට බලවත් ලෙස, දැඩි ලෙස කියපු කිසිම දෙයක් ගැන සම්පන්දන් මන්ත්‍රීතුමා අවධානය යොමු කළේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා සියලු දෙනාගෙන්ම අපි ඉල්ලා සිටින්නේ, මේ සාම ක්‍රියාදාමය ගෙන යන්න අපට උදව් කරන්න කියලයි. අපිත් රජයක් හැටියට වග කියනවා. අපිත් කැමති නැහැ, මේ රටේ දකුණේ බෝම්බ පිපිරෙනවාට. ඒ වාගේම උතුරේ ද්‍රවිඩ ජනතාව මැරෙනවාටත් අපි කැමැති නැහැ. අපිත් කැමැතියි මේ ප්‍රශ්නය ඉවර කරන්න. එහෙම නම් ඒක රජයේ පාර්ශ්වයට විතරක් කියන්න එපා. අද - රවිරාජ් මන්ත්‍රීතුමා හිටියේ නැහැ. - අතිගරු ජනාධිපතිතුමාගේ මෙහෙයවීමෙන් මිලියන දහස් ගණනක සංවර්ධන වැඩ උතුරු නැගෙනහිර අපි කර ගෙන යනවා. අපි උතුරේ ජනතාවට වැඩ කරන්නේ නැත්නම්, අපි උතුරේ ජනතාව කොන් කරනවා නම්, උතුරේ දෙමළ ජනතාවට අපි සලකන්නේ නැත්නම්, මේ විධියට මිලියන දහස් ගණනක වියදමින් උතුරේ ජනතාවට විදුලි බලය දෙන්නේ නැහැ, මිලියන දහස් ගණනක වියදමින් උතුරේ පාරවල් හදන්නේ නැහැ, මිලියන දහස් ගණනක වියදමින් උතුරු නැගෙනහිර රෝහල් ඉදි කරන්නේ නැහැ. ඒ සංවර්ධනය දිහා බැලුවාම තමුන්නාන්සේලාට තේරේවි, දකුණට වඩා සංවර්ධනයක් උතුරේ සිදු වන බව. කොළඹ නගරයේ පාරවල්වලට කාපට් දමන්නේ නැති වුණාට යාපනය නතරයේ පාරවල් මිලියන 1,500ක් වියදම් කරලා කාපට් කරන්න කටයුතු කරලා තිබෙනවා. එදා යාපනයේ හිටියේ විදුලිය පාරිභෝගිකයෝ හැටදාහයි. නමුත් අද වන විට යාපනයේ පාරිභෝගිකයෝ අසූදාහකට විදුලි බලය ලබා දීලා සංවර්දනය කරලා තිබෙනවා. එහෙම නම් උතුරේ ජනතාවට අපි වැඩ කරන්නේ නැහැ කියන්නේ කොහොමද? අපේ ආණ්ඩුව වැඩ කරනවා. ඒ නිසා අපි නැවතත් තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ මේ සාම ක්‍රියාදාමය ගෙන යන්න උදවු කරන්න කියලයි. මන්ත්‍රීවරු හැටියට තමුන්නාන්සේලා එල්ටීටීඊ සංවිධානයේ තමිල් සෙල්වන් මහත්මයා හමු වුණාම, ප්‍රභාකරන් හමු වුණාම සාකච්ඡා කරලා ඒ ගොල්ලන්ට කියලා සාම ක්‍රියාදාමයට එල්ටීටීඊ සංවිධානයේ අවංක සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටින්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ. භා. 11. 40]

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි**
*(வண. எல்லாவல மேதானந்த தேரர்)*
(Ven.Ellawala Medhananda Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උතුරු පළාතේ හා නැගෙනහිර පළාතේ පවතින තත්ත්වය පිළිබඳව විවාදයක් කරන මේ අවස්ථාවේ ඊට සහභාගි වීමට ලැබීම පිළිබඳව අපි සතුටට පත් වෙනවා.

මාගේ දීර්ඝ කථාව ටයිප් කර තිබෙනවා. මට මගේ කථාව සම්පූර්නයෙන්ම කරන්නට කාලය නොමැති වුණොත් එම කථාව හැන්සාඩ් ගත කිරීම සඳහා මම ඉදිරිපත් කරනවා.

මේ දෙමළ ගැටලුව 1950 වර්ෂයට පෙර පටන් මේ රටේ පැවතුණාය කියන කාරණය මුලින්ම කථා කළ අප හිතවත් ගරු ආර්. සම්පන්දන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම, එකම රටක් තුළ ඔවුන්ගේ පාලනයක් ගැන එතුමා සඳහන් කළා, තමන්ගේ නිජ බිම තුළ තමන්ට තීරණයන් කිරීමේ අයිතියක් සම්බන්ධයෙන් ද ඒ කථාවේදි කියැවුණා. මේ කථාව තුළ ගැබ් වී තිබුණේ, දෙමළ ජනතාවට බලවත් අසාධාරණයක් සිදු වන බවත්, ඒ බලවත් අසාධාරණය රජය මුල් කර ගෙන සිංහල ජනතාවගෙන් එල්ල වන බවත්, ඒ අසාධාරණය දිගින් දිගටම පවතින බවත්.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ගීතාන්ජන ගුණවර්ධන මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் (மாண்புமிகு கீதாஞ்சன குணவர்தன) அக்கிராசனத்தமர்ந்தார்கள்.*

*Whereuon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair and* MR. DEPUTY SPEAKER [THE HON. GITANJANA GUNAWARDENA] *took the Chair.*

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි**

*(வண. எல்லாவல மேதானந்த தேரர்)*

(Ven.Ellawala Medhananda Thero)

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ දෙමළ නිජ බිම තුළ ඔවුන්ගේ පාලන තන්ත්‍රය කර ගෙන යාමට අවශ්‍යතාවක් තිබෙන බවක් තමයි, ඒ මුළු කථාවෙන්ම ඉදිරිපත් වන සාරාංශය හැටියට අප දකින්නේ. මේ දෙමළ නිජ බිම කියන එක ලංකාවේ කොහේද තිබුණේ කියන එක ගැන සාකච්ඡාවක් තිබිය යුතුය කියා මා මීට පෙරත් සඳහන් කළා. කොළඹ පාලනය අප කෙරෙහි දක්වන ආකල්පය වෙනස් විය යුතුයි ජාතීන් දෙකක්ය යන සංකල්පය ගෙන ආ යුතු අතර, එය වෙනම රටවල් දෙකක් විය යුතුයයි තමිල් සෙල්වන් ප්‍රකාශ කරනවා. එතකොට දැන් මෙතැන තමිල් සෙල්වන්ගේ අදහස කියන්නේ, එල්ටීටීඊ නායක වේළුපිල්ලේ පිරභාහරන්ගේ අදහසයි. එහෙම නම්, එල්ටීටීඊ සංවිධානය සඳහන් කරන්නේ තීරණය කරන්නේ ජමේ රට දෙකඩ කර වෙනම රාජ්‍යයක් වශයෙන් පාලනය කළ යුතු බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එකම රටක් තුළ ඔවුන්ගේ පාලනයක් ගැන සිතනවාය කියන කථාවේ කිසිම අර්ථයක් නැහැ. එකම රටක් තුළ පාලන තන්ත්‍ර දෙකක් තිබෙන්න බැහැ. දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද කිසිදු විධියකින් ආවරණය නොකළ යුතු අතර, මේ රට බෙදන්නේ නැතුව මේ රටේ සාධාරණ පාලන තන්ත්‍රයක් ඇති විය යුතුය කියන එකයි අප පැහැදිලිවම සඳහන් කරන්නේ. ඇත්ත වශයෙන් මේ රට දෙකඩ කිරීමට විරුද්ධව ප්‍රකාශනයක් අත්සන් කර මේ පාර්ලිමේන්තුවට පැමිණෙන මන්ත්‍රීවරයෙකුට දෙමළ නිජ බිමක් පිළිබඳව එන කථාව ඉදිරිපත් කරන්න බැහැය කියන එකයි මගේ අදහස වන්නේ.

ඒවාගේ ම, ජිනීවා පොරොන්දුවක් පිළිබඳව එතුමා සඳහන් කළා, විරුද්ධ ආයුධ ගත්ත කණ්ඩායම් නිරායුධ කිරීම පිළිබඳව රජය පොරොන්දු වෙනවා කියා. අප මේ කාරණය සම්බන්ධව මීට පෙර අවස්ථා ගණනාවකදී සඳහන් කළා. ද්‍රවිඩ සන්නද්ධ කල්ලියෙන් බිඳී ගිය කරුණාගේ කල්ලිය පිළිබඳවයි මේ කථාව ඉදිරිපත් වන්නේ. මෙබඳු කල්ලියක් නිරායුධ කිරීමේ අයිතිය කිසිසේත් රජය භාරගත යුතු කරුණක් නොවන බව අප ඒ අවස්ථාවේදී පැහැදිලි කරලා තිබෙනවා. දහස් ගණන් දෙමළ ජනතාව අවතැන් වූ බවත්, සරණාගතයන් වශයෙන් සිටින බවත්, දෙමළ ජනතාව විශාල වහයෙන් ඝාතනය කරලා තිබෙන බවත් ප්‍රකාශයට පත් වුණා. නමුත්, මේ කාරණය තුළ සිංහල ජනතාවට සහ මුස්ලිම් ජනතාවට සිදු වී ඇති අසාධාරණය සහ ඝාතනයට ලක්ව සිටින පිරිස පිළිබඳව එතුමා වචනයක්වත් කථා කළේ නැහැ. කොටි සංවිධානය විසින් සිංහල ජනතාවත්, මුස්ලිම් ජනතාවත් දහස් ගණනක් ඝාතනය කරපු මූලික ලැයිස්තු ගණනාවක් මා ළඟ තිබෙනවා. මා එය **හැන්සාඩ් ගත*** කිරීම සඳහා මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරනවා.

යම් කිසි අයිතිවාසිකමක් හෝ යම් කිසි වරප්‍රසාදයක් ද්‍රවිඩ ජාතික හිතවතුන්ට අපේ සහෝදර දෙමළ ජනතාවට තිබෙනවා නම් මේ විධියට බෝම්බ අටවලා, කුඩා ළමයින්ගේ පටන් මේ රටේ ජනතාව ඝාතනය කරලා ඒ අයිතිවාසිකම සහ ඒ වරප්‍රසාදය මේ අයට ලබා ගන්න පුළුවන්ද කියන එකයි මා අහන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොළොන්නරුව රාජධානිය කාලයේ ලංකාව ආක්‍රමණය කරපු කාලිංග මාඝ පලවා හැරියාට පස්සේ ඔහු ගෙනාපු කේරළ සේනාව විශාල වශයෙන් උඅතුරට තල්ලු වෙලා ගියා. ඉන්දියාවේ කුලසේකර රජු යටතේ ආර්ය චක්‍රවර්ති නමැති ඔහුගේ සෙන්පතියා විසින් 13 වන ශත වර්ෂයේ - දඹදෙණිය රාජධානිය කාලයේදී - ලංකාව ආක්‍රමණය කළා. මේ අය ගෙනාපු සේනාව උඋතුරට සංක්‍රමණය වීම නිසා උතුරු ප්‍රදේශයේ දෙමළ ජනතාව බහුතරයක් බවට පරිවර්තනය වූ අතර, රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීම නිසා උතුරු පළාත බොහෝ සෙයින් ජනාවාසවලින් තොර වුණා. නමුත්, යාපනය ඇතුළු ප්‍රදේශවල දහස් ගණනක් ද්‍රවිඩ ජනතාව වාගේ ම, දහස් ගනනක් සිංහල ජනතාවත් ජීවත් වුණා. කෝට්ටේ රාජධානි කාලයේ හය වන සිරි පැරකුම්බා රජතුමාගේ කාලයේදී කෝට්ටේ ගිය හමුදාව මේ ප්‍රදේශය පාලනය කරපු ආර්ය චක්‍රවර්ති නමැති ආක්‍රමණිකයා පරාජයට පත් කළා. "කනකසූරිය සිංගෙයිආර්යාන්" නමින් යාල්පාන වයිපවමාලෙයිහි සඳහන් කරන මෙම පුද්ගලයා පරාජයට පත් කරලා යාපනය ප්‍රදේශය සිංහල, දෙමළ ජනතාවට යහපත් ලෙස වාසය කරන්න පුළුවන් ස්ථානයක් බවට පත් කළා. ඔබතුමන්ලා කියවන්න, මක්කර් කියන ලන්දේසි ආණ්ඩුකාරවරයාගේ කාලයේ දී මයිල්වාහන පුලවර් නමැති ලේඛකයා විසින් ලියන ලද සාවද්‍ය ඉතිහාස කථාවක් තමයි 'යාල්පාන වයිපවමාලෙයි' කියන්නේ. ඒක පිළිබඳව කරුණු කියනවා නම්, ඒ ග්‍රන්ථයේ තිබෙන හුඟක් වැරදි පැහැදිලි කර දෙමළ ජනතාවගේ තත්ත්වය පැහැදිලි කරලා දෙන්න පුළුවන් සාධක අප ළඟ ඕනෑ තරම් තිබෙනවා. මේ ග්‍රන්ථයෙන් කියන පරිදි, සංකිළි නමැති චක්‍රවර්ති පරම්පරාවේ පුද්ගලයා ද්‍රවිඩ ජනතාව මොන තරම් මරලා තිබෙනවාද, කතෝලික ආගම වැළඳ ගැනීම පිළිබඳව? ඒ වාගේ තමයි යාපනයේ සිංහල ජනතාවටත්, දෙමළ ජනතාවටත් සහෝදරත්වයෙන් ජීවත් වන්නට පුළුවන් පරිසරයක් මවලා දුන්නේ සපුමල් කුමාරයායි. ඒ තියා තමුන්නාන්සේලාගේ නල්ලූර් කෝවිල හදලා දීලා තිබෙන්නේත් කෝට්ටේ හය වෙනි බුවනෙකබාහු නමින් රජකමට පත් වුණු සපුමල් කුමාරයායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පසුගිය දිනක, ඒ කියන්නේ සටන් විරාම ගිවිසුම ඇති වෙන්න මාස දෙකකට කලින් යාපනයේ ගියා. ඒ යාපනයේ ගිය අවස්ථාවේදී මම නාගදීපයට ගියා. නාගදීපයේ නාගපූසනි අම්මන් කෝවිලට ගියා. ඒ කෝවිලේ හිටිය පූසාරිවරු අපිව ඉතාමත්ම සහෝදරත්වයෙන් පිළිගෙන, කෝවිලේ හැම තැනම එක්කර ගෙන ගිහින්, අපිට ඒ කෝවිලේ දර්ශන නරඹන්න අවස්ථාව සලසා දුන්නා. ඒ පූජාවකටත් අපි සහභාගි වුණා. අපි ගියා, කන්දරෝඩේ. අපි ගියා මාවිට්ටපුරම් කෝවිල බලන්න. අපි ගියා, නල්ලූර් කෝවිල බලන්න. සාමාන්‍ය ජනතාව අපව ඉතාම සාදරයෙන් පිළිගත්තා. අපි යාපනය නගරයේ ඇවිද්දා. කඩ දමා ගෙන ඉන්න දෙමළ ජනතාව අපව සාදරයෙන් පිළිගත්තා. ඒ මේ සටන් විරාම ගිවිසුම ඇති වන්නට ඉස්සෙල්ලායි. ත්‍රාඩයින් විසින් ගිනි තබන ලද යාපනයේ පුස්තකාලය ඉදිරිපිට පාරේ අපි ගමන් කරන කොට පුංචි ද්‍රවිඩ ළමයින් දෙන්නෙක් ආවා. මම දෙමළ දන්නේ නැහැ. මම දන්න දෙමළෙන් ඒ ළමයින් දෙන්නාට කථා කළා. "පොඩියන් වාංග" කියලා. මේ දරුවෝ දෙන්නා දුවගෙන ඇවිත් මාව බදා ගත්තා. මා ළඟ තිබුණු ටොෆී කීපයක් මම ඒ දරුවන්ට දුන්නා. යාපනයේ දෙමළ ජනතාව සමඟ අපි කථා කළා. අපිට පැහැදිලිව පෙනුණා, යාපනයේ දෙමළ ජනතාව ඉතාම පීඩිත තත්ත්වයකින් ඉන්නේ රජයේ හමුදාව නිසා නොවෙයි, එල්ටීටීඊ සංවිධානය කරන බරපතල අපරාධ නිසා බව. ඒ නිසා සාමාන්‍ය දෙමළ ජනතාවගේ අදහස එල්ටීටීඊ සංවිධානය ගැන නොවෙයි. ඔවුන් යටපත් වෙලා ඉන්නේ, බියපත් වෙලා ඉන්නේ, ඇත්ත කථා කරන්න බය වෙලා ඉන්නේ සම්පූර්ණයෙන්ම පිරබාහරන්ගේ තුවක්කුවේ බලයටයි කියන එක පැහැදිලි කරන්න ඕනෑ. යාපනයේ තොරතුරු නිරන්තරයෙන් අපිට කියනවා. යාපනයේ හමුදාව විසින් ජනතාව ආරක්ෂා කරන ආකාරය ගැන කියනවා. මේක සම්පූර්ණයෙන්ම අනෙක් පැත්ත හරවලා චෝදනා මුඛයෙන් කථා කරන්නේ, සිංහල ජනතාවත් හමුදාවත් උතුරු නැඟෙනහිර ජනතාවට මේ විධියේ බරපතල අපරාධ කරන හැටියට බොරුවට චෝදනා කරන්නේ පිරබාහරන්ගේ සංවිධානයෙන් බිහි වෙලා ඉන්න පුද්ගලයින් විසින් බව මේ අවස්ථාවේදී අපි පැහැදිලිවම කථා කරන්නට ඕනෑ. මේ ස්ථානයේ වුණත් ඒ කථා කරන්නේ, ඇත්ත වශයෙන්ම කෙළින්ම කියනවා නම් ඒ තමන්ගේ අදහස නොවෙයි. වේළුපිල්ලේ පිරබාහරන්ගේ තුවක්කුවේ කට තමයි මේ අවථාවේදී කථා කරන්නේ කියන එක මම පැහැදිලි කර දෙන්නට කැමැතියි.

උතුරු නැඟෙනහිර පළාත්වල නිජබිම උරුමයන් තිබෙනවායි කියන බොරු ප්‍රෝඩාව මත සිංහල ජනතාව පමණක් නොවෙයි, මොන තරම් ද්‍රවිඩ ජනතාව ඝාතනය කර තිබෙනවාද කියන එක ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ඉදිරිපත් කරන්නට පුළුවන්. කන්කසන්තුරේ, මන්නාරම, යාපනය, වෙල්වැටිතුරෙයි, අන්නකෝට්ටේ, කිලිනොච්චිය ආදී ප්‍රදේශවල වගේම පේදුරුතුඩුව, ඒ වාගේම චාවකච්චේරි, වව්නියාව ආදී මේ මේ ප්‍රදේශවල ඝාතනය කර තිබෙන අය මට කියන්න පුළුවන්. 1976.07.06 වෙනි දින ඇල්ප්‍රඩ්

---

** පුස්තකාලයේ තබා ඇත.*

*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

*Placed in the Library .*

[පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි]

දුරෙයිඅප්පා මහතා ඝාතනය කිරීමේ සිට ආර්. බාලසුබ්‍රමනියම් මහතා, ඒ. ත්‍යාගරාජා මහතා, වී. තම්බිපිල්ලේ මහතා, කේ. ටී. පුලේන්ද්‍රන් මහතා, ඇස්. ජේ. මුත්තයියා මහතා, කේ. වී. රත්නසිංහම් මහතා, වී. රාජරත්නම් මහතා, තිලකාර් මහතා, සින්නතම්බි මහතා, නඩරාජා මහතා, ඉමැනුවෙල් මහතා, තංගරාජා මහතා, ක්‍රිෂ්ණගෝපාල් මහතා, පූපාලසිංහම් මහතා, සිවරාජා මහතා, ස්වර්නරාජා මහතා මේ විධියට සිය ගනනකගේ නම් මාගේ මේ ලැයිස්තුවේ තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය මදිංගු වන නිසා මම කියන්නේ නැහැ. පොන්නයියා රාජකුමාර්, පී. වේලායුදන්, බාලකුමාර්, ඇස්. මහාලිංගම්, ඇස්. ප්‍රභාකරන්, කුලසේකරන් දේවස්කරන් මේ කවුද? සිංහල මිනිස්සුද? [බාධා කිරීමක්] දෙමළ ජනතාව පිරබාහරන් විසින් ඝාතනය කළ මිනිස්සු. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)

ස්වාමීන් වහන්සේගේ කථාවට බාධා කරන්නේ නැතුව-[බාධා කිරීමක්]

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද ස්ථවිර**
*(வண. எல்லாவல மேதானந்த தேரர்)*
(Ven.Ellawala Medhananda Thero)

අරුගම්පලම් මහතා නල්ලූර් මන්ත්‍රී කනගරත්නම් මහතා, කෝපායි මන්ත්‍රී අලලාසුන්දරම් මහතා [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

ගරු මනෝ ගනේෂන් මන්ත්‍රීතුමා, ගරු ස්වාමීන් වහන්සේගේ කථාව කරගෙන යන්න ඉඩ දෙන්න. ඔබතුමාගේ අවස්ථාව ආවාම කථා කරන්න.

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි**
*(வண. எல்லாவல மேதானந்த தேரர்)*
(Ven.Ellawala Medhananda Thero)

මේ ජනතාව ඝාතනය කර තිබෙන්නේ කවුද? සම්පූර්ණයෙන්ම මේ ජනතාව ඝාතනය කර තිබෙන්නේ එල්ටීටීඊ සංවිධානය විසින්, ඊළඟට මේ විධියට ඝාතනය කරන ලද සිංහල, මුස්ලිම්, දෙමළ ජනතාව පිළිබඳව අපට දිගටම ලැයිස්තුවක් කියන්නට පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා**
*(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)*
(The Hon. M. K. Shivajilingam)

කරුණාකරලා ස්වාමීන් වහන්සේ, 1983 ජුලි කලබලවලදී දෙමළ මිනිසුන් කොච්චර ඝාතනය වුණාද කියලා -[බාධා කිරීම්]

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි**
*(வண. எல்லாவல மேதானந்த தேரர்)*
(Ven.Ellawala Medhananda Thero)

ඔය ගොල්ලන්ගේ කථාවලට අපි බාධා කළේ නැහැ. [බාධා කිරීම්] කරුණාකර වාඩි වෙන්න. අහගෙන ඉන්න බැරි නම් තමුන්නාන්සේ කථා කරන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

ගරුතර ස්වාමීන් වහන්සේගේ කථාවට බාධා කරන්න එපා. සිවාජිලිංගම් මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. [බාධා කිරීම්] Hon. Shivajilingam, will you take your seat, please? - [*Interruption*]

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි**
*(வண. எல்லாவல மேதானந்த தேரர்)*
(Ven.Ellawala Medhananda Thero)

අපටත් කථා කරන්න බැරිද? අපට අයිතියක් තිබෙනවා. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

Hon. Shivajilingam - [*Interruption*]

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)

මේක ඊළම කරගෙන ඉන්නද හදන්නේ?

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි**
*(வண. எல்லாவல மேதானந்த தேரர்)*
(Ven.Ellawala Medhananda Thero)

ඊළඟට මම කියන්න කැමැතියි, [බාධා කිරීම්] විදේශ ඇමති ලක්ෂ්මන් කදිර්ගාමර් මහතා මැරුවා. හමුදාපති සරත් පොන්සේකා මහතා ඝාතනය කරන්න හැදුවා. ඔහුගේ ආරක්ෂකයන් මැරුවා. තෙ වැනි හමුදා නායක පාරමී කුලතුංග මහතා මැරුවා. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

Hon. Shivajilingam - no Member has the right to threaten any Member who is on his feet - [*Interruption*] Will you take your seat? - [*Interruption*]

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි**
*(வண. எல்லாவல மேதானந்த தேரர்)*
(Ven.Ellawala Medhananda Thero)

යාපනයේ දහස් ගණනක් සිංහලයන් එලෙව්වා. මේ ලෙස සිංහල, දෙමළ, මුස්ලිම් සාමාන්‍ය ජනතාවට සිදු වූ විනාශය කොතෙක්ද? හමුදා අතින් මෙබඳු ජනතා ඝාතනයක් සිදු වෙලා තිබෙනවාද? කොටි විසින්ම සාමාන්‍ය ජනයා ඝාතනය කර හමුදා පිට පටවන්නේ නැද්ද? කොටින්ට සිදු වන හානිය පමණක්ද හානි? අනෙක්වා හානි නොවේද? අනෙක් අතට මේ සියලු ඝාතනවලට මුල පිරබාහරන් ආයුධ අතට ගැනීම නොවේද? දේශපාලන ත්‍රාඩයන් සුළු පිරිසක් නිසා කළු ජූලියක් තිබුණු බව හැබැව. එහෙත් එය ආයුධ අතට ගෙන ප්‍රජාතන්ත්‍රවාදී ජනතාව ඝාතනයට හේතුවක් ද කියා අපි ප්‍රශ්න කරන්නට කැමැතියි. තමුන්නාන්සේලාට මේවා කියන කොට රුදාව හැදෙනවා. අපේ සිංහල මිනිසුන් ඝාතනය කරලා, ගම්මාන පිටින් විනාශ කළ හැටි මම කියන්නම්. මා ළඟ ඒ ලැයිස්තුව තිබෙනවා. ශාස්ත්‍රවෙල ගමට පහර දුන්නා, පොතුවිල් ගමට පහර දුන්නා, ඒත්තම ගමට පහර දුන්නා, නාමළුව ගමට පහර දුන්නා, හුලංනුගේ විදුහලට පහර දුන්නා, විනාශ වුණා. බක්මීටියාව ගමට පහර දුන්නා, අක්කරපත්තුව සිංහලයන් පැන්නුවා, ගෝනගලට පහර දීලා හතළිස් නව දෙනෙක් මැරුවා. කීනවත්ත ගමට පහර දුන්නා, බක්කිඇල්ල ගමට පහර දුන්නා, මංගලඔය ගමට පහර දුන්නා, පීල්ලුමලේ ගමට පහර දුන්නා, ත්‍රිකෝණමඩුව ගමට පහර දුන්නා, කොම්බනාච්චි ගමට පහර දුන්නා, නාමල්තලා ගමට පහර දුන්නා. මෙතුමා සේරුවිල ගැන කිව්වා, ඉච්චලම්පත්ත ගැන කිව්වා. ඉච්චලම්පත්ත යන්නේ පැරණි සිංහල ගමක්. වෙරුගල් කියන්නේ වෙහෙරගල කියන පැරණි ගමක්. ඒ ප්‍රදේශවල සිටි සිංහල ජනතාව පිළිබඳව ඉච්චලම්පත්තේ තිබෙන සෙල් ලිපිවල කියනවා. සේරුවිල ගමට පහර දුන්නා, ලංකාපටුන විනාශ කළා. දම්මින්න ගමට පහර දුන්නා, ඕමන්ත ගමට පහර දුන්නා, දෙහිවත්ත ගමට පහර දුන්නා, සෝමනුවර ගමට පහර දුන්නා, තිරුමංගලා ගමට පහර දුන්නා. මුතූර් ගමට පහර දුන්නා, සම්පත්නුවර ගමට පහර දුන්නා, කෙන්ට්ෆාම් ගමට පහර දුන්නා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

ගරුතර ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේගේ කාලය අවසන් වේලනයි එන්නේ.

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි**
*(வண. எல்லாவல மேதானந்த தேரர்)*
(Ven.Ellawala Medhananda Thero)

තව විනාඩියයි ගන්නේ. කිරිඉබ්බන්වැව ගමට පහර දුන්නා. කිරිඉබ්බන්වැව තිබෙන කුමහකර්ණමලේ කන්ද මුදුණේ තිබුණු චෛත්‍යයේ තමයි කොටි බංකරයක් හදා ගෙන සිටියේ. ඒකත් තමුන්නාන්සේලාට මම කියන්න ඕනෑ. එරාමඩු ගමට පහර දුන්නා. කෝකිලායි ගමට පහර දුන්නා. මේ අන්දමට සියලු ඝාතනයන් සිදු කරද්දීත්, අපේ රජය දයා මාස්ටර් මිනීමරුවා යානාවලින් කොළඹට ගෙන්නලා ඔහුට ප්‍රතිකාර කළා. ඔහුට ආරක්ෂාව දුනනේ කවුද? අපේ හමුදාව. අපේ පොලීසියේ ආරක්ෂාව ලබා දුන්නා. උදාර අදහසක් වශයෙන් මානුෂිකත්වය මත රජය කළ ඒ කාර්යය අපි අගය කරනවා.

**ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා**
*(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)*
(The Hon. M. K. Shivajilingm)

ඒක තමයි අපි කිව්වේ ඔය ගොල්ලොත් සහයෝගය දුන්නා. -[බාධා කිරීමක්]

**පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි**
*(வண. எல்லாவல மேதானந்த தேரர்)*
(Ven.Ellawala Medhananda Thero)

නමුත් ඕමත්තෙන් දයා මාස්ටර් පිටවන විටම මුහමාලේදී කොටි හමුදා හටයින් ඝාතනය කළා. දයා මාස්ටර් වාහනයට නැගලා ඕමත්තෙන් පිට වන කොටම මුහමාලේ දි හමුදා හටයින්ට වෙඩි තබා ඝාතනය කළා. ඒ එක්කම මඩකලපුවේදී හමුදාවේ දොළොස් දෙනෙක් ඝාතනය කළා. කොටින්ගේ නායකයන්ට මේ ආරක්ෂාව දෙන්නේ ඔවුන්ගේ අතින්ම ඝාතනයට ලක් වන පොලීසියම, හමුදාවම නොවේද? ඔවුන්ට ආයුධ තබා ගෙනම මේ පාපතරයා ආරක්ෂා කරන්න රැකවල් දීමට නියම වීමෙන් ඒ පොලීසියේ සහ හමුදාවේ ආත්ම ගෞරවයට සරදමක් කළා නොවේද කියලත් අපි ප්‍රශ්න කරන්න කැමැතියි.

මගේ කථාවේ කොටස් වශයෙනුයි මම ඉදිරිපත් කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් වැඩියෙන් දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ සම්පූර්ණ කථාව හැන්සාඩ් ගත කරන්නය කියා මෙය **සභාගත*** කරමින් ඔබතුමාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

ගරු තිස්ස විතාරණ අමාත්‍යතුමා.

[පූ. භා. 11.58]

**ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
*(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான, தொழில்நுட்பவியல் அமைச்சர்)*
(The Hon. (Prof.) Tissa Vitharana - Minister of Science and Technology)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතියි. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා ඉංග්‍රීසි භාෂාවෙන් තමන්ගේ යෝජනාව ඉදිරිපත් කළ නිසා ඉංග්‍රීසි භාෂාවෙන් මගේ කථාව කරන්න මා අදහස් කරනවා. Hon. Sampanthan made a case emphasising the plight of the Tamil people in the North due to the recent development of events and I fully sympathize with him on that ground. Not only the Tamil people but also the Muslim and the Sinhala people are suffering in the North and the East and we have to do everything possible to try to ameliorate this situation and create a suitable environment and work towards a process of dialogue and peaceful settlement to this problem.

I would like ato state that His Excellency the President and the government are comitted to achieving this objective and we, regret very much the unfortunate developments that have taken place in the North and the East and we wouldlike normalcy to be restored there as soon as possible. My colleague, Hon. Mahindananda Aluthgamage, gave in his speech a list of the various services, activities and the development projects that are being carried out by the government in the North and the East. I would just like to add one more to that from my own Ministry of Science and Technology. We are in the process of seetting up 'Vidatha' centres which will provide free computer facilities to the people in every Divisional Secretariat. I am happy to say that we have set up 'Vidatha' centres in Kopay in the Jaffna District and also in Aalaiadiwembu and in the Tamil division of Kalmunai and we are going ahead with this programme where there will be direct development benefits for the Tamil people. The Government in providing infrastructure facilities for road development, and electricity has taken all possible action even in the last few months despite the strained situation. Ii is trying to serve the Tamil people, and it will continue to do so in the period ahead despite any problems.

I am also glad that Hon. Sampanthan in his speech stated very clearly that he was not trying to defend the LTTE. I am glad that he spoke on behalf of the Tamil people voicing their grievances, their hardships and that is an extremely good development form the point of view of trying to work out a settlement to athis problem, because, I think, the course of action of the LTTE has clearly hampered working towards a peaceful settlement to this problem. It has aggravated the problems of the Tamil people as well as the Muslim and the Sinhala people in the North and the East and therefore we need to draw attention to those problems and not to justify what the LTTE is doing. Sir, let me state here, on the basis of a report prepared by the Police Department for the period since the beginning of this year, the number of police offcers and the service personnel injured and killed; total deaths is 172, total injured is 234. So in all 406 service personnel have been either killed or seriously injured by the actions of the LTTE. There have been 59 incidents of claymore mine attacks. That is, seven in Jaffna division, 20 in Vauniya, 12 in Trincomalee, Five in Kantalai, 14 in Batticaloa and one in Ampara. These have been directed mainly against service personnel but not only against service personnel.

Now in addition there have been 94 hand grenade attacks and 279 shooting incidents during this period. A majority of them have been directed against the Army and the Police personnel. Then there have been five attacks on border villages in the Kantalai division in which 11 civilians were killed and 16 were injured.

Then there have been abductions of youth over this period. In the Jaffna division eight in Vavuniya division, one Trincomalee division two, Batticaloa division 31 and out of

---

* පුස්තකාලයේ තබා ඇත.
*நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*Placed in the Library .*

the 57 youths abducted 23 have now been released. In the Ampara division four have been abducfed and two have been released. Abduction of children in the Jaffna division two, in the Trincomalee division one and in the Batticaloa division 17. Out of the 27 children abducted 12 have been released.

We are also concerned about the problem of refugees. According to this police report there have been 1800 refugees who have left for India. This is not a situation that we are happy about and we hope that this trend will stop and the need for that type of refugee movement will also stop in the period ahead.

So the point that emerges from all this is the misery and the problems facing the Tamil people are largely the result of the LTTE activity and this has to be recognized by everybody if we are trying to work towards a solution. The unfortunate reality is that there is collection of ransom from traders and farmers. The public are frightened to make complaints due to death threats. As mentioned, young persons and children are abducted by the LTTE for training. There have been innocent civilians killed and injured by LTTE actions and their illegal taxation of traders in the LTTE areas, in uncleard areas, as well as in cleared areas increases tha cost that the people have to pay for their requirements.

So the role of the LTTE during this whole process has been to try to provoke a war situation and this war situation they attributed to the failings of the Government but fortunately over this period the world has recognized, and I think the Tamil people have recognized, that it is not due to the failings of the Government but of the LTTE.

I would like to mention that there is also the other factor that we have to keep in mind. There is a third force operating in this country. These are the people who profit from the war, who would like a war situation. It is not only those who profit by armament sales but who profit in various other ways, through trading, profiteering during a situation of war and these people are joining with racist elements to provoke a situation in which there will be confrontation and conflicts. So these are the factors leading to an aggravation of tension to the misery of the people in the North and the East.

We have to change this situation and I think the course of action that His Excellency the President has been taking clearly bears this out. We know that despite the various provocations directed against police personnel, when "Daya Master'' was seriously ill, the President gave the necessary help to enable him to get the best medical attention in Colombo. This has been strongly criticized by various racist elements but I am glad that the President has acted here in the interest of looking after those who are sick, whether they are on our side or on another side and this is the type of policy that the President is committed to. He has been actively trying to get a consensus among the political parties. The major problem-

**පූජ්‍ය අතුරලියේ රතන හිමි**
*(வண. அத்துரலியே ரதன தேரர்)*
(Ven. Athuraliye Rathana Thero)

දයා මාස්ටර් අසනීප වී රෝහලට ගෙනා බව කියනවා නේ. වෛද්‍ය වාර්තා අනුව ඔහුට ලෙඩක් නැති බව දැන ගන්නට ලැබී තිබෙනවා. අනෙක් එක ජාතිවාදී ප්‍රවණතා කියා ඔබතුමා කියනවා. අඩු ගණනේ, කොටි සංවිධානයේ අත් අඩංගුවේ සිටින රෝගාතුර වුණු හමුදා භටයන්ට බෙහෙත් කිරීමටවත් ආණ්ඩුව ඉල්ලීමක් කළා ද? රජයේ මානුෂික සහනය ඔවුන්ට ලැබුණා ද? කොටි සංවිධානයේ අත් අඩංගුවේ සිටින හමුදා නිලධාරීන් අද අසනීප වී සිටිනවා. ඔවුන්ගේ මානුෂික ප්‍රශ්න ගැන ඔබතුමන්ලා කතා කළේ නැද්ද?

**ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා**
*(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)*
(The Hon. (Prof.) Tissa Vitharana )

මම ස්වාමීන් වහන්සේට කියන්න කැමැතියි, අර පොලිස් පිරිස අත් අඩංගුවට ගත් අවස්ථාවේදී ඒ අය නිදහස් කරවා ගැනීම සඳහා "සෙඩෙක්'' ආයතනය හරහා පෞද්ගලිකවම මා සම්බන්ධ වී කතා කළා බව. ඒ අවස්ථාවේදී දයා මාස්ටර් ටෙලිෆෝන් කර, ඒ අය නිදහස් කර ගැනීම සඳහාත් මා කටයුතු කළා. මෙය මා පෞද්ගලිකව දන්නා දෙයක් නිසයි කියන්නේ. එල්ටීටීඊය අත් අඩංගුවට ගත් පිරිස් නිදහස් කර ගැනීම සඳහා රජය හැම පැත්තෙන්ම උපරිම ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා.

**පූජ්‍ය අතුරලියේ රතන හිමි**
*(வண. அத்துரலியே ரதன தேரர்)*
(Ven. Athuraliye Rathana Thero)

ඔබතුමා ජාතිවාදී ප්‍රවණතා ගැන කතා කරනවා. ජාතිවාදී ප්‍රවණතා නොවෙයි, අපි අහන ප්‍රශ්නය සාධාරණ ප්‍රශ්නයක්. හමුදාවේ, පොලිසියේ නිලධාරීන් ඔවුන්ගේ දෙමාපියන් හරහා රජයට දැනුම් දී තිබෙනවා, තමන් අසනීපයෙන් සිටින බව, තමන්ට හෘදය සැත්කම් කළ යුතුව තිබෙන බව. අපේ ප්‍රශ්නය මේකයි. දයා මාස්ටර් මෙහාට ගෙන්වන විට අඩු ගණනේ ආණ්ඩුවට ගනුදෙනුවක් කර ගන්න තිබුණා, එක් කෙනකුට බෙහෙත් කරන විට තව එක් කෙනක් නිදහස් කර ගන්නට. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය.

**ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා**
*(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)*
(The Hon. (Prof.) Tissa Vitharana)

I will continue with my speech, Sir. In this situation we have tried to behave in a way to defuse the situation and not to aggravate tensions. We will try as the Government, to look after the interests of Sri Lanka and we have to act in a way rather than increasing racial tensions, to defuse the situation so that a suitable environment for a negotiated settlement can be created. That is the policy that the Government is following.

With regard to the All Party Conference, tomorrow there is a meeting of the representatives of the political parties. I am glad that the United National Party has agreed - *[Interruption.]*

**ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා**
*(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)*
(The Hon. M. K. Shivajilingam)

TNA is also a political party - *[Interruption.]*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

Hon. Shivajilingam, will you take your seat? You cannot interrupt from any other seat, please. This is the third time you have interrupted. *[Interruption.]*

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ. ஜீ. பொன்னம்பலம்)
(The Hon. G. G. Ponnambalam)

Do you say that to the other Members, Mr. Deputy Speaker?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Not a single Member disturbed the Hon. Sampanthan. For eighty two minutes he was on his feet.

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ. ஜீ. பொன்னம்பலம்)
(The Hon. G. G. Ponnambalam)

I am not talking of today but your conduct over the years.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Speak for yourself, Hon. Ponnambalam. - *[Interruption.]*

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ. ஜீ. பொன்னம்பலம்)
(The Hon. G. G. Ponnambalam)

I am speaking. – [*Interruption.*]

ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා
(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)
(The Hon. M. K. Shivajilingam)

TNA is also a political party. [*Interruption.*]

ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitharana)

Will you come to the meeting? - [*Interruption.*] I made that request. [*Interruption.*] At the last All Party Conference itself I said that the TNA should be represented there and even some of the political parties representing the Tamil people who are not represented in Parliament should be invited including Mr. Anandasangari, the President of the TULF. So we are –

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

I beg your pardon. He calls himself the president of the TULF, but he si not the president of the TULF.

ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitharana)

Okay. These are subjudice matters. Let us try to get the maximum representation of the political forces in this country to work out a solution to our problem and that is the approach that His Excellency the President is taking and I must here commend the United National Party for agreeing to send a representative for tomorrow's meeting. Hopefully, we can engage in a dialogue where we can work out solution that will be acceptable if not to all the people of Sri Lanka, at least to the large majority of people who are not extremists. In that way, I think we have to work towards a solution and I am again requesting you, the TNA, please participate in this meeting. I will see that an invitation, a written invitation is sent to you. I request you because we have to work out a solution that meets with the aspirations of the Tamil speaking people. We would like you also to contribute to that.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

May I have one minute with your permission, Hon. Member. Why should you try so hard to have an invitation sent to us? We have 22 Members in Parliament. Of the 33 Members elected from the North-East 22 of us are here. Why should you be trying so hard Hon. Member to have an invitation sent to us?

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

Because, we need you.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

Why should you be trying so hard?

ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண
(The Hon. (Prof.) Tissa Vitharana)

Why? Because, we want you to come and contribute to the dialogue.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

Is it only you who needs us?

ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitharana

No. Not only–

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

I am not saying that we will come. I am just asking you.

ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitharana)

It is not only we who need you. I think it is as part of the process of dialogue that you should be represented there.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

We have had dialogues for 20 years.

**ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා**
*(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)*
(The Hon. (Prof.) Tissa Vitharana)

It does not matter. So, we have to continue the dialogue.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)

Does that mean you want war, Hon. Member?

**ගරු මහාචාර්ය තිස්ස විතාරණ මහතා**
*(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)*
(The Hon. (Prof.) Tissa Vitharana)

The solution is not to go back to war. We have to continue the dialogue and that is what the President and the Government are trying to do.

I must commend the United National Party for having agreed to sent a person for tomorrow's discussion, where, hopefully, we will be ab le to have a reasonable exchange of views and try to meet the asspirations of the Tamil speaking people as well. We have to work out a solution, something that is, as is said, home–grown and which will be acceptable to the people of this country. That is the effort that is being made and I would strongly urge theTNA also to participate in this discussion. Let us try to work out a solution. In your speech, Hon. Sampanthan, you kept on saying that the structures of the old Constitution are not suitable; they need to be changed. We fully agree with you. So, why do you not come and participate in that process? Your input could be to the extent where we will be able to fashion something that will be acceptable to you as well as to the rest of the Tamil people in this country.

So, I hope that in this situation, the role of the LTTE has been exposed to the whole world. The world community has reacted appropriately and we have to work out a solution that will be acceptable to the majoriy of the Tamil speaking people. Once that is accepted both by the Tamil speaking people as well as the international community, then there will be pressure on the LTTE that it cannot resist, which will force them to come to the conference table. That is the goal the Govenment is trying to achieve in order to ameliorate the situation confronting the Tamil speaking people in the North and the East as well as everyone else.

Thank you.

[අ. භා. 12.18]

**ගරු සරත් රණවක මහතා**
*(மாண்புமிகு சரத் ரணவக்க)*
(The Hon. Sarath Ranawaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේ ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයෙක් වන සම්පන්දන් මන්ත්‍රීතුමා ද්‍රවිඩ ජනතාවට වාගේ ම ජාත්‍යන්තරයටත් කථා කලා. ඒ වාගේ ම එතුමා රජයටත් කථා කළා. කථා කරනවා, පිහියෙන් අනිනවා කියලා එතුමාගේ කථාවේදී කිව්වා. ඒ වාගේ ම ජිනීවා සාකච්ඡාවලදී වුණු පොරොන්දු ගැනත් එතුමාගේ කථාවේදි කිව්වා. අද උතුරු නැඟෙනහිර ප්‍රශ්නය ගැන කථා කරන කොට, එදා සම සමාජ පක්ෂයේ හිටපු නායකයෙක් වන ලෙස්ලි ගුණවර්ධන මැතිතුමා මට මතක් වෙනවා. 1950 දී එතුමා ලියාපු පොතක් - ඒ පොතේ නම මට මේ අවස්ථාවේදී අමතකයි. - පැහැදිලිවම කියා තිබුණා, මේ උතුරු නැඟෙනහිර ජාතික ගැටලුවට විසඳුමක් නොදුන්නොත් අනාගතයේ දී මේ රට ලේ ගංගාවක් බවට පත් වෙනවා කියලා. ඒ වාගේ ම ඒ යුගයේ ම සම සමාජ පක්ෂයේ නායකයෙක් වන ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා කිව්වා, එක භාෂාවක් නම් රටවල් දෙකයි, භාෂා දෙකක් නම් එක රටයි කියලා. අද සම්පන්දන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ ප්‍රශ්නය පැටලි පැටලී එන්නේ 1950 ගණන්වල ඉඳලායි.

අද දකුණේ "මහින්ද චින්තන" උතුරු නැඟෙනහිරට ගෙන යන්නට ජනාධිපතිතුමා උත්සාහ කරනවා. උතුරු නැඟෙනහිර ප්‍රභාකරන්, ප්‍රභාගෙ චින්තනය දකුණට ගෙනෙන්න උත්සාහ කරනවා. මේ දෙදෙනාගේ ම චින්තන ක්‍රියාත්මක කරන කොට දැන් දැන් මරණ ඉතාමත් ම සුලබ වී ගෙන යනවා. අද ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ අහිංසක සිවිල් වැසියන් කොටි විසින් ඝාතනය කරන කොට, ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය විසින් ත්‍රස්තවාදීන් ඝාතනය කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ වාගේ ම, කොන්ත්‍රාත්කාරයෝ සල්ලිවලට මිනී මරන කොට, අනෙක් පැත්තෙන් පාතාලයෙන් තවත් මිනී මැරුම් සිද්ධ වෙනවා. අනෙක් පැත්තෙන් මාධ්‍යවේදීන් ඝාතනය කරනවා. 2004 සිට මේ වන විට මාධ්‍යවේදීන් හත් දෙනෙකු ඝාතනය කර තිබෙනවා. ඒ හත් දෙනාගෙන් හය දෙනෙක් ද්‍රවිඩ අයයි. මේ ළඟදී ඝාතනයට ලක් වුණා, ආරක්ෂක තොරතුරු ලියූ සම්පත් ලක්මාල් සිල්වා. මේ මාධ්‍යවේදීන් හත් දෙනාගේ ඝාතනය කළේ කවුද කියා සොයා බලා මේ රටට දන්වනට අද වන විටත් පොලීසිය අසමත් වී තිබෙනවා.

අනෙක් පැත්තෙන් උතුරු නැඟෙනහිර ජනතාව සරණාගතයන් වශයෙන් ඉන්දියාව බලා යනවා. සරණාගතයන් වශයෙන් ඉන්දියාවට ගිහින් කියන්නේ නැහැ, "අපි ආවේ ප්‍රභාකරන් නිසා, කොටියා නිසා" ය කියා. සරණාගතයන් එහේ ගිහින් කියන්නේ, "අපි ආවේ ත්‍රිවිධ හමුදාවෙන් අපේ ජීවිත රැක ගන්න ." කියලයි. අද මේකයි මේ රටේ තත්ත්වය.

අද දකුණට වාගේම, උතුරු නැඟෙනහිර ජනතාවටත් රජයෙන් සමාජ ආරක්ෂාව ලබා දිය යුතු අවස්ථාවක් උදා වී තිබෙනවා. අද මරණය සුලබ කරපු අවස්ථාවක රජය මේ ප්‍රශ්නය අවුලෙන් අවුලට පටලවා ගෙන තිබෙනවා. මම කියන්න කැමැතියි, දැන් රජයේම සිටින සමහර පක්ෂ, "දැන ගියොත් කතරගම නොදැන ගියොත් අතරමග" කියා රජයට අනතුරු අඟවන බව. ඒ වාගේම, "ගෙදර ගියොත් අඹු නසී මඟ සිටියොත් තෝ නසී" කියන තත්ත්වයට රජය අද පත් වී තිබෙනවා. ඇයි මෙහෙම වුණේ?

මගේ කාලය ප්‍රමාණවත් නැති නිසා මම ඉතිහාසය ලැන දිගින් දිගටම කථා කරන්නට යන්නේ නැහැ. උතුරු නැඟෙනහිර ප්‍රශ්නය සඳහා 1987 දී දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. බණ්ඩාරනායක-චෙල්වනායගම්, ඩඩ්ලි-චෙල්වනායගම් ගිවිසුම් අපි දෙ ගොල්ලන්ම එකතු වෙලා එදා ප්‍රතික්ෂේප කළා. දිගින් දිගටම ප්‍රශ්නය කැකෑරෙන විට එදා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළාම මේ රට ගිනි ජාලාවක් බවට පත් කළා. බස් ටික ගිනි තැබුවා; ට්‍රාන්ස්ෆෝමර් ටික ගිනි තැබුවා; ලයිට් කණු කැඩුවා; ටෙලිෆෝන් කණු කැඩුවා; රජයේ කාර්යාල පිච්චුවා; රජයේ දේපොළ විශාල වශයෙන් විනාශ කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)

තරුණයෝ මැරුවා. ඒවා මතක නැහැ.

**ගරු සරත් රණවක මහතා**
*(மாண்புமிகு சரத் ரணவக்க)*
(The Hon. Sarath Ranawaka)

ඒකටත් එන්නම්, ඉන්න. ඒ වාගේ විශාල විනාශයක් කරලා එදා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සම්පූර්ණයෙන් විරුද්ධ වුණා. එහෙම වි රුද්ධ වුණු ජනතා විමුක්ති පෙරමුණ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ක්‍රියාත්මක වන පළාත් සභාවලට අද ගිහිල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අද උතුර නැඟෙනහිර පළාත් දෙක වෙන් කරන්න ජනතා විමුක්ති පෙරමුණ උසාවි ගිහිල්ලාත් තිබෙනවා. දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පැහැදිලිව තිබෙනවා, උතුර නැඟෙනහිර වෙන්

කරන්නට ඒ ප්‍රදේශයේ ජනතාව තීරණය කරන්න ඕනෑය කියා; එය ජන මත විචාරණයට ලක් කරන්නට ඕනෑය කියා. මම මේ කියන්නේ ප්‍රශ්නය දිගින් දිගට ගැට ගහන්න එක නොවෙයි; අවුලෙන් අවුලට පත් කරන එක නොවෙයි; මේ ප්‍රශ්නය කොහෙමද ලිහිල් කර ගන්නේ කියන එක ගැනයි. එදා ප්‍රේමදාස ජනාධිපතිතුමා 1989 දී බලයට පත් වෙලා එතුමාට කරන්න වුණේ මොකක්ද? එතුමාට විශාල ධන සම්භාරයක් විදයම් කරන්නට වුණා, පුච්චපු ට්‍රාන්ස්ෆෝමර්ස් දමන්නට; පුච්චපු ලයිට් කණු දමන්නට; පුච්චපු ටෙලිෆෝන් කණු දමන්නට; පුච්චපු රජයේ කාර්යාල හදන්නට. දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළාම එයට විරෝධය පාමින් පුච්චපු බස් වෙනුවට අලුතින් බස් ගෙනෙන්න බැරි වුණු නිසයා අදත් 'සීටීබී' එක විනාශ වෙලා තිබෙන්නේ. අද විදුලිබල මණ්ඩලය විශාල දූෂණ කරනවාය කියා ජනතා විමුක්ති පෙරමුණ කියනවා. දූෂණ වෙනා ඇති. "නැහැ" කියලා මම කියන්නේ නැහැ. නමුත් මම කියන්න ඕනෑ, අද විදුලිබල මණ්ඩලය රුපියල් කෝටි 9300ක් ණය වෙලා තියෙන්නේ, එදා කළ විනාශ කිරීම් නිසා, අපරාධ නිසා විදුලිබල මණ්ඩලයේ මුදල් වියදම් කරන්නට වූ නිසායි.

පසු ගිය දවසක තමුන්නාන්සේලා දයා මාස්ටර් කොළඹ ගෙනාවා. රජය කියනවා, ඒක මානුෂික පැත්තෙන් බලා සාම සාකච්ඡා පිළිබඳව විශ්වාසය තහවුරු කර ගන්නට ගෙනාවාය කියා. එදා අපේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ පුලිදේවන් අනතුරකට ලක් වෙලා, පුලිදේවන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්න හදන විට, මුළු රටම කැළඹෙව්වා, "කොටියා ගෙනැල්ලා, කොටියාට වෛද්‍ය ප්‍රතිකාර දීලා මේ ආණ්ඩුව කොටින්ට රට දෙන්න යනවා" යි කියලා. දැන් දයා මාස්ටර් කොළඹට ගෙනාවාම ඒකට විරුද්ධව හෙළ උරුමය කථා කරනවා. ඒ ස්ථාවරයේ හෙළ උරුමය ඉන්නවා. දයා මාස්ටර් ගැන මානුෂික පැත්තෙන් හිතලා සාම සාකච්ඡා සාර්ථක කර ගැනීමේ බලාපොරොත්තුවෙන් කොළඹට ගෙනාවාය කියන ස්ථාවරය උඩ, එක්සත් ජාතික පක්ෂයත් එදා පුලිදේවන් යුගය වාගේම ඒ ස්ථාවරයේ ඉන්නවා. ඒක තමයි අපේ ස්ථාවරය. නමුත් ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය කෝ? කෝ තමුන්නාන්සේලා මේ ගැන කථා කරනවා? ඊයේ, එනම් 2006.07.18 වන දින "දිවයින" පත්‍රය බලන්න. එහි මෙහෙම සඳහන් වෙනවා.

"දයා මාස්ටර් කොළඹ ආවේ පළාත් ඇමැති විකිණූ රියකින්"

මේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. උතුරු මැද පළාත් සභාවේ වත්මන් ඇමතිවරයෙක්. බැරි වෙලාවත් යූඑන්පී මන්ත්‍රීවරයෙක්, හිටපු ඇමතිවරයෙක් මේ "මංගල්‍යය" කර තිබුණා නම් අද අපි පාරේ යන්නද? මේවා ගැන කථා කරන්නේ නැත්තේ මොකද? මේ වාහනය විකුණා තිබෙනවා. [බාධා කිරීමක්] ඒක තමයි අපි අහන්නේ. එම් ඔප්පු වී තිබෙන ඒවා.

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
*(மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண)*
(The Hon. R. P. A. Ranaweera Pathirana)
තමුන්නාන්සේලා කොටින්ට වාහන දීලා නැතිව ඇත.

**ගරු සරත් රණවක මහතා**
*(மாண்புமிகு சரத் ரணவக்க)*
(The Hon. Sarath Ranawaka)
මේ ඔප්පු වී තිබෙන ඒවා නේ. තමුන්නාන්සේ ඔප්පු කරන්න, අපි කොටින්ට වාහන දුන්නා නම්. මේ හිටපු මන්ත්‍රීවරයෙකුගේ වාහනයක්. මේ වාහනය ඒ හිටපු මන්ත්‍රීවරයාගේ නමට තිබෙන්නේ. මෙන්න මේවා හොයන්න. මේවා කොටීන්ගේ සල්ලි නොවෙයිද? තමුන්නාන්සේලා මේවා ගැන කථා කරන්නේ නැහැ. වෙනත් දේවල් ගැන කථා කරන්නේ. කටේ පිට්ටුද? [බාධා කිරීමක්]

ඊළඟට, සටන් විරාමය ගැන බලන්න. අපට ලොකු චෝදනාවක් ආවා. සටන් විරාමය නිසා තමයි අර බෝම්බේ එන්නේ. මේ බෝම්බෙ එන්නේ කියලා. දැන් මොකද "Limpet" බෝම්බ එනවා. "Harrison C 4" වෙඩි බෙහෙත් බෝම්බ එනවා. ප්ලාස්ටික් බෝම්බ එනවා. මේ ඔක්කොම මේ සටන් විරාමය නිසාලු. ජනාධිපතිවරයා වෙනස් වුණාට 2004 ඉඳලා මේ ආණ්ඩුවට දැන් අවුරුදු දෙකහමාරක් වෙනවා. 2006 ජූනි මාසයේ 15 වන දා දිවයින පත්‍රයේ මෙසේ සඳහන් වෙනවා:

"නෝර්වේ රාජ්‍යය ශ්‍රී ලංකාවේ සතුරු රටක් ලෙස නම් කරමු දේශ හිතෛෂී ජාතික ව්‍යාපාරයේ මහ ලේකම් විමල් වීරවංශ"

මේ කියන්නේ නෝර්වේ රට සතුරු රටක් ලෙස නම් කරන්න කියලා. ඉතින් මේකට එච්චර කලබල වෙන්න ඕනෑ නැහැ නේ. නෝර්වේ ප්‍රශ්න 5ක් අසා තිබෙනවා. මේ සටන් විරාමය තවදුරටත් ක්‍රියාත්මක කළ යුතුද? මේ සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායම තවදුරටත් රඳවා ගත යුතුද? සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායම තවදුරටත් රඳවා ගත යුතු නම් තිබෙන භෞතික සම්පත්, නිරීක්ෂකයින්ගේ ජීවිත ආරක්ෂා කර දෙනවාද? යනාදී වශයෙන් මේ ප්‍රශ්න පහ එල්ටීටීඊ එකෙනුයි, ආණ්ඩුවෙනුයි දෙ ගොල්ලන්ගෙන්ම අහලා තිබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්න පහ නෝරවේ රට අහන විට –

**ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා**
*(மாண்புமிகு ஆர். பீ. ஏ. ரணவீர பத்திரண)*
(The Hon. R. P. A. Ranaweera Pathirana)
මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ හිතනවාද –

**ගරු සරත් රණවක මහතා**
*(மாண்புமிகு சரத் ரணவக்க)*
(The Hon. Sarath Ranawaka)
නෝර්වේ රට අහන විට කොටි විතරක් කියලා තිබෙනවා, –

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)
ගරු රණවීර පතිරණ මන්ත්‍රීතුමා, එතුමා ඔබට ඉඩ දෙන්නේ නැහැ. කරුණාකර අසුන් ගන්න [බාධා කිරීමක්]

**ගරු සරත් රණවක මහතා**
*(மாண்புமிகு சரத் ரணவக்க)*
(The Hon. Sarath Ranawaka)
කොටි පැහැදිලිව කියා තිබෙනවා. ඩෙන්මාර්කය, පින්ලන්තය, ස්වීඩලය නිරීක්ෂණ කටයුතුවලින් ඉවත් කරන්න කියා. එතකොට කොටි අඩු ගණනේ ඒ ප්‍රශ්න පහට උත්තරයක් දීලා තිබෙනවා. ආණ්ඩුව දුන්න උත්තරය අපි දන්නේ නැහැ. ඉතින් ආණ්ඩුවට උත්තරයක් දෙන්න පුළුවන්. ඒකට විමල් වීරවංශ මන්ත්‍රීතුමා –

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)
නිශ්ශබ්ද වන්න. දිවා ආහාරය සඳහා කල් තබන්න ඔබේ කථාව අවසානයකට ගෙනෙන්න.

**ගරු සරත් රණවක මහතා**
*(மாண்புமிகு சரத் ரணவக்க)*
(The Hon. Sarath Ranawaka)
නෝර්වේ රට සතුරු රාජ්‍යයක් විධියට නම් කරන්න නම් එච්චර කලබල වෙන්න ඕනෑ නැහැ. කෙළින්ම ආණ්ඩුවට කියන්න – රජයට කියන්න – "පැහැදිලිව අපි රජයට පක්ෂපාතීව ඉන්නේ, කරුණාකරලා මේ සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වෙන්න" කියලා. මොනවාද අද තමුන්නාන්සේලා කියන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)
දිවා ආහාරය සඳහා සභාවේ කටයුතු ප.ව. 1.00 වන තෙක් අත් හිටුවනවා.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி. ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.*

**ගරු සරත් රණවක මහතා**
*(மாண்புமிகு சரத் ரணவக)*
(The Hon. Sarath Ranawaka)

නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කථා කරමින් සිටියේ දයා මාස්ටර් කොළඹට ගෙනාපු කාරණය ගැනයි. ඔහු රෝහල් ගත කළා. වෛද්‍යවරුන් කියනවා අසනීපයක් නැහැ කියලා. ඒ නිසා ඒක ඉතා ලෙහෙසි කාරණයක් විධියට රජය හිතන්න එපා. වෛද්‍ය වාර්තාව ඇත්තක් නම්, මෙයා කොළඹ ආවේ මොකටද කියා හොයා බලන්න වෙයි. මනුස්සකමට අසනීපයකට ප්‍රතිකාර කළාට කමක් නැහැ. අපි ඒ ස්ථාවරයේ ඉන්නවා. අපේ කාලයේ අපි පුලිදේවන්ට ප්‍රතිකාර කරන කොට තමුන්නාන්සේලා විරුද්ධ වුණා. අපි එදා සටන් විරාම ගිවිසුම අත්සන් කරලා අනෝන්‍ය විශ්වාසය ගොඩ නඟන්න තමයි ඒ විධියට කටයුතු කළේ. මෙතැනදී ජනතා විමුක්ති පෙරමුණ, හෙළ උරුමය කථා කරන්නේ අමුතු විධියකට. හෙළ උරුමය ඒ ස්ථාවරයේ ඉන්නවා. මම හෙළ උරුමයෙන්, ජනතා විමුක්ති පෙරමුණෙන් එක කාරණයක් අහන්න කැමතියි. දයා මාස්ටර් කොළඹට ආවා. අඩු ගණනේ, මේ හේතුව නිසාවත් රාජකාරියට ගිහින් කොටු වෙලා ඉන්න බන්දුජීව බෝපිටිගොඩ පොලිස් පරීක්ෂකවරයාව නිදහස් කර ගන්න උත්සාහ කළාද? එහෙම එකක් නම් අපට පෙනුණේ නැහැ.

ඊ ළඟට මහින්ද චින්තන ගැන කථා කරන්න කැමතියි. මහින්ද චින්තනවල මෙන්න මෙහෙම කියනවා.

"අපේ අසල්වැසි ඉන්දියාව සමඟ ප්‍රමුඛතා පදනම මත මම මේ පිළිබඳව සාකච්ඡා ආරම්භ කරමි. ඔවුන් සමඟ ද කලාපීය ආරක්ෂාව හා සාමය පිළිබඳව සම්මුතියකට එළඹෙමි."

ඊ ළඟට මෙහෙම කියනවා.

"දැනට සාම සම සභාපතිවරුන් වන එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය හා නෝර්වේ සමඟද මම මේ අලුත් ප්‍රවේශය පිළිබඳව විවෘත සාකච්ඡාවකට එළඹෙමි."

ඒ වාගේම මහින්ද චින්තනවල තව දුරටත් මේ ආකාරයට සඳහන් වෙනවා.

"කිසිදු ත්‍රස්ත ක්‍රියාවකට ඉඩ නොලැබෙන පරිදි සටන් විරාම ගිවිසුම යළි සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. සටන් විරාම නිරීක්ෂණ ක්‍රියාදාමය පිළිබඳව යළි විමර්ශනය කොට පිළියම් යොදනු ඇත. එහිදී කලාපීය සහයෝගීත්වය ලබා ගැනීමටද කටයුතු කරමි."

ඒ මහින්ද චින්තනවල කියපු දේ. ඊ ළඟට ජනාධිපතිතුමා සර්ව පාක්ෂික උපදේශක කමිටුවේදී, ඒ සභාවේදී මෙහෙම කියනවා.

"සාමය උදා කරගත හැක්කේ සාකච්ඡා මාර්ගයෙන් පමණයි. යුද්ධයෙන් හෝ භීෂණයෙන් බෑ - ජනපති අවධාරණය කරයි."

2006 ජූලි 12 වන බදාදා පත්තරේ එහෙම තිබෙනවා. එතුමා එහෙම ප්‍රකාශ කරන කොට අද මේ ආණ්ඩුවත් එක්ක සන්ධානගත වෙලා ඉන්න අනිකුත් පක්ෂ මොනවාද කියන්නේ. කියා අපි බලන්න ඕනෑ. ඒකයි මෙතැන තිබෙන අවුල් ජාලාව. මේ හැම එකක්ම අපේ කර පිටට පටවන්න හදනවා. මේ අවුල් ජාලාව ගැනයි මා මතක් කරන්නේ. ජූලි මාසයේ 7 වන සිකුරාදා "දිවයින" පත්තරේ මෙහෙම තිබෙනවා.

"කොටි සහ ජාත්‍යන්තර සතුරන් ඉදිරියේ ජනපතිට පස්වන මහින්ද කෙනකු වීමට ජවිපෙ ඉඩ දෙන්නේ නෑ - ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ"

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සම සභාපතිවරුන් ගැන කථා කරන කොට, සම සභාපතිවරුත් එක්ක සාකච්ඡා කරනවායි කියා කියන කොට, ජනතා විමුක්ති පෙරමුණේ ලේකම් ටිල්වින් සිල්වා මහතා ඒ ගැන මෙහෙම කියනවා.

"මුන් සම සභාපතිවරු නෙමෙයි. මේ ජාත්‍යන්තර හොරු, පට්ටපල් ජාත්‍යන්තර බොරුකාරයෝ. යුරෝපා සංගමය ඇතුළු බටහිර හා බටහිර ගැති රටවලින් අපි අහනවා, ඔය රටවල් කොටි ත්‍රස්තවාදයට කවදාවත් යට වෙන්ඩ කැමතිද, එහෙම යට වෙනවාද?"

ඊ ළඟට මෙහෙම කියනවා.

"කොටි ත්‍රස්තවාදීන් 2002 රනිල් වික්‍රමසිංහගෙ සටන් විරාමය දැන් ඉවර කරලයි තියෙන්නේ. සටන් විරාමයක් අවශ්‍ය නම් නැවත අලුත් එකක් ඇති කළ යුතුයි. හැබැයි ඒකෙදි කොටි සාම සාකච්ඡාවලට එනව නම් අවි බිම තියල ආ යුතුයි. අලුත් සටන් විරාමෙදි එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් අවි බිම තැබිය යුතුයි. ඒක අපි රජයට යෝජනා කරලයි තියෙන්නේ."

ඒ වාගේම ඊට පස්සේ මෙහෙම කියනවා.

"මේ අකාෂි අපිව හමුවෙන්න ඇවිත් අපිට කියනවා ශ්‍රී ලංකාවේ යුද වාතාවරණය උත්සන්න වෙලා. ඒ නිසා, එයා කියන් හදනකොටම අපි අකාෂිගෙන් ඇහුවා ලංකාවේ ප්‍රශ්න ගැන කතා කරන්න ඔයා කවුද කියලා.

ඊට පස්සේ මේ හාදයා කියනවා රජයේ හමුදාවන්ට යුද්ධයෙන් මේ ප්‍රශ්නෙ විසඳන්න බැහැ නේ ද කියලා. අකාෂි කවුද මෙහෙම කියන්න. ඇයි නීත්‍යානුකූල හමුදාවකට බැරි රටේ අභියෝග භාර ගන්න."

දැන් මෙන්න මෙතැන තමයි ගැටලුව. ජනාධිපතිතුමා මහින්ද චින්තනවල කියනවා, සම සභාපතිවරුන් එක්ක සකච්ඡා කර, මේ ප්‍රශ්නයට උදවු පදවු ගන්න හැටි. කවුද සම සභාපතිවරු? ඇමෙරිකාව, යුරෝපා සංගමය, ඉන්දියාව, හා නෝර්වේ. මේ රටවල් හතරටම හොරුයි කිය කියා බණිනවා. ජාත්‍යන්තර හොරු යි කිය කියා බණිනවා. එහෙම නම මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමතියි, අපේ ආගම අනුව, මේ ජාත්‍යන්තර නායකයන් සෝවාන් වෙලාද කියා. ජාත්‍යන්තර හොරු ය, පට්ටපල් බොරුකාරයෝ ය කිය කියා මෙහෙම බණින්න බණින්න, ජාත්‍යන්තරයට ගහන්න, ගහන්න, මොකක්ද සිද්ධ වන්නේ? කොටියා ඉහළ යනවා. කොටියාගේ ලකුණු ඉහළ යනවා. එතකොට ජාත්‍යන්තරය කල්පනා කරනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉන්නේ මේ ජාතිවාදී නායකයන් ටිකත් එක්ක එකතු වෙලායි කියා. එතුමාගේ ප්‍රතිරූපයත්, ජාත්‍යන්තරව අද ජාතිවාදී නායකයෙක් බවට පරිවර්තනය වෙමින් තිබෙන්නේ, ජනතා විමුක්ති පෙරමුණයි, හෙළ උරුමයයි කරන සමහර ප්‍රකාශ නිසා යි. දැන් මේකේ මෙන්න මෙහෙම මහ ලොකු වට කයිය ගහනවා.

"එල්ටීටීඊ කොටි ත්‍රස්තවාදීන් අද තීරණයක් අරගෙන තියෙනව ඉක්මනින්ම ජනතා විමුක්ති පෙරමුණට මොනව හරි කරන්න ඕන කියල. කොටින්ට දැන් එහෙම හිතුනට ජනතා විමුක්ති පෙරමුණ ඒක බලාපොරොත්තු වුණේ හුඟ කාලෙකට ඉස්සර ඉඳන්."

ඊ ළඟට මෙහෙම කියනවා :

"ලන්ඩනයේ රැස්වීමකට පසු ගිය දිනවල මම එහෙ ගිය වෙලාවෙ ලන්ඩනයේ ඉන්න කොටි ඒ රැස්වීම සංවිධානය කළ අපේ සංවිධායකයන්ට තර්ජනය කරල තිබුණා."

මේ එක්කම ඊළඟට "ජනතා විමුක්ති පෙරමුණට අත තිබ්බොත් ඒ ගොල්ලොත් ජීවිතවලට ජීවිත ගන්නවා" යි කියා. මම මෙන්න මේ කාරණය කියන්න කැමතියි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොටියාට ඕනෑ කර තිබෙන්නේ, මේ රටේ තව තවත් ජාතිවාදී නායකයන් බිහි කරන්නයි. කොටියාත් තමුන්නාන්සේ වාගේ දෙවියන් අදහනවා නම්, තව තවත් ශ්‍රී ලංකාවේ සිංහල ජාතිවාදීන් බිහි වේවායි කියා, දවස ගානේ ගිහින් දෙවියන්ට මල් මාලා පළඳවයි. මේක තමයි ඇත්ත කතාව. විශාල වගකීමක් ඇතිව මා මේ සභාවේදී කියනවා, කොටියා කවදාවත් ජාතිවාදී නායකයන්ව නම් මරා දමන්නේ නැහැ යි කියා. කොටියා එච්චර මෝඩයෙක් නොවෙයි. ජාතිවාදී නායකයින් ඉන්න ඉන්න ඒ වාසිය යන්නේ කොටියාටයි. ඒ වාසිය ජාත්‍යන්තරව කොටියා දිනා ගන්නවා. ජනාධිපතිතුමා කියනවා, මේ ප්‍රශ්නයට ජාත්‍යන්තර උදවු ලබා ගන්නා හැටි. එතකොට ජනතා විමුක්ති පෙරමුණ කියනවා. "අපි අපේ ප්‍රශ්නය විසඳා ගන්න ඕනෑ, මේක අභ්‍යන්තර අරගලයක්, මේ ප්‍රශ්නය අභ්‍යන්තරව විසඳා ගන්න ඕනෑ" යි කියා. එහෙම නම්, මේ සඳහා ජාත්‍යන්තර උදවු පදවු ලබා ගෙන මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා ගන්නට රජය උත්සාහ කරනවාද, එහෙම නැත්නම් ජනතා විමුක්ති පෙරමුණ කියන විධියට තමුන්නාන්සේලා මේ ප්‍රශ්නය අභ්‍යන්තරව විසඳා ගන්නට උත්සාහ කරවාද කියා මම පැහැදිලිවම රජයෙන් අහනවා. මේක තමයි හතර බීරි කථාව. තේරුමක් නැහැ. පැහැදිලි වැඩ පිළිවෙළක් නැහැ.

ඊ ළඟට 2006 ජූලි 7ඉවැනි දා "දිවයින" පුවත් පතේ මේ විධියට කියා තිබෙනවා :

"යුදමය වශයෙන් පරාජය කිරීම හැර කොටි ත්‍රස්තවාදයට වෙනත් විකල්පයක් නෑ. කොටි උන්මාදය වළක්වන්නේ කෙසේද සමුළුවේදී විමල් වීරවංශ කියයි."

ඒ වාගේම 2006 ජූලි 13 වැනි දින දිවයින පුවත් පතේ මේ විධියට කියා තිබෙනවා :

"කොටින් සමඟ ආණ්ඩුව සාම විසඳුම් සැකසීම විහිළුවක්."

ඒ දෙකම කියා තිබෙන්නේ දේශ හිතෛෂී ජාතික සංවිධානයේ මහ ලේකම්වරුන් විසිනුයි. එහි සභාපති අපේ හිතවත් දොස්තර ගුණදාස අරමසේකර මැතිතුමා මේ විධියට කියා තිබෙනවා :

"රටේ ඇත්තේ මිලේච්ඡ ත්‍රස්තවාදයක් මිස ජනවාර්ගික ප්‍රශ්නයක් නොවේ."

බලන්න එතුමන්ලා ඒ ප්‍රශ්නය තේරුම් අරගෙන තිබෙන හැටි, අද රටේ ජන වාර්ගික ප්‍රශ්නයක් නැත්නම් ජනතා විමුක්ති පෙරමුණ සර්ව පාක්ෂික සමුළුවට යන්නේ, ජාතික හෙළ උරුමය සර්ව පාක්ෂික සමුළුවට යන්නේ මොනවා යෝජනා කරන්නද ? මොකක්ද බලාපොරොත්තුව ? ජාතික හෙළ උරුමයත් කියනවා, ජන වාර්ගික ප්‍රශ්නයක් නැහැ කියා. නමුත් 1950 ගණන්වල ඉඳලා මේ තිබුණු ප්‍රශ්නයට පිළියමක් නොදුන් නිසා අද තමුන්නාන්සේලා අපි දෙ ගොල්ලම එකම වළේ වැටී ඉන්නවා. මේ වළෙන් ගොඩ එන්න මේ බහු බූත කතා කරන දේශපාලනඥයනුත් එක්ක පුළුවන්ද කියන එක තමයි රජය කල්පනා කරන්නට ඕනෑ.

දැන් ජන වාර්ගික ප්‍රශ්නයක් නැහැ කියා තමයි කතා කරන්නේ. ජන වාර්ගික ප්‍රශ්නයක් නැත්නම් සර්ව පාක්ෂික සමුළුවට ගිහින් ලගින්නේ මොකටද ? එහෙම නම් මුලින්ම කියන්නට තිබුණා නේ, මේ සමුළුවෙන් වැඩක් නැහැ. මේකේ ජන වාර්ගික ප්‍රශ්නයක් නැහැ, මේකේ තිබෙන්නේ ත්‍රස්තවාදයක්. ඒ නිසා අපි යුද්ධ කරමුයි කියා. ඒක නේ කියන්නේ "යුදමය වශයෙන් පරාජය කිරීම හැර කොටි ත්‍රස්තවාදයට වෙනත් විකල්පයක් නෑ" කියා.

ඉතින් මෙන්න මෙහෙම කණ්ඩායමක් එක්ක තමයි අද රජයට මේ ගමන යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා අද රජයට සිද්ධ වෙලා තිබෙන්නේ, ගලේ පහරපු බළලාට සිද්ධ වෙච්ච දෙයයි කියා මම කියනවා. මේ යථාර්ථය තේරුම් ගන්නට බැරිව, මට ඉස්සෙර වෙලා කතා කළ තිස්ස විතාරණ මහතා ජූලි මස 10 වැනි දා 'දිනමින' පුවත් පතේ මේ විධියට කියා තිබෙනවා :

"අපි යුද්ධයට බහින තරමට සිද්ධ වෙන්නේ කවදුරටත් සාමාන්‍ය දෙමළ ජනතාව පීඩාවට අසහනයට පත් වීමයි. එතකොට ඒ අය ගිහිල්ලා නිකම්ම එල්ටීටීඊ ඔඩොක්කුවට වැටීමෙන් එල්ටීටීඊ ය තවත් ශක්තිමත් වෙනවා. සටන් විරාම කාලයේදී එල්ටීටීඊ ය කල්ලිවලට කැඩුණා. දැන් නැවතත් අප ප්‍රහාර එල්ල කරන්න ගත්තොත් මේ කැඩුණු පිරිස් පවා යළිත් එල්ටීටීඊ යට එකතු වේවි. අප කළ යුත්තේ දෙමළ ජනතාව දිනා ගැනීම සඳහා ක්‍රියා කිරීමයි."

සන්ධානයේ ඉන්න තවත් පක්ෂයක් තමයි ඒ විධියට කියා තිබෙන්නේ. පක්ෂවල එකමුතුවක් නැති  එක තමයි. අද ලොකුම ප්‍රශ්නය බවට පත් වෙලා තිබෙන්නේ. ඉස්සෙල්ලා සන්ධානය එකමුතු විය යුතුයි. උතුරු නැගෙනහිර ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්න ඕනෑ නම් අපි එක තීරණයකට පැමිණිය යුතුයි. ඒක තමයි ඉතාමත්ම වැදගත් වන්නේ. ඊළඟට කේ. ඩී. ලාල් කාන්ත මන්ත්‍රීතුමා 2006 ජූලි 9 වැනි දා ලක්බිම පුවත්පතට මේ විධියට කියා තිබෙනවා.

"ඉන්දියාව කැමති ෆෙඩරල් විසඳුමකට වුණත් අපේ 'ඒකීය රාජ්‍ය' ප්‍රතිපත්තියේ වෙනසක් නෑ."

ඒ එක්කම අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා 2006 ජූලි 9 වැනි දා දිවයින පුවත් පතට මේ විධියට කියා තිබෙනවා :

"මොන 'මොඩලය' ආවත් මහින්ද චින්තනයට පැටහැනිව බෑ."

මේ ගොල්ලන් මේ විධියට කියන කොට, ආනන්ද සංගරී මැතිතුමා මොකක්ද කියා තිබෙන්නේ ? එතුමාත් මේ රටේ ද්‍රවිඩ නායකයෙක්. එතුමා මේ විධියට කියා තිබෙනවා :

"එල්ටීටීඊ විලංගුවෙන් දෙමළ ජනයා නිදහස් කරන්න. – ඉන්දියානු ආදර්ශය මත පදනම් වූ විසඳුමක් කෙරෙහි මවිසින් අඛණ්ඩ උද්ඝෝෂණයක් කර ගෙන යෑමට ප්‍රධාන හේතුව පෙඩරල් සහ එක්සත් ගණයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙරෙහි විරෝධය දක්වෙන්නන් පවා ඉන් සෑහීමට පත්වීමයි. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පෙඩරල් හෝ එක්සත් හෝ එකක් ගොවන අතර තමන් 'විවිධත්වය තුළින් ඒකීයත්වයට' ළඟා වන බව විශ්වාස කරන්නේ යැයි පවසමින් ඉන්දියානුවෝ සාඩම්බරයට පත් වෙති."

ආනන්ද සංගරී, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයා. අද කොටින්ගෙන් විශාල වශයෙන් තර්ජන තිබෙන නායකයෙක්. ඒ නායකයා පැහැදිලිව කියන්නේ අපව කොටින්ට හිර කරන්න එපා. අපට විසඳුමක් ලබා දෙන්නය කියායි. දැන් කරුණා මොකද කියන්නේ? කරුණා කියනවාද? විසඳුමක් එපාය කියා. කරුණා කියන්නේ අපි ප්‍රජාත්‍රන්ත්‍රවාදී ව්‍යුහයට ඇවිත් තිබෙනවා, ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදීව මේ ප්‍රශ්නය දිහා බලලා, ද්‍රවිඩ ජනතාව පිළිගන්නා බලය විමධ්‍යගත කිරීමක් කරලා දෙන්නය කියායි. මේක තමයි, ඒ ගොල්ලන්ගේ ඉල්ලීම. මෙතැන කොටියා කොටිකම් කරනවා, මිනී මරනවා, ත්‍රස්තවාදය පතුරුවනවා. මේක කිය කියා සියයට 70ක් විතර වන අහිංසක ද්‍රවිඩ ජනතාව තළන්න, පෙළන්න ගත්තොත් අපට මොකක්ද වෙන්නේ?

ආණ්ඩුව සමහර විට බලාපොරොත්තු වෙන්න ඇති, කරුණානිධි එල්ටීටීඊ -කොටි- විරෝධියෙක් නිසා කරුණානිධිගේ සම්පූර්ණ සහයෝගය ලැබෙයි කියා. මොකක්ද වුණේ ? මෙහෙන් යන සරණාගතයෝ කියන්න පටන් ගත්තා, අපි ආවේ ලංකාවේ ත්‍රිවිධ හමුදාවෙන් ජීවිත බේරා ගන්නයි කියා. සරණාගතයෝ එන්න එන්න වැඩි වුණා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, your time is up.

**ගරු සරත් රණවක මහතා**
*(மாண்புமிகு சரத் ரணவக)*
(The Hon. Sarath Ranawaka)
Give me one more minute, Sir. සරණාගතයෝ වැඩි වෙන්න, වැඩි වෙන්න කරුණානිධි අසරණ තත්ත්වයට පත් වුණා. ජයලලිතා, වයිකෝත් එක්ක එකතු වෙලා කිව්වා, "මේ ප්‍රශ්නයට මධ්‍යම ආණ්ඩුවෙන් විසඳුමක් ලබා දෙන්නේ නැත්නම් අපි එළියට බහිනවයි කියලා. විජයකාන්ත් කියන නළුවාගේ පක්ෂය; එතුමාගේ පක්ෂය මද්‍රාසියේ තුන් වන දේශපාලන පක්ෂයයි. ඔක්කොම කොල්ලෝ, කෙල්ලෝ ඉන්නේ එතුමා වටේයි, එතුමාත් කිව්වා, "ලංකාවේ ද්‍රවිඩ සිවිල් ජනතාවට විසඳුමක් ලබා දෙන්නේ නැත්නම්, ඉන්දියන් මහ ආණ්ඩුව මේකට ඉදිරිපත් වන්නේ නැත්නම් අපි පැහැදිලිවම පාරට බහිනවා" යි කියා. ඒ නිසා තමයි, ඉන්දියාවේ විදේශ ලේකම් ලංකාවට ආවේ. විදේශ ලේකම් ඇවිත් මොකක්ද, කිව්වේ? ගහන කොට ගහන්න කිව්වාද? ගහන කොට ගහන්න කිව්වේ නැහැ. ඒක තමයි, ජාත්‍යන්තරව අපට තිබෙන ප්‍රශ්නය. අල්ලපු රටේ තිබෙන ප්‍රශ්නය. ජනතා විමුක්ති පෙරමුණට, ජාතික හෙළ උරුමයට අල්ලපු ඉන්දියාව තරහ කරගෙන, ඉන්දියාවට පයින් ගහගෙන, මේ ප්‍රශ්නයට විසඳුමක් සොයන්න පුළුවන්ය කියා හිතනවාද? එහෙම හිතන්න ගියොත් සිද්ධ වෙන්නේ මේ රට දවසින් දවස විනාශයෙන් විනාශයට පත් වීමයි. අර සම්පන්දන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ අවුරුදු 30කට පෙර අපට පස්සෙන් හිටපු සිංගප්පූරුව අද ගොඩ නැගී තිබෙන්නේ මේ ගැටලුවලට උත්තර දීපු නිසයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසන් කරන්නට පෙර එක වචනයක් කියන්න කැමැතියි. විහිළුත් කෙරෙනවා. මේක අස්සේ. මහනුවරින් ක්ලේමෝ බෝම්බ 2ක් අල්ලා ගෙන තිබෙන බව අපි දැක්කා. ඒ බෝම්බවල ඉදිරියෙන් ම සිංහලෙන් ගසා තිබෙනවා, "ඉදිරිය සතුරාට" කියා. අපි මේක රූපවාහිනියෙන් දැක්කා. ක්ලේමෝ බෝම්බ දෙකේම ඉස්සරහින් ගහලා තිබෙනවා, "ඉදිරිය සතුරාට" කියා. එතකොට මේ බෝම්බ කොහෙන්ද ආවේ? ඒ කාලයේ මාන්කුලම කැම්ප් එකේ නම් එවැනි බෝම්බ තිබුණා. ඒ බෝම්බ මාන්කුලම කැම්ප් එකෙන් කොටි අරගෙන ගිහින් නැවත මෙතැනට ආවේ ඒ බෝම්බද කියා කියන්න දන්නේ නැහැ. මාන්කුලම කැම්ප් එකේ "ඉදිරිය සතුරාට" කියන ඔය ක්ලේමෝ බෝම්බ තිබුණා. දැන් ඒ බෝම්බ කොටි ගෙනැවිත් අපේ මාධ්‍ය ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල අමාත්‍යතුමාගේ නිවසට යන පාරේ තැබුවාද? එහෙම නැත්නම් මේවා කවුරුන් හෝ හමුදාවෙන් සොරකම් කරලා තිබුණු බෝම්බද?මේකටත් කොමිෂන් එකක් පත් කරන්න වෙලා තිබෙනවා. ඒක මම කියන්නේ, එදා යුද්ධයට සම්බන්ධව සිටියේ මහනුවර සපුමල් කුමාරයා, අනුරුද්ධ රත්වත්තේ හිටපු අමාත්‍යතුමායි. එදා හිටපු ජනාධිපතිවරිය සන්නස් පත්‍රයක් දුන්නා, යුද්ධය ජය ගත්තාය කියා. එදා සපුමල් කුමාරයාට, තිබ්බේ නැති ක්ලේමෝ බෝම්බ, අද ආණ්ඩුවේ ආර්ක්ෂක මාධ්‍ය ප්‍රකාශකට තැබීම එක පැත්තකින් ත්‍රාසයක්, තවත් පැත්තකින් විහිළුවක්. මේ විහිළු අස්සේ, ත්‍රාසයන් අස්සේ ඇත්තකුත් තිබෙනවාද කියා අපි බලන්න  ඕනෑ. ඒ නිසා මෙවැනි ජෝකර් වැඩ ගැනත් අපි හොඳින් බලා ගෙන ඉන්න බව මතක් කරමින්,  අනුරුද්ධ රත්වත්තේට නොතිබ්බ, දි. මු. ජයරත්න අමාත්‍යතුමාට නොතිබ්බ බෝම්බ අද ආණ්ඩුවේ ආරක්ෂක මාධ්‍ය ප්‍රකාශකට තබනවා නම් ආණ්ඩුවේ අමාත්‍යවරු බොහොම කල්පනාකාරීව ජීවත් විය යුතුයි කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

[අ. භා. 1.17]

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (කෘෂිකර්ම, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යතුමා සහ පරිසර අමාත්‍යතුමා)**

*(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் மகாவலி அபிவிருத்தி அமைச்சரும் சுற்றாடல் அமைச்சரும்)*

(The Hon. Maithripala Sirisena - Minister of Agriculture, Irrigation and Mahaweli Development and Minister of Environment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උතුරු නැගෙනහිර තත්වය සම්බන්ධයෙන් විශේෂයෙන්ම ද්‍රවිඩ ජාතික සන්ධානයේ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද කල්තැබීමේ යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී රජය වෙනුවෙන් කරුණු කිහිපයක් පැහැදිලි කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. මා මුලින්ම කියන්නට ඕනෑ. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා අද දින උදේ වරුවේ මෙම කල් තැබීමේ යෝජනාව මෙම සභාවට ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළ කරුණු මේ රටේ අනාගතය සඳහා, ඒ වාගේම අද පවතින් උතුරු නැගෙනහිර ප්‍රශ්නය විසඳිම සඳහා කොතෙක් දුරට සාධාරණද යන්න එතුමා තමන්ගේම හෘදය සාක්ෂියෙන් ඇසිය යුතු වන බව.

මේ ප්‍රශ්නය පිළිබඳව ඉතාමත්ම සාධාරණව, අපක්ෂපාතීව අදහස් ප්‍රකාශ කිරීම සහ කටයුතු කිරීම අවශ්‍ය වෙනවා. රජය වේවා, විපක්ෂය වේවා, රටේ වෙනත් පිළිගත් දේශපාලන නායකයකු වේවා, අද රටේ පවතින ත්‍රස්තවාදය පිලිබඳව, ඒවාට අදාළ විසඳුම් සහ ක්‍රියා මාර්ග පිළිබඳව ඒක පාක්ෂිකව සිතීම, එක පැත්තකින් පමණක් නියෝජනය කිරීම කිසිසේත්ම සාධාරණ නොවන බව අපි රජය විධියට ප්‍රකාශ කරන්නට ඕනෑ.

අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මීට මාස හතකට පෙර මේ රටේ බලයට පත් වුණේ, ජනතාව එතුමාට වරමක් දුන්නේ අද රටේ තිබෙන ප්‍රශ්න සම්බන්ධයෙන් දීර්ඝ කාලීන ස්ථිරසාර විසඳුම් ලබා දීම සඳහායි. එතුමා සහ එතුමාගේ රජය මේ සම්බන්ධයෙන් දැඩි කැපවීමකින් කටයුතු කරන වෙලාවක ආණ්ඩුව වේවා, විපක්ෂය වේවා වෙනත් කිසියම් හෝ පාර්ශ්වයක් වේවා. මේ උත්තරීතර ගරු සභාව තුළදී වාගේම ඉන් පිටතදීත් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉතා සාධාරණ සහ යුක්ති සහගත ලෙස කථා කිරීමේ සහ කටයුතු කිරීමේ අවශ්‍යතාව පිළිගත යුතු වෙනවාය කියලා මා හිතනවා.

රජයක් විධියට කටයුතු කිරීමත්, ත්‍රස්තවාදී සංවිධානයක් විධියට කටයුතු කිරීමත් අංශ දෙකක් බව අපි දන්නවා. විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී, ජනතාවගේ ඡන්දයෙන් පත් වුණු ආන්ඩුවක් කටයුතු කරන ආකාරයත් ඒ වාගේම තුවක්කු අතට ගත් ත්‍රස්තවාදී සංවිධානයක් කටයුතු කරන ආකාරයත් අතර වෙනස්කම් රාශියක් තිබෙනවා. ඒ නිසා අපි රජය විධියට ප්‍රධාන වශයෙන් ද්‍රවිඩ ජාතික සන්ධානයෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලීමක් කරනවා, යෝජනාවක් කරනවා. එනම් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් එක් පාර්ශ්වයක් පිළිබඳව, එක් ජන වර්ගයක් පිළිබඳව පමණක් කථා නොකර රටේ සියලුම ජන වර්ගයන් පිළිබඳව සාධාරණව, අපක්ෂපාතීව සහ යුක්තිසහගතව, කථා කරන ලෙස. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාටත්, අපේ ආණ්ඩුවටත් සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් කියලා වෙනසක් නැහැ. සියලු ජන කොටස් සඳහා ඉතා සාධාරණ ලෙස, සමානාත්මතාවෙන් යුක්ති සහගත ආකාරයටයි අපි රජයක් විධියට කටයුතු කරන්නේ.

ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා අද මේ යෝජනාව ඉදිරිපත් කරමින් කරන ලද කථාවේදී ප්‍රධාන වශයෙන් ම උතුරු නැඟෙනහිර තත්ත්වය පැහැදිලි කරමින් ඒ ප්‍රදේශවල සිදු වන ඝාතන පිළිබඳව, ආරක්ෂක හමුදාව නැත්නම් රජය පැත්තෙන් සිදු කරන ලද ඝාතන කියලා එතුමා සඳහන් කළා. නමුත් අපි ඉතාමත්ම කනගාටු වෙනවා, එල්ටීටීඊ සංවිධානය විසින් අද රට තුළ කරනු ලබන ඝාතන ගැන. ඝාතන සිදු කරනු ලබන්නේ උතුරු නැඟෙනහිර පමණක් නොවෙයි. ඒ කරන සැලැසුම් සම්බන්ධයෙන් ද්‍රවිඩ ජාතික සන්ධානයට අද තමන්ගේ මතය නිදහසේ ප්‍රකාශ කළ හැකි තත්ත්වයක් නොමැති බව අපට පැහැදිලිව පෙනෙනවා.

ප්‍රධාන වශයෙන් රට තුළ සිදු වන මිනිස් ඝාතන යම් යම් සිද්ධීන්, බෝම්බ පිපිරීම්, ආයුධ අතට ගත්ත අයගේ හැසිරීම් යනාදිය සම්බන්ධයෙන් අපි මේ අවස්ථාවේදී ඉතා සාධාරණ ලෙස අවධානය යොමු කිරීම අවශ්‍ය වෙනවා. උතුරු නැඟෙනහිර පමණක් නොවෙයි, මේ යුද්ධය ආරම්භ කළ දවසේ ඉඳලා- 1983 ඉඳලා-අද දක්වා එල්ටීටීඊ සංවිධානය විසින් මේ රටේ සිදු කරනු ලැබූ මිනිස් ඝාතන හා මහා විනාශයන් පිළිබඳව ප්‍රධාන වශයෙන් අපේ අවධානය යොමු කළ යුතු වෙනවා. උතුරේ එල්ටීටීඊ සංවිධානය විසින් සිදු කරනු ලබන ඝාතන සම්බන්ධයෙන් අද මේ ගරු සභාව නියෝජනය කරන ඇතැම් මන්ත්‍රීවරු මේ ගරු සභාවේ දී එක වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඔවුන් ඒ සම්බන්ධයෙන් මුනිවත රකිනවා. එල්ටීටීඊ සංවිධානයට සුදු හුනු ගානවා. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් සාධාරණ ලෙස සහ යුක්ති සහගත ලෙස ක්‍රියා කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ඔවුන් ප්‍රධාන වශයෙන් තමන්ගේ අවධානය යොමු කළ යුතු වෙනවා.

එල්ටීටීඊ සංවිධානය විසින් යුධ හමුදාපතිතුමා ඝාතනය කිරීමට උත්සාහකළා. ජනරාල් පාරමී කුලතුංග මැතිතුමා ඝාතනය කළා. මා මේ ගරු සභාවේ දී ද්‍රවිඩ ජාතික සන්ධානයෙන් ප්‍රශ්නයක් අහනවා. මීට මාස දෙකකට පෙර මාගේ ජීවිතය විනාශ කරන්නට එල්ටීටීඊ සංවිධානය ගත් උත්සාහයේ දී අපේ ආරක්ෂක නිලධාරීන් විසින් ඔවුන්ව අත් අඩංගුවට ගත්තා. එසේ අත් අඩංගුවට ගැනීමෙන් පසුව එල්ටීටීඊ සාමාජිකයින් සයිනයිඩ් කාලා තම ජීවිත විනාශ කර ගන්නට උත්සාහ කළා. මේවා අනුමත කරනවා ද, මේ සම්බන්ධයෙන් මොනවාද කියන්නේ කියලා අපි ද්‍රවිඩ ජාතික සන්ධානයෙන් අහනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, මේ රටේ මානව නිදහස, ඒ වාගේම මේ රටේ ජනතාවගේ අනාගතය සඳහා මේ උත්තරීතර සභාවේ ගරු මන්ත්‍රීවරුන් සාමූහිකත්වයකින් කටයුතු කළ යුතු අවස්ථාවක මෙවැනි සිද්ධීන් පිළිබඳව එක් පාර්ශ්වයක් නිහඬ වීම අපට බරපතල ප්‍රශ්නයක්. ඊයේ දකුණේ දී කොටි කාන්තාවක් අත් අඩංගුවට ගැනීමෙන් අතිගරු ජනාධිපතිතුමා ඝාතනය කිරීමේ සැලසුමක් තිබෙන බව ඉතා පැහැදිලිව පෙනී ගොස් තිබෙනවා. ඒ නිසා මේ සිද්ධීන් පිළිබඳව සහ ඒවායේ පසු පස ඇති තත්ත්වයන් පිළිබඳව අප කථා කළ යුතු වෙනවා, ඒ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු කළ යුතු වෙනවා.

මා නියෝජනය කරන පොළොන්නරුව මැතිවරණ කොට්ඨාසයේ, වැලිකන්ද ප්‍රදේශයේ මහවැලි ගම්මානවල කොන්ත්‍රාත් කටයුතුවල නියැලුණු සේවකයින් විශාල පිරිසක් ඝාතනය කරනු ලැබුවා. කැබිතිගොල්ලෑවේ සිද්ධිය ගැන අප කවුරුත් දන්නවා. පසු ගිය වසර විසි පහක කාලය තුළ දී මේ රටේ සිදු වුණු සිද්ධීන් දිහා බැලුවාම මේවා අපට අලුත් සිද්ධීන් නොවෙයි. මේ සිද්ධීන් පිටු පස සිටින්නේ කවුරුන්ද, මේවා කරන්නේ කවුරුන්ද කියන එකත් රහසක් නොවෙයි. නමුත් මේ සිදුවීම් සම්බන්ධයෙන් රජයට ඇඟිල්ල දික් කරනවා; ආරක්ෂක හමුදාවන්ට ඇඟිල්ල දික් කරනවා. ප්‍රධාන වශයෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන ආණ්ඩුවක් හැටියට අප මේ රටේ ස්ථිර සාමයක් ඇති කිරීම සඳහා සියලු ජන වර්ග කෙරෙහි සමානාත්මතාවකින් යුතුව කටයුතු කරනවා. ඒවා ගැන සොයා බලනවා. මෙවැනි කාර්යයන් ඇති වගකීම පිළිබඳව කවුරුත් සාධාරණ ලෙස කල්පනා කළ යුතු වෙනවා.

ඒ වාගේම රජයේ සාම වෑයමේ දී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා - එතුමාගේ නායකත්වය යටතේ පසු ගිය මාස හතක කාලය තුළ දී විශාල කැප කිරීමක් කර තිබෙනවා. එතුමා බලයට පත් වෙලා ඉතාම කෙටි කාලයකින් - මාස එක හමාරකින් දෙකකින් - නැවතිලා තිබුණු සාම සාකච්ඡා නැවත ආරම්භ කරන්නට පුළුවන්කම ලැබුණා. එහිදී එල්ටීටීඊ සංවිධානයට කරන ලද ආරාධනයට ඒ අය දැක්වූ සහයෝගය සම්බන්ධයෙන් රජය හැටියට අප ඒ අයට ස්තුතිවන්ත වෙනවා. ප්‍රධාන වශයෙන්ම ජිනීවා සාකච්ඡාවලට සහභාගි වීමෙන් දැක්වූ ඒ සහයෝගය අපි ඉතාමත්ම අගය කරනවා.

ඒ වාගේම ඉන් පසුව ඔස්ලෝ සාකච්ඡාවලදී එල්ටීටීඊ සංවිධානය එය මඟ හැරීමෙන්, ප්‍රධාන වශයෙන් රජයට ඇඟිල්ල දික් කර ඒ සාකච්ඡාවලින් ඔවුන් ඉවත් වීමෙන් සිද්ධ වුණේ මේ ප්‍රශ්නය විසඳීම සඳහා එල්ටීටීඊ සංවිධානය අපක්ෂපාතීව තමන්ගේ කටයුත්ත ඉෂ්ට කිරීමක්ද කියා අපි අහනවා.

ජිනීවා සාකච්ඡාවලින් ආරම්භ කළ දේ ඔස්ලෝවල දී එල්ටීටීඊ සංවිධානය විසින් අසාර්ථක කළේ, රජයක් විධියට කැප වීමෙන් සහ ඒ වැඩපිළිවෙළේ ඒ කාර්යයන් කිසිදු අඩු පාඩුවක් නැතිව අපි ඉටු කර තිබිය දී යි.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සර්ව පාක්ෂික සමුළු ගණනාවක් – හතරක් පහක් – කැඳවා, ඒ ඒ දේශපාලන පක්ෂවල එකතුව තුළ ලබා ගත් අදහස් එක්ක අද විද්වත් මණ්ඩලයක් පත් කර තිබෙනවා. ඒ විද්වත් මණ්ඩලයට සියලු දේශපාලන පක්ෂවලට ආරාධනා කර, ඒ සඳහා අදහස් ප්‍රකාශ කරන්නට, නියෝජිතයන් පත් කරන්නට ඉඩකඩ ලබා දී, ඒ වෙනුවෙන් කැප වීමට කටයුතු සලස්වා තිබෙනවා. ඒ වාගේම සර්ව පාක්ෂික සමුළුවේ අදහස් අනුව මේ ප්‍රශ්නයට විසඳුම් සෙවීම සඳහා කමිටුවක් පත් කිරීමට අදාළ දේශපාලන පක්ෂවලට ආරාධනා කර තිබෙනවා. කවුරු හරි

මෙයින් මඟ හරිනවා නම්, එතැනින් ඉවත් වෙනවා නම්, "අපි ඒවාට එන්නේ නැහැ" යි කියනවා නම්, මේ ප්‍රශ්නය විසඳීම සඳහා ඒ අයගේ තිබෙන සැබෑ වුවමනාව කොතෙක්ද කියන එක කාටත් පැහැදිලි වෙනවා. මේ ගරු සභාව තුළ මොන විධියට කථා කළත්, වේදිකාවල මොන ආකාරයෙන් කථා කළත්, ජනමාධ්‍යයට මොන විධියේ උත්තර සැපයුවත්, මේ ප්‍රශ්නය විසඳීම සඳහා රජය ගන්නා වූ ක්‍රියා මාර්ගයට කිසියම් හෝ දේශපාලන පක්ෂයක්, පාර්ශ්වයක් දක්වන කැපවීම සහ සහයෝගය, සහභාගිත්වය තුළ තමයි, මේ සඳහා අවංක කැපවීමක් තිබෙනවාද කියන එක අපට තක්සේරු කරන්නට පුළුවන් වන්නේ. මේ සඳහා අවංක කැපවීමක් තිබෙනවා නම් ඒ සෑම කෙනෙක්ම ඒ සඳහා එකතු විය යුතු වෙනවා. ඒ අවංක කැපවීම නැති අය එයින් ලිස්සා යනවා, මඟ හරිනවා, වෙනත් මොනවා හරි ප්‍රශ්නයක් පෙන්වා ඒ ප්‍රශ්නයට තමන්ට විසඳුමක් දුන්නේ නැහැ කියා ඒ ප්‍රශ්නයෙන් පලා යනවා. මේ යෝජනා කරන කමිටුවට තමන්ගේ අදහස්, යෝජනා ඉදිරිපත් කරන්නට, තමන්ගේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්නට සෑම කෙනෙකුටම අයිතිය දී තිබෙනවා. නමුත් ඒවායින් පලා යනවා නම්, ප්‍රශ්නයෙන් පලා යනවා නම් අපි දකින්නේ මේ ප්‍රශ්නය විසඳීමේ කිසිදු වුවමනාවක් ඔවුන්ට නැති බවයි.

මේ තිබෙන තත්ත්වය සැලකිල්ලට අරගෙන කටයුතු කරන විට, ආණ්ඩුවක් විධියට ජාතික වශයෙන් යම් යම් ක්‍රියා මාර්ග ගන්නවා වාගේම, ජාත්‍යන්තර වශයෙන් මීට පෙර කිසියම් කාලයක මේ රටේ ආණ්ඩුවකට නොතිබුණු සහයෝගයක් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයට ලැබී තිබෙනවාය කියන එක අපි සෑම කෙනෙක්ම පිළිගත යුතු නෙවා. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අන්නන් මහතා කරන ලද ප්‍රකාශයන් ගැන අපි කවුරුත් දන්නවා. යුරෝපා සංගමය කරන ලද ප්‍රකාශයන්, ගෙන තිබෙන ක්‍රියා මාර්ගයන් මොනවාද කියා අපි දන්නවා. ඉන්දියාව, ඇමෙරිකාව වැනි ප්‍රබල රටවල් වාගේම මේ ප්‍රශ්නය විසඳීම සඳහා උනන්දුවක් දක්වන, ඒ සඳහා සැබෑ වුමනාවක් තිබෙන, ඒ වාගේම ත්‍රස්තවාදය පරාජය කිරීමේ අවශ්‍යතාව තිබෙන ජාත්‍යන්තර සංවිධාන රජයට විශාල සහයෝගයක් දී තිබෙනවා. මීට පෙර කිසියම් ම කාලයක මේ තරම් සහයෝගයක් ලැබුණේ නැහැ. අද ලෝකයේ සමහර රටවල රාජ්‍යයන් – අද ලන්ඩන්වල පවා – එල්ටීටීඊය තහනම් කිරීමෙන් පමණක් නැවතී නැහැ. ඒ රටවල එල්ටීටීඊය සම්බන්ධයෙන් ක්‍රියාකාරිත්වය තිබෙන ආයතන, කාර්යාල වටලන්නට පවා අද සමහර රටවල් ක්‍රියා කර තිබෙනවා. ඒක ඉතාමත්ම හොඳ තත්ත්වයක්; ජාත්‍යන්තර ප්‍රජාව තුළින් මෙ රජයට තිබෙන සහයෝගය ඉතාමත් පැහැදිලිව, මැනවින් කැපී පෙනෙන තත්ත්වයක්. ජාත්‍යන්තර වශයෙන් ලැබී තිබෙන ඒ සහයෝගය ගැන අවධානය යොමු කරමින්, රජයක් විධියට කාගේත් සහයෝගය තුළ මේ ප්‍රශ්නය විසඳීමේ අවශ්‍යතාව ඇති වෙනවා. රටට අවශ්‍ය ස්ථිරසාර සාමයක් සඳහා යන වැඩ පිළිවෙළේ දී, මේ ප්‍රශ්නය විසඳීම සඳහා වි සඳුමක් පිළිබඳව කථා කරන විට, රජය නියෝජනය කරන පාර්ශ්වයන් තුළ යම් යම් අදහස්, යෝජනා, විවිධාකාර මත තිබෙන්නට පුළුවන්. නමුත් මෙහිදී රජය නියෝජනය කරන පාර්ශ්වවලට වාගේම, රජයට සහයෝගය දක්වන පාර්ශ්වවලට වාගේම, විපක්ෂයේ සියලු දෙනාටත් තමන්ගේ අදහස්, යෝජනා සහ සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා සම්පූර්ණයෙන් ම අවස්ථාව සලසා තිබෙනවා.

මේ සම්බන්ධයෙන් බලය බෙදීමේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන්, රජයේ ප්‍රධාන දේශපාලන පක්ෂය විධියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මීට කලින් තිබුණු ස්ථාවරයේ කිසිදු වෙනස් වීමක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ සිද්ධ වී නැහැ.

පළාත් සභා ක්‍රමය ඇති කළේ ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේදී ය කියන කාරණය අපි දන්නවා. එතකොට පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක වෙලා පසුගිය වසර 25කට ආසන්න කාලය තුළ ඒ ගැන අපි ලබා තිබෙන අත්දැකීම් එක්ක පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙන් අපි අධ්‍යයනයක් කරන්නට ඕනෑ. මේ ක්‍රමය කොතෙක් දුරට සාර්ථක වෙලා තිබෙනවාද, එයින් බලාපොරොත්තු වුණු දේ ඉෂ්ට වෙලා තිබෙනවා ද, එහි තිබෙන අඩු පාඩුකම මොනවාද ද, එහි තිබෙන දුර්වලතාවන් මොනවාද ද, ඒවා නිවැරදි කර ගැනීම සඳහා අප කොයි ආකාරයෙන් කටයුතු කරන්නට ඕනෑ ද කියා ආපසු හැරී බලන්නට ඕනෑ. අද රටේ තිබෙන මේ ප්‍රධාන ප්‍රශ්නය විසඳීම සඳහා බලය බෙදීමේ ක්‍රමයක දී අපි මොන විධියේ වැඩ පිළිවෙළකට යා යුතු ද කියා බලන්නට ඕනෑ. පළාත් සභා ක්‍රමය තුළින් අපි ලබා ගත් අත් දැකීම් සමඟ එතැනින් එහාට යන්නට අවශ්‍ය වටපිටාව සකස් කර ගැනීමේදී රටේ එක්සත් භාවය, ඒකීය භාවය, භෞමික අඛණ්ඩතාව යන මේ සියල්ල ආරක්ෂා වන විධියට, සුරක්ෂිත වන විධියට ලෝකයේ අනික් රටවල මේ ප්‍රශ්නය විසඳා ඇති ආකාරයට බලය බෙදීමේ ක්‍රමය ක්‍රියාත්මක කර ඇති ආකාරය ගැන අත් දැකීම් අර ගෙන මේ ප්‍රශ්නය විසඳීම ඉතාම අවශ්‍ය වෙනවා.

ඒ නිසා ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා උදේ වරුවේ මේ සභාවේදී දක්වන ලද අදහස්, යෝජනා සම්බන්ධයෙන් අපි එතුමන්ලාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. මේ ප්‍රශ්නයේ දී එක් පාර්ශ්වයක් එක් කොටසක් එක් පැත්තක් දිහා බලන්නේ නැතිව සිංහල වේවා, ද්‍රවිඩ වේවා, මුස්ලිම් වේවා මේ ගරු සභාව නියෝජනය කරන සෑම කෙනෙක් ම මේ කාර්යයේ දී එකට එකතු වෙලා අත හිත දීලා මේ ප්‍රශ්නය විසඳිය යුතු වෙනවා. රජයක් විධියට අද අපි එල්ටීටීඊ සංවිධානයට අභියෝග කරනවා තමන්ගේ ආයුධ බිම තියා ඡන්දයකට ඇවිල්ලා ඒ අයට තිබෙන ජනතා සහයෝගය පෙන්වන්න කියා. මහජන මතය තමයි ප්‍රධාන වශයෙන් ම ප්‍රමුඛතාවෙහි ලා සැලකෙන්නේ. ඒ නිසා එල්ටීටීඊ සංවිධානය මේ කියන ආකාරයේ සාධාරණත්වයක් බලාපොරොත්තු වෙනවා නම්, මහජනතාවගේ අයිතිවාසිකම් ගැන බලාපොරොත්තු වෙනවා නම් කළ යුතු එකම දෙය තමයි ආයුධ බිම තියා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එක් වීම. මෙන්න අපට තිබෙන මහජන සහයෝගය මේ ආකාරයෙන්ය කියා එල්ටීටීඊ සංවිධානය තමන්ට තිබෙන ජනමතය පෙන්වන්න ඕනෑ.

රජයක් විධියට අපි උතුරේ කරන සංවර්ධන කටයුතු ගැන ගරු මහින්දානන්ද අලුත්ගමගේ නියෝජ්‍ය අමාත්‍යතුමා උදේ පැහැදිලි කළා. ජාතික අය වැයෙන් වාගේම ජාත්‍යන්තර සංවිධානවලින් ලැබෙන විශාල මුදල් කන්දරාවක්, අති විශාල මුදල් ප්‍රමාණයක් වැය කර අද උතුරු නැගෙනහිර සංවර්ධනය සඳහා කටයුතු කෙරෙනවා. උතුරු-නැගෙනහිරට යොදවා තිබෙන, ආයෝජනය කර තිබෙන මුදල් ප්‍රමාණය තරම් මුදල් ප්‍රමාණයක් රටේ වෙනත් කිසිදු ප්‍රදේශයකට යොදවා නැහැ. පළාත් වශයෙන් ගත්තොත් උතුරු නැගෙනහිර ප්‍රදේශවලට ජාත්‍යන්තර වශයෙන් මූල්‍ය ආයතනවලින්, ආධාර දෙන ආයතනවලින් ලැබී තිබෙන මුදල් වාගේම ජාතික අය වැයෙන් ලබා දී තිබෙන මුදල් ප්‍රමාණය බැලුවොත් උතුරු නැගෙනහිර ප්‍රදේශවලට වැය කරන මුදල තරම් මුදලක් රටේ වෙනත් ප්‍රදේශවල සංවර්ධනය සඳහා වෙන් කර නැහැ. ඒ විධියට අති විශාල මුදලක් වැය කර උතුරු-නැගෙනහිර ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කරනවා. බාධාවන් තිබෙනවා. අපි දන්නවා ඒ බාධාවන්. තමුන්නාන්සේලාත් දන්නවා ඒ බාධාවන් මොනවා ද කියා. සංවර්ධන කටයුතුවල දී මූලික වශයෙන් ඇස්තමේන්තුවක් හදා ගන්න ගියාම ඒ ඇස්තමේන්තුව හදා ගැනීමේ දී තිබෙන බලපෑම් මොනවාද කියා හැම කෙනෙක් ම දන්නවා. ඒක රහසක් නොවෙයි. ඒ නිසා ඒ සංවර්ධන කටයුතු සඳහා, ජනතාවගේ සුබ සිද්ධිය සඳහා උතුරු නැඟෙනහිර ප්‍රදේශවල වාගේම රටේ අනික් ප්‍රදේශවල සංවර්ධනය සඳහාත් රජයක් විධියට කැප වෙනවා වාගේම ස්ථිර සාමයක් ඇති කිරීම සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවක් විධියට සම්පූර්ණයෙන්ම කැප වීමෙන් කටයුතු කරන බව ප්‍රකාශ කරනවා, ස්තූතියි.

[අ. භා. 1.37]

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද උදේ ආර්. සම්පන්දන් මන්ත්‍රීතුමා පැය එකයි විනාඩි 22ක කාලයක් ගත කරමින් ඉදිරිපත් කළ යෝජනාව විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශවල තිබෙන තත්ත්වය පිළිබඳවයි. එතුමා පැය එකයි විනාඩි 22ක කාලය තුළ බොහොම ප්‍රවේශමෙන් වචන පාවිච්චි කළා. උතුරු නැගෙනහිර ප්‍රදේශවල අද මුහුණ පාන්න වෙලා තිබෙන තත්ත්වය වග කිව යුතු ප්‍රධාන පාර්ශවකරුවාට කිසිදු චෝදනාවක් එල්ල නොකර එතුමාගේ කාලය සම්පූර්ණයෙන්ම ඒ යෝජනාව වෙනුවෙන් මිඩංගු කළා. ඒ කිසිදු තැනකදී, කිසිදු අවස්ථාවක දී අද උතුරු නැගෙනිහර ප්‍රදේශවල මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ කවර හේතුවක් මත ද, එහි ප්‍රධාන පාර්ශ්වකරුවා කවුද, වග උත්තරකරුවා කවුද කියන එක ගැන එතුමා කථා කළේ නැහැ. එතුමා ඒක අමතක කළා. නොදන්නාකම නොවෙයි, නොතේරෙනකම නොවෙයි, ඒක තමයි එතුමාගේ වුවමනාව වුණේ. ඒ නිසා අපට මේ ප්‍රශ්නය වහලා යන්න පුළුවන්කමක් නැහැ. මේ තත්ත්වය ඇති කරන්නට බලපාපු ඉතිහාසමය කරුණු ගණනාවක් තිබෙනවා. ඔබතුමාත් ඒක පැහැදිලි කළා. ඇත්ත ප්‍රශ්නයක්, උතුරේ, නැඟෙනහිරේ පමණක් නොවෙයි, මුළු රටේම තිබෙනවා. එදා ඉතිහාසයේ මේ රට පාලනය කළ දේශපාලන නායකයින්, ආන්ඩු කරපු දේශපාලන නායකයින් අනුගමනය කළ වැරදි දේශපාලන ප්‍රතිපත්ති

[ගරු විජිත හේරත් මහතා]

නිසා මේ රටේ සුළු ජාතිකත්වයන්ට යම් යම් අසාධාරණයන්ට ලක් වෙන්න සිද්ධ වුණා. ඒක අපි පිළිගන්නවා. එය වෙනස් කිරීම සඳහා දේශපාලන පරම්පරාවේ අලුත් නායකයන්ට තිබෙන වගකීම තමයි ඒ සුළු ජාතිකත්වයන්ට, ආර්ථික වශයෙන්, දේශපාලන වශයෙන් හෝ සංස්කෘතිකමය වශයෙන් මුහුණ පාන්නට සිදු වුණු යම් හෝ අසාධාරණයක් තිබෙනවා නම් අන්න ඒ අසමානතාවෙන්, ඒ පීඩනයෙන් මුදා ගැනීම සඳහා වෙච්ච නියමානුකූල ආර්ථික දේශපාලන සංස්කෘතික ප්‍රතිපත්තියක් රට තුළ ක්‍රියාත්මක කිරීම. ඒක තමයි මේ ප්‍රශ්නයේ අවසාන කෙළවර, මේ ප්‍රශ්නය පිළිබඳව අපි දකින්න ඕනෑ, අපිට යන්න තිබෙන අවසාන කෙළවර. එය ඉටු කර ගිනීම සඳහා, එවැනි ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැඟීම සඳහා අද මේ ශ්‍රී ලංකා ධරණී තලයේ තිබෙන ප්‍රධාන බාධාව කුමක්ද? අද අපට උතුරේ සහ නැඟෙනහිර සංවර්ධනයක් ඇති කර ගන්නට බැරි වෙලා තිබෙන්නේ ඇයි? උතුරු සහ නැඟෙනහිර පළාත්වල පරිපාලනය සම්පූර්ණයෙන්ම බිඳ වැට්ටුවේ කවුද? එහි අනෙකුත් සමාජමය කටයුතු බිඳ වටටන්න ආරම්භය දුන්නේ කවුද? අන්න එතැන තමයි ප්‍රධාන බාධාව තිබෙන්නේ. ඒ බාධාව ඉවත් නොකර මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්න බැහැ. ඒ නිසා අපේ රටේ තිබෙන ප්‍රශ්නය අපි කවුරුත් අද තේරුම් අරගෙන තිබෙනවා. මේ ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන බරපතල, සංකීර්ණ දේශපාලන ප්‍රශ්නය අද අපේ රටෙන් ඔබ්බටත් අරගෙන ගිහින් තිබෙනවා. අද විතරක් නොවෙයි. මීට දශක දෙක තුනකට පෙර සිට මේ ප්‍රශ්නය අපේ රටෙන් ඔබ්බට අරගෙන ගියා. එදා හිටපු පාලකයෝ, එදා හිටපු වැරදි දේශපාලන නායකයෝ මේ ප්‍රශ්නය ජාත්‍යන්තරීකරණය කරන්න පටන් ගත්තා. මේ ප්‍රශ්නය විදේශගත කළා. ඒ විදේශගත කිරීම නිසා මේ ප්‍රශ්නය තවත් වුල් වුණා. අපේ රටේ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියන ජාතිකත්වයන් අතර සමානතාව ඇති කරලා මේ රටේ ජාතික සමගිය ගොඩ නඟනවා වෙනුවට මේ තිබෙන අසමානතාව, එය මහා ලොකු ප්‍රශ්නයක් විධියට සලකා එහි තවත් සංකීර්ණතා ඇති කරමින් මෙය එක් එක් විදේශ බලවේගයන්ට ඕනෑ විධියට පාලනය කරන්න, හසුරුවන්න පුළුවන් තත්ත්වයක් ඇති කළා. වැඩි ඈතක යන්න ඕනෑ නැහැ, උදාහරණයක් විධියට මෑත ඉතිහාසයේ 2002 දී එක්සත් ජාතික පක්ෂය අත්සන් කළ ඒ සටන් විරාම ගිවිසුම ගන්න පුළුවන්. අද සරත් රණවක මන්ත්‍රීතුමා කථා කරමින් ජනතා විමුක්ති පෙරමුණට විවිධ චෝදනා එල්ල කළා. හැබැයි, එතුමාගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා බලුවොත් එතුමා පිළිගන්නවා. මොකක්ද? 2002 පෙබරවාරි මාසයේ 22 වැනි දා සටන් විරාම ගිවිසුම අත්සන් කරන්න කලින් – පෙබරවාරි මාසයේ 22 වැනි දා මේ ගිවිසුම අත්සන් කළේ – ඒ මාසයේ ම, එනම්, පෙබරවාරි මාසයේ 13 වැනි දා නෝර්වේ රාජ්‍යයේ TGS - NOPEC Geophysical සමාගම ශ්‍රී ලංකා ආණ්ඩුවත් එක්ක – රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවත් එක්ක – ගිවිසුමක් අත්සන් කළා. මොකක්ද? අපේ රටේ ඛනිජ සම්පත, අද මහා ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන, ආර්ථිකයට බරපතල ප්‍රශ්න මතු කරන එයට ස්ථිරසාර විසඳුමක් විධියට තිබෙන සම්පතක් විච්ච අපේ තෙල් නිධිය, අද සොයා ගෙන තිබෙන මේ තෙල් සම්පත් පිළිබඳව දත්ත එකතු කිරීමේ සම්පූර්ණ අයිතිය එදා පෙබරවාරි මාසයේ 13 වැනි දා TGS - NOPEC Geophysical සමාගමට පැවරුවා. අවුරුදු 10ක් යන තෙක් ඒ සමාගමෙන් පිට, ඒ සමාගමේ අනුමැතියකින් තොරව ශ්‍රී ලංකාවේ ආණ්ඩුවටවත්, ඒ දත්ත එකතු කර ගන්න, ඒ දත්ත ලබා ගන්න බැහැ. කාවේරි ද්‍රෝණියේ ඉඳලා හම්බන්තොට කෙළවරට යනතුරු තිබෙන තෙල් සම්පත කලාප 6කට බෙදා, ඒ කලාප 6 තුළ වෙනස් හු විෂමතාවන් සහිතව පවතින මේ තෙල් සම්පතේ මූලික දත්ත එකතු කිරීමේ අයිතිය එදා පෙබරවාරි මාසයේ 13 වන දා නෝර්වේ නෝර්පෙක් සමාගම පවරා ගත්තා. පෙබරවාරි මාසයේ 13 වන දා මේක පවරා ගෙන දින කිහිපයකට පස්සේ තමයි අපේ රටේ පවතින ජාතික ප්‍රශ්නය දඩමීමා කර ගෙන එල්ටීටීඊ සංවිධානයත්, ලංකා ආණ්ඩුවත් සහ රනිල් වික්‍රමසිංහ මහත්මයාත් අතර මේ පාවා දීමේ ගිවිසුම අත්සන් කළේ. එක්සත් ජාතික පක්ෂයේ මහත්වරුන්ට මේක තේරෙන්නේ නැද්ද? මේක පිටුපස්සේ තිබෙන්නේ මොකක්ද කියන එක රටට ආදරයක් තිබෙන එක්සත් ජාතික පාක්ෂිකයෙකුට තේරෙන්න ඕනෑ. මේ කුමන්ත්‍රණය අපි හරියට හඳුනා ගන්න ඕනෑ. අපි රටේ සිංහල, දෙමළ, මුස්ලිම් පුරවැසියෝ විධියට ගහ ගන්නවා; මරා ගන්නවා, ඒ වාගේ ම ජීවිතාන්තය දක්වා යුද්ධ ගණනාවකට මුහුණ දෙනවා. හැබැයි, මේ යුද නිර්මාණය කරන්නේ, යුද්ධයන්ට අවශ්‍ය කරන ඉන්ධන සපයන්නේ වෙන කොහෙත්වත් නොවෙයි.මෙන්න මේ ජාත්‍යන්තර කුමන්ත්‍රණකාරයෝ තමයි ඒවා කරන්නේ.

සම්පන්දන් මන්ත්‍රීතුමා අද ලෝකයට කථා කරන්න, ලෝකයට වැරදි අදහසක් මතු කරන්න මේ සමහර දත්ත, කරුණු ඉදිරිපත් කරනවා. හැබැයි, ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, ලෝකයේ බොහෝ රටවල් අපේ රටට මැදිහත් වන ආකාරය හරියට තේරුම් ගන්න ඕනෑ. එහෙම වුණොත් තමයි අපේ රටේ පුරවැසියන් විධියට, ඔබතුමා දෙමළ ජාතිකයෙක් විධියටත් මම සිංහල ජාතිකයෙක් විධියටත් ඒ වාගේ ම මේ ගරු සභාවේ සිටින තවත් මුස්ලිම් ජාතිකත්වයන් විධියටත් අපි මැදිහත් වෙලා අපේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වන්නේ. ඒ නිසා එතැන ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් තිබෙනවා. එම කුමන්ත්‍රණය හරහා තමයි මේ ප්‍රශ්නය අවුලෙන් අවුලට පත් කර තිබෙන්නේ. පසුගිය දවස්වල යුරෝපා සංගමය එල්ටීටීඊ සංවිධානය තහනම් කළා. හැබැයි, ඒ තහනම් කිරීමත් එක්ක යුරෝපා සංගමය සහ සම සභාපතිවරුන්ගේ කණ්ඩායම මොකද කළේ? ඒ සම සභාපතිවරු එකතු වෙලා අපේ රටේ ආණ්ඩුවට බල කරනවා, නියෝග කරනවා. අපේ රට පාලනය කළ යුතු වන්නේ කොහොමද, ඒ සඳහා අනුගමනය කළ යුතු වන්නේ කොයි විධියේ ක්‍රමයක්ද, ඒ වාගේ රාජ්‍ය නොවන සංවිධාන විවේචනය කරන්න එපා කියලත් අපිට නියෝග කරනවා.

මේ ප්‍රශ්නය තවත් අවුල් කරන කණ්ඩායමක් තමයි රාජ්‍ය නොවන සංවිධාන, ඒ අයව විවේචනය කරන්නත් එපා කියනවා. ඒ විවේචනය නතර කරන්න, මේ ප්‍රශ්නයට විසඳුම මෙන්න මේ විධියට දෙන්න කියාත් ඒ අයගේ මැදිහත් වීම තුළින් බලපෑම තිබෙනවා. අද ඒ සම සභාපතිවරු – Co-Chairs– මේ ප්‍රශ්නයට විවිධ විධියට බලපෑම් කරමින් මැදිහත් වෙනවා. ජපානයේ යසුෂි අකාෂි මහත්මයා ඇවිත් කිලිනොච්චියට ගිහින් තමිල් සෙල්වන් මුණ ගැසෙනවා. ඊළඟට ඕස්ට්‍රේලියානු ඒබීසී ගුවන් විදුලියට කියනවා, මේ ප්‍රශ්නයට එක්සත් ජාතීන්ගේ හමුදාවක් පැමිණීමේ අවශ්‍යතාව පිළිබඳව. ඊළඟට රාජ්‍ය නොවන සංවිධාන, රාවය පත්තරේ මහත්වරු, එල්ටීටීඊ සංවිධානය නෝර්වේ රාජ්‍යයේත් වෙනත් රාජ්‍යයන්වලත් ඒ සටන් පාඨයම ඉදිරියට අර ගෙන ලංකාව අසාර්ථක රාජ්‍යයක්ය කියන සංකල්පය, මතවාදය ලෝකය පුරා පතුරුවන්න හදනවා. මේ මොකටද? එක පැත්තකින් ලංකාව අසාර්ථක රාජ්‍යයක් බවට ලෝකය තුළ තහවුරු කරමින් ඒ අසාර්ථක රාජ්‍යය සාර්ථක කිරීම සඳහා යුදමය සහ ජාත්‍යන්තර වශයෙන් මැදිහත් වීමේ ඉඩකඩ විවෘත කර ගැනීම සඳහා තමයි මේ අර අඳින්නේ. අපේ රටේ මේ ප්‍රශ්නය අපි එකිනෙකා අතර ජාතික වශයෙන් විසඳා ගන්නවා වෙනුවට ජාත්‍යන්තරකරණය කිරීම හරහා ඒ සියලු දෙනාම අද මේ ප්‍රශ්නයට ඔළුව දමා මේ ප්‍රශ්නය එක එක පැත්තට එක එක් දිශානතියට අදිනවා. ඒ අයට විවිධ වුවමනාවන් තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදය, අද ලෝකයේ විවිධ රටවල අනුගමනය කරන ප්‍රතිපත්තිය මේ ලෝකවාසී ජනතාව නොදන්නා කාරණාවක් නොවෙයි. අද ලෙබනනයට ඊශ්‍රායලය බෝම්බ ගහද්දී මිසයිල ගහද්දී, පලස්තීනයට බෝම්බ හෙළද්දී මේ ලෝක පොලිස්කාරයා වූ ඇමෙරිකාව, එක්සත් ජාතීන්ගේ සංවිධානය ඒකමතික තීන්දු ගන්නවා, ප්‍රකාශ නිකුත් කරනවා. ඊශ්‍රායලයේ යුදමය ක්‍රියා මාර්ගය නිවැරදි කරමින් ඔවුන් විසින් ප්‍රකාශ නිකුත් කරනවා. අහිංසක පලස්තීන ජනතාව අමු අමුවේ ඝාතනය කරද්දී - ඇමෙරිකාවේ ජනතාව නොවෙයි, ඇමෙරිකාවේ රාජ්‍ය නායකයෝ එය අනුමත කරමින්, එයට අනුබල දෙමින් ඊශ්‍රායලය විසින් පලස්තීනයට බෝම්බ හෙළීම සාධාරණීකරණය කරනවා. එහෙව් ඇමෙරිකාවේ සහකාර ලේකම්වරයා ලංකාවට ඇවිල්ලා කරපු ප්‍රකාශන ගැන සම්පන්දන් මහත්මයා අපට උදාහරණ කියනවා. Mr. Richard Boucher විසින් මතුපිටට පෙනෙන විධියට එක පැත්තකින් ආණ්ඩුව සනසන්න යම් යම් ප්‍රකාශ නිකුත් කරනවා. අනික් පැත්තෙන් තමන්ගේ ඇමෙරිකානු වුවමනාව ඉෂ්ට කර ගන්න සම්පන්දන් මන්ත්‍රීතුමා අද උදෑසන උපුටා දක්වපු වාක්‍ය කියනවා. දෙමළ ජනතාවගේ නිජ භූමිය, උතුරු නැඟෙනහිර පාලනය පිළිබඳ අදහස්, Mr. Richard Boucher ගේ කටින් ඊට පස්සේ පිට වෙනවා. ඒ නිසා අප මේවා තේරුම් ගන්න ඕනෑ. මේ ප්‍රශ්නය කොහොමද අවුල් වෙන්නේ, මේ ප්‍රශ්නය හසුරුවන්නේ කවුද කියන එක තේරුම් ගන්න ඕනෑ සම්පන්දන් මන්ත්‍රීතුමනි. එහෙම නැත්නම් ඔබතුමායි, අපියි - කවුරුත් - මේ උගුලේ හිර වෙලා අවසානයේ ජාතියක් විධියට - ශ්‍රී ලාංකීය ජාතිය විධියට - නො නවතින යුද්ධයක කොටස්කාරයෝ බවට අප පත් වෙයි. ඒ නිසා අප මේවා හරියට තේරුම් අරගෙන, එවැනි බලවේගයන් විසින් මේ ප්‍රශ්නය එක එක දිශානතියට අදින එක නතර කරන්න ඕනෑ.

1987 වර්ෂයේ ඉන්දු - ලංකා ගිවිසුමට ජේ. ආර්. ජයවර්ධන මහත්මයායි, රජිව් ගාන්ධි මහත්මයායි අත්සන් කරන කොට ඒ ගිවිසුමට ඇතුළත් කරපු කරුණු මොනවාද කියලා අප දන්නවා. ඒ ගිවිසුම නිසා තවමත් අර්බුදයන් මතු වෙලා තිබෙන්නේ අපේ රටේ පරිපාලනයේ විතරක් නොවෙයි. සාමාන්‍ය සිවිල් පුරවැසියෙකු යම් සමාජ ශුභ සාධන කටයුත්තකට මැදිහත් වෙනවා නම් අන්න ඒකටත් බාධා ඇති වන තත්ත්වයට ඉන්දු - ලංකා ගිවිසුමේ බලපෑම අදත් අපේ රටේ තිබෙනවා. සම්පන්දන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගිවිසුමේ කරුණු නැවත මතක් කරගන්න ඕනෑ නම් නැවත එය කියවලා බැලුවොත් හොඳයි. ඒ ගිවිසුමේ තිබෙන කරුණුවලට අනුව ඉන්දියාව මොනවාද ලබා ගත්තේ, ඉන්දියානු හමුදාව ලංකාවට එව්වේ ඇයි කියා ඒ කරුණු ගැන නැවත

මතක් කර ගත්තොත් හොඳයි. සරත් රණවක මන්ත්‍රීතුමා ඉතිහාසය අමතක වෙලා සමහර දේවල් මතු කරලා කථා කළා. ඉන්දු - ලංකා ගිවිසුමත් එක්ක රජිව් ගාන්ධි අගමැතිවරයා ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට එවපු ලිපියේ වගන්ති කිහිපයක් මා කියවන්නම්. ඒ ලිපියේ එක තැනක මෙහෙම සඳහන් වෙනවා.

"Trincomalee or any other ports in Sri Lanka will not be made available for military use by any country in a manner prejudicial to India's interests."

ඊළඟ කාරණාවේ මෙසේ සඳහන් වෙනවා.

"The work of restoring and operating the Trincomalee oil tank farm will be undartaken as a joint venture between india and Sri Lanka."

එම ලිපියේ තවත් කොටසක මෙසේ සඳහන් වෙනවා.

"India and Sri Lanka have agreed to set up a joint consultative mechanism to continuoulsy review matters of common concern in the light of the objectives stated in para I and specifically to monitor the implementation of other matters contained in this letter."

එක පැත්තකින් බැලුවාම, මේ ලිපියේ ජාතික ප්‍රශ්නයට උදවු කරන වගන්ති තිබෙනවා, ඒකට මැදිහත් වන ආකාරයත් තිබෙනවා. අනික් පැත්තෙන් බැලුවාම තමන්ට වුවමනා කරන දේ ලබා ගන්නා ආකාරයත් තිබෙනවා. හැබැයි, සම්පන්දන් මන්ත්‍රීතුමනි, ඔබතුමා උදේ මතු කරපු කාරණය වන උතුරු නැඟෙනහිර ප්‍රදේශය දෙමළ ජනතාවගේ නිජ භූමියයි කියන කාරණය මේ ගිවිසුමේ නැහැ. ඒ ලිපියේ බොහොම පැහැදිලිව මෙන්න මෙහෙම සඳහන් වෙනවා. ඒකත් අප අවධාරණයට ලක් කරන්න ඕනෑ.

"Also recognising that the Northern and the Eastern Provinces have been areas of historical habitation of Sri Lankan Tamil - Speaking people. who have at all times hitherto lived together in this territory with other ethnic groups.

Conscious of the necessity of stregthening the forces contributing to unity, sovereignty and territotrial integrity of Sri Lanka, and preserving its character as a multi-ethnic, multi-lingual and multi- religious plural society, in which all citizens can live in equality, safety and harmony, and prosper and fulfil their aspirations."

ඒ නිසා නිජ භූමිය පිළිබඳ අදහස් පළ කරන කොට විවිධ රටවලට, ජාත්‍යන්තරයට ඔබතුමා මතු කරන්න යන අදහස කොහේවත් ඒ විධියටම පිළිගෙන නැහැ. පූජ්‍ය එල්ලාවල මේධානන්ද හාමුදුරුවන් වහන්සේ අපේ ඉතිහාසය පැහැදිලි කළා. මම නැවත එය මතක් කරන්න ඕනෑ නැහැ. නමුත් අපි තේරුම් ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ කවර හෝ රටක්, එය අසල්වාසී ඉන්දියාව වන්න පුළුවන්, නෝර්වේ වන්න පුළුවන්, ඇමෙරිකාව වන්න පුළුවන්, යූරෝපා සංගමය වන්න පුළුවන්, බටහිර කුමන හෝ රටක් වන්න පුළුවන්, අපේ රටේ ජාතිකමය ප්‍රශ්නය දඩමීමා කර ගෙන මේ රටට ඇවිත් මේ ප්‍රශ්නය තවත් අවුලෙන් අවුලට පත් කරලා අපව විවිධාකාරයට, විවිධ පැතිවලට හසුරුවලා, – ආණ්ඩුව එක පැත්තකින් විපක්ෂයේ දේශපාලන පක්ෂ එක විධියකට, කොටි සංවිධානය තව විධියකට මේ සියලු පාර්ශවයන් විවිධාකාරයට කළමනාකරණය කරලා – මේ ප්‍රශ්නය බරපතල සංකීර්ණ තත්ත්වයකට ගෙනත් දිගින් දිගටම අපේ රටේ යුද්මය තත්ත්වයක් ඇති කරමින් අනෙක් පැත්තෙන් අසාර්ථකත්වය කරා ගෙන යන්න දරන තැත අපි තේරුම් ගන්න ඕනෑ. එහෙම තේරුම් ගත්තොත් විතරයි මේ ප්‍රශ්නයට නිවැරදිව ප්‍රවේශ වන්නට අපට පුළුවන් වන්නේ. නැගෙනහිර ප්‍රදේශයේ, උතුරේ ජීවත් වන දෙමළ ජනතාව, මුස්ලිම් ජනතාව ඒ වාගේම සිංහල ජනතාව මුහුණ පාන ඇත්ත අසීරුතාවක් තිබෙනවා. මේ ඇති වුණු යුද්මය වාතාවරණය හේතුවෙන් ඒ ජනතාවට මුහුණ පාන්න වුණු ඇත්ත ප්‍රශ්න ටිකක් තිබෙනවා. උදේට කන්න, දවල්ට කන්න, රෑට නිදා ගන්න තැනක් නැති ජීවිතය පිළිබඳ බලාපොරොත්තු සුන් කර ගත් තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වය අපි කවුරුත් තේරුම් අරන් තිබෙනවා. ඒ ප්‍රශ්නය තේරුම් ගත් නිසා තමයි මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑයි කියන අවංක වුවමනාව මේ දේශපාලන ව්‍යාපාරවලට තිබෙන්නේ. ඒ අවංක වුවමනාවෙන් මැදිහත් වන කොට, ඒ ප්‍රශ්නය විසඳන්න උත්සාහ කරන කොට ඒ ප්‍රශ්නය විසඳන්න නොදී බාධා ඇති කරන්නේ, මෙ ප්‍රශ්නය යුද්මය පැත්තට – දිශානතියට – ඇද ගෙන යන්නේ වෙනත් කවුරුවත් නොවෙයි, එල්ටීටීඊ සංවිධානයයි. ඒක නිර්භයව කියන්න ඕනෑ. ඒක කියන්න භය වෙන්න ඕනෑ නැහැ. ඒ තුවක්කුවට භයේ අපි යථාර්ථය හංගන්න ඕනෑ නැහැ, ඇත්ත වසන් කරන්න ඕනෑ නැහැ. මේ රටේ ප්‍රශ්නයක් තිබෙනවා. සියලු ජාතිකත්වයන්, සියලු දේශපාලන පක්ෂ, සියලු කුලයන්, සියලු ආගම්වලට අයිති සියලු ජනතාව එකතු වෙලා මේ ප්‍රශ්නය විසඳා ගත යුතුයි. එහෙත් මේ ප්‍රශ්නය විසඳන්නට නොදෙන බාධාව තිබෙන එකම **barrier** එක වෙන කවුරුවත් නොවෙයි, මේ කොටි, මිනීමරු එල්ටීටීඊ ත්‍රස්තවාදී සංවිධානයයි. ඒ බාධාව තිබෙන තාක් කල් අපිට මේ ප්‍රශ්නය විසඳා ගන්න හම්බ වෙන්නේ නැහැ, ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ ඒ දෙමළ ජනතාව, ඔබතුමා නියෝජනය කරන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දෙමළ ජනතාව වෙනුවෙන් නිවැරදිව අවංකව වැඩ කරන්න පුළුවන් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් ඇති කර ගත්තොත් විතරයි අපි මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්න පුළුවන් වන්නේ. ඒ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව ඇති කරන්න බාධා කරන්නේ කවුද? ඒ බාධාව ඇති කරන්නේ එල්ටීටීඊ සංවිධානයයි. අන්න ඒක අපි හරියට අඳුනා ගන්න ඕනෑ. ඒ නිසා තුවක්කුවෙන් භය කරලා, ප්‍රජාතන්ත්‍රවාදය අමු අමුවේ උල්ලංඝනය කරමින් එල්ටීටීඊ සංවිධානය මේ ගෙන යන ෆැසිස්ට් යුද්මය තත්ත්වය තමයි අපි පරාජය කළ යුතු වන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, your time is up.

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ පක්ෂයේ වෙලාව තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
හොඳයි.

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)
සමහර දේශපාලන පක්ෂවලට උතුරු සහ නැගෙනහිර ප්‍රාදේශීය සභාවල ඡන්ද ලැබුණේ අඩුවෙන්ය කියලා ඔබතුමා උපහාසයට ලක් කළා. මතක් කර ගන්න, 2004 පාර්ලිමේන්තු මහ මැතිවරණය. ඒ මැතිවරණය තිබුණේ කොහොමද? යාපනය දිස්ත්‍රික්කයේ ගරු ඩග්ලස් දේවානන්ද ඇමතිතුමාට, ගරු ආනන්ද සංගරී හිටපු මන්ත්‍රීතුමාට යාපනය දිස්ත්‍රික්කයේ මැතිවරණ ව්‍යාපාරයේ යෙදෙන්නට දුන්නාද? රැස්වීම් පවත්වන්නට දුන්නාද? ජනතාව ආමන්ත්‍රණය කරන්න දුන්නාද? නැහැ. [බාධා කිරීම්]

**ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා**
*(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)*
(The Hon. M. K. Shivajilingam)
*1994 இல் கள்ள வாக்குகளின் மூலம் வந்தவர்கள் நீங்கள்!*

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)
එල්ටීටීඊ හිතවාදී නොවන කිසිදු දේශපාලන පක්ෂයකට ඒ ප්‍රදේශවල දේශපාලනය කරන්න ඉඩ තැබුවේ නැහැ, ප්‍රජාතන්ත්‍රවාදයක් තිබුණේ නැහැ. අදත් ඔබතුමා ඊපීඩීපී සංවිධානය සමහර ප්‍රාදේශීය සභාවල ලබා ගත් ඡන්ද ප්‍රමාණයන් ගැන මතු කරනවා. එල්ටීටීඊ සංවිධානය ඊපීඩීපී සංවිධානයේ ප්‍රාදේශීය සභා සභාපතිවරු, ඒ ඡන්දයට ඉදිරිපත් කළ අපේක්ෂකයෝ මහ දවාලේ අමු

[ගරු විජිත හේරත් මහතා]

අමුවේ ඝාතනය කරලා ඒ දෙමළ ජනතාවට තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී නිදහස නැති කරලා, තුවක්කුවත් එක්ක මෙහෙය වෙන ඔබතුමන්ලා නියෝජනය කරන ඒ හිතවත් දේශපාලන පක්ෂ විතරක් ඡන්දයට ගියාම ඡන්ද වැඩි වෙනවා තමයි. ඒක යථාර්ථය නොවෙයි.

**ගරු ආර්. සම්පන්දන් මහතා**
*(மாண்புமிகு ஆர். சம்பந்தன்)*
(The Hon. R. Sampanthan)

I do not want to interrupt the Hon. Member but as far as the local authority elections are concerned the Hon. Member cannot say that any such thing happened. No such thing happened in the course of the local government elections.

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

ප්‍රාදේශීය සභා මැතිවරණය, පාර්ලිමේන්තු මහ මැතිවරණය, ඔය හැම එකේම එල්ටීටීඊ සංවිධානයේ තුවක්කුව නොතිබුණාය කියනවා නම් ඒක විහිළුවක්.

**ගරු නඩරාජා රවිරාජ් මහතා**
*(மாண்புமிகு நடராஜா இரவிராஜ்)*
(The Hon. Nadarajah Raviraj)

විහිළුවක්? [බාධා කිරීම්]

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

මෙතුමන්ලාගේ පක්ෂයේ නායකතුමන්ලාව ඝාතනය කිරීම පිළිබඳව, තමන්ට අත් වුණු ඉරණම ගැනත් කල්පනා කරලා බලන්න. කවුද? ඒක කළේ? [බාධා කිරීම්] වෙන කවුද, ඒක කළේ එල්ටීටීඊ සංවිධානය නොවෙයිද? [බාධා කිරීම්] ඒ නිසා තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව කථා කළොත් බොහොම පැහැදිලිව මේකේ ඇත්ත තේරෙනවා, අනික් එක ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජන සංයුතිය, එහෙම නැත්නම් පක්ෂපාතිත්වය හෝ විරෝධය ඒකෙන් කියන්න පුළුවන් නම් ඒක වැරදියි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ –

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)

ත්‍රිකුණාමලයේ [බාධා කිරීමක්] කැමති අය ඔක්කොම එකතු කරලා ආවා.

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

ඔබතුමන්ලාගේ ජාතික සන්ධානය ලබාගත් ඡන්ද සංඛ්‍යාව 69,000යි. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය 65,000ක් ලබා ගත්තා. එක්සත් ජනතා නිදහස් සන්ධානය ඡන්ද 30,000ක් ලබා ගත්තා. ඒ දෙක එකතු කළාම 95,000යි. එතකොට අතැන 69,000යි.

**ගරු ආර්. සම්පන්දන් මහතා**
*(மாண்புமிகு ஆர். சம்பந்தன்)*
(The Hon. R. Sampanthan)

How can you add the Muslim Congress vote with your vote?

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

That is not our vote but it is not your vote also. Muslim Congress vote is not your vote. Muslim Congress votes are anti-tiger votes. They are not Tiger votes. It is not a pro-LTTE vote. It is an anti-LTTE vote.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)

කෝ යාපනයේ? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please!

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

Therefore, if you calculate the total votes of the Trincomalee District what you claim is wrong. Therefore, I emphasize it to this House. [*Interruption*]

Hon. R. Sampanthan's figures give a wrong picture of the Trincomalee District. That is not true. It is wrong. I must emphasize to this House that the total number of Muslim cargers and UPAA votes in Trincomalee is higher than the total number of TNA votes.

එම නිසා අද ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුස්ලිම් ඡන්ද සම්පන්දන් මන්ත්‍රීතුමාට පක්ෂපාතී නම්, එහෙම නම් ඇයි යාපනයේ මුස්ලිම් ජනතාව ගහලා පන්නන්නේ? මුස්ලිම් ජනතාව ඝාතනය කරන්නේ ඇයි? ගම්මාන පිටින් මුස්ලිම් ජනතාව ගහලා පන්නන්නේ ඇයි? යාපනයේ විතරක් නොවෙයි. මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලයේ දෙමළ භාෂාව කථා කරන මුස්ලිම් ජනතාව අමු අමුවේ ඝාතනය කරන්නේ ඇයි? They speak Tamil. නමුත් ඒ අයව එහෙම පැන්නුවේ, ඒ අයව අමු අමුවේ ඝාතනය කළේ ඒ අයගේ ඉඩම් පවරා ගන්න. වෙනම තමන්ගේ නිජභූමිය කියන මේ බොරු සංකල්පය, ඊනියා නිජභූමි සංකල්පය බලහත්කාරයෙන් තහවුරු කරන්න. නැහැ, එහෙම තහවුරු කරන්න බැහැ. ඉතිහාසයේ සාක්ෂි තිබෙනවා. ඒ උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල කොහොමද වෙහෙර විහාර තිබුණේ? අනිකුත් ආගම්වල, එහෙම නැත්නම් යාපනයේ මුස්ලිම් පල්ලිය තිබුණේ කොහොමද කියන එකට නටබුන් තිබෙනවා, සාක්ෂි තිබෙනවා. ඒ නිසා මුස්ලිම් ජනතාව ඒ ප්‍රදේශවලින් පන්නලා තුවක්කුව පෙන්නලා බලහත්කාරයෙන් මේ ප්‍රදේශ "අපේ නිජභූමිය" කියා ඒ අය පෙන්වන්න හදනවා නම් ඒක කවදාවත් ඉෂ්ට වන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒ නිසා මේක දෙමළ විරෝධයක් නොවෙයි, මේක දෙමළ ජනතා විරෝධයක් නොවෙයි. සම්පන්දන් මන්ත්‍රීතුමා හරියට තේරුම් ගන්න. මේක පැසිස්ට්වාදී එල්ටීටීඊ මිනී මරු ත්‍රස්තවාදී සංවිධානයට තිබෙන විරෝධය. [බාධා කිරීම්] ඒ මිනීමරු ත්‍රස්තවාදී එල්ටීටීඊ තුවක්කුවට විරුද්ධව නඟන හඬක්, මේක. [බාධා කිරීම්] එදා 2004 මැතිවරණය පිළිබඳව කවුද කිව්වේ? 2004 මෙතුමන්ලාගේ නියෝජනය, මෙතුමන්ලා පාර්ලිමේන්තුවට ආව එක ගැන බලන්න. ඒ ආව එකත් අද ප්‍රශ්නයක්. අද ඒ සම්බන්ධව උසාවියේ ප්‍රශ්නයක් තිබෙනවා. එල්ටීටීඊ තුවක්කුව පාවිච්චි කර දෙමළ ජනතාවගේ ඡන්දය දීම වළක්වා තිබෙනවා. ජාත්‍යන්තර නිරීක්ෂණ කමිටුවට යුරෝපා සංගමයෙන් පැමිණ ජෝන් කැෂ්නහාන් 2004 මැතිවරණය පිළිබඳ ඉදිරිපත් කළ මැතිවරණ වාර්තාවේ බොහොම පැහැදිලිව සඳහන් කළා, එල්ටීටීඊ සංවිධානයේ තුවක්කුව පාවිච්චි වී තිබෙන හැටි. මේ හඬවල්, එල්ටීටීඊ එක වෙනුවෙන් කථා කරන මේ හඬවල් පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන විධියත් ප්‍රශ්නයක්. ඒ නිසා ඒවා මතක් කර ගන්න ඕනෑ. තමන්ව ඒතැනට එවන්න උදවු කරපු මේ හඬවල් එල්ටීටීඊ එක වෙනුවෙන් කථා කරන එක පිළිබඳව මේ සභාවට හොඳට තේරුම් ගන්න පුළුවන් කියලයි මම හිතන්නේ.

ඔබතුමා මතක් කළා, ඉන්දියාවේ සියයට 2ක් වන සික් ජනතාව නියෝජනය කරමින් ඉන්දියාවේ ජනාධිපතිවරයා බවට පත් වී සිටින මන් මෝහන් සිං පිළිබඳව.

**ගරු ආර්. සම්පන්දන් මහතා**
*(மாண்புமிகு ஆர். சம்பந்தன்)*
(The Hon. R. Sampanthan)

Prime Minister.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

Prime Minister. අගමැතිවරයා බවට පත් වී සිටින සික් ජාතික නියෝජිතයා පිළිබඳව. ඔව්. ඒක බොහොම හොඳ තත්ත්වයක්. අපි කවුරුත් අපේක්ෂා කරන්නේ ලංකාවෙත් එහෙම තත්ත්වයක් ඇති කර ගන්න. එහෙම තත්ත්වයක් ඇති කර ගන්න තමයි ලංකාවේ දේශපාලනයේ ඉහළම භූමිකාවක නිරත වුණු නීලන් තිරුචෙල්වම්, ඒ වාගේම ලක්ෂ්මන් කදිර්ගාමර් ඒ දෙමළ ජාතිකත්වයන්, ඒ දෙමළ නියෝජිතයන් [බාධා කිරීමක්] ජනතා විමුක්ති පෙරමුණේ අපි 2004 මැතිවරණයේදී මේ රටේ අගමැති කරන්න කියා නම් කළ කෙනා දෙමළ ජාතිකයෙක්.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
පුළුවන් වුණාද?

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
බැරි වුණා, තමුන්නාන්සේලාගේ තුවක්කුව නිසා. හැබැයි, අපි ඒ තුවක්කුව නිසා යට වුණු ඒ යථාර්ථය, ඒ තත්ත්වය වෙනස් කරන්න ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ උපරිම වශයෙන් මැදිහත් වෙනවා. සම්පන්දන් මන්ත්‍රීතුමා හිතනවා නම් කදිර්ගාමර් ඒ දෙමළ ජාතික නායකයා ඝාතනය කර තමන්ගේ එල්ටීටීඊ තුවක්කු වුවමනාව ඉෂ්ට කර ගන්න, නැහැ, ඒකට ඉඩ තියන්නේ නැහැ. ඒක කවදාවත් වන්නේ නැහැ. ඒක සිහිනයක් විතරයි. ඒ නිසා අපේ රටෙත් අපට හාපුරා කියා සතුටු වන්න පුළුවන් දෙමළ ජාතික රාජ්‍ය නායකයෝ – ජාතික නායකයෝ – බිහි කර ගන්න තිබුණා.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
කරන්න බැහැ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
එහෙම බිහි කර ගන්න පුළුවන්. ඒක බිහි කරන්න පුළුවන් වන්නේ මෙන්න මේ කියන තිවට තියාලු හඬ නතර කරන්න පුළුවන් දවසට, තුවක්කුවට හයේ හඬ නහන මේ තිවට තියාලු හඬ නතර කළ දවසට.

පොන්නම්බලම් මන්ත්‍රීතුමා සිවාජිලිංගම් මන්ත්‍රීතුමාට උදාහරණයක් කිව්වා. කළුවර කාමරයේ ඉඳලා කළු පූසා අල්ලන්න යනවාය කියලා. හැබැයි, කළුවර කාමරයේ කළු පූසා ඉන්න විට කළු පූසාගේ ඇස් දෙක අපට පෙනෙනවා. ඒ නිසා ඒක වහන්න බැහැ. ඒ කළු පූසා අල්ලා ගන්න පුළුවන් ඒ අඳුරු කාමරයේ ඉඳලා වුණත්. [බාධා කිරීම්] ඒ නිසා උදාහරණය ගන්න විට -[බාධා කිරීමක්] පූසාගේ ඇස් දෙකෙන් අපට කියන්න පුළුවන් පූසා ඉන්නේ කොහේද කියලා. පූසාට පේන්නෙ නැති නිසා තමයි මේ අමන මිලේච්ඡ වැඩ කරන්නේ. පූසාට හරියට පෙනෙනවා නම් මේ මිලේච්ඡ වැඩ කරන්නේ නැහැ, ඒ බලල් වැඩ කරන්නේ නැහැ. හැබැයි, කවදා හරි දවසක මේ එළිය තිබෙන තැන අපි දන්නා නිසා අඳුරේ කොච්චර ඉන්න හැදුවත් ඒක අල්ල ගන්නා පුළුවන් විධි, ක්‍රම අපි දන්නවා.

අපි කවුරුත් කැමතියි, ඉන්දියාවේ සික් ජාතිකයෙක් අගමැතිව සිටිනවා වාගේ ලංකාවේ සුළු ජාතික නියෝජනයක් ලංකාවේ ජාතික නායකත්වයට පත් වෙනවාට. කිසි ගැටලුවක් නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවදාවත් වන්නේ නැහැ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඒ තත්ත්වය ඇති කරන්න පුළුවන්. ඒ තත්ත්වය ඇති කරන්න බැරි මෙන්න මේ එල්ටීටීඊ ජාතිවාදී තුවක්කුව නිසායි. මේ ජාතිවාදය නැති කළ දවසට මේ රටේ නියම ජාතික සමගිය ඇති කරන්න පුළුවන්. ඒක ස්ථිරව කරන්න පුළුවන්.

අනික් පැත්තෙන් ඔබතුමා මතු කරන්න හැදුවා, "මේ දෙමළ ජාතිකත්වයන්ට කිසිදු නියෝජනයක් නැහැ, අපට සලකන්නේ නැහැ" කියා. ත්‍රිකුණාමලයේ සංවර්ධන කටයුතු සඳහා ගිය [බාධා කිරීම්] ඇත්ත ඇති ඒවා අපි ඇත්ත විධියට පිළිගන්නවා. හැබැයි, බොරු කියන්න දෙන්න බැහැ, මේ සභාවට. ත්‍රිකුණාමලයේ විශේෂයෙන්ම මේ එල්ටීටීඊ ප්‍රහාර නිසා, – යුදමය තත්ත්වය නිසා නොවෙයි – ඒ ගම්මානවල ජනතාවට මුහුණ දෙන්න වී තිබෙන ප්‍රශ්න සලකා බලන්න ආණ්ඩුවේ නියෝජිත මහත්වරු, ජනතා විමුක්ති පෙරමුණේ අපි. ජාතික හෙළ උරුමයේ නියෝජිතයෝ ත්‍රිකුණාමලයට ගියා. ඔබතුමා කිව්ව ඔය ත්‍රිකුණාමලයේ කච්චේරියට මමත් ගියා. හැබැයි, ඔබතුමා කිව්වේ, ඔබතුමාට ආරාධනා කළේ නැහැයි කියායි. ඒක පට්ටපල් බොරු. මේ ගරු සභාව, ලෝකය නොමඟ යවන්න කරන ඒවා. [බාධා කිරීම්]

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
I challenge the Hon. Member. He is not there. [*Interruption*]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Do not interrupt my speech. Hon. Sampanthan, you are a politician. [*Interruption*] I respect you. [*Interruption*] Do not disturb me. [*Interruption*] As a senior politician do not disturb me. [*Interruption*]

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
It is a bloody lie.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please!

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
This is the letter. [*Interruption*]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා වාඩි වෙලා ඉන්න. ඔබතුමාගේ වෙලාවේදී කවුරුත් බාධා කළේ නැහැ නේ. [බාධා කිරීම්]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
This is the letter which was sent by the GA of the Trincomalee District. [*Interruption*] I will read it.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please !

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

This is the letter. [*Interruption*]

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

How did you get it?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Chandrasekaran, please take your seat.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මේ ලිපියේ ආරම්භයේම තිබෙන්නේ, මුලින්ම ආමන්ත්‍රණය කර තිබෙන්නේ එතුමාටයි. ඒ Hon. R. Sampanthan, MP. කියලයි. දෙවෙනියාට තිබෙන්නේ, Hon. K. Thurairetnasingam කියලයි. තුන්වෙනියට තිබෙන්නේ, Hon. Jayantha Wijesekara කියලයි. ඊළඟට Mr. M. K. A. D. S. Gunawardena, Mr. Nimal Gamini Hewawitharana, Secretary to the Hon. Governor යනුවෙන් සඳහන්ව තිබෙනවා. ඒ ලිපියේ මෙසේ සඳහන් වෙනවා. [බාධා කිරීම්]

"Dear, Sir,

Committee of the Development of Problematic Areas- Trincomalee District

The special Committee meeting on the Development of Problematic Areas in the Trincomalee District will be scheduled to held on 02.07.2006 at 10.00 a.m. at the new conference hall Kachcheri, Trincomalee on the instruction given by the Presidential Secretariat and Chaired by the Hon. Dilan Perera, Deputy Minister of Justice and Law Reforms.

You are kindly invited to attend for this meeting and it is greatly appreciated your co-operation in this regard please.

Government Agent/District Secretary, Trincomalee District." - [*Interruption*]

I will table* this letter. I appeal to you to include it in Hansard.

ඒ නිසා ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, මේ ගරු සභාව නොමඟ යවන්න හදන්න එපා. ලෝකය නොමඟ යවන්න හදන්න එපා. ජාත්‍යන්තරයට බොරු කථාන්දර කියන්න ලෑස්ති වෙන්න එපා . [බාධා කිරීම්] සිවාජිලිංගම් මන්ත්‍රීතුමා [බාධා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Chandresekaran, please sit.

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

No, no. We never received it. [*Interruption*]

ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා
(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)
(The Hon. M. K. Shivajilingam)

After your speech, after that lecture, I will make a speech. [*Interruption*]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

Yes. That is your right.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Mr. Deputy Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தமாந்தார்கள்*

*Whereupon* MR. DEPUTY CHARIMAN OF COMMITTEES l*eft the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි -

ගරු කේ. ඩී. ලාල්කාන්ත මහතා
(மாண்புமிகு கே. டீ. லால்காந்த)
(The Hon. K. D. Lalkantha)

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න. [බාධා කිරීම්]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

You can deliver your speech after my speech. That is your right. This is my right. I want to protect my rights. That is our right. [*Interruption*]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Ratnayake)

ඉස්සෙල්ලා කථාව අහගෙන ඉන්න. [බාධා කිරීම්]

ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)

Do not tell lies in this House

---

**කථාව අවසානයේ පළ කර ඇත.*
*உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
*Produced at end of speech.*

ගරු බිමල් රත්නායක මහතා
*(மாண்புமிகு பிமல் ரத்நாயக்க)*
(The Hon. Bimal Ratnayake)

තමුන්නාන්සේලා තරම් අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැහැ. කථාව අහගෙන ඉන්න, පළමුවෙන්ම. [බාධා කිරීම්] සම්පන්දන් මන්ත්‍රීතුමාට පැය 2ක් කථා කරන්න පුළුවන් නම් [බාධා කිරීම්] වාඩි වන්න.

ගරු විජිත හේරත් මහතා
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

දෙමළ ජනතාවගේ අයිතීන් ගැන කථා කරන්න නම්, මේ ගරු සභාවට ඇත්ත හෙළි කරන කොට ඒක අහගෙන ඉන්න පුළුවන් විනයක් මේ මන්ත්‍රීවරුන්ට තිබෙන්න ඕනෑ. ඒක නැහැ. [බාධා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
*(மாண்புமிகு பிமல் ரத்நாயக்க)*
(The Hon. Bimal Ratnayake)

ඉස්සෙල්ලා කථාව අහගන්න. [බාධා කිරීම්]

ගරු විජිත හේරත් මහතා
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

If it is a lie you can take your time to give the truth to the House. අද කලබල වෙලා තිබෙනවා. පැයයි. විනාඩි 22ක් එතුමා කතා කළා. මේ ගරු සභාවේ කිසි කෙනෙක් එතුමාට බාධා කළේ නැහැ. ඒක තමයි, සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන නියම තත්ත්වය. අද උදේ අපි ඒක ඔප්පු කරලා පෙන්වූවා. හැබැයි, මේ විධියට බලහත්කාරයෙන් තර්ජනය කරලා, බලපෑම් කරලා එහෙම වැරදි වරප්‍රසාදයක් ගන්න ඉඩ තබන්නේ නැහැ. ඒවා අයිතීන් නොවෙයි. ඒකට අපි භය වන්නේ නැහැ. මේ රටේ ජනතාව ඒකට භය නැහැ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මේ උතුරු-නැගෙනහිර (බාධා කිරීම්) අද මේ විධියට ඒකාබද්ධ කිරීම [බාධා කිරීම්] එදා ඉන්දු - ලංකා ගිවිසුම අනුව උතුරු - නැගෙනහිර ඒකාබද්ධ කිරීම, ඒ හරහා මතු වී තිබෙන ප්‍රශ්න [බාධා කිරීම්] එක්සත් ජාතික පක්ෂයේ සරත් රණවක -

ගරු කේ. ඩී. ලාල්කාන්ත මහතා
*(மாண்புமிகு கே. டீ. லால்காந்த)*
(The Hon. K. D. Lalkantha)

සම්පන්දන් මහත්මයා, මතක තබා ගන්න, තමුන්නාන්සේලාටත් අපි නිදහසේ කථා කරන්ට දෙන්නේ නැහැ. හරිද? මේ කථාවට බාධා කළොත් තමුන්නාන්සේලාටත් අපි අයේ මෙහෙ නිදහසේ කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු නඩරාජා ඉරවිරාජ් මහතා
*(மாண்புமிகு நடராஜா இரவிராஜ்)*
(The Hon. Nadarajah Raviraj)

නැහැ, කමක් නැහැ. [බාධා කිරීම්]

ගරු කේ. ඩී. ලාල්කාන්ත මහතා
*(மாண்புமிகு கே. டீ. லால்காந்த)*
(The Hon. K. D. Lalkantha)

සම්පන්දන් මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ පැය එකහමාරක් කථා කළා. කවුරුවත් එක වචනයකින්වත් බාධා කළේ නැහැ. ඒක මතක තබා ගන්න [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

කරුණාකර ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ කථාව කරගෙන යන්න එතුමාට ඉඩ දෙන්න. කරුණාකර නිශ්ශබ්ද වන්න [බාධා කිරීම්]

ගරු විජිත හේරත් මහතා
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උතුරු නැඟෙනහිර ඒකාබද්ධ කිරීම පිළිබඳ කාරණයත් මේ සභාවේ මතු වුණා. දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා පළාත් සභා ක්‍රමය ආවා. ඒ පළාත් සභා ක්‍රමය ගෙනෙන කොට කිව්වේ මේ රටේ ජාතික ප්‍රශ්නය විසඳනවා යි කියලයි. ඒ සඳහා තමයි පළාත් සභා ගෙනෙන්නේ කියලා කිව්වා. ජනතා විමුක්ති පෙරමුණේ අපි එදා දුර දැකලා එය ගෙනෙන්න කලින් බොහොම පැහැදිලිව කිව්වා, මේ පළාත් සභාවලින් ජාතික ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ යි කියලා. අවුරුදු ගණනකට පසුව දසක දෙකකට පසුව මේ රටේ ජනතාවට එදා අපි කියපු දේ පළාත් සභාවලින් මේ ජාතික ප්‍රශ්නය විසඳන්නට බැහැ යි කියන එක – අද පිළිගන්නට සිදු වෙලා තිබෙනවා. – ඒකෙන් ඇති වුණු හානි දායක තත්ත්වය අද අපට කථා කරනවා.

ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා
*(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)*
(The Hon. Suresh Premachandran)

Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

What is the point of Order.

ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා
*(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)*
(The Hon. Suresh Premachandran)

We do not hear the interpretation, Sir.

ගරු විජිත හේරත් මහතා
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

Please, press your button. [බාධා කිරීම්]

ගරු කේ. ඩී. ලාල්කාන්ත මහතා
*(மாண்புமிகு கே. டீ. லால்காந்த)*
(The Hon. K. D. Lalkantha)

අපේ ඒවා ඇහෙනවා නේ. එයාලාගේ ඒව විතරක් මොකද දන්නේ නැහැ ඇහෙන්නේ නැත්තේ?

ගරු විජිත හේරත් මහතා
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

You are wrong, Hon. Premachandran. The interpretation is there. – [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

Hon. Devananda, would you, please, allow Hon. Herath to speak? – [*Interruption.*]

ගරු විජිත හේරත් මහතා
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව එවකට හිටපු රාජ්‍ය නායක, ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන – [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩි පහයි ඔබතුමාට තිබෙන්නේ. පක්ෂයට තිබෙන්නේ තව විනාඩි පහයි. [බාධා කිරීම්]

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

මම ස්තුතිවන්ත වෙනවා, මගේ කථාව අහන්න කන් දෙක ශුද්ධ කරගෙන interpretation එක පාවිච්චි කරන්නට එතුමා නිහතමානී වීම ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උතුරු නැඟෙනහිර ඒකාබද්ධ කිරීම ගැන එදා ජූනියස් රිචඩ් ජයවර්ධන ජනාධිපතිතුමා ගත්තේ අත්තනෝමතික, වැරැදි, මෝඩ, තකතීරු තීන්දුවක්. ඒ තීන්දුව නිසා අද මුන්නැහෙලා ඔප්පු කරන්නට හදනවා, ත්‍රිකුණාමලයේ සිටින්නේ දෙමළ ජනතාව විතරයි කියලා. මේ ගරු සභාවේ කාටත් තේරුම් ගියා, එතුමන්ලාට වැඩියෙන්ම කේන්ති ගියේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජන සංයුතිය ගැන කියන කොටයි කියලා. මෙතුමන්ලාට ලැබුණේ ඡන්ද 69,000යි; ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයෙයි එක්සත් ජනතා නිදහස් සංධානයෙයි ඡන්ද එකතු කළාම 95,000ක් වෙනවා කියලා කියපුවම කේන්ති ගියා. ප්‍රශ්නය පටන් ගත්තේ එතැනින්. ඇයි? මේ ජන සංයුතිය ඇත්ත ජන සංයුතියක්. අම්පාරේ තත්ත්වය මීට වෙනස්. මඩකලපුවේ තත්ත්වය මීට වෙනස්. ඒ අනුව ඒ අයගේ මේ ''නිජභූමිය'' ප්‍රතික්ෂේප වෙනවා. මෙ නිජභූමි සංකල්පය ප්‍රතික්ෂේප වෙනවා දිකින කොට, තමන්ගේ ආධිපත්‍ය නැති වෙනවායි කියන එකට කරුණු එන කොට එතුමන්ලාට කේන්ති ගියා. බොහොම පැහැදිලියි, කේන්ති ගියේ කොතැනද? ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මෙතුමන්ලා ගත්තු ඡන්දවලට වඩා වැඩියි, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් එකයි, සන්ධානයයි ගත්තු ඡන්ද ටික කියලා කියන කොට, ඒකට කේන්ති ගියා. [බාධා කිරීම්] ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒක තමයි එහි ඇත්ත තත්ත්වය. මුස්ලිම් සහ සිංහල ජන සංයුතියක් මේ ත්‍රිකුණාමලයේ තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)

නිජබිම ඉවරයි!

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

ඒ නිසා ''නිජභූමිය'' කියන එක බොරු. උතුර සහ නැඟෙනහිර ඒකාබද්ධ කිරීම හරහා මේ නිජභූමියට පාර කපා ගෙන, නිජභූමිය තවත් තහවුරු කරගෙන, වෙනම ඊළාම් රාජ්‍ය හදන්නටයි මේ උදවිය යන්නේ. ඒක තමයි ජේ. ආර්. ජයවර්ධන මහත්මයා ඉන්දු-ලංකා ගිවිසුමට යටත් වෙලා කරලා දුන්නේ. එදා ජූනියස් රිචඩ් ජයවර්ධන ජනාධිපතිවරයා වැරැදි විධියට පනත් වෙනස් කළා. [බාධා කිරීම්] මා ළඟ තිබෙනවා, –

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

Hon. Members, could you please take your seats? We only allow one speaker at a time.

**ගරු විජිත හේරත් මහතා**
*(மாண்புமிகு விஜித ஹேரத்)*
(The Hon. Vijitha Herath)

මේ, 1988 පළාත් සභා පනත. පළාත් සභා පනතක් වෙනස් කරන්නට පුළුවන් වෙන්නේ පාර්ලිමේන්තුවේ අනුමැතියකින් විතරයි. හැබැයි, ජූනියස් රිචඩ් ජයවර්ධන එදා ගැසට් නිවේදනයකින් ඒ පනතත් වෙනස් කරලා තිබෙනවා. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා එදා වැරැදි විධියට, අත්තනෝමතික විධියට උතුරු-නැඟෙනහිර ඒකාබද්ධ කිරීමට අදාළව ඒ අවශ්‍ය කරන කටයුතු කර තිබෙනවා. පනතක් වෙනස් කරන්නට පාර්ලිමේන්තුවට සංශෝධනයක් ගෙන එනවා වෙනුවට, ගැසට් නිවේදනයක් මගින් එය වෙනස් කරලා තිබෙනවා. ඒ තමයි පරිපාලනය අවුල් වෙලා තිබෙන හැටි. නැඟෙනහිර ජීවත් වන එල්ටීටීඊ විරෝධී සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව බලහත්කාරයෙන් ඒ පළාත්වලට පවරා ගන්න මේ උතුරු - නැඟෙනහිර ඒකාබද්ධ කිරීම පාවිච්චි කරන්න හදනවා. ඒක වැරැදියි. ඒක වෙනස් විය යුතුයි. [බාධා කිරීම්] ඒ ඊනියා නිජභූමිය කියන තත්ත්වය නැති කරන්න – [බාධා කිරීම්] ඒ වෙච්ච පරිපාලන වැරැද්ද, අවුරුද්දකින් ජනමත විචාරණයක් තියනවාය කියලා සම්මත කර ගත් ඒ තත්ත්වය, ඒ ගැසට් නිවේදනය, ජනාධිපතිවරයාගේ ඒ නියෝගය වැරැදියි. ඒ නිසා තමයි අද මේ ප්‍රශ්නය තව තවත් අවුල් වෙලා තිබෙන්නේ. ත්‍රිකුණාමලයේ මුස්ලිම් ජනතාව පලවා හරින්න, අම්පාරේ මුස්ලිම් ජනතාව පලවා හරින්න, එහෙම පළවා හැරලා ඒ ප්‍රදේශවල තිබෙන ආගමික සිද්ධස්ථාන, ඒ ඓතිහාසික නටබුන් විනාශ කරලා තමන්ගේ ඓතිහාසික භූමියක් කියලා ඉතිහාසමය වැරැදි කරුණු ගෙනල්ලා මේ සභාවට ඔප්පු කරලා, උතුරු නැඟෙනහිර තමන්ගේ කියලා ලෝකයට කියන්න හදන දේ වැරැදියි. ඒක වෙනස් කරන්න ඕනෑ. ඒක වෙනස් කරන්න පුළුවන්. උතුර සහ නැඟෙනහිර වෙනම පළාත් සභා දෙකක් විධියට 1987 දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ස්ථාපිත කළා. පළාත් සභා ක්‍රමය වැරදි වෙන්න පුළුවන්. ඒකට අපේ අනුමැතියක් නැති වෙන්න පුළුවන්. හැබැයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කරපු දේ වැරදි විධියට, අත්තනෝමතික විධියට පාවිච්චි කරන එක නතර කරන්න ඕනෑ. නැඟෙනහිර, නැඟෙනහිර ජනතාවට අයිතියි. නැඟෙනහිර දෙමළ ජනතාව ප්‍රභාකරන්ගේ තුවක්කුවට යට වෙන්න කැමති නැහැ. ප්‍රභාකරන්ගේ තුවක්කුව නැති වෙච්ච දවසට, ඒ තුවක්කුව යට කර ගත්ත මොහොතක නැඟෙනහිර අහිංසක දෙමළ පුරවැසියෝ නැඟිටිනවා. එදා කරුණා නැඟිටපු වෙලාවේ, කරුණා එළියට බැහැපු වෙලාවේ නැඟෙනහිර අහිංසක අම්මලා, තාත්තලා, සීයලා පාර බැහැලා ප්‍රභාකරන්ගේ පින්තූර ගිනි තියලා, පුච්චලා, පාගලා, ඒකට ඉලපතෙන්, කොස්සෙන් ගහලා තමන්ගේ විරෝධය පෙන්නුවා. ඒක තමයි නැඟෙනහිර දෙමළ ජනතාව ඇත්තෙන්ම ඉල්ලා සිටින දේ.

ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න, නියම සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න නැඟෙනහිර ප්‍රදේශය උතුරෙන් වෙන් කරන්න ඕනෑ. ඒ නියමානුකූල වෙන් කිරීම කරන්න ඕනෑ. ඒ වෙන් කිරීම සඳහා අපි මැදිහත් වෙනවා. ඒ නිසා සිවාජිලිංගම් මන්ත්‍රීතුමන්ලාට ඒක වළක්වන්න බැහැ.

අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සම්පන්දන් මන්ත්‍රීතුමා මේ යෝජනාව හරහා ලෝකයට කියන්න හදපු ප්‍රලාපය – ඒක සම්පූර්ණ ප්‍රලාපයක් – සම්පූර්ණයෙන්ම නිශේධනය කරනවා. ඇත්ත වගඋත්තරකාරයෝ කවුරුවත් නොවෙයි, එල්ටීටීඊ සංවිධානයයි. එල්ටීටීඊ සංවිධානයේ මිනීමරු ක්‍රියාවලිය ඇතුළේ තමයි උතුරු නැඟෙනහිර මේ තත්ත්වය ඇති කරලා තිබෙන්නේ. එල්ටීටීඊ සංවිධානයේ ම්ලේච්ඡ ත්‍රස්තවාදය පැරැද්දවීමෙන් තමයි උතුරේත්, නැඟෙනහිරත්, රටේමත් ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් සාමාන්‍ය සිවිල් පුරවැසියන්ට කොන්ද කෙළින් තියා ගෙන ජීවත් වෙන්නට පුළුවන් තත්ත්වයක් ඇති කරන්නේ. ඒ ඇති කිරීම සඳහා මේ ගරු පාර්ලිමේන්තුවේ සහ මේ රටේ ජනතාව නොබියව, නොසැලී නැඟී සිටිය යුතු බව පවසමින් මා මගේ කථාව අවසන් කරනවා.

**සභා මේසය මත තබන ලද ලිපිය :*
*சபாபீடத்தில் வைக்கப்பட்ட கடிதம் :*
*Letter tabled :*

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති හා දිස්ත්‍රික් ලේකම්**
*திருகோணமலை மாவட்ட அரசாங்க அதிபரும் மாவட்ட செயலாளரும்*
Government Agent & District Secretary, Trincomalee District
KACHCHERI, FORT FREDRICK, TRINCOMALEE

| | |
|---|---|
| Hon. Najeep A Majeed | – Minister of Cooperative Development & Deputy Minister of Local Government & Provincial Council. |
| Hon. R. Sampanthan | – MP |
| Hon. K. Thurairatnasingam | – MP |
| Hon. Jayantha Wijesekara | – MP |
| Mr. M.K.D.S. Gunawardana | – Chairman-Sugar Corporation, Kanthale |
| Mr. Nimal Gamini Hewawitharana | – Organizer of SLFP, Trincomalee Secretary to the Hon. Governor |

Dear Sir,

*Committee of the Development of Problematic Areas - Trincomalee District*

The special committee meeting on the **Development of Problematic Areas** in the Trincomalee District will be scheduled to held on 02.07.2006 at 10.00 a.m. at the new conference hall Kachcheri, Trincomalee on the instruction given by the Presidential Secretariat and Chaired by the Hon. Dilan Perera - Deputy Minister of Justice of Justice and Law Reforms.

You are kindly invited to attend for this meeting and it is greatly appreciated, your cooperation in this regard please.

| | |
|---|---|
| W.A.S.B. Amarathunga, | Sgd. Major General T.T.R. De SIlva |
| Addl. Government Agent/ | Government Agen/ |
| Addl. District Secretary, | District Secretary. |
| Trincomalee District. | Trincomalee District. |

[අ. භා. 2.21]

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා සහ ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
*(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சுதேச மருத்துவத்துறை அமைச்சரும் மத அலுவல்கள் பிரதி அமைச்சரும்)*
(The Hon. Tissa Karalliyadde - (Minister of Indigenous Medicine and Deputy Minister of Religious Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගේ අදහස් ප්‍රකාශ කිරීමෙන් පසුව මටද අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

මේ පාර්ලිමේන්තුවේ ඉන්න ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයකු වන ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවක් තමයි අද මේ විවාදයට භාජනය කරලා තිබෙන්නේ. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු හැටියට දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඒ කාල වකවානුව තුළදීත් ඔබතුමන්ලා මේ ප්‍රශ්නය ගැන අදහස් හුවමාරු කර ගන්නට ඇති. සමහර විට ඔබතුමා අද දරන මතයට වඩා වෙනස් මතයක එදා හිටියාද කියන කාරණයක් මට අහන්න වෙනවා. කෙසේ නමුත් ඔබතුමා දැන් එක්තරා මතයකට ඇවිත්. අපි ඔබතුමාගේ කථාව බොහොම නිහඬව අසා ගෙන හිටියා. ඉන්දියාවේ ජනාධිපති, අගමැති, වෙනත් ජාතිකයන් කියන කථාව අපි අහගෙන හිටියා. දැන් ඔබතුමා මේ උත්තරීතර සභාවේ හූවකුත් කිව්වා. ඔබතුමා අතින් ඉබේම ඒක කියැවුණා. ඒ වාගේම ඔබතුමාගේ කණ්ඩායමෙනුත් අද ඒ වාගේ හූවක් කියැවුණා. මෙහෙම කියනවාට සමා වෙන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අහලා තිබෙන්නේ කොටියා ගොරවනවා කියලයි. නමුත් හම පොරවා ගත්ත කොටින්ගේ ගතිය, නරි ගතිය අද පෙන්නුම් කළා. තමුන්නාන්සේලාගේ ම වර්ගයේ නායකයෙක් එක්කයි අඩ දබර වුණේ. මෙතුමා අවස්ථා කිහිපයකදී ම වෙඩි පහරවලට ලක් වෙමින්, ජීවිතය බේරා ගෙන අදටත් ජීවිත පරිත්‍යාගයෙන් යාපනයට ගිහින් එතුමාගේ ශක්ති ප්‍රමාණයෙන් ජනතාවට සේවයක් කරනවා. ඒ ගැන අප ආඩම්බර වෙනවා, එතුමාට ආශිර්වාද කරනවා. [බාධා කිරීමක්] *கொஞ்சம் நில்லுங்கோ, சின்னன்னை !* Do not disturb me. අප ඔබතුමන්ලාටත් කියන්නේ, මෙන්න මේ විධියට මහජන සේවාව සඳහා එකට ගොනු කිරීමක් අවශ්‍ය වී තිබෙන බවයි. ඉතිහාසය පුරා ගත්තාම, දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්, දිවංගත ඩඩ්ලි සේනානායක ශ්‍රීමතානන්, දිවංගත චෙල්වනායගම් මැතිතුමන්ලා සමඟ යම් ගිවිසුමක් ඇති කර ගෙන ආවා. 1956 යුග පෙරළියත් සමඟ – අදට වසර පනහක් වෙනවා. – මේ තර්ක විතර්කය, මේ ප්‍රශ්නය දෝලනය වෙලා අමුතු ආකාරයකට විසිතුන් අවුරුදු යුද්ධයකට යුද්ධමය වාතාවරණයක් කරා රට ගෙනැවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියාවේ වගේ අගමැති කෙනෙක්, ජනාධිපති කෙනෙක් වෙනත් ජාතියකින් පත් වෙනවාට – සුළු ජාතිකයෙක් පත් වෙනවාට – අපත් කැමති යි කියා, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කියන කොට, ගරු සම්පන්දන් මන්ත්‍රීතුමාට හූවක් කියැවුණා. ඒ කියන්නේ, මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැතිව හැම දාම මෙහෙම තිබේය කියන එක ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා බලාපොරොත්තු වෙනාව. [බාධා කිරීමක්] ඒක මගේ වැරදි වැටහීමක් නම් මට සමාවෙන්න.

මා අද උදේ සිටම මේ යෝජනාව සම්බන්ධයෙන් කෙරුණු තර්ක විතර්ක අහගෙන හිටියා. [බාධා කිරීමක්] එහෙම නොවෙයි අප උත්සාහ කරන්නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට මට දවසක් උපදෙස් දී තිබෙනවා. පාර්ලිමේන්තුවේ කෑ ගහන්න එපා ය කියා. ඔබතුමා මට උපදෙස් දී තිබෙනවා. අපේ රට ඉන්දියාවත් එක්ක සංසන්දනය කරන්නට බැරිය කියන එක තමයි ඔබතුමා "හූ" කිව්ව එකෙන් තේරෙන්නේ. මමත් "හූ" කියන්නේ නැතිව කියන්නේ, – මේ පුංචි කොළ කැල්ලක ලියා තිබෙන්නේ ඉන්දියාවට අවුරුදු පනහක් ගිහින් ඒ තත්ත්වයට පත් වුණා නම්, ඒ තත්ත්වයට පත් වන්නට අපට අවුරුදු සියයක්වත් යනවාය කියලායි. ඒ තත්ත්වයට පත් වන්න, මේ රටේ මේ ගමන ආපු තාක් කල් විවිධ දේශපාලන නායකයින් ඝාතනය කළා. ප්‍රශ්නය විසඳුණාද? තමිල් සෙල්වන් ය කියන්නේ, අප ගරු කළ මන්ත්‍රීවරයෙක්. අපේ එහෙම භේදයක් තිබුණේ නැහැ. [බාධා කිරීමක්] ඇයි හිනහ වෙන්නේ?

**ගරු ටී. මහේස්වරන් මහතා**
*(மாண்புமிகு ரீ. மகேஸ்வரன்)*
(The Hon. T. Maheswaran)

තමිල් සෙල්වන් මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙක් නොවෙයි.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
*(மாண்புமிகு திஸ்ஸ கரலியத்த)*
(The Hon. Tissa Karaliyadde )

සමා වෙන්න. අපේ නීලන් තිරුචෙල්වම් මැතිතුමා ගැනයි මම කිව්වේ. තමිල් සෙල්වනුත් මේවා තේරුම් ගෙන සමහර විට පාර්ලිමේන්තුවට ඇවිත් වාඩි වේවිද කියා කවුද දන්නේ? එතුමන්ලාත් අද විදේශ ගත වෙනවා. [බාධා කිරීමක්]

**ගරු එම්. කේ. ඊලවේන්දන් මහතා**
*(மாண்புமிகு மா. க. ஈழவேந்தன்)*
(The Hon. M. K. Eelaventhan)

Sir, I rise to a point of Order.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
*(மாண்புமிகு திஸ்ஸ கரலியத்த)*
(The Hon. Tissa Karaliyadde )

*உட்காருங்க!* Do not disturb me.

මේ වළපයයි, ගොඩ පයයි තියා ගෙන මෙතුමා කෑ ගහන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෑ ගනහන්නේ නැතිව, පොඩ්ඩක් නම්බුකාර විධියට ඉන්න කියන්න. එම නිසා ඒ අයත් පාර්ලිමේන්තුවට ඇවිත් වාඩි වේවිද කියා කවුද දන්නේ? අද කරුණා පාර්ශ්වයත් වෙනත් මාර්ගයට එනවා, දේශපාලන කරන්නට ඕනෑ ය කියනවා. ඒ අයත් දේශපාලනය කරන්නට එනවා නම් අප කැමැතියි. ප්‍රභාකරනුත් දේශපාලනය කරන්නට එනවා නම් අප කැමතියි. නමුත්, ලෝක දණ්ඩ නීතියේ ඉඩක් කිබෙයිද කියා අපට හිතන්නට බැහැ. එම නිසා මේවා තේරුම් ගෙන අප කථා කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය විසිතුන් අවුරුදු යුද්ධයෙන් බැට කෑ ජනතාවක් තමයි මම නියෝජනය කරන්නේ. ඊයේ පෙරේදාත් අහිංසක ජීවිත විනාශ වුණා. මේ යුද්ධය නිසා හැම දෙයක්ම වෙනවා යි කියලා ඇඟ බේරා ගන්නට බැහැ. අප උතුරටත් නැඟෙනහිරටත් ආසන්නයේ ම ජීවත් වන නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැල්ලවත්තේ සිංහල මුස්ලිම් දෙමළ ජනතාවට එක්කාසු වනවාට වඩා, අපේ සීමාවේ ඉන්න, අපත් එක්ක ජීවත් වුණු දමිල ජනතාවත් සමඟ අප ජීවත් වුණු යුගය ඒ ක්‍රමය එලෙස ජීවත් වෙනවා දකින්න අප වඩාත් කැමතියි. මායිම් ගම්මානවල ඉන්න අපි එහෙමයි ජීවත් වුණේ. අප වඩාත් කැමතියි, ඒ වකවානුවට යන්න. මගේ මතකයේ හැටියට, ගරු රවිරාජ් මන්ත්‍රීතුමා 1997 දී යාපනයේ නගරාධිපති වෙලා හිටියාද කොහේද. මම කියන්න කැමතියි, මම ඒ මරු කපොල්ලට ගියා. කවුරුවත් යන්නේ නැති ගමනක්. මම එදා පේදුරුතුඩුවට ගිහින් පේදුරුතුඩුව උසාවිය, පේදුරුතුඩාව බැංකුව විවෘත කර ආවා. ඒ ගැන මම අදත් මෙනෙහි කරනවා, සතුටු වෙනවා. මම නිතර අපේ මිත්‍රවරුන්ට කියනවා, අපි ටික යාපනයට යමුයි කියා. කයිතඩි ආයුර්වේද රෝහල වැඩි දියුණු කර දෙන්න ඕනෑ. ඒ වාගේම වවුනියාවේ ගොඩනැගිලි දෙකක් ඉදි කර තිබෙනවා. ඒ දෙක විවෘත කරන්න යන්න මම ආසාවෙන්, බලාපොරාත්තුවෙන් ඉන්නවා. අපි කැමැතියි යන්න. ඇමතිවරුන් හැටියට අපට ඒ දිස්ත්‍රික්කයට යන්න දෙන්න. ගිහින් වැඩ කරන්න තමුන්නාන්සේලා අපට අවස්ථාවක් සලසා දෙන්න. එතකොට ලංකාවේ අනෙකුත් පළාත්වල වාගේම අපට ඒ ප්‍රදේශයේත් වැඩ කරන්න පුළුවන්.

අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත"ජාතික සවිය" වැඩ සටහන ආරම්භ කළේ කැබිතිගොල්ලෑවෙන්. අපි ඒ ගැන ආඩම්බර වෙනවා. අද පුදුමාකාර විධියට එහි සංවර්ධන ක්‍රියාදාමය ක්‍රියාවට නැඟෙනවා. අද උතුරු නැගෙනහිර කලාපවලටත් ඒ සංකල්පය ගෙන ගොස් ඒ ජනතාව වෙනුවෙන් පොදු යටිතල පහසුකම් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. මම මේ අවස්ථාවේ ජාතික සවිය අධීක්ෂණය කරන බැසිල් රාජපක්ෂ මහතාට ස්තූතිවන්ත වෙනවා. උතුරට, නැගෙනහිරට වාගේම දකුණටත් එක හා සමානව සේවයක් කරන්නට ඕනෑයි කියා එතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

[ගරු තිස්ස කරල්ලියද්ද මහතා]

අපි හැම දාම මේ සභාව ඇතුළේ කෑ ගහ ගහ ඉඳලා වැඩක් වන්නේ නැහැ, ගරු මන්ත්‍රීවරුනි. මොන බොරුවක්ද මේ? මම එදත් කිව්වා, හැම දාමත් කියනවා. මෙතැන කෑ ගහනවා, ලේ ටික පුච්චා ගන්නවා, අපි අර දොරවල්වලින් එළියට ගියාම, 'මචං' කියලා තමයි යන්නේ. මේක තමයි සත්‍යතාවය. මේවා තේරුම් ගන්නට ඕනෑ. අපි තර්ක විතර්ක කරනවා. ඒක වෙනම ප්‍රශ්නයක්. නමුත් මෙහි යථාර්ථය අවබෝධ කර ගන්නට ඕනෑ.

මම දැක්කා ජූලි 19 වැනිදා – අද – දිවයින පුවත් පතේ තිබෙනවා, රජය උතුරු නැඟෙනහිරට වෙන් කරන මුදල්වලින් සියයට 20ක් වෙනත් සංවිධාන, ඒ කියන්නේ එල්ටීටීඊ සංවිධානයට ලැබෙනවායිය කියා. ඒ පුවත් පතේම පළ වෙනවා, මේ වන විට ඩොලර් මිලියන 1283ක මුදලක් උතුරු නැගෙනහිරට අනුයුක්ත කර තිබෙනවාය කියා. ඒ වාගේම සුනාමියෙන් විපතට පත් වුණු නැගෙනහිර පළාත වෙනුවෙන් ඩොලර් මිලියන 673ක මුදලක් රජය විසින් ලබා දී තිබෙනවා. ඒ වාගේම උතුරු නැගෙනහිර සුනාමි විපතට පත් වුණු ඇතැම් ප්‍රදේශවලට යන්ත්‍රෝපකරණ පවා ලබා දී තිබෙනවා. ඒවාත් මංකොල්ල කා තිබෙනවා. මේ සුනාමි විපත වුණු වෙලාවේ අපි නැගෙනහිරට ගියා. මන්ත්‍රී කණ්ඩායම් නැඟෙනහිරට ගිය වෙලාවේ එල්ටීටීඊ සංවිධානයේ නැගෙනහිර කලාපයේ ප්‍රබලයන් පවා අපත් එක්ක සාකච්ඡා කළා. අපෙන් ඇහුවා මේ පොරොන්දුව ඉෂ්ට කරනවාද කියා. අපි කිව්වා, හෙට වන විට ඒ පොරොන්දුව ඉෂ්ට කරනවායි කියා. සුනාමියෙන් අවතැන් වූ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව වෙනුවෙන් යම් සේවාවක් කරන්න අපට පුළුවන් වුණා. අපට මතකයි, ජනතා විමුක්ති පෙරමුණෙන් ගිහින් පාලම් හදලා දුන්නා. වෙනත් සංවර්ධන වැඩවලට අපි දායක වුණා. එදා අපි බැලුවේ නැහැ, මේ දෙමළද, සිංහලද, මුස්ලිම්ද, එල්ටීටීඊද කියා. ඒවා මොකුත් අපි බැලුවේ නැහැ. බොහොම සහෝදරත්වයෙන් විපතට පත් වුණු හැම කෙනෙක් ගැනම අපි සොයා බැලුවා. සුනාමිය නිසා අනාථ වුණු, අසරණ වුණු සෑම පවුලකටම සමෘද්ධි ණය වශයෙන් තිබුණු ණය කපා හැරීමේ කටයුත්ත රජය ක්‍රියාත්මක කරනවායි කියන එකත් මේ අවස්ථාවේ සිහිපත් කරන්නට ඕනෑ.

මේ පවතින යුද වාතාවරණය තුළ මිය පරලොව යන්නේ කවුද? යමක් කමක් තිබෙන අය විදේශගත වෙනවා. සිංහල වේවා, දමිළ වේවා, මුස්ලිම් වේවා මේ යුද්ධයේදී සොල්දාදුවන් හැටියට වැඩ කරන්නේ දුප්පත්ම දුප්පත් පවුල්වල ජනතාවයි. ඒ නිසා අනාගත පරපුර එහෙම පිටින්ම විනාශ වී යනවා. මේ සිංහල, දමිළ යුද භටයන්ගේ අනාගත පරම්පරාව, ජාතිය බෝ කිරීමට සිටින පරම්පරාව මේ යුද්ධය නිසා විනාශ වී යනවා. මේක අනාගතයට බැරෑරුම් ප්‍රශ්නයක් වෙනවා. මේවා ගැන කල්පනා කර බලා අපි කටයුතු කරන්නට ඕනෑ. ඒ වාගේම අපි අහන්න කැමැතියි, යමක් කමක් තිබෙන අයගේ දරුවන් මේ යුද්ධයට යනවාද කියා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ යමක් කමක් තිබෙන අය යුද්ධයට යන්නේ නැහැ. ඒ දරුවන්ට උගන්න ගන්නවා. යමක් කමක් නැති අයගේ දරුවන් තමයි අද යුද්ධයට යට වී විනාශ වී යන්නේ.

ආගමික සිද්ධස්ථාන නවීකරණය කරන්න අපි කැමැතියි. උතුරු නැගෙනහිර තිබෙන සර්ව ආගමික සිද්ධස්ථාන, විනාශ වුණු සිද්ධස්ථාන එහි ගොස් දැක බලාගන්න අපි කැමැතියි. ඒවා නවීකරණය කරන්න අපි කැමැතියි. ඒ නිසා රට ගොඩ නඟන්නට නම් තමුන්නාන්සේලාගේ සහයෝගයත් මේ වෙලාවේ අවශ්‍ය වෙනවා. ලංකාවට වඩා පහළින් සිටි ලෝකයේ අනෙකුත් රටවල් අවුරුදු මෙච්චරකදී මෙහෙම දියුණු වුණායි කියනවා. ඇත්ත වශයෙන්ම ඒවා අපට ලජ්ජා හිතෙන කතා. ඒ ගැන අපි ලජ්ජාවට පත් වන්න ඕනෑ. ඔය කවුරු මොනවා කිව්වත්, මේ රටේ සියලුම සම්පත් ගිල ගන්න විදේශීය රටවල් බලාපොරොත්තුවෙන් ඉන්නවා. සමහර ස්වේච්ඡා සංවිධානවලට, සමහර NGO කාරයන්ට දමිළ, සිංහල, මුස්ලිම් ජනතාව බේද භින්න කරන්න අවශ්‍යයි. එහෙම කරලා මේ රට සී සී කඩ යන කොට ඒ අය මේ රටේ සම්පත් ලබා ගන්නට බලාපොරොත්තුවෙන් කටයුතු කරනවායි කියන එකත් හිතේ තබා ගන්නට ඕනෑ.

එසේ ප්‍රකාශ කරමින්, අවසාන වශයෙන් මා තවත් කාරණයක් කියන්නට ඕනෑ. අපි උතුරු නැගෙනහිර ජනතාව වෙනුවෙන් කප්පල්තුරෙ ආයුර්වේද රෝහල විවෘත කරන අවස්ථාවේදී, ත්‍රිකුණාමලයේ අපේ ගරු මන්ත්‍රීතුමාත් එම ස්ථානයට පැමිණ සිටියා. එල්ටීටීඊ සංවිධානයේ එලිලන් කියන නායකයාත් එදා ඒ ස්ථානයට ආවා. ඒ රෝහල විවෘත කරන්න මට යන්න එපාය කිව්වා. කළු කොඩි දානවාය යන්න එපාය කිව්වා. සද් භාවයෙන් යන ගමනක්. ඒ නිසා මරාදැම්මත් යනවාය කියා මා ගියා. එදා යාපනයට යන කොටත් මට යන්න එපාය කිව්වා. සද් භාවයෙන් යන ගමනක් නිසා මරා දැම්මත් කමක් නැහැ කියා තමයි මා එදා ගියේ. මේ වාගේ හොඳ වැඩක් කරන තැනකට මට එන්නට ලැබීමත් සන්තෝෂයක්ය කියා එදා එලිලන් ප්‍රකාශ කළා. ඒ රෝහලත් අපට තව දියුණු කරන්නට තිබෙනවා.

මේ අවස්ථාවේදී අපි දකිනවා, මේ ප්‍රශ්නය විසඳා ගන්නට මෑත යුගයේ බිහි වෙච්ච නායකයෙක්ය කියා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. එතුමාට එක් කෙනෙක් කියන දෙයක් විතරක් අහන්නට බැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියලු දෙනාම සමඟ සාකච්ඡා කරන්නට ඕනෑ. සාකච්ඡා කර තීරණ ගන්න ඒවාට සම්පන්දන් මන්ත්‍රීතුමනි, බොහෝ කාලයක් ගත වෙනවා. ඔබතුමන්ලා වාගේ ජ්‍යෙෂ්ඨ ඇත්තන්ට මේ ක්ෂේත්‍රය ගැන පෘථුල අවබෝධයක් තිබෙනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා සමඟ ඒකරාශී වෙලා යම් ගමනක් යන්නට අපි අත් වැල් බැඳ ගනිමුය කියන ගමන්, ඒ සඳහා සියලුම දෙවි දේවතාවුන්ගේ ආශීර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරමින්, මගේ අදහස් ප්‍රකාශ කිරීම නිම කරනවා. ස්තුතියි.

[අ. භා. 2.35]

**ගරු ටී. මහේස්වරන් මහතා**
*(மாண்புமிகு ரீ. மகேஸ்வரன்)*
(The Hon. T. Maheswaran)

*கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று வடக்கு – கிழக்கு மக்களுடைய நிலைமை சம்பந்தமாக நடைபெறுகின்ற இந்த ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் சில கருத்துக்களை முன்வைக்கச் சந்தர்ப்பம் கொடுத்தமைக்காக உங்களுக்கு நன்றி தெரிவிக்கிறேன். எனக்கு முன் பேசிய அமைச்சர் திஸ்ஸ கரல்லியத்த, பிரதியமைச்சர் மஹிந்தானந்த அளுத்கமகே மற்றும் ஜே.வி.பீ. பாராளுமன்ற உறுப்பினர்கள் உள்ளிட்ட பலருடைய உரைகளையும் செவிமடுத்தோம். இன்று இந்தச் சபையிலே உரையாற்றிய பலரும் பெரும்பான்மையின - சிங்கள பாராளுமன்ற உறுப்பினர்கள் தங்களுடைய கருத்துக்களையும், எமது தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்கள் இன்று தமிழ் மக்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் பற்றியும் எடுத்துக்கூறினார்கள். இன்று ஒரு விடயம் மிகத் தெளிவாகத் தெரிகிறது. அதாவது, இந்த நாட்டினை ஆட்சி செய்கின்ற அரசாங்கம் தமிழ் மக்களுக்கு எதிரான, விரோதமான ஒரு போக்கைக் கொண்டிருக்கிறது என்பது கடந்த ஆறு மாத கால ஆட்சியிலிருந்து நிரூபிக்கப்பட்டிருக்கிறது. இன்று காலையில் இச்சபையில் இந்தப் பிரேரணையைச் சமர்ப்பித்த மதிப்புக்குரிய ஆர். சம்பந்தன் ஐயா அவர்கள் திருகோணமலை மாவட்ட நிலைமைகளை எடுத்துக் கூறினார்.*

*தற்போது அரசில் இருப்பவர்கள் உண்மையாகவே இதயசுத்தியுடன் அரசை வழி நடத்துபவர்களாக இல்லை. இலங்கையின் திருகோணமலை மாவட்டத்தைத் தவிர்ந்த வேறு எந்த மாவட்டத்திலாவது ஓர் இராணுவ அதிகாரி அரசாங்க அதிபராக நியமிக்கப்பட்டிருக்கிறாரா? அவர் எவ்வாறு மூவின மக்களையும் சரிசமமாக வழி நடத்தப் போகிறார் என்பதை அவர்கள் நிரூபித்துக் காட்ட வேண்டும். இதற்கு மேலாக, குறிப்பிட்ட அரசாங்க அதிபர் நிர்வாகம் செய்கின்ற அந்த மாவட்டத்திலே வாழ்கின்ற பெரும்பான்மைத் தமிழ் மக்களுக்கு மேலும் நெருக்கடிகளை உருவாக்குவதற்காகத்தான் இந்த அரசாங்கமும் அரசாங்கத்துடன் கூட்டுச் சேர்ந்திருக்கின்ற ஏனைய இனவாதக் கட்சிகளும் அவரை அரசாங்க அதிபராக நியமிப்பதற்கு ஜனாதிபதிக்கு ஆலோசனை வழங்கியிருக்கின்றன. அதுமாத்திரமல்ல, அன்று இந்திய அரசினால் இந்த நாட்டினை இனப்பிரச்சினைத் தீர்வுக்கு ஒரு முன்மொழிவாக மாகாண சபை நிர்வாகம் கொண்டுவரப்பட்டது. இதில் தமிழர்களுக்கு ஏதாவது கிடைக்குமா? தமிழர்கள் இதனூடாகத் திருப்திப்படுவார்களா என்ற ஓர் ஆதங்கம் இருந்த நிலையிலும், அன்று ஜே.வி.பீ. யினர் தமிழ் மக்களுக்கு இதனூடாகக் கூடுதலான உரிமைகள் வழங்கப்படுகின்றன என்று அந்த மாகாண சபையை எதிர்த்தார்கள். ஆனால், இதே மாகாண சபையில் இன்று அவர்கள் அனுபவிக்கின்ற சலுகைகளோ அதிகம். அன்று மாகாண சபையை எதிர்த்தவர்கள் இன்று அதே மாகாண சபையை ஆதரித்து, வடக்கு – கிழக்குக்கு இரண்டு மாகாண சபைகளைக் கொடுப்பதற்காக நீதிமன்றம் வரை சென்றிருக்கிறார்கள்; இன்னும் பத்து வருடங்களுக்குப் பின்பு நான்கு மாகாண சபைகளாக்க முயற்சிப்பார்கள்.*

ஒரு விடயம் நினைவுக்கு வருகிறது. அதாவது, எங்களுடைய முன்னாள் தமிழ் தலைவர்கள் 1956 ஆம் ஆண்டில் இந்த நாட்டிலே மொழிக்குரிய அந்தஸ்தைத்தான் கேட்டார்கள். அப்போது ஆட்சியில் இருந்த பெரும்பான்மையின இனவாதத் தலைவர்கள் அதனைக் கொடுக்க மறுத்தார்கள்; பிக்குமார்கள் அதற்கு எதிராகக் கூக்குரலிட்டார்கள். இன்று அந்த மொழிப் பிரச்சினை பல பிரச்சினைகளாக உருவெடுத்து நாடு பிரிகின்ற நிலைக்கான உச்சக்கட்டத்துக்குச் சென்றிருக்கிறது. யார் விரும்பினாலும் விரும்பாவிட்டாலும் இந்த நாடு நிச்சயமாக இரண்டாகப் பிளவுபடத்தான் போகின்றது. அதில் எவ்வித மாற்றுக் கருத்துக்கும் இடமில்லை. அப்படி இந்த நாடு பிரிவது, தற்போதைய ஜனாதிபதி அவர்களுடைய காலத்திலா அல்லது அதற்குப் பின்னரா என்பதுதான் இன்று எம்முன்னுள்ள கேள்வியாக இருக்கின்றது.

இன்று இந்த நாட்டிலே வாழ்கின்ற சிறுபான்மை மக்களாகிய எங்களுடைய அபிலாஷைகளை திருப்திப்படுத்துவதற்கு அரசாங்கம் முயலுவதாக இந்த அரசின் அமைச்சர்கள் கூறுகின்றார்கள். அந்த வகையில், இன்று காலை பிரதி அமைச்சர் மஹிந்தானந்த அளுத்கமகே அவர்கள் இங்க உரையாற்றும்பொழுது, ஆயிரம் மில்லியன் ரூபாவை வடக்கு – கிழக்கின் மின்சாரத் தேவைகளுக்காக ஒதுக்கியதாகக் கூறினார். வடக்கு – கிழக்குக்கு ஆயிரம் மில்லியன் அல்ல, எந்த நிதியும் அங்கு ஒதுக்கப்படவில்லை. அத்தோடு, அங்கு 40 – 50 சதவீதமான மக்கள் கள்ளத்தனமாக மின்சாரம் பெறுகின்றார்கள் என்ற குற்றச்சாட்டையும் அவர் சுமத்தினார். அவர் வாழ்கின்ற நாவலப்பிட்டிய பிரதேசத்தில், அவருடைய தலைமையின் கீழ் செயற்படுகின்றவர்கள்தான் கள்ளத்தனமாக மின்சாரம் பெறுகின்றார்கள். நான் இதற்கு முன்பு இரண்டு தடவைகள் யாழ்ப்பாண மாவட்டப் பாராளுமன்ற உறுப்பினராக இருந் திருக்கிறேன். யாழ்ப்பாணத்திலே உள்ள பிரதான குடியிருப்பாளர் களான தமிழர்கள் கள்ளத்தனமாக மின்சாரம் பெறவில்லை; எந்தக் களவு வேலையிலும் ஈடுபடாத கௌரவமான மக்கள்தான் அந்தப் பிரதேசத்தில் வாழ்கின்றார்கள் என்பதை இத்தகைய இனவாதிகளுக்கு நான் இந்த உயர்ந்த சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன். மாறாக, அங்கு மின்சார சபைக்கு ஏற்படுகின்ற நஷ்டங்களுக்குத் தமிழர்கள் பொறுப்பாளிகளுமல்லர். உலக வங்கி, சருவதேச நாணய நிதியம் உள்ளிட்ட பல சருவதேச அமைப்புக்களும் நாடுகளும், வடக்கு – கிழக்கிலே சீரழிந்துபோன பிரதேசங்களை மீளக் கட்டியெழுப் புவதற்காக பல கோடி ரூபா நிதியினை இலங்கைக்கு வழங்கி யிருக்கின்றன. யுத்தத்தினால் பாதிப்படைந்த பிரதேசங்களைப் புனர்நிர்மாணம் செய்யவேண்டுமென்ற நிபந்தனையுடன்தான் அந்த நிதி வழங்கப்பட்டது. அந்தப் பிச்சை நிதியிலிருந்து தென்னிலங்கையும் இன்று அபிவிருத்தி செய்யப்படுகின்றது. ஆனால், எந்தவித முன்நிபந்தனையுமின்றி, அந்த அமைப்புக்களும் நாடுகளும் அந்த நிதியை விரும்பிக் கொடுத்ததாக இந்தச் சபையிலே இவர்கள் கூறுகின்றார்கள். இதை ஒருபொழுதும் நாங்கள் ஏற்றுக்கொள்ளத் தயாராக இல்லை. புனர்வாழ்வு சம்பந்தமான நடவடிக்கைகளுக்காக ஜனாதிபதி அவர்களின் தலைமையின் கீழ் தற்பொழுது ஒரு புதிய அமைச்சு உருவாக்கப்பட்டிருக்கின்றது. யுத்தத்தினால் பாதிப்படைந்த பிரதேசமான வடக்கு – கிழக்குக்கு வந்த அந்த நிதிகள் எங்கு போகின்றன? அந்த நிதிக்குப் பொறுப்புக் கூறவேண்டிய அமைச்சர்கள், அரசின் ஏனைய சக அமைச்சர்களின் வழிகாட்டலுக்கமைய தென்னிலங்கையிலே அந்த நிதியைச் செலவழித்துக் கொண்டிருக்கின்றார்கள். இன்று வடக்கிலே எந்த நிதியும் செலவழிக்கப்படுவதில்லை.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා (ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන අමාත්‍යතුමා සහ සමාජ සේවා හා සමාජ සුබසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஸ்பகுமார – கிராமிய வாழ்வாதார அபிவிருந்தி அமைச்சரும் சமூக சேவைகள், சமூக நலனோம்புகை பிரதி அமைச்சரும்)*

(The Hon. A. P. Jagath Pushpakumara - Minister of Rural Livelihood Development andDeputy Minister of Social Services and Social Welfare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*

(The Deputy Speaker)

ගරු ජගත් පුෂ්පකුමාර ඇමතිතුමා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**

*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஸ்பகுமார)*

(The Hon. A. P. Jagath Pushpakumara)

උතුරු නැගෙනහිර පුනරුත්ථාපන කටයුතු සියල්ලම සිද්ධ වෙනවා. මා හිතන හැටියට මෙතුමා හිටපු ඇමති ජයලත් ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ඒවා සම්බන්ධවයි මේ කථා කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*

(The Deputy Speaker)

ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු මහේස්වරන් මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

**ගරු ටී. මහේස්වරන් මහතා**

*(மாண்புமிகு ரீ. மகேஸ்வரன்)*

(The Hon. T. Maheshwaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நிலையில் நாங்கள் ஒன்றைக் கூறிக்கொள்ள விரும்புகின்றோம். ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசாங்கத்திலே பல அபிவிருத்தித் திட்டங்கள் முன்னெடுக்கப்பட்டிருப்பதாகக் கூறப்படுகின்றன. ஆறு மாதங்களுக்கு முன்பு ஒரு பிரதமராக, அதற்கு முன்பு எதிர்க்கட்சித் தலைவராக நாங்கள் அவரைப் பார்த்திருக்கிறோம். ஏன், 2002 ஆம் ஆண்டு எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினராகவும் அவர் சில மாதங்கள் இங்கிருந்தார். அவர் அமைச்சராகவும் இருந்தார்.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair]*

அண்மைக் காலங்களில் எங்களுடைய வடக்கு – கிழக்குப் பிரதேசத்தைச் சேர்ந்த 90 அப்பாவி இளைஞர்கள் கடத்தப்பட்டுக் கொலை செய்யப்பட்டிருக்கிறார்கள். அவர்கள் நீதிமன்றத்தின் முன் ஆஜர் செய்யப்பட்டவர்களுமல்லர். அவர்களுடைய பெற்றோருக்கு அவர்கள் பற்றிய விபரங்களும் தெரிவிக்கப்படவுமில்லை. கொழும்புக்கு – தென்னிலங்கைக்கு – வந்த அப்பாவித் தமிழர்கள் பலரும் கடத்தப்பட்டிருக்கிறார்கள். ஏனெனில் ஜனாதிபதி அவர்களால்தான் பாதுகாப்பு அமைச்சு வழிநடாத்தப்படுகின்றது ; இராணுவமும், பொலிஸும் வழிநடாத்தப்படுகின்றது. ஒருவரைச் சந்தேகத்தின் பேரில் கைது செய்யலாம் ; நீதிமன்றத்தின் முன் ஆஜர்படுத்தலாம். அதை விடுத்து இன்று எதேச்சாதிகாரமான முறையிலே நடந்து கொள்கின்றார்கள். அப்படிக் கைது செய்யப்பட்டவர்கள் எங்கே? அவர்களுடைய உடல்கள் தலையில்லாத முண்டங்களாக அவிசாவளைப் பிரதேசத்திலே வீசப்பட்டன.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**

*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*

(The Hon. A. P. Jagath Pushpakumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*

(The Deputy Speaker)

ගරු ජගත් පුෂ්පකුමාර ඇමතිතුමා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**

*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*

(The Hon. A. P. Jagath Pushpakumara)

අතිගරු ජනාධිපතිතුමා සම්බන්ධයෙන් මෙතුමා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නැයි කියා මා යෝජනා කරනවා. [බාධා කිරීමක්] නැහැ. ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

**ගරු ටී. මහේස්වරන් මහතා**
*(மாண்புமிகு ரீ. மகேஸ்வரன்)*
(The Hon. T. Maheshwaran)
මම ඉල්ලා අස් කර ගන්නේ නැහැ. ඔය ගොල්ලන්ට ඕනෑ එකක් අස් කර ගන්න. මම කියන ඒවා මම කියනවා. මට ඉල්ලා අස් කර ගන්නැයි කියන්න ඔයා කවුද?

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara)
තමුන්නාන්සේ ඒක ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)
අතිගරු ජනාධිපතිතුමා පිළිබඳව කරපු සියලු ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජන මාධ්‍යවලිනුත්.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)
එය ජන මාධ්‍යයත් සටහන් කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ටී. මහේස්වරන් මහතා**
*(மாண்புமிகு ரீ. மகேஸ்வரன்)*
(The Hon. T. Maheswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த அரசாங்கத்திடம் மண்டியிட்டுக் கேட்கவேண்டிய எந்தத் தேவையும் எங்களுக்கு இல்லை. [இடையீடு] නැහැ, නැහැ. ඕනෑ එකක් අස් කර ගන්න. අපට ප්‍රශ්නයක් නැහැ. මෙතැන කිව්වයි කියලා වැඩක් වෙන්නේත් නැහැ නේ. අපි කියන ඒවා අපි කියනවා. ඔය ගොල්ලෝ අස් කරන ඒවා අස් කරනවා. අපට ප්‍රශ්නයක් නැහැ. நாங்கள் இந்த உயர்ந்த சபையிலே எந்தவொரு கருத்தையும் கூறுகின்றபொழுது மிகவும் பொறுப்புடன்தான் கூறுகின்றோம். அப்பாவித் தமிழர்கள் மீது காடைத்தனங்கள் கட்டவிழ்த்து விடப்படுவதற்கு இடமளிக்காதீர்கள் என்று நாங்கள் ஜனாதிபதியிடம் பல தடவைகள் கூறியிருக்கின்றோம். ஆனால், சிரித்து சிரித்து எங்களுடைய முதுகுகளிலே குத்துவது போன்ற நிகழ்வுகளே தொடர்கின்றன. கொழும்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர்கள் என்ற வகையில் கைது செய்யப்பட்ட அப்பாவித் தமிழர்களை விடுவிப்பதற்காக நாங்கள் ஒவ்வொரு கிழமை நாட்களிலேயும் காலையிலே பொலிஸ் நிலையங்களுக்கும் பகலிலே நீதிமன்றங்களுக்கும் செல்கின்றோம். ஆனால், அந்த மக்கள் எந்தவிதமான குற்றங்களையும் செய்யவில்லை. [இடையீடு] அதை நீங்கள் பேசுங்கள்! [இடையீடு] அதற்குத்தான் உங்களை நியமித்திருக்கின்றார்கள். [இடையீடு] நீங்கள் பேசுங்கள். [இடையீடு] இல்லை. [இடையீடு] ஆகையினால் பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று எதுவும் அறியாத அப்பாவித் தமிழர்கள் ஏன் நீதிமன்றத்திற்குடுன் செல்ல வேண்டும். [இடையீடு] சம்பந்தப்பட்டவர்களிடம் இது சம்பந்தமாகப் பல தடவைகள் எடுத்துக் கூறியிருக்கின்றோம். [இடையீடு]

நீங்கள் இன்று இந்த அரசாங்கம் பக்கச் சார்பற்ற முறையில் செயற்படுகின்றது என்று நீங்கள் கூறுவீர்களாக இருந்தால், அல்லைப்பிட்டியிலே கொலை செய்யப்பட்ட தமிழர்களின் சார்பில் நீங்கள் நஷ்டஈடு கொடுத்தீர்களா? அது பற்றி நீதி விசாரணை நடத்தப்பட்டதா? அந்தக் குற்றவாளிகள் நீதிமன்றத்தின் முன்னால் ஆஜர் செய்யப்பட்டார்களா? [இடையீடு] வங்காலையிலே படுகொலை செய்யப்பட்ட குடும்பத்தவர்களை எண்ணிப் பாருங்கள்! [இடையீடு] அது சம்பந்தமாக ஏதாவது நீதி விசாரணை மேற்கொள்ளப்பட்டதா? [இடையீடு] வங்காலையிலே கிறிஸ்தவ தேவாலயத்திற்குள் குண்டு வீசிய கடற்படையினர் கைது செய்யப்பட்டிருக்கின்றார்களா? அவர்களுக்கு எதிராக நீதி விசாரணை மேற்கொள்ளப்பட்டிருக்கின்றதா? திருகோணமலையிலே ஐந்து தமிழ் மாணவர்களைக் கொலை செய்த விசேட அதிரடிப் படையினரைக் கைது செய்வதற்கு ஏதாவது நடவடிக்கை எடுத்தீர்களா? [இடையீடு] இதற்கும் மேலாக மந்துவில் பிரதேசத்திலே கும்பாபிஷேகத் திருப்பணிகளுக்காக ஆலயத்திலே தங்கியிருந்த எட்டு தமிழர்களை கடத்திச் சென்று கொலை செய்தீர்களே! அது சம்பந்தமாக என்ன கூறப் போகின்றீர்கள். இந்தக் கொலைக் குற்றங்களிலிருந்து விடுபட முடியுமா? இந்தக் கொலைகளைச் செய்ததன் ஊடாக தமிழர்களை அடக்கி விட முடியுமா என்று நான் இந்த அரசைப் பார்த்துக் கேட்க விரும்புகின்றேன். [இடையீடு] ஆகையினால் இந்த அரசாங்கமானது நீதியாகவும் நியாயமாகவும் நடந்துகொள்கின்றதென்பதைத் தன்னுடைய செயற்பாடுகளின் மூலம் முதலில் நிரூபித்துக் காட்ட வேண்டும். [இடையீடு]

இன்று காலை இந்தப் பிரேரணையைக் கொண்டு வந்து இங்கு பேசிய இரா. சம்பந்தன் ஐயா அவர்கள், இந்த அரசுக்கு எந்தவிதமான உதவிகளும் வழங்கப்படக்கூடாது என்று சர்வதேச சமூகத்திடம் கேட்டுக் கொண்டார். நான் அதை வழிமொழிந்து பேசுகின்றேன். இந்த அரசாங்கமானது தமிழர் விரோத அரசாங்கம்! இந்த நாட்டிலே இந்த அரசாங்கம் ஆட்சியைத் தொடர்வதற்கு சர்வதேச நாடுகள், விசேடமாக உலகத்திலே மனிதாபிமானத்தை மதித்து நடக்கின்ற ஜனநாயக நாடுகள் எந்தவிதமான உதவிகளும் வழங்கக்கூடாது என்று நான் இந்த உரிய சபையிலே சர்வதேச சமூகத்திடம் கேட்டுக் கொள்ள விரும்புகின்றேன். அவ்வாறு வழங்கப்படுகின்ற அந்த நிதியுதவிகள் அனைத்தையும் தமிழர்களுக்கு எதிராக உபயோகிப்பதற்கு அரசாங்கம் சகல தில்லுமுல்லுகளையும் செய்து கொண்டிருக்கின்றது. [இடையீடு] இதற்கும் மேலாக இன்று இந்த அரசாங்கம் தமிழர்கள் மீது எல்லா வழிகளிலும் நெருக்கடிகளை உருவாக்கிக் கொண்டிருக்கின்றது.

மூதூர் பிரதேசத்திற்குப் பொருளாதாரத் தடை விதிக்கப்பட்டிருக்கின்றது என்று இன்று காலை இங்கு சொல்லப்பட்டது. மூதூர் பிரதேசத்திலே வாழ்கின்ற சுமார் ஐம்பதாயிரம் மக்கள் இன்று அகதிகளாக இருக்கின்றார்கள். அந்த மக்களுக்கு நிவாரணம் வழங்குவதற்கு எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. அவர்களின் தேவைக்கேற்ப பொருள்களை வழங்குவதாக அரசாங்கம் கூறுகின்றது. மூதூர் உள்ளிட்ட பல கிராமங்களிலே விடுதலைப்புலிகளின் கட்டுப்பாட்டுப் பிரதேசங்களில் வாழ்கின்ற மக்களுக்கு இன்று ஒரு பொருளாதாரத் தடை - மறைமுகமான பொருளாதாரத் தடை - ஏற்படுத்தப்பட்டிருக்கின்றது. தமிழர்கள் மீது பொருளாதாரத் தடையைத் திணிப்பதை எந்த வகையில் நியாயப்படுத்த முடியும்? என்று நான் இந்த அரசைப் பார்த்துக் கேட்க விரும்புகின்றேன். எனவே, இந்தத் தடைகள் அனைத்தும் மிக விரைவிலே நீக்கப்பட வேண்டும்.

அரசாங்கம் தன்னுடைய அதிகாரத்தின் ஊடாக கடந்த காலங்களிலே செய்த செயற்பாடுகள் போன்ற செயற்பாடுகளை இனி வரும் காலங்களிலும் செய்து விட முடியாது. இன்று சர்வதேச நாடுகளில் எல்லாம் தமிழர்கள் வியாபித்திருக்கின்றார்கள். இங்கு தமிழர்களுடைய குரல்கள் ஒடுக்கப்படுகின்றபோது சர்வதேச நாடுகளிலே அவர்களுடைய குரல்கள் ஓங்கி ஒலிக்கின்றன. இதனூடாகத் திணறிப் போயிருக்கின்ற இந்த அரசாங்கம் இன்று தன்னுடைய ஊடகங்களின் ஊடாக பொய்யான பிரசாரங்களை மேற்கொண்டு மேலும் தன்னுடைய அடக்குமுறைகளைத் தொடரலாம் என்று நினைத்துக் கொண்டிருக்கின்றது. அண்மையில் இந்த அரசாங்கத்தினால் 'ஜாதிக சவிய' என்ற ஒரு வேலைத்திட்டம் உருவாக்கப்பட்டிருக்கின்றது. இது எதற்காக உருவாக்கப்பட்டிருக்கிறது? இது அந்தப் பிரதேசங்களில் வாழ்கின்ற தமிழ் மக்களின் குரல்வளைகளை நசுக்குவதற்காகத்தான் உருவாக்கப்பட்டிருக்கிறது. இந்த வேலைத்திட்டத்தினூடாக மேற்கொள்ளப்பட இருக்கின்ற நடவடிக்கைகள் யாவை? இந்த வேலைத்திட்டத்தை முன்னெடுப்பதற்கு வவுனியாவுக்குச் சென்றார்கள். வவுனியாவில் தமிழ் தேசியக் கூட்டமைப்பு பாராளுமன்ற உறுப்பினர்கள் நான்கு பேர்

இருக்கிறார்கள். அந்தப் பிரதேசத்தில் 85 வீதத்துக்கும் அதிகமான தமிழ் மக்கள் வாழ்கிறார்கள். அதுபோல் திருகோணமலை மாவட்டத்தில் 60 - 70 வீதத்துக்கும் அதிகமான தமிழர்கள் வாழ்கிறார்கள். இந்தப் பிரதேசங்களில் இன்று ஜனாதிபதி அவர்களின் சகோதரருடன் ஏனைய இனவாதக் கட்சியினர் எதற்காக வலம் வந்து கொண்டிருக்கின்றனர்? அந்தப் பிரதேசங்களில் வாழ்கின்ற தமிழர்களுடைய அன்றாட வாழ்க்கையைச் சீர்குலைக்கும் வகையில் அங்கு கூட்டங்கள் ஒழுங்கு செய்யப்பட்டிருக்கின்றன. அரசாங்கம் தன்னுடைய உண்மையான நிலைப்பாட்டை "ஜாதிக சவிய" வேலைத்திட்டத்தினூடாக நிரூபித்திருக்கிறது. இந்த நிலையில், பாராளுமன்ற உறுப்பினர் விமல் வீரவங்ச அவர்கள் "ஜாதிக சவிய" வேலைத்திட்டத்தை வவுனியாவில் முன்னெடுப்பதற்காக அங்கு முதல் தடவையாகச் சென்றிருந்தார். இந்த வேலைத்திட்டத்திலே ஜே.வி.பீ. யினரையும் இணைத்துக்கொண்டு, இதனூடாக [இடையீடு] எதைச் செய்ய முற்படுகிறீர்கள்? என்று நான் உங்களைப் பார்த்துக் கேட்க விரும்புகிறேன். இதற்கு முன் இருந்த பல அரசாங்கங்களும் இவ்வாறான பல வேலைத்திட்டங்களை மேற்கொண்டன; பல தமிழ் கிராமங்களை ஆக்கிரமிப்பதற்குப் பல்வேறு உபாயங்களை மேற்கொண்டன; எதுவும் சாத்தியப்படவில்லை. இன்று அதற்கு எதிர்மாறான விளைவுகள் உருவாகிக்கொண்டிருக்கின்றன.

நான் இறுதியாக இந்தச் சபையில் ஒன்றைக் குறிப்பிட விரும்புகிறேன். யாழ்ப்பாணத்திலிருந்து கிடைத்த, அங்கு காணாமல் போனோரின் பட்டியலை இந்தச் சபையில் சமர்ப்பிக்க விரும்புகிறேன்.

***ලියවිලි ඉදිරිපත් කර නොමැත :**
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை :*
*Document not tendered :*

படுகொலை செய்யப்பட்டவர்கள், தலையில்லாமல் கண்டெடுத்த முண்டங்கள், கைதடியிலும் நாவற்குழியிலும் புதைக்கப்பட்ட சடலங்கள் என்று காணாமல் போன அனைவருக்கும் இந்த அரசு பொறுப்புக் கூற வேண்டும். அரசாங்கத்தின் இரகசிய முகாம்களிலே தடுத்து வைக்கப்பட்டிருக்கின்ற அப்பாவித் தமிழர்களை வெளியே கொண்டுவர வேண்டும்; அவர்களைப் பெற்றோருக்குக் காண்பிக்க வேண்டும்; அவர்களைச் சட்டத்தின்முன் நிறுத்த வேண்டும் என்று இந்த உயர்ந்த சபையிலே கேட்டுக்கொள்ள விரும்புகிறேன். அத்தோடு தமிழர்கள் எங்கே முறையிட முடியும் என்கின்ற ஒரு செய்தியையும் இந்த அரசாங்கம் வெளியிட வேண்டும். இன்று நான்காம் மாடியில் பல தமிழ் இளைஞர், யுவதிகள் தடுத்து வைக்கப்பட்டிருக்கிறார்கள். ஒரு தமிழ் பாராளுமன்ற உறுப்பினர்கூட அங்கு சென்று பார்ப்பதற்கு அனுமதியில்லை. நான்காம் மாடிப் பொறுப்பதிகாரியுடன் தொடர்பு கொண்டு கேட்டால், "யாரைப் பார்க்க விரும்புகிறீர்கள்? சனிக்கிழமைகளில் பார்க்கலாம்" என்று சொல்கின்றார். ஆனால், அங்கு யார் யார் தடுத்து வைக்கப்பட்டிருக்கிறார்கள் என்ற விபரங்களைச் சமர்ப்பிக்கும்படி நாங்கள் இந்த உயர்ந்த சபையிலே பல தடவைகள் கேட்டும், இன்றுவரை இவர்கள் எதனையும் வெளியிடவில்லை. இதனுடைய விளைவுகளுக்கு அரசாங்கம் என்றோ ஒருநாள் நிச்சயமாகப் பதில் கூறியேயாக வேண்டும்.

அரசாங்கம் இன்று இனப்பிரச்சினைத் தீர்வுக்காகச் சமாதானப் பேச்சுவார்த்தை நடத்தவிருப்பதாகவும் அதற்கும் மேலாக தயா மாஸ்டருக்குச் சிகிச்சையளித்தது பற்றியும் கூறுகிறது. தயா மாஸ்டருக்குச் சிகிச்சையளிப்பதையும் தமிழர்களுக்கெதிராக நடத்துகின்ற கொடுமையான நிகழ்வுகளையும் தமிழர்கள் சரிசமமாக ஏற்றுக்கொள்கின்ற நிலையில் இல்லை. தயா மாஸ்டர் அவர்கள் சிகிச்சைக்காக கொழும்புக்கு வந்தார். சிகிச்சை முடிந்ததும் சிகிச்சைக்குரிய 'பில்'லுக்கான பணத்தை அவரே செலுத்திவிட்டுச் சென்றுவிட்டார். இதற்கு மேலாக தயா மாஸ்டருடைய நிலைமையை ஒப்பிட்டு ஏனைய தமிழர்கள் மீது கட்டவிழ்த்து விட்டிருக்கின்ற அடாவடித்தனங்களை நியாயப்படுத்த முடியாது. இன்று சர்வதேச சமூகம் அரசுக்கெதிராகக் குற்றஞ் சாட்டியிருக்கிறது. அண்மையில், சருவதேச மன்னிப்புச் சபையால் பத்திரிகைகளில் வெளியிடப்பட்ட பல அறிக்கைகளில், "இந்த அரசாங்கம் பல தடவைகள் மனித உரிமை மீறல்களில் ஈடுபட்டிருக்கின்றது" என்று கூறப்பட்டிருக்கின்றது.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමාගේ කාලය අවසන් වෙලායි තිබෙන්නේ.

**ගරු ටී. මහේස්වරන් මහතා**
*(மாண்புமிகு ரீ. மகேஸ்வரன்)*
(The Hon. T. Maheshwaran)
"இலங்கை அரசாங்கம் பொதுமக்களுக்குப் போதிய பாதுகாப்பை வழங்கத் தவறியுள்ளது" என்ற குற்றச்சாட்டை சருவதேச மன்னிப்புச் சபை சுமத்தியிருக்கின்றது. தமிழர்கள் விரட்டியடிக்கப்பட்டிருக்கிறார்கள்; இடம்பெயர்ந்து அயல் நாடான இந்தியாவிலே தஞ்சமடைந்திருக்கிறார்கள். ஆகையினால், தமிழ் மக்களுக்குத் தொடர்ச்சியாக ஏற்படுகின்ற இந்த இழிநிலையிலிருந்து மீளுவதற்கு, அவர்கள் மீது கட்டவிழ்த்துவிடப்பட்டிருக்கின்ற சகல இராணுவ அட்டூழியங்களையும் இந்த அரசாங்கம் தடுத்து நிறுத்த வேண்டுமென்ற கோரிக்கையை இந்த விவாதத்தின் கருப்பொருளாக இந்த உயர்ந்த சபையிலே முன்வைத்து, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி, வணக்கம்.

[අ. භා. 2.55]

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
*(மாண்புமிகு ஏ. பீ ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara )
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ විශාල කාලයක් රැගෙන ගරු සම්පන්දන් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා උතුරු නැගෙනහිර පළාතේ ජනතාවගේ ජන ජීවිතය සම්බන්ධව කරුණු කාරණා ඉදිරිපත් කළා. මේවා ගැන කථා කරන කොට පළමුව එතුමාගෙන් මා දැන ගන්න කැමැතියි, මෙන්න මේ කරුණ. 1977දී මා දන්නා කාලයේ දී - එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරන අවස්ථාවේ එතුමාගේ කණ්ඩායම් නායකතුමා කවුද කියලා මට මතකයි. ඒ තමයි, අමිර්තලිංගම් මැතිතුමා. එතකොට අමිර්තලිංගම් මැතිතුමා ඝාතනය කළේ කවුද? 2004 වර්ෂයේදී අපේ මේ රජය බලයට පත් වන කොට සම්පන්දන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කණ්ඩායමේ නායකතුමා කවුද? එහෙම නම් තමුන්නාන්සේගේ ඒ නායකතුමන්ලා දෙපොළට සිදු වුණේ කවර තත්ත්වයන්ද? මේක තමයි, මට දැන ගන්නට අවශ්‍ය පළමු වෙනි ප්‍රශ්නය. උතුරු නැගෙනහිර ජනතාවගේ ජන ජීවිතය ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේ දී තමුන්නාන්සේගේ නායක අමිර්තලිංගම් මැතිතුමාට මොකද වුණේ කියලා තමුන්නාන්සේ කියන්න. ඔබේ නායක ආනන්දසංගරී මැතිතුමාට අද ආරක්ෂාව සහිතව ජීවත් වන්නට සිද්ධ වෙලා තිබෙන්නේ කුමන හේතුවක් නිසාද? එතුමාට තර්ජනය තිබෙන්නේ කාගෙන්ද? අපේ ගරු මහේස්වරන් මන්ත්‍රීතුමා දැන් කථා කළා. ආනන්දසංගරී මැතිතුමාට තර්ජනය තිබෙන්නේ කාගෙන්ද? ඔබතුමන්ලා කියනවා, දෙමළ ජනතාවගේ එකම නියෝජිතයා එල්ටීටීඊ සංවිධානය තමයි, ප්‍රභාකරන් තමයි කියලා. එහෙම නම් අමිර්තලිංගම් මැතිතුමාගේ එකම නියෝජිතයා කවුද? ආනන්දසංගරී මැතිතුමාගේ එකම නියෝජිතයා කවුද? මෙන්න මේවා සම්බන්ධව තමුන්නාන්සේලා කරුණාකරලා පැහැදිලි කරලා දෙන්න. තමුන්නාන්සේලා මේ සභාවට අහිංසක ජීවිත ගැන විවිධ කාරණා ඉදිරිපත් කළා. අපි ළඟ තොරතුරු තිබෙනවා. පසු ගිය කෙටි කාල සීමාව තුළ දී යාපනය දිස්ත්‍රික්කයේ පොලිසියේ, හමුදාවල සහ අනෙකුත් අයගේ ජීවිත 46ක් මේ රටට අහිමි වෙලා තිබෙනවා, වවුනියාවේ දිස්ත්‍රික්කයේ 71ක් අහිමි වෙලා තිබෙනවා, ඒ වාගේම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ 10ක්, කන්තලේ 19ක්, මඩකලපුවේ 22ක්, අම්පාරේ 4ක් අහිමි වෙලා තිබෙනවා.

ඊළඟට ක්ලේමෝර් බෝම්බ සවි කර පහර දීම් නිසා යාපනයේ 7ක්, වවුනියාවේ 20ක්, ත්‍රිකුණාමලයේ 12ක්, කන්තලේ 5ක්, මඩකලපුවේ 14ක් සහ අම්පාරේ 1ක් ජීවිතක්ෂයට පත් වුණා. මේ මෑතකදී සිදු වුණ අතිශෝචනීය සිද්ධිය තමයි, කැබිතිගොල්ලෑවේ සිද්ධිය. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමකු හැටියට, දක්ෂ නීතිඥවරයකු හැටියට මේ සිද්ධිය අනුමත කරයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. මේ වාගේ ක්ලේමෝර් බෝම්බ තියලා අහිංසක දරුවෝ, අත දරුවෝ ඝාතනය කළ ඒ සිදු වීම සම්බන්ධව තමුන්නාන්සේලා කල්පනා කර බලන්න. මා මේවා කියන්නේ මෙමගින් එක එක පැති සාධාරණීය කරන්න නොවෙයි. මේ ප්‍රශ්නය මත අහිංසක ද්‍රවිඩ ජනතාවත්, සිංහල ජනතාවත් ඒ වාගේම මුස්ලිම් ජනතාවත් මැරෙනවා. හැම පාර්ශ්වයකම අය මේ ප්‍රශ්නය මත මැරෙනවා. [බාධා කිරීමක්]

ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා
(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)
(The Hon. M. K. Shivajilingm)
රජයේ ත්‍රස්තවාදය තමයි, දෙමළ ජනතාව මරා දැම්මේ. ඒක මතක තියා ගන්න. [බාධා කිරීමක්]

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ. பீ ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara )
මේ තත්ත්වය ඔබතුමාට දැන ගන්නට ඕනෑ නම්, –[බාධා කිරීමක්] මෙය පටන් ගත්තේ ප්‍රභාකරන් නේ?

ගරු රෝහන දිසානායක මහතා (මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - நெடுஞ்சாலைகள் பிரதி அமைச்சரும் நகர அபிவிருத்தி, நீர் வழங்கல் பிரதி அமைச்சரும்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Highways and Deputy Minister of Urban Development and Water Supply)
ප්‍රභාකරන් මරපු ද්‍රවිඩ නායකයෝ කොච්චර ඉන්නවාද?

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ. பீ ஜகத் புஷ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara )
තමුන්නාන්සේලාගේ නායකයෝ කවුද මැරුවේ?

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
තුරෙයප්පා මැරුවේ කවුද? අපිද?

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க்)
(The Hon. Rohana Dissanayake)
එතුමා මැරුවේ කවුද? [බාධා කිරීම්] තමුන්නාන්සේලා හය වෙන්න එපා. තමුන්නාන්සේලා හයයි මම දන්නවා. [බාධා කිරීම්]

ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා
(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)
(The Hon. M. K. Shivajilingm)
ආණ්ඩුවේ සහය තිබෙන නිසා තමයි, ඒ ගොල්ලෝ මැරුවේ. ඒක මතක තියා ගන්න. ආණ්ඩුවට තමයි වාසි.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
සම්පන්දන් මන්ත්‍රීතුමා, අද තමුන්නාන්සේලා කථා කරන්නේ එල්ටීටීඊ එකට. තමුන්නාන්සේලා පත් කරලා එවලා තමුන්නාන්සේලා ලියලා දුන්නු කථාව මේ කරන්නේ. අද දවසේ තමුන්නාන්සේලාගේ මේ විවාදයේ හරය මොකක්ද? එල්ටීටීඊ එකේ අවශ්‍යතාවයි මේ ඉෂ්ට කරන්නේ. එම නිසා මා පැහැදිලිව කියන්නේ මේකයි. තමුන්නාන්සේලා නියෝජනය කරන්නේ සාමාන්‍ය ද්‍රවිඩ ජනතාව නොවෙයි. තමුන්නාන්සේලා නියෝජනය කරන්නේ එල්ටීටීඊ සංවිධානයයි. තමුන්නාන්සේලා ඒක පැහැදිලිව දන්නවා. තමුන්නාන්සේලා කොච්චර නැහැ කිව්වත්, තමුන්නාන්සේලා එය පිළිගන්නවා. තමිල් සෙල්වන් එන්නය කියා දැනුම් දුන්නාම මුලතිව්වලට ගිහිල්ලා, කිලිනොච්චියට ගිහිල්ලා චීස් කකා, බිස්කට් කකා ඔවුන්ගේ උපදෙස් ටික අහගෙන ඇවිල්ලා තමයි, මෙහාට කරුණු ඉදිරිපත් කරන්නේ. -[බාධා කිරීමක්]- අර කියන්නා වාගේ තමුන්නාන්සේලා මේ රටේ වැදගත් දේවල් කතා කරන්නට තිබෙන අවස්ථාව නැති කරන්න හදනවා. තමුන්නාන්සේලා මේ කාරණාවත් කල්පනා කරලා බලන්න. යම් ආකාරයකින් අපේ හමුදා නිලධාරියෙකුට මුදවා නොගත් ප්‍රදේශයකදී අඩු ගණනේ යම් අනතුරක් සිදු වුණා නම් "යාපනයට ගිහින් ප්‍රතිකාර කරගෙන එන්න කොළඹට ගිහින් ප්‍රතිකාර කරගෙන එන්න" කියා තමුන්නාන්සේලා කියනවාද? තමුන්නාන්සේලාගේ එල්ටීටීඊ සංවිධානයේ මාධ්‍ය ප්‍රකාශක තමයි දයා මාස්ටර්. එතුමාට ප්‍රතිකාර ගන්නට කොළඹට යන්න අවශ්‍යයි කියා එතුමාගේ බිරිඳ උදව් ඉල්ලුවා. මානව දයාවෙන් පිරි නායකයෙක් හැටියට වර්තමාන අතිගරු ජනාධිපතිතුමා ඒ දෙස බැලුවේ මිනිස්කමෙන් යුතුවයි. ඒක මතක තියා ගන්න. මිනිස්කමෙන්, මානව දයාවෙන් යුතුව බලා තමයි ඒ විධියට කටයුතු කළේ. ඒ නිසා තමුන්නාන්සේලාට - [බාධා කිරීමක්]

ගරු එම්. කේ. ඊලවේන්දන් මහතා
(மாண்புமிகு மா. க. ஈழவேந்தன்)
(The Hon. M. K. Eelaventhan)

It does not function because of the High Security Zones. You deprive us of it and then blame us. - [Interruption.]

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஸ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara )
සුත්තර පුංචා ඉඳගන්න. දැන් මොකක්ද කියා තිබෙන්නේ? කිලිනොච්චියේ තමුන්නාන්සේලාගේ වෛද්‍යවරු මොකක්ද කියා තිබෙන්නේ? පැය 24ක් තුළ සැත්කමක් කරන්න. එහෙම නොකළොත් ජීවිතය බේරා ගන්නට බැහැ කිව්වාය කියා තිබෙනවා. ඇවිල්ලා බලන කොට ලෙඩක් නැහැ. හැබැයි සමහර වෙලාවට මේකට ඉඩ නොදී කටයුතු කළා නම්, තව සිද්ධියක් වුණා නම් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එහෙම කියා හෙලිකොප්ටරයක් දුන්නා නම් මේක වෙන්නේ නැහැ කියා එදා රාජිත සේනාරත්න මන්ත්‍රීතුමා කිව්වා වාගේ දයා මාස්ටර්ට ඇවිල්ලා බෙහෙත් ගන්න දුන්නා නම් මේක වෙන්නේ නැහැ කියා. ඒ නිසා මම වැදගත් කොට සලකනවා, අපේ ජනමාධ්‍යවේදී මනෝජ් අබයදීර මහතා බොහොම ලස්සණට වැදගත් විධියට ඒක විග්‍රහ කරලා 'දිවයින' පුවත් පතේ සඳහන් කර තිබීම.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද? [බාධා කිරීමක්]

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஸ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara )
කියන කොට අහගන්න. Earphone එක දමා ගන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ කවුද කියලා මම අහන්නේ.

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஸ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara )
මනෝජ් අබයදීර මහත්මයා. Library එකට ගිහිල්ලා බලන්න. මනෝජ් අබයදීර.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කාගේ වාහනේ ද ආවේ.?

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஸ்பகுமார)
(The Hon. A. P. Jagath Pushpakumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාගේ වාහනයේ ද ආවේ කියන එකට ඉස්සෙල්ලා මට දැන ගන්න ඕනෑ දෙයක් තිබෙනවා, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දැන් වැදගත් ප්‍රශ්නයක් ඇහැව්වා. දයා මාස්ටර් ඇවිල්ලා ඇපලෝ රෝහලේ ප්‍රතිකාර ගන්න කොට, රහසේ ගිහිල්ලා එතුමාත් එක්ක පැය එක හමාරක් සාකච්ඡා කරපු දේශපාලනඥයා කවුද?

ගරු මන්ත්‍රීවරයෙක්
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)
උත්තරයක් දෙන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)
කවුද ගියේ?

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara )
රහසේ ගිහිල්ලා සාකච්ඡා කළේ කවුද?

ගරු දයාසිරි ජයසේකර මහතා
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)
කවුද ඒ ගිය එක් කෙනා,?

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara )
අන්න ඒක තමයි ඕනෑ. ඒක තමයි මම අහන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)
කවුද, ගිය එක් කෙනා?

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara )
දොස්තර මහත්තයෙක් යන්න ඇත්තේ. මා හිතන හැටියට සමහර විට ප්‍රතිකාර දෙන දොස්තර මහත්මයෙක් යන්න ඇති.

ගරු මන්ත්‍රීවරයෙක්
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)
දත් දොස්තර කෙනෙක් ද?

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara )
ඒ නිසා මට මේ රටේ ජනතාවට කියන්න කාරණාවක් තියෙනවා. අද එල්ටීටීඊ සංවිධානයේ මාධ්‍ය ප්‍රකාශක ඇපලෝ රෝහලට ඇවිල්ලා ප්‍රතිකාර ගන්න කොට, ඇපලෝ රෝහලට ගිහිල්ලා පැය එක හමාරක් රහසේ සාකච්ඡා කරපු මේ දොස්තර මහත්තයා නැත්නම් මේ දේශපාලනඥයා කවුද කියන එක මේ රටේ ජනතාවට හෙළි කරන්න කාලය උදා වෙලා තියෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)
කෝ, හෙළි කරන්න තිබුණා නේ. ඔය කියන්නේ අසත්‍යයක්.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ තැපැල් හා විදුලි සංදේශ නියෝජ්‍ය අමාත්‍ය)
*(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு அமைச்சரும் தபால், தொலைத் தொடர்புகள் பிரதி அமைச்சரும்)*
(The Hon. Rohitha Abeygunawardena - Minister of Foreign Employment Promotion and Deputy Minister of Posts and Telecommunication)
දයාසිරි මට කියනවා, ජයලත් කියලා කියන්නලු,

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara )
අද එල්ටීටීඊ සංවිධානයේ සෙබළු මැරෙනවා. මේ යුද්ධයට ප්‍රභාකරන්ගේ පුතා යන්නේ නැහැ. ඒක මා මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. දැන් තමුන්නාන්සේලා පහසුකම් ඉල්ලනවා. අපේ රජය උතුරු නැගෙනහිර ප්‍රදේශවලට පහසුකම් දෙනවා. සෞඛ්‍ය පහසුකම් දෙනවා, විදුලිය ලබා දෙනවා, වැව් සංවර්ධන වැඩසටහන යටතේ වාරි සංවර්ධන කටයුතු කරනවා; වී මිල දී ගැනීම සඳහා කිලිනොච්චියට සල්ලි දුන්නා. සම්පන්දන් මන්ත්‍රීතුමාට මා මෙය කියන්න කැමැතියි. අද අහිංසක දෙමළ තරුණයෝ යුද්ධ කරනවා. ඒ ප්‍රදේශවලට අධ්‍යාපන පහසුකම් දෙනවා. නමුත් ප්‍රභාකරන්ගේ දුවරහා දියණිය එංගලන්තයේ අධ්‍යාපනය ලබනවා. අහිංසක සාමාන්‍ය දෙමළ ජනතාව වෙනුවෙන් ද තමුන්නාසේලාගේ මේ අරගලය? තමුන්නාන්සේලා ඔය කියන විමුක්තිය ඒ අය සඳහා ද? ඒ නිසා මා එය පැහැදිලිව කියන්න කැමැතියි. මේ සියලු සංවර්ධන කටයුතු සඳහා - [බාධා කිරීමක්]

ගරු දයාසිරි ජයසේකර මහතා
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රභාකරන්ගේ දුව රට ඇරියේ කවුද?

ගරු මන්ත්‍රීවරයෙක්
*(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)*
(An Hon. Member)
ආගමන විගමන පාලක.

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara )
මේ අවස්ථාවේ මම තමුන්නාන්සේලාට පැහැදිලිව කියන්න ඕනෑ. උතුරු නැගෙනහිර පළාත කියලා වෙනම සලකන්නේ නැහැ. අපේ වර්තමාන ජනාධිපතිතුමා - අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා - අපට පැහැදිලිව උපදෙස් දී තිබෙනවා, වර්ග කරන්නේ නැතිව, භේද කරන්නේ නැතිව සියලුම සංවර්ධන කටයුතුවලට සහයෝගය දෙන්න කියලා. පළමු වන වතාවට අතිගරු ජනාධිපතිතුමා පළාත් හැටියට බෙදපු ඇමතිකම් නැති කළා. පළාත් හැටියට දකුණු පළාතට ඇමතිවරයෙක්, මධ්‍යම පළාතට ඇමතිවරයෙක්, ඊළඟට ඌව පළාතට ඇමතිවරයෙක්, උතුරට ඇමතිවරයෙක් කියන සංකල්පය නැති කළා. ඒ විධියට විශාල සංවර්ධන කටයුතු සඳහා පළාත් හැටියට වෙන් කරපු ඇමතිකම් නැති කළා. බෞද්ධ කටයුතුවලට වෙනම, මුස්ලිම් කටයුතුවලට වෙනම, හින්දු කටයුතුවලට වෙනම, ක්‍රිස්තියානි කටයුතුවලට වෙනම කියන භේදකාරී විධියට ඇති කළ අමාත්‍යාංශ නැති කළ. ඒක ගරු මහේස්වරන් මන්ත්‍රීතුමාත් දන්නවා. ඒ වෙනුවට අපේ රජය සියලුම ආගම් වෙනුවෙන් ආගමික කටයුතු අමාත්‍යාංශයක් ඇති කර, ඒ තුළ විවිධ දෙපාර්තමේන්තු ඇති කරමින් කටයුතු කළ බව විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ.

තමුන්නාන්සේලා උතුරු නැගෙනහිර ජන ජීවිතය සම්බන්ධයෙන් විමසුවා. දැනටමත් මුදා ගත් ප්‍රදේශවල අනෙක් ප්‍රදේශත් මුදා ගන්නවා. කලබල වෙන්න එපා. ඒ ටිකත් වැඩි කල් යන්න ඉස්සර වෙලා මුදා ගන්න සිද්ධ වෙනවා.

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
*(மாண்புமிகு ஜீ. ஜீ. பொன்னம்பலம்)*
(The Hon. G. G. Ponnambalam)
ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා ඒ ප්‍රදේශවල ජන ජීවිතය ගැන කථා කළේ නැහැ.

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara )
ඇත්තද? එහෙම නම් ඉල්ලපු එක සම්බන්ධයෙන් කියන්නම්. ජන ජීවිතය සම්බන්ධයෙනුත් කියන්නම්. දැනටමත් ඒ ප්‍රදේශවල නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. ඊළඟට බිම් බෝම්බ ඉවත් කර ගැනීමට කටයුතු කිරීම, නිවාස සපයා දීමේ වැඩ පිළිවෙළ, ඒ වාගේම යාපනයේ ආරක්ෂිත කලාපයේ තිබෙන පිළිකා රෝහලේ ප්‍රතිකාර ලබා ගැනීමේ පහසුකම්. ඊළඟට ඉන්ධන

[ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා]

සහ ආහාර සැපයීම, ධීවර කර්මාන්තය සඳහා තිබෙන යම් යම් බාධක අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම, [බාධා කිරීමක්] මම දන්නවා මේවා කියන කොට දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ප්‍රධාන එක්සත් ජාතික පක්ෂයට ලොකු අමාරුවක් තිබෙන බව. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඒක දන්නවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මේ පක්ෂයේ ඉඳලා අද විපක්ෂයේ ඉන්න වෙලා තිබෙනවා. මේ පක්ෂයේ හිටියා නම් අද තමුන්නාන්සේත් ඇමතිවරයෙක්. මේවාට ඊර්ෂ්‍යා, කරන්න එපා. තමුන්නාන්සේ ඊර්ෂ්‍යා කරන්න එපා. "ජී.එල්.පීරිස් මන්ත්‍රීතුමාත් එක්ක යන්න ගිහිල්ලා මම අමාරුවක වැටුණා'' කියලා, තමුන්නාන්සේ පසු ගිය දවස්වල මා එක්ක කිව්වා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)

අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. ඕවා අසත්‍ය. [බාධා කිරීම්]

**ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා**
*(மாண்புமிகு ஏ. பீ. ஜகத் புஷ்பகுமார)*
(The Hon. A. P. Jagath Pushpakumara)

තමුන්නාන්සේ මාත් එක්ක කිව්වා මේ පක්ෂයේ හිටියා නම් අඩුම ගණනේ නියෝජ්‍ය අමාත්‍ය කැල්ලක්වත් හම්බ වෙනවා කියලා, ඒ නිසා තමුන්නාන්සේ මට බාධා කරන්න එපා. තමුන්නාන්සේ දන්නවා නේ, කියපු ඒවා. අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ නායකයා වන කොට තමුන්නාන්සේ "සාධු'' කියලා පිළිගත්තා. ඔබතුමා හැම දාම එතුමාට ආදරෙයි. ඒක මම දන්නවා. එදා "අතිගරු ජනාධිපතිතුමා මේ රටේ රාජ්‍ය නායකයා වේවා'' කියන කොට තමුන්නාන්සේ "සාධු'' කියලා ඒක අනුමත කළා. ඒ නිසා තමුන්නාන්සේ එතුමාට ආදරෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ කටයුතු කර ගෙන යන්න අවශ්‍ය සහයෝගය දෙනවා. ඒ නිසා මම ද්‍රවිඩ සන්ධානයේ මන්ත්‍රීතුමන්ලාට පැහැදිලිව කියනවා අපි මෙතැන විවාද කර ගන්නවත්, යුද්ධ කර ගන්නවත් නොවෙයි, එකම රටක් හැටියට මේ රටේ සංවර්ධනයට පිය නඟන්න සියලු දෙනාම එකමුතුව මේ ප්‍රශ්නය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගෙන මේ රට දියුණු රටක් කරන්නට ආදර්ශයක් දෙමු. කියා. ඒ සඳහා අපි එකතු වෙමු කියන ආරාධනාව කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ. භා. 3.10]

**ගරු බෂීර් සේගුඩාවුඩ් මහතා**
*(மாண்புமிகு பஷீர் சேகுதாவூத்)*
(The Hon. Basheer Segu Dawood)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ பாராளுமன்ற உறுப்பினர் சம்பந்தன் ஐயா அவர்களால் முன்மொழியப்பட்ட இன்றைய வடக்கு - கிழக்கு நிலைமை சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணையிலே உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்கு உங்களுக்கு நன்றி கூறிக்கொள்கின்றேன். இன்றைய வடக்கு - கிழக்கு நிலைமை மிகவும் மோசமாகக் காணப்படுகின்றது என்பதை இந்தச் சபையிலே கூறியாக வேண்டும். கடந்த ஜனாதிபதித் தேர்தலின் பின்பு, யுத்தத்திலே பிரதான தரப்புக்களாக இருக்கின்ற அரசாங்கத்துக்கும், தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்துக்கும் இடையிலே மிக மோசமாக சந்தேகங்கள் வளர்ந்திருக்கின்றன ; மிக மோசமாக அவநம்பிக்கைகள் தோற்றம் பெற்றிருக்கின்றன. இந்த நிலைமையிலே, தமிழீழ விடுதலைப் புலிகள் அரசாங்கத்தைத் தாக்கக்கூடும் என்ற சந்தேகமும், அரசாங்கம், வடக்கு - கிழக்கிலே தாக்குதல்களைத் தொடுக்கக் கூடும் என்ற சந்தேகமும் இன்று நாட்டை ஒரு பாரிய யுத்தத்தை நோக்கி நகர்த்தி வருவதனால், சாதாரண பொதுமக்களின் வாழ்க்கைக்கு அச்சுறுத்தலான சூழ்நிலைகள் தோன்றியிருக்கின்றன. மக்கள் ஒரு யுத்தத்தின் விளிம்பிலே நின்றுகொண்டிருக்கின்றார்கள் என்பதற்கு ஆதாரமாகப் பல விடயங்கள் நடைபெற்று வருகின்றன.

வடக்கு - கிழக்குப் பகுதிகளிலே அப்பாவிப் பொதுமக்கள் படுமோசமாகப் படுகொலை செய்யப்பட்டிருக்கிறார்கள் ; படுமோசமாக அங்கவீனப்படுத்தப்பட்டிருக்கிறார்கள் ; சொத்துக்கள் படுமோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றன. அதேபோன்று, வடக்கு - கிழக்கிலே மாற்று இயக்கங்களைச் சேர்ந்தவர்கள் கொலை செய்யப்பட்டிருக்கிறார்கள். தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தைச் சேர்ந்த உறுப்பினர்களும் கொலை செய்யப்பட்டிருக்கிறார்கள். தமிழீழ விடுதலைப் புலிகள், தங்களுடைய கட்டுப்பாட்டுப் பகுதியிலே போராட்டத்தை மக்கள் மயப்படுத்துகின்ற அடிப்படையிலே பொதுமக்களுக்கான இராணுவப் பயிற்சிகளை வழங்கியிருக்கின்றார்கள். அவர்களுடைய முன்னரங்கு நிலைகள் பலப்படுத்தப்பட்டிருக்கின்றன. இலங்கை அரச படைகளும் தன்னுடைய முன்னரங்குகளைப் பலப்படுத்தி, ஆளணிகளைப் பலப்படுத்தி, அதிகமான ஆயுதங்களைச் சேகரிக்கின்ற நிலைமைகளைப் பார்க்கின்றோம். அதேபோன்று, இன்று அரசாங்கம் வடக்கு - கிழக்கிலும், அதை அண்டிய மாவட்டங்களில் இருக்கின்ற எல்லைக் கிராமங்களுக்கும் 'அம்பியூலன்ஸ்' வண்டிகளை வழங்கி வருகின்றது. அந்தப் பகுதிகளிலே இருக்கின்ற வைத்தியசாலைகள் வளப்படுத்தப்படுகின்றன. உட்கட்டமைப்பு வசதிகள் அவசரமாகச் செய்யப்படுகின்றன. எல்லைக் கிராமங்களில் இருக்கின்ற இளைஞர்களுக்கு ஆயுதங்களை வழங்கி பாதுகாப்பு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன. இவ்வாறான ஒரு சூழ்நிலை "அனைத்து மக்களும் தங்களைத் தாங்களே பாதுகாத்துக் கொள்கின்ற நிலைக்கு வாருங்கள்!" என்று சொல்வதைப் போன்றுதான் உள்ளது.

இதேவேளை, இந்த யுத்த நிறுத்தத்தைக் கண்காணிப்புச் செய்கின்ற கண்காணிப்புக் குழுவினுடைய பணியும் சவாலுக்கு உட்படுத்தப்பட்டுள்ளது. இலங்கையின் இனப் பிரச்சினையைத் தீர்த்துவைக்க வேண்டும் என்ற சருவதேச சமூகத்தினுடைய அக்கறையில் கீழிறக்கம் காணப்படுகின்றது. கண்காணிப்புக் குழுவிலே அங்கம் வகிக்கின்ற ஐரோப்பிய நாடுகளைச் சேர்ந்த அங்கத்தவர்களைக் கண்காணிப்புப் பணியிலிருந்து நீக்குவதற்குத் தமிழீழ விடுதலைப் புலிகளால் விதிக்கப்பட்ட 'செப்தெம்பர் முதலாம் திகதி' என்ற அந்தக் காலக்கெடுவும் நெருங்கி வருகின்றது. இனப்பிரச்சினை தீர்த்துவைக்கப்பட வேண்டும் என்று முயற்சிகள் மேற்கொள்ளப்பட்ட கடந்த நான்கரை ஆண்டுகாலப் பகுதியில் கடந்த பேச்சுவார்த்தைக் காலங்களிலே வடக்கு - கிழக்கில் இருந்த அரசியல் நிலைமைகள் மற்றும் பேச்சுவார்த்தை மூலம் ஏற்பட்ட புரிந்துணர்வுகள், பரஸ்பரம் நம்பிக்கையைக் கட்டியெழுப்புகின்ற நிலைமைகள் எல்லாம் சீர்குலைந்து, இன்று வடக்கு - கிழக்கு ஓர் இராணுவத்தளமாக மாறி வருவதை நாங்கள் பார்க்கின்றோம் ; மக்கள் மிகுந்த அச்சத்துடன் வாழ்கின்ற நிலைமையை அவதானிக்கின்றோம்.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

Order Please! Mr. Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereuon* MR. DEPUTY SPEAKER *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු බෂීර් සේගුඩාවුඩ් මහතා**
*(மாண்புமிகு பஷீர் சேகுதாவூத்)*
(The Hon. Basheer Segu Dawood)

வடக்கு - கிழக்கு மாகாணங்களில் வாழ்கின்ற மக்கள் நிர்க்கதியான நிலையில் தவிக்கின்ற நிலைமையைப் பார்க்கின்றோம். அங்கு வாழ்கின்ற மக்கள் கொடூரமான

யுத்தத்துக்கு முகங்கொடுத்து தமது சொந்த ஊர்களிலேயே அகதி வாழ்க்கை வாழ்ந்து, இன்று தங்களைத் தாங்களே கவலையுடன் நோக்குகின்ற நிலைமையைப் பார்க்கின்றோம். இந்த அரசாங்கத்துக்கும், தமிழ்த்தேசத்துக்கும் அனைத்துத் தரப்பினருக்கும் இந்த நிலைமையில் மாற்றத்தைக் கொண்டுவரவேண்டிய பொறுப்பு இருக்கின்றது. விசேடமாக இன்று சிங்களத் தீவிரவாதத்தைப் பேசுகின்ற சிறிய கட்சியினரின் கொள்கையிலும் மனப்பான்மையிலும் மாற்றங்கள் ஏற்படாதவரை, அக்கட்சியினரின் தயவில் தங்கியுள்ள அரசின் நிலைப்பாட்டில் மாற்றத்தை ஏற்படுத்துவதற்கு வாய்ப்புகளில்லாத துரதிஷ்டமான சூழ்நிலை இருக்கின்றது. இந்த நிலையில் இந்த இனப்பிரச்சினைத் தீர்வில் சர்வதேச சமூகம் தனது கழுத்தை மேலும் உள்ளே நுழைத்துப் புதிய இராஜதந்திர முயற்சிகளைச் செய்யுமா? அல்லது புதிதாக வேறேதாவது பலப்பிரயோகங்களைச் செய்யுமா? என்ற சந்தேகம் எமது நாட்டு மக்களனைவருக்கும் ஏற்பட்டுள்ளது.

இன்று லெபனானிலே இஸ்ரேலின் கொடூரமான வான் தாக்குதலினால் குழந்தை குட்டிகளுட்பட நூற்றுக்கணக்கான முஸ்லிம் மக்கள் கொல்லப்பட்டிருக்கின்றார்கள். பெய்ரூட் நகரம் முற்றாக அழிந்து காணப்படுகின்றது. அங்குள்ள துறைமுகங்கள், அமைச்சுக் கட்டிடங்கள், பொது மக்கள் வாழும் குடிமனைகள் அனைத்தும் தகர்க்கப்பட்டுள்ளன. லெபனானுக்குச் சொந்தமான கடல் பிரதேசம் இஸ்ரேலியக் கடற்படையினரால் சுற்றிவளைக்கப்பட்டுள்ளது. இஸ்ரேல் தனது காலாட்படையினரை லெபனானுக்குள் அனுப்பப்போவதாக அச்சுறுத்துகின்ற நிலைமை காணப்படுகின்றது. லெபனான் மக்களின் உயிருக்கு எந்தவிதமான பெறுமதியுமில்லாத வகையில் அம்மக்கள் மீது மிகவும் கொடூரமான தாக்குதல்கள் கட்டவிழ்த்து விடப்பட்டுள்ளன. இரண்டே இரண்டு இராணுவத்தினரைக் கடத்திச் சென்றமைக்காக ஒரு நகரத்தையே அழிக்கின்ற, ஒரு நாட்டையே அழிக்கின்ற, அங்குள்ள மனுக் குலத்தையே அழிக்கின்ற மிகவும் மோசமான அடாவடித்தனமான, பிற்போக்குத்தனமான இராணுவ நடவடிக்கை விஸ்தரிக்கப்பட்டுள்ளது. சர்வதேச வல்லரசுகளுடைய நன்மை கருதி இன்று சர்வதேசப் படையொன்றை லெபனானின் தெற்குப் பகுதியிலே நிலைநிறுத்த வேண்டுமென்ற இராணுவ மூலோபாயத்துக்கு - அந்தச் சதித் திட்டத்திற்கு - இஸ்ரேல் ஆட்பட்டதன் விளைவாக அப்பாவி மக்கள் மீது இத்தாக்குதல்கள் கட்டவிழ்த்து விடப்பட்டுள்ளன. எனவே, இந்த அனுபவத்தை வடக்கு - கிழக்கில் வாழ்கின்ற தமிழ் பேசும் மக்களும், இலங்கை பூராவும் வாழ்கின்ற சிங்கள, தமிழ், முஸ்லிம் மக்கள் அனைவரும் கவனத்திற் கொள்ள வேண்டும். இதுவரை காலமும் இலங்கையின் இனப்பிரச்சினைத் தீர்வு விடயத்திலே சர்வதேச சமூகம் தன்னுடைய இராஜதந்திர அணுகு முறையைக் கடைப்பிடித்து வந்தது. அந்த இராஜதந்திர அணுகு முறைகள் தோற்றுப்போகின்றபொழுது அல்லது பின்னடைவைக் காணுகின்ற பொழுது, அவர்கள் மாற்றுத் திட்டங்களை வகுக்கின்ற முயற்சியை மேற்கொள்ளுகின்றபொழுது, வடக்கு - கிழக்கில் இன்று இருக்கின்ற களேபர நிலைமை பூதாகாரமாக மாறக்கூடிய ஆபத்து இருக்கின்றது. நாம், நமது நாட்டிலுள்ள மக்களுக்கிடையில் இருக்கின்ற பிரச்சினையை இராஜதந்திர அணுகுமுறைகளுக்கூடாக மாத்திரம் தீர்த்து வைக்காவிட்டால் சர்வதேச சமூகம் தனது நலனில் அக்கறை கொண்டு, உலக சமுதாயத்துக்கு அச்சுறுத்தல் இருக்கின்றதென்ற பெயரில் - மனிதாபிமானம் என்ற பெயரில் - மனித உரிமை மீறல் என்ற பெயரில் - மனிதர்களைக் காப்பாற்றுகிறோம் என்ற பெயரில் இங்கு தனது முழுமையான தலையீட்டைச் செய்வதற்குரிய வாய்ப்பிருக்கிறது. எனவே, தமிழ் தேசமும் இலங்கை அரசாங்கமும் தெற்கிலே வாழ்கின்ற சிங்கள மக்களும், தீவிரவாதம் பேசுகின்ற சிங்கள அரசியல் கட்சிகளும், முஸ்லிம் சமூகத்தைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற கட்சிகளும் ஒருநிலைப்பட்ட அடிப்படையிலே, எமது பிரச்சினைகளைச் சர்வதேச சமூகத்தினுடைய பலாத்காரப்பிரயோக மின்றி இராஜதந்திர அணுகுமுறையில், சர்வதேச சமூகத்தின் அனுசரணையுடனான பேச்சுவார்த்தை மூலமாக ஏன் தீர்த்துக்கொள்ள முடியாதெனச் சிந்திக்கவேண்டிய இறுதிச் சந்தர்ப்பம் இது என நான் நினைக்கின்றேன். எனவே, நாம் இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்த வேண்டும். இந்த நாட்டிலுள்ள பிரச்சினைகள் மீண்டும் புதிய வடிவமெடுத்து, புதிய கோணத்தில் தாக்குவதன் மூலம் மோசமாகப் பாதிக்கப்படுகின்ற சமுதாயமாக நமது மக்கள் வாழக்கூடாதென்கின்ற அடிப்படையில் நாம் நமது நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அந்த அடிப்படையிலே அரசும், எதிர்க்கட்சியும், ஏனைய சிறிய கட்சிகளும், விட்டுக்கொடுப்புடனும் புரிந்துணர்வுடனும் சரியான பங்களிப்பைச் செய்து, சகஜ நிலைமையைக் கொண்டுவர வேண்டுமென ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரசின் சார்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

கௌரவ உறுப்பினர் சம்பந்தன் ஐயா அவர்களுடைய உரையை யொட்டி JVP பாராளுமன்ற உறுப்பினர் விஜித ஹேரத் அவர்கள் இந்தச் சபையிலே கருத்துத் தெரிவித்தபொழுது, கிழக்கு மாகாணத்திலே முஸ்லிம்களின் நிலைமைகள் பற்றிப் பேசினார். எனவே, இன்று ஒரு புதிய நிலைமை தோற்றம் பெற்றிருக்கின்றது. கடந்த தேர்தலில் திருகோணமலையிலே முஸ்லிம் காங்கிரசுக்கு கிடைத்த 65 ஆயிரம் வாக்குகளையும் சிங்கள மக்களுடைய வாக்குகளையும் ஒன்றாக இணைத்தால், அவை அங்கு தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பெற்ற வாக்குகளை விட அதிகமானவை என்று இன்று இந்தப் பாராளுமன்றத்தில் சூடான வாதப் பிரதிவாதங்கள் - கருத்துப் பரிமாறல்கள் - இடம்பெற்றன. இந்த நிலைமையிலே நாங்கள் மிகத் தெளிவாகப் பார்க்க வேண்டிய ஒரு விஷயம் இருக்கின்றது. அதாவது, சிங்களத் தீவிரவாதம் என்பது கிழக்கிலே வாழ்கின்ற முஸ்லிம் களுடைய அரசியல் விருப்பத்தை அல்லது அவர்களுடைய அரசியலைத் தங்களுக்குச் சாதகமாகப் பயன்படுத்துகின்ற நிலைமையைப் பற்றியோ, வடக்கு - கிழக்கிலே இருக்கின்ற தமிழ்த் தேசியம் என்பது முஸ்லிம்களைத் தங்களோடு சேர்த்துப் பார்க்கின்ற நிலைமையைப் பற்றியோ நாங்கள் இன்று யோசிக்க முடியாது. ஆனால், முஸ்லிம் காங்கிரசுக்கு 65 ஆயிரம் வாக்குகள் திருகோண மலையிலே கிடைத்தது என்றால் - வடக்கு - கிழக்கிலே இலட்சக் கணக்கான முஸ்லிம்கள், முஸ்லிம் காங்கிரசுக்கு வாக்களித்தார்கள் என்றால், வடக்கு - கிழக்கிலே வாழ்கின்ற முஸ்லிம் மக்கள் தாங்கள் ஒரு சுயாதீனமான தனி இனம் என்ற தங்களுடைய அரசியல் அடையாளத்தை வெளிப்படுத்தியிருக்கின்றார்கள் என்பதுதான் அதனுடைய அர்த்தம். அவற்றை இன்று தெற்கிலே இருக்கின்ற சிங்களத் தீவிரவாதத்திற்குத் துணை போகின்ற, சிங்களத் தீவிரவாதத்திற்கு ஆதரவான வாக்குகளாக யாரும் பார்க்க வேண்டாம் என்றும், வடக்கு - கிழக்கிலே கிடைத்த அந்த முஸ்லிம் வாக்குகள் முஸ்லிம்களுக்கான சுயாட்சியை நிறுவிக் கொள்வதற்கு முஸ்லிம் மக்கள் முஸ்லிம் காங்கிரசுக்கு அளித்த ஆணை என்பதை தமிழ் தேசியமும் சிங்கள மக்களுக்கு மத்தியிலே இருக்கின்ற தீவிரவாதச் சிந்தனையுள்ள அரசியல் சக்திகளும் மனதிலே கொள்ள வேண்டும் என்றும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் சார்பாக நான் இந்த உயரிய சபையிலே கூறி வைக்கக் கடமைப்பட்டிருக்கின்றேன். அந்தப் பாராளுமன்றத் தேர்தலிலே, சமூக அடிப்படையிலான அதிகாரப் பரவலாக்கல், பேச்சுவார்த்தையிலே முஸ்லிம்களை மூன்றாந் தரப்பாக ஏற்றுக்கொள்ளல், வடக்கு - கிழக்கிலே வாழ்கின்ற முஸ்லிம் சமுதாயம் சுயாட்சியை அனுபவிக்க உரித்துடைய சமுதாயம் என்பதை அங்கீகரித்தல் என்பவற்றின் அடிப்படையில்தான் நாங்கள் அந்த மக்களிடம் வாக்குக் கேட்டோம். அந்த வகையில்தான் அன்று அந்த வாக்குகள் அளிக்கப்பட்டனவேயொழிய, வேறு எவருக்கும் வக்காலத்து வாங்குவதற்காக அளிக்கப்பட்டவை அல்ல என்பதையும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பாக நான் இந்தச் சபையிலே கூறிக்கொள்ளக் கடமைப்பட்டிருக்கின்றேன்.

இன்று வடக்கு - கிழக்கு மாகாணத்தைப் பிரிப்பதற்கான முயற்சிகள் மும்முனைகளில் மேற்கொள்ளப்படுகின்றன. இந்த நிலைமையிலே முஸ்லிம்கள் மீது தமிழ் தேசியம் அதீத அக்கறையைச் செலுத்த வேண்டும். பேச்சுவார்த்தைகள் இரண்டு சமூகங்களுக்கு இடையிலேயும் தோற்றம் பெற வேண்டும். இல்லாவிட்டால் கிழக்கு மாகாணத்திலே வாழ்கின்ற முஸ்லிம் மக்களுடைய அரசியல் ஆதரவு எந்தப் பக்கமும் கவிழக்கூடிய அச்சமிருக்கிறது. தமிழ் தேசியம் ஆயுதப் பலத்தை மாத்திரம் வைத்துக் கொண்டு அனைத்தையும் சாதிக்க முடியும் என்று கருதிவிடக் கூடாது. அப்படிக் கருதினால் அது அரசியலிலே தமிழ் - முஸ்லிம் மக்களுக்கு இடையிலான ஓர் உறவுக்கு, பேச்சுவார்த்தைக்குக் குந்தகமான ஒரு சிந்தனைக் கோட்பாடாக அமையும் என்ற ஆபத்தையும்

[ගරු බෂීර් සේගුඩාවූඩ් මහතා]

நான் இந்த இடத்திலே சுட்டிக் காட்ட விரும்புகின்றேன். வடக்கு - கிழக்கைப் பிரிப்பதற்கு மூன்று விதத்தில் முயற்சி மேற்கொள்ளப்படுகின்றது என்று நான் சொன்னேன். அதாவது, நிறைவேற்று அதிகாரம் கொண்ட ஜனாதிபதி அவர்கள் வடக்கு - கிழக்கைப் பிரிக்கப் போகின்றாரா, இல்லையா என்பதை எதிர் வருகின்ற நவம்பர் மாதம்தான் நாம் தெரிந்து கொள்ள முடியும். அவர் அதற்கான வர்த்தமானி அறிவித்தலில் கையெழுத்திடப் போகின்றாரா, இல்லையா என்பது நமக்கு இன்னும் தெரியாது. அடுத்து JVP யும் வடக்கு - கிழக்கைப் பிரிக்க வேண்டும் என்ற கோரிக்கையை நீதிமன்றத்தில் முன்வைத்திருக்கின்றது. அதுபோல், 'ஜாதிக ஹெல உறுமய' அவ்வாறான ஒரு தீர்மானத்தைப் பாராளுமன்றத்திலே தனிநபர் பிரேரணையாக முன்மொழிந்திருக்கின்றது. எனவே, வடக்கு - கிழக்குப் பிரிக்கப்பட வேண்டும் என்ற கோரிக்கைக்கு பாராளுமன்றத்தின் மூலமும் நீதித்துறை மூலமும் நடவடிக்கை மேற்கொள்ளப்படவிருக்கின்றது. நிறைவேற்று அதிகாரமுள்ள ஜனாதிபதியோடு நெருக்கமான இந்த இரண்டு கட்சிகளும் அவருடன் இது பற்றிப் பேசாமல் இருந்திருப்பார்களா என்ற கேள்விகளும் இதில் எழுகின்றன. எனவே, இது தமிழ் தேசியமும் முஸ்லிம் தேசியமும் ஒருங்கிணைந்து பேச வேண்டிய மிகவும் முக்கியமான காலகட்டம் என்பதை நான் இந்த இடத்திலே மிகத் தெளிவாகக் கூறிக் கொள்ள ஆசைப்படுகின்றேன். ஏனென்றால், இன்று வடக்கு - கிழக்கிலே வாழ்கின்ற தமிழ மக்களுடைய அரசியல் கோரிக்கைகளையும் அபிலாஷைகளையும் முஸ்லிம் மக்களுடைய அரசியல் கோரிக்கைகளையும் அபிலாஷைகளையும் ஒருமுகப்படுத்துவதன் மூலம்தான் தமிழ் மக்கள் அதியுச்சத் தொனியிலே பேசுகின்ற தமிழர் தாயகம் அல்லது தமிழ் - முஸ்லிம் மக்களின் தாயகம் என்ற கோட்பாட்டை ஒருங்கிணைக்க முடியும். வடக்கு - கிழக்கிலே தமிழ் மக்களும் நிலத் தொடர்பற்ற அடிப்படையிலேதான் வாழ்கின்றார்கள். முஸ்லிம் மக்களும் நிலத் தொடர்பற்ற அடிப்படையிலேதான் வாழ்கின் றார்கள். அந்த அடிப்படையிலான ஒரு தாயகத்தை வரையறுக்க வேண்டுமாக இருந்தால், தமிழ் மக்களுடைய அரசியல் அபிலாஷை களையும் முஸ்லிம் மக்களுடைய அரசியல் அபிலாஷைகளையும் ஒருமுகப்படுத்துகின்ற ஒரு வேலைத் திட்டத்தின் ஊடாக மாத்திரம்தான் முடியும்.

இன்று இங்கு பேசுகின்ற JVP உறுப்பினர்களாக இருந்தாலும் சரிதான், வேறு அரசு சார்பான உறுப்பினர்களாக இருந்தாலும் சரிதான், அல்லது வடக்கு - கிழக்கு தேசியத்திற்கும் கோட்பாட்டுக்கும் தமிழ் தேசியத்திற்கும் முஸ்லிம் தேசியத்திற்கும் எதிரான கோட்பாடுகளைக் கொண்டவர்களாக இருந்தாலும் சரிதான், இந்த நிலைமையைத்தான் அவர்கள் தங்களுடைய கருத்துக்களுக்கு ஆதரவாகப் பயன்படுத்தப் போகின்றார்கள் என்பதைப் பற்றி இன்று வலுவோடு இருக்கின்ற தமிழ் தேசியம் நன்றாகச் சிந்திக்க வேண்டும் என்ற கோரிக்கையும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் சார்பாக இந்த இடத்திலே நான் முன் வைக்கக் கடமைப்பட்டிருக்கின்றேன். அதேநேரம், இந்த ஒருமுகப்படுத்த லுக்குக் கடந்த காலம் இடம்பெற்ற பெரும் பிரச்சினைகள் தடையாக இருக்கின்றன. அதாவது, வடக்கிலேயிருந்து முஸ்லிம் மக்கள் வெளியேற்றப்பட்டிருக்கின்றார்கள். வடக்கு - கிழக்கு முஸ்லிம் மக்களுடைய தாயகம் என்ற கோட்பாட்டை சரியாகப் பின்பற்ற வேண்டுமாக இருந்தால், வடக்கிலே இருந்து பலாத்காரமாக வெளியேற்றப்பட்டு இன்று தெற்குப் பகுதிகளிலே அகதிகளாக வாழ்கின்ற மக்களுடைய தாயகப் பூமி பற்றிய விடயம் எவ்வாறு கையாளப்படும் என்பதை இங்கு சரியாக முன்மொழிவதற்கு தமிழ் தேசியம் தன்னுடைய அரசியல் கோட்பாட்டை வெளிப்படுத்த வேண்டிய அவசியம் இருக்கின்றது என்ற தெளிவான கருத்தையும் இந்த இடத்திலே நான் கூறிக் கொள்ள விரும்புகின்றேன்.

அதேபோன்றுதான் வடக்கு - கிழக்குப் பகுதிகளிலே அண்மையில் ஏற்பட்டிருக்கின்ற பூதாகாரமான நிலைமையையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். திருகோணமலை மாவட்டத்திலே இருக்கின்ற கேந்திர முக்கியத்துவம் வாய்ந்த நிலங்களைச் சுற்றிவளைத்து, அங்கு வாழ்கின்ற முஸ்லிம் சமுதாயத்துக்கு இன்று மாபெரும் அச்சுறுத்தல் விடுக்கப்பட்டிருக் கின்ற ஒரு நிலைமையை நாங்கள் பார்க்கின்றோம். யுத்தத்திலே பங்குபற்றுகின்ற இரண்டு தரப்பும் தங்களுடைய இராணுவச் சமநிலையைப் பேணுவதற்காக இராணுவ பலத்தில் உச்சநிலையை ஏற்படுத்திக்கொள்வதற்கான, உபாயங்களை வகுத்துக்கொள்கின்ற காலகட்டத்திலே முஸ்லிம்களுக்கு அச்சுறுத்தல் ஏற்பட்டிருக்கிறது. பொய்யாகவோ, மெய்யாகவோ, வேறு யாருடைய பெயரிலோ எல்லா முஸ்லிம்களும் வெளியேற வேண்டுமென்று நோட்டீஸ் அடித்து வெளியிடப்படுகின்ற துர்ப்பாக்கியமான நிலைமை இன்று அங்கு ஏற்பட்டிருப்பதைப் பர்க்கின்றோம். இதனைத் தமிழீழ விடுதலைப் புலிகள் செய்தாலும் செய்யாவிட்டாலும் அங்கிருக்கின்ற நிலைமையைத் தமிழ்த் தேசம் மிகத் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும். எந்த மடையன், எந்தப் பேய், எந்தப் பிசாசு, எந்தப் பைத்தியக்காரன், முஸ்லிம்கள் வெளியேற வேண்டுமென்று நோட்டீசை வெளியிட்டாலும், அது தமிழீழ விடுதலைப் புலிகளால் வெளியிடப்பட்ட நோட்டீஸ் என்றுதான் முஸ்லிம்கள் நம்பு கிறார்கள். அவ்வாறு அவர்கள் நம்புகின்ற நிலைமையை இல்லாமல் செய்வதற்குரியஅரசியல் முன்னெடுப்பாக எதனைத் தமிழ்த் தேசம் செய்யப்போகிறது? என்ற கேள்வியோடு இன்று முஸ்லிம் சமுதாயம் எதிர்பார்த்துக்கொண்டிருக்கிறது. ஏற்கெனவே வடக்கிலிருந்து முஸ்லிம்கள் வெளியேற்றப்பட்டிருப்பதனால், அந்த முன் அனுபவத்தின் அடிப்படையில் கிழக்கிலும் வெளியேற்றப் படக்கூடிய வாய்ப்பிருக்கிறது என்று முஸ்லிம்கள் நம்புகிறார்கள். எந்த முட்டாளினாலோ வெளியிடப்படுகின்ற துண்டுப்பிரசுரத்தைப் பார்த்து இவ்வாறு நம்பிக்கை கொள்கின்ற அவலமான நிலைமையை முஸ்லிம் சமூகத்திலிருந்து இல்லாதொழிக்கின்ற பொறுப்பு முஸ்லிம்களைப் பொறுத்தது அல்ல. முஸ்லிம்களுக்கு இருக்கின்ற அந்த அவநம்பிக்கையின் காரணமாக அவர்களால் வேட்கையுடன் செயற்பட முடியாமல் இருக்கின்றது. எனவே, அவர்களுடைய அந்த அனுபவங்களைச் சரியான பாடமாகக் கொண்டு முஸ்லிம்களுக்குத் தமிழ் தேசம் சரியான அரசியல் கருத்தைச் சொல்ல வேண்டிய கடப்பாடுடையதென இந்த உயரிய சபையிலே நினைவூட்ட விரும்புகிறேன்.

அதேபோன்று, மட்டக்களப்புக்கும் பொலன்னறுவைக்கும் இடையில் இருக்கின்ற எல்லைக் கிராமமான றிதீதென்ன என்கின்ற பிரதேசத்திலிருந்து முஸ்லிம்கள் வெளியேற வேண்டுமென்று கரடியனாற்றிலிருந்து தமிழீழ விடுதலைப் புலிகளால் மூன்று வகையான துண்டுப்பிரசுங்கள் அனுப்பப்பட்டதாகச் சொல்லப் படுகிறது. அந்தப் பிரசாரங்கள் மூன்றையும் நான் பார்த்தேன். அது ஒரு விடுதலை இயக்கம் எழுதிய கடிதத்தைப்போல இருக்க வில்லை. ஆனால், அவ்வாறான கடிதங்களைக்கூட முஸ்லிம் மக்கள் நம்புகின்ற நிலைமை இருக்கிறது. தமிழீழ விடுதலைப் புலிகளைச் சேர்ந்த உறுப்பினர்கள் தங்களை வெளியேறச் சொல்கிறார்கள் என்று அந்த ஊரிலே இருக்கின்ற முஸ்லிம்கள் சொல்கிறார்கள். அந்தப் பிரதேசத்திலேதான் தமிழீழ விடுதலைப் புலிகளின் முன்னாள் உறுப்பினரான கருணாவின் குழுவுக்கும் தமிழீழ விடுதலைப் புலிகளுக்குமிடையில் மோதல்கள் இடம்பெறுகின்றன. ஆகவே, இந்தச் சூழ்நிலைகளைப் பார்க்கின்றபோது எல்லைக் கிராமங்களில் வாழ்கின்ற முஸ்லிம் மக்களும் மிகவும் மோசமாகப் பாதிக்கப்படுகின்ற ஆபத்து இருக்கின்றது. எனவே, இந்த அச்சத்தைப் போக்கவேண்டிய பொறுப்பு தமிழீழ விடுதலைப் புலிகளுக்குரியது ; தமிழ் தேசத்துக்குரியது ; தமிழ் அரசியல் சக்திகளுக்குரியது. அதற்கான பேச்சுவார்த்தைகள் ஆரம்பிக்கப்பட வேண்டும் என்பதை இந்த இடத்திலே நான் நினைவூட்ட விரும்புகிறேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நிலைமைகளைச் சரியாகப் புரிந்துகொண்டு எதிர்காலத்தில் வடக்கு - கிழக்கில் 4ஆம் கட்ட ஈழப்போர் ஒன்று ஆரம்பித்தால் ஏற்படக்கூடிய மிகவும் மோசமான அழிவிலிருந்து தமிழ், முஸ்லிம் மக்களையும் அந்த மக்களின் சொத்துக்களையும் பாதுகாக்க வேண்டியது மட்டுமல்ல, இரண்டு இராணுவ தரப்பினரும் மோதுகின்றபோது சாதாரண தமிழ் மக்களும் முஸ்லிம் மக்களுக்கும்

இடையிலே எந்தச் சந்தேகங்களும் வந்துவிடாமல், அந்த மக்களுக்கிடையில் எந்தவிதமான மோதல்களும் வந்து விடாமல் பார்த்துக்கொள்ள வேண்டிய பொறுப்பும் நம் அனைவரையும் சார்ந்தது என்பதை இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

இன்று லெபனானில் மக்களைக் கொல்லுகின்ற இந்த இஸ்ரேல்தான் 1985ஆம் ஆண்டு தமிழ் மக்களுக்கும் முஸ்லிம் மக்களுக்குமிடையே பிரிவினையை ஏற்படுத்தியது. அன்று இந்த மக்களுக்கிடையில் அந்த நாடு விதைத்த விதை, இன்றும் ஊன்றிய நிலையில் இருக்கின்ற நிலைமையை நாங்கள் பார்க்கின்றோம். எனவே, கடந்த காலங்களைப்போல முஸ்லிம் மக்களை எந்தக் காரணத்தைக் கொண்டும் தங்களுடைய புலனாய்வு நடவடிக்கைகளுக்குப் பயன்படுத்த வேண்டாம் என்றும் முஸ்லிம்களைச் சுதந்திரமாக இருக்க விடுமாறும் இலங்கைப் படையினருக்கு நான் கோரிக்கை விடுக்கின்றேன். அதேநேரத்தில், உங்களுக்குள் இருக்கின்ற பிரச்சினைகளில் போராட்டத்தின் ஒரு கட்டத்தைத் தனியார் மீது தொடுக்கின்ற சூழ்நிலையிலிருந்தும் முஸ்லிம் சமூகத்தை விடுதலை செய்ய வேண்டும். இவ்வாறாக அவர்களைப் பயன்படுத்துகின்ற நிலைமையை நீங்கள் விட்டொழிக்க வேண்டுமென்றும் வேண்டுகோள் விடுக்க விரும்புகிறேன். 1985ஆம் ஆண்டிலிருந்து இன்று வரைக்குமான இரண்டு தசாப்த காலங்களில் இருதரப்பும் முஸ்லிம் சமுதாயத்தைப் பரஸ்பரம் பயன்படுத்துகின்ற நிலைமை இருக்கிறது. தமிழ் தேசத்தினுடைய உண்மையான போராட்டத்திற்கு, விடுதலை உணர்விற்கு அவர்களுடைய அந்த வேட்கைக்கு எதிராக ஒரு சில முஸ்லிம் இளைஞர்களைப் பயன்படுத்துகின்ற போக்கை நாங்கள் அரச தரப்பிலிருந்தபோது கண்டிருக்கின்றோம்; அதற்கு எதிராக வேலை செய்திருக்கின்றோம். அதேபோன்றுதான் கடந்த காலங்களில் தமிழ் இயக்கங்களுடன் முஸ்லிம் இளைஞர்கள் இணைந்திருந்தார்கள். இந்த நிலைமையில் வடக்கு - கிழக்கிலுள்ள தமிழ், முஸ்லிம்களுக்கிடையில் பாரிய வேறுபாடும் பூதாகாரமான பிரச்சினைகளும் இனப்பூசல்களும் வெட்டுக்குத்துகளும் சுட்டுக் கொலைகளும் ஏற்பட்டிருக்கின்றன. வீடுகளும் வாகனங்களும் எரிந்திருக்கின்றன; மக்கள் அழிந்திருக்கின்றார்கள். எனவே, மீண்டும் இப்படியான கலவரங்கள் ஏற்படாமல் மக்களைப் பாதுகாக்க வேண்டிய பொறுப்பு நம்மைச் சார்ந்தது என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[අ. භා. 3.30]

**ගරු එම්. අයි. අන්වර් ඉස්මයිල් මහතා (වාරිමාර්ග අමාත්‍යතුමා)**
*(மாண்புமிகு எம். ஐ. அன்வர் இஸ்மாயில் - நீர்ப்பாசன அமைச்சர்)*
**(The Hon. M. I. Anver Ismail - Minister of Irrigation)**

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

இன்று, வடக்கு - கிழக்கின் தற்போதைய நிலைமை தொடர்பாக நடைபெறுகின்ற ஒத்திவைப்புப் பிரேரணையிலே உரையாற்றச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு மகிழ்ச்சி அடைகின்றேன். இந்த விவாதத்திலே, பல அமைச்சர்களும், பாராளுமன்ற உறுப்பினர்களும் பல்வேறுபட்ட கருத்துக்களை முன்வைத்தார்கள். குறிப்பாக, கிழக்கு மாகாணமானது, முஸ்லிம்கள் பெரும்பான்மையாக வாழ்ந்த மாகாணமாகும். கடந்த யுத்த காலத்தில் அவர்கள் எவ்வாறு அச்சத்துக்கு மத்தியில் வாழ்ந்தார்களோ, அவ்வாறுதான் சமாதான சூழ்நிலை நிலவிய காலத்திலும் வாழ்ந்தார்கள். ஓர் அடிமைச் சமுதாயமாக, ஆயுதங்களினால் அச்சுறுத்தப்படுகின்ற ஒரு சமுதாயமாக கிழக்கிலே உள்ள முஸ்லிம்கள் மாற்றப்பட்டு, தொடர்ந்தும் அதன் 'எச்சங்கள்' அரங்கேற்றப்பட்டுக்கொண்டிருக்கின்றன.

இந்த நாட்டிலே உள்ள இனப்பிரச்சினை தீர்க்கப்பட வேண்டுமென்ற நோக்கில் கடந்த காலங்களில் பல்வேறுபட்ட பேச்சுவார்த்தைகள் நடைபெற்றன. டட்லி - செல்வா ஒப்பந்தமாக இருக்கட்டும்! பண்டா - செல்வா ஒப்பந்தமாக இருக்கட்டும்! அதன் பின்பு நடைபெற்ற வட்டமேசைப் பேச்சுவார்த்தைகளாக இருக்கட்டும்! அப்போதெல்லாம், மாவட்ட அதிகாரசபை முறைகள் போன்ற அதிகாரப் பகிர்வு சம்பந்தமாகப் பேசப்பட்டபோது, வடக்கு - கிழக்கிலே வாழ்ந்த முஸ்லிம்கள், குறிப்பாக, கிழக்கிலே வாழ்ந்த முஸ்லிம்கள், தங்களைத் தாங்களே ஆளுகின்ற விதத்தில் எந்தவிதமான கோரிக்கையையும் முன்வைக்காமல், அந்த மாகாணத்திலே ஏனைய இனத்தவர்களோடு சமத்துவமாக வாழ முடியும் என்ற நம்பிக்கையிலே தான் வாழ்ந்து வந்தார்கள். ஆனால், அந்த நம்பிக்கைகளையெல்லாம் தூக்கியெறிந்த வரலாறு 1985 ஆம் ஆண்டு ஆரம்பித்தது. வடக்கு - கிழக்கிலே வாழுகின்ற தமிழ் மக்களுக்காகப் போராட வேண்டும் என்று புறப்பட்ட விடுதலை இயக்கங்கள், அன்று முஸ்லிம்கள் மீது தங்களுடைய தாக்குதல்களைத் தொடுத்தன. 1985 முதல் 2004 ஆம் ஆண்டு ஏப்பிறல் மாதம் வரை ஆயிரக்கணக்கான முஸ்லிம்கள் கொல்லப்பட்டார்கள். பல்லாயிரக்கணக்கான ரூபா பெறுமதியான அவர்களுடைய உடைமைகள் அழிக்கப்பட்டன; சொத்துக்கள் சூறையாடப்பட்டன. மூதூர், புல்மோட்டையிலிருந்து பொத்துவில் வரை, வடக்கு - கிழக்கு மாகாணம் எங்குமே முஸ்லிம்களின் இரத்தம் வழிந்தோடிய வரலாற்றை மறந்துவிட முடியாது.

அதுமாத்திரமன்றி, எனக்கு முன்னர் பேசிய முஸ்லிம் காங்கிரஸ் பாராளுமன்ற உறுப்பினரான பஷீர் சேகுதாவூத் அவர்கள் கூறியவாறு, உலக நாடுகளிலே குறிப்பாக, சப்ரா, சதில்லா போன்ற பிரதேசங்களிலே பள்ளிவாசல்களில் வைத்து முஸ்லிம்கள் எவ்வாறு இஸ்ரேலிய படைகளினால் கொல்லப்பட்டார்களோ, அதைவிடவும் கொடூரமான முறையில் காத்தான்குடியிலும், இதர பிரதேசங்களிலும் பள்ளிவாசல்களில் தொழுதுகொண்டிருந்த பல நூற்றுக்கணக்கான முஸ்லிம்கள் கொல்லப்பட்டார்கள். இவ்வாறாக, முஸ்லிம்கள் அச்சுறுத்தப்பட்டு, அடிமைப்படுத்தப்பட்டிருந்த சூழ்நிலையிலேதான், இந்த நாட்டிலே சமாதானத்தை ஏற்படுத்துவதென்ற போர்வையிலே, 'சமாதானம்' என்ற நாமத்தோடு ஐக்கிய தேசிய முன்னணி அரசு தமிழீழ விடுதலைப் புலிகளுடன் அன்று புரிந்துணர்வு உடன்படிக்கையொன்றைச் செய்துகொண்டது. அந்த உடன்படிக்கை செய்யப்பட்ட வேளை, ஐக்கிய தேசிய முன்னணி அரசாங்கத்தின் ஓர் அங்கமாக அன்று நாங்கள் இருந்தும்கூட, அதில் உள்ளடங்கியிருக்கின்ற விடயங்கள் பற்றி வெளிப்படையாக எதுவும் பேசாமல் இரகசியமாக, கள்ளத்தனமாக, இரவோடிரவாக அந்த ஒப்பந்தம் தயாரிக்கப்பட்டு இறுதியிலே கைச்சாத்திடப்பட்டது. எனவே, யுத்த காலத்தில் நாங்கள் அனுபவித்த அவலங்களை விடவும் சமாதான காலத்திலே பல்வேறுபட்ட கஷ்டங்களை அனுபவிக்கவேண்டிய நிர்ப்பந்தம் எங்களுக்கு ஏற்பட்டது. கடந்த காலங்களில், ஐக்கிய தேசியக் கட்சி ஆட்சிபீடத்தில் இருந்தபோது, இந்திய அமைதி காக்கும் படை அன்று கிழக்கிலங்கைக்கும் வரக் காரணமாக இருந்த, இந்திய - இலங்கை உடன்படிக்கை எவ்வாறு முஸ்லிம் மக்களைக் கலந்தாலோசிக்காமல் செய்யப்பட்டதோ, அவ்வாறுதான் ரணில் விக்கிரமசிங்க அவர்களுடைய அரசாங்கத்தினாலும் சருவதேச மத்தியஸ்தம் என்ற போர்வையிலே நோர்வேயின் அனுசரணையுடன் விடுதலைப் புலிகளோடு புரிந்துணர்வு ஒப்பந்தம் செய்யப்பட்டது. ஈற்றிலே, சமாதானம் நிலவிய அந்தக் காலத்தில் முஸ்லிம்கள் படுபயங்கரமாக கொல்லப்பட்டபோது, அல்லது அரச படைகளுக்கு முன்னிலையில் அவர்கள் சுட்டுக்கொல்லப்பட்டபோது, அவர்களுடைய சொத்துக்கள் சூறையாடப்பட்டபோது, வாழைச்சேனை பிரதான வீதியில் வைத்து பெற்றோருடைய கண்ணெதிரிலேயே முஸ்லிம் இளைஞர்கள் எரிக்கப்பட்டபோது, அன்றைய அரசும் அரசுக்கு ஆதரவளித்து வந்த இதர கட்சிகளும் மாத்திரமல்லாமல், நோர்வே அனுசரணையாளர்களும் மௌனம் சாதித்த வரலாற்றை நாங்கள் மறந்துவிட முடியாது.

வடக்கு - கிழக்கில் வாழ்கின்ற மக்களுக்குச் சமாதானம் வேண்டும்; அதிகாரப்பகிர்வு வேண்டும் என்று பேசுகின்ற தமிழ் சக்திகள், முஸ்லிம் மக்களைப்பற்றி எண்ணிய வரலாறு ஒருபோதும் இல்லை. கடந்த காலங்களில் இந்த நாட்டிலே எந்தவிதமான குற்றத்தையும் செய்யாமல் தண்டிக்கப்பட்ட ஒரு சமுதாயம் இருக்குமாகவிருந்தால், அது முஸ்லிம் சமுதாயமென்பதனை இந்த நாடோ, உலகமோ மறந்து விட முடியாது. வட மாகாணத்தில் வாழ்ந்த அப்பாவிகளான ஓர் இலட்சம் முஸ்லிம்

[ගරු එම්. අයි. අන්වර් ඉස්මයිල් මහතා]

மக்கள் இரவோடிரவாக வெளியேற்றப்பட்டார்கள். அந்த முஸ்லிம்களை மீளவும் அவர்களுடைய சொந்த இடங்களில் குடியமர்த்துவதற்கு இன்று வரையில் யாரும் எத்தகைய நடவடிக்கையும் எடுக்கவில்லை என்பதை இந்தச் சபையில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

2002 ஆம் ஆண்டு செய்துகொண்ட புரிந்துணர்வு உடன் படிக்கையின் பின்னர் விடுதலைப் புலிகளின் தலைவர் வேலுப்பிள்ளை பிரபாகரனுக்கும் சகோதரர் றவூப் ஹக்கீம் அவர்களுக்குமிடையில் ஓர் உடன்படிக்கை கைச்சாத்திடப்பட்டது. அந்த உடன்படிக்கையில், 24 மணித்தியாலங்களுக்குள் முஸ்லிம்கள் அவர்களின் சொந்த இடங்களில் மீளவும் குடியமர்த்தப்படுவார்கள் என்று வெளிப்படையாகக் கூறப்பட்டது. ஆனால், இன்று வரையில் ஒரு முஸ்லிம்தானும் அங்கு குடியேற்றப்படவில்லை. அவர்களுக்குரிய நிலங்கள் யாவும் இன்று சூறையாடப்பட்டுள்ளன. முஸ்லிம்களால் புனிதமாக் கருதப்படுகின்ற வழிபாட்டுத் தலங்களில், "வுழு" செய்வதற்காகப் பாவிக்கப்படுகின்ற "ஹவுதுகள்" யாவும் இன்று விடுதலைப் புலிகளின் நீச்சல் தடாகங்களாக மாற்றப்பட்டுள்ளன. இத்தகைய சூழ்நிலையிலே வடக்கு - கிழக்கிலுள்ள முஸ்லிம்களாகிய நாங்கள் எந்த நம்பிக்கையுடன், எத்தகைய விசுவாசத்துடன் வாழ முடியுமென்பதைச் சிந்தித்துப் பார்க்க வேண்டும். இதனாலேயே மறைந்த தலைவர் மர்ஹூர் எம். எச். எம். அஷ்ரஃப் அவர்கள் இனப்பிரச்சினை உக்கிரமடைந்த சூழ்நிலையிலே, "வடக்கு - கிழக்கு இணைப்பு என்பதுதான் வடக்கு - கிழக்கு மாகாணங்களில் வாழ்கின்ற தமிழ் மக்களுடைய அபிலாஷையாகவிருக்குமாகவிருந்தால், வடக்கு - கிழக்கு இணைப்பு மாத்திரம்தான் தமிழ் பேசும் மக்களுடைய விடுதலையாகவிருக்குமாகவிருந்தால், நாங்கள் அதற்குக் குறுக்காக நிற்கவில்லை. ஆனால், வடக்கு - கிழக்கு மாகாணங்கள் நிபந்தனையுடன் இணைக்கப்படவேண்டும். வடக்கு - கிழக்கு மாகாணங்களில் வாழ்கின்ற முஸ்லிம் பெரும்பான்மைப் பிரதேசங்களை உள்ளடக்கிய - நிலத்தொடர்பற்ற - முஸ்லிம்களே, முஸ்லிம்களை ஆளக்கூடிய ஆட்சியதிகாரம் வழங்கப்படவேண்டும்" என மிகத்தெளிவாகக் கூறியிருந்தார். அந்த அடிப்படையில் இன்று வடக்கிலும், கிழக்கிலும் வாழ்கின்ற முஸ்லிம்கள் எந்த நம்பிக்கையின் அடிப்படையில், அல்லது எந்த எதிர்பார்ப்பின் அடிப்படையில் வடக்கு - கிழக்கில் இணைந்து வாழ முடியுமென்பதனை நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டும். கடந்த காலத்தில் பள்ளிவாசலிலும், பாதைகளிலும், வயல்வெளிகளிலும், அகதிமுகாம்களிலும் முஸ்லிம் மக்களைக் கொன்ற வரலாறுகள் இருக்கும்பொழுது, தமிழ் மக்களும் முஸ்லிம் மக்களும் "புட்டும் தேங்காய்ப்பூவும் போன்று" என்ற பழைய கதையை எவ்வாறு மீண்டும் அரங்கேற்றுவது என்று கேட்டுக்கொள்ள விரும்புகின்றோம். அத்தகைய ஒரு நம்பிக்கையூட்டுகின்ற, முஸ்லிம்களுக்குச் சாதகமான எந்தவொரு விடயத்தையும் இதுவரையில் தமிழ் தரப்பினரோ, தமிழ் சக்திகளோ, அல்லது விடுதலைப்புலி களோ, வெளிக்காட்டவில்லை என்பதனைக் கடந்த கால வரலாறுகள் நிரூபித்துக்கொண்டிருக்கின்றன. ஆகவே, குறிப்பாக கிழக்கு மாகாண முஸ்லிம்களாகிய நாங்கள் மிகவும் தெளிவாக இருக்கின்றோம்.

இன்று எனக்கு முன்னர் பேசியவர்கள் 65,000 வாக்குகளைப் பெற்றதாகக் கூறிக்கொண்டு இன்று சில காரணங்களை முன் வைத்தார்கள். ஆனால், 65,000 வாக்குகளுக்குள்ளும் இருக்கின்ற முஸ்லிம் உணர்வுகள் வடக்கு - கிழக்கு இணைப்பு விடயத்திலே மிகவும் மாறுபாடான கருத்துக்களைக் கொண்டுள்ளன. தலைவர் மர்ஹூம் எம். எச். எம். அஷ்ரஃப் அவர்கள் 1999 ஆம் ஆண்டில் இதே பாராளுமன்றத்தில் மிகவும் தெளிவாகக் கூறியிருந்த அந்த விடயங்களை இந்த நாடே அறிந்திருக்கின்ற சூழ்நிலையிலே, அந்த மக்களின் ஆணையைப் பெற்றவர்கள் ஒருபோதும் இன்னுமோர் இனத்தின் கீழ் வாழ்வதற்குரிய அரசியல் முடிவை எடுக்க முடியாது. ஆகவே, வடக்கு - கிழக்கு மாகாணங்களை இணைப்பதாகவிருந்தால், முஸ்லிம் பிரதேசங்கள் உள்ளடக்கிய பிரதேசங்களை சுயாட்சிப் பிரதேசங்களாக வரையறுப்பதென்ற நிபந்தனையுடன் இணைக்கப்பட வேண்டும். அவ்வாறிணைக்கப்படாவிடில், வடக்கு - கிழக்கைப் பிரித்தேயாக வேண்டுமென்பதுதான் இன்று கிழக்கில் வாழ்கின்ற அனைத்து முஸ்லிம் மக்களினதும் நிலைப்பாடாக இருக்கின்றது. இன்று முஸ்லிம் மக்கள், வடக்கு - கிழக்கு இணைப்பு விடயத்தை எவ்வாறு இராஜதந்திர ரீதியாக அணுகுவதென்ற சிந்தனையுடன் இருக்கிறார்கள். இன்று ஜே. வி. பீ. யினர் நீதிமன்றத்திற்குச் சென்றிருக்கிறார்கள். ஜனநாயக நாட்டிலுள்ள எவருக்கும் நீதிமன்றத்திற்குச் சென்று நீதி கேட்கும் உரிமை இருக்கிறது. அதே போன்று 'ஹெல உறுமய' கட்சியினர் பாராளுமன்றத்திலே மசோதா ஒன்றைச் சமர்ப்பித்திருக்கிறார்கள். அவர்களும் ஜனநாயக வழியிலே கேட்கிறார்கள். அந்த அடிப்படையில் வடக்கு - கிழக்கிலே வாழ்கின்ற முஸ்லிம்களின் அரசியல் உரிமைகள் மறுக்கப்படுமாக அல்லது முற்றாக அழிக்கப்படுமாகவிருந்தால், உடனடியாக அன்று ஜே. ஆர். ஜயவர்தன அவர்களும் ராஜீவ் காந்தி அவர்களும் இலங்கை இந்திய உடன்படிக்கையில் எதைக் கூறினார்களோ, அதனை நடைமுறைப்படுத்துகின்ற வகையிலே வடக்கு - கிழக்கு இணைப்புக்கான சர்வஜன வாக்கெடுப்பை உடனடியாக நடத்த வேண்டும். அந்த மக்கள் தீர்ப்பின் மூலம் இந்த அரசு உரிய நடவடிக்கைகளை மேற்கொள்ளமுடியும்.

இன்று அம்பாறை மாவட்டத்தில் மாத்திரமல்ல, மூதூர் பிரதேசத்திலிருந்தும் இதர பிரதேசங்களிலிருந்தும், அன்று வடமாகாணத்திலிருந்து முஸ்லிம்கள் எவ்வாறு விரட்டப்பட்டார்களோ, அவ்வாறே முஸ்லிம் மக்களை வெளியேறுமாறு கூறுகிறார்கள்; 24 மணித்தியாலம், 72 மணித்தியாலம் என்று கால அவகாசம் விதித்துக் கொண்டிருக்கின்றார்கள். அவ்வாறுதான் மட்டக்களப்பு மாவட்டத்திலேயும் அத்தகைய நடவடிக்கைகளில் ஈடுபட்டுக் கொண்டிருக்கின்றார்கள். கடந்த இரண்டு மாதங்களுக்குள் என்னுடைய தனிப்பட்ட இல்லம் இரண்டு முறை விடுதலைப் புலிகளினால் கிரனைட் தாக்குதலுக்குள்ளாகியது. மயிரிழையிலே நாங்கள் உயிர் தப்பினோம். இரண்டாவது முறை நடத்தப்பட்ட தாக்குதல் கடந்த மாதம் 11 ஆந் திகதி 8.30 மணியளவிலே மேற்கொள்ளப்பட்டது. கடந்த 3 ஆந் திகதி 7.50 மணியளவிலே என்னுடைய தனிப்பட்ட உதவியாளரும் மற்றும் இரண்டு பொலிஸ்காரர்களும் கிரனைட் தாக்குதலுக்குள்ளானார்கள். இறுதியாக, கடந்த 9 ஆந் திகதி என்னுடைய பாதுகாப்பு உத்தியோகத்தரான அப்பாவி ஊர்காவல் படைவீரர் ஒருவர் தன்னுடைய இல்லம் சென்று கொண்டிருந்தபொழுது, இரவு 7.30 மணியளவிலே சுட்டுக் கொல்லப்பட்டார். இவ்வாறு அங்குள்ள முஸ்லிம் பிரதேசங்களிலே இன்று பிரச்சினைகளைக் கட்டவிழ்த்து விடுவதற்குத் தீய சக்திகள் துடித்துக் கொண்டிருக்கின்றன.

நேற்று முன்தினம் வெளியான சில தமிழ் பத்திரிகைகள் பிழையான செய்தியொன்றை வெளியிட்டிருக்கின்றன. அதாவது, சம்மாந்துறை பிரதேசத்திற்கு ஆறு மணிக்குப் பின்பு எந்தத் தமிழ் மக்களும் வரக்கூடாது என்று அங்குள்ள பள்ளிவாசல்கள் முடிவெடுத்துள்ளதாக அவை தெரிவித்திருக்கின்றன. இதில் உள்ள உண்மையைத் தெளிவாக விளங்கிக் கொள்ள வேண்டும். அண்மையில் சம்மாந்துறையில் தொடர்ச்சியாக இடம்பெற்று வந்த சம்பவங்களின் பின்னர், சம்மாந்துறையை அண்டியுள்ள இதர முஸ்லிம் பிரதேசங்களின் பாதுகாப்பு நிலைமையைக் கருத்தில் கொண்டு, சம்மாந்துறை பிரதேசத்திலுள்ள பள்ளிவாசல்களின் நம்பிக்கையாளர் சபை உறுப்பினர்களும் அதேபோன்று கோயில் தர்மகர்த்தாக்களும் இணைந்து, அங்குள்ள தற்போதைய நிலைமையின் காரணமாக, ஆறு மணிக்குப் பின்பு தமிழ் பிரதேசங்களுக்கு முஸ்லிம்கள் செல்லக்கூடாது என்றும் முஸ்லிம் பிரதேசங்களுக்கு தமிழ் மக்கள் செல்லக்கூடாது என்றும் முடிவு செய்தார்கள். அது அங்குள்ள தற்போதைய நிலைமையைக் கருத்திற்கொண்டு எடுக்கப்பட்ட தற்காலிக முடிவேயாகும்.

இந்தச் சபையிலே நாங்கள் ஒன்றை மாத்திரம் கூறிக் கொள்ள விரும்புகின்றோம். அதாவது, நாங்கள் இந்த நாட்டைப் பிரித்துக் கேட்கவில்லை. இந்த நாடு ஒற்றையாட்சியின்கீழ் இருக்க வேண்டும் என்பதில் நாங்கள் முற்றுமுழுதாக நம்பிக்கை வைத்திருக்கின்றோம். ஆனால், யார் சுட்டுக் கொல்லப்பட்டாலும் பரவாயில்லை எமது வரலாற்றில் எத்தனையாயிரம் முஸ்லிம்கள் பலி கொடுக்கப்பட்டாலும்

பரவாயில்லை, வடக்கு - கிழக்கிலே இருக்கின்ற எந்தவொரு முஸ்லிமும் ஆயுதம் தாங்கிய சக்திகளின் கீழ் அடிமைப்பட்டவராக இருக்க விரும்பவில்லை. பிரபாகரனாக இருந்தாலும் சரி, சம்பந்தனாக இருந்தாலும் சரி, நீங்கள் நினைக்கின்ற அந்தச் சமாதானத்தை அல்லது உங்களின் கரங்களுக்கு அதிகாரம் வருகின்ற அந்த நிலைமையை நீங்கள் ஒருபோதும் முஸ்லிம்களுடன் முரண்பட்டுக் கொண்டு அடைய முடியாது என்று கூறி விடைபெறுகின்றேன். நன்றி. அஸ்ஸலாமு அலைக்கும்.

[අ. භා. 3.42]

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
*(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)*
(The Hon. Jayalath Jayawardana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි මුළු දවස පුරාම විවාදයට ලක් කළේ උතුරු නැඟෙනහිර වර්තමාන තත්ත්වය පිළිබඳවයි. ආණ්ඩු පක්ෂයෙනුත්, විපක්ෂයෙනුත් මේ තත්ත්වය පිළිබ.ඳව විවිධ මත, චෝදනා, යෝජනා ඉදිරිපත් වුණා. අපි කවුරුත් පිළිගන්නවා, උතුරු නැරගෙනහිර සිංහල ජනතාව, දෙමළ ජනතාව සහ මුස්ලිම් ජනතාව දැඩි පීඩනයකට ලක් වී සිටින බව. දකුණේ ජීවත් වන අපට වඩා මේ රටේ ස්ථිරසාර සාමයක් ගැන උනන්දුක් දක්වන්නේ උතුරු නැඟෙනෙහිර අහිංසක ජනතාවයි කියන එක මම පැහැදිලිව කියන්නට ඕනෑ. මේ ප්‍රශ්නය පිළිබඳව අපි කථා කරද්දී පසුගිය අවුරුදු 50 තුළම අපි විවිධ පටු දේශපාලන වාසි ලබ ගන්නට උත්සාහ ගත්තා. සිංහල ජන නායකයෝ, ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක්. මේ වන විට මේ ජාතික ප්‍රශ්නය නිසා 60,000කට වඩා අධික ජීවිත අපට අහිමි වෙලා තිබෙනවා. 30,000කට වඩා අධික ජීවිත සංඛ්‍යාවක් අතුරුදහන් වෙලා තිබෙනවා. තරුණ වැස්දඹුවන් 10,000කට අධික සංඛ්‍යාවක් අද උතුරු නැඟෙනහිර සිටින බව වාර්තා වෙලා තිබෙනවා සිංහල වෙන්නට පුළුවන්; දෙමළ වෙන්නට පුළුවන්; මුස්ලිම් වෙන්නට පුළුවන්. මේ සෑම ජන කොට්ඨාසයක්ම යුද්ධය නිසා මේ තත්ත්වයට මුහුණ පා තිබෙනවා. උතුරු නැඟෙනහිර යටිතල පහසුකම් සම්පූර්ණයෙන් විනාශ වෙලා; ජන ජීවිතය අඩාළ වොලා; පාසල්, රෝහල් වි නාශ වෙලා; මාර්ග පහසුකම් නිවාස විනාශ වෙලා. එහෙම නම් මේ ප්‍රශ්නය අපි තවදුරටත් ඉදිරියට ගෙන යනවාද කියන ප්‍රශ්නයට හැමදාම උත්තරයක් හොයන්න උත්සාහ කරනවා. එක්සත් ජාතික පක්ෂ රජයේ පාලන කාල සීමාව තුළ – 2001 සිට 2004 කාල සීමාව තුළ රනිල් වික්‍රමසිංහ වර්තමාන විපක්ෂ නායකතුමාගේ, එක්සත් ජාතික පක්ෂ නායකතුමාගේ දර්ශනය අනුව, නායකත්වය අනුව අපි සාම ක්‍රියාවලියක් ආරම්භ කළා. අපි 2001 සටන් වි රාම ගිවිසුමක් –

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
*(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose that the Hon nadarajah Raviraj do take the Chair?

**ගරු රෝහන දිසානායක මහතා**
*(மாண்புமிகு ரோஹண திசாநாயக்க)*
(The Hon. Rohana Dissanayake)

I propose that the Hon. Nadarajah Raviraj do noe take the Chair.

**ගරු පී. රාධක්‍රිෂ්නන් මහතා**
*(மாண்புமிகு பீ. இராதாகிருஷ்ணன்)*
(The Hon. P. Radhakrishnan)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.*
*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නඩරාජා රවිරාජ් මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே மாண்புமிகு நடராஜா ரவிராஜ் அவர்கள் அக்கிராசனத்தமர்ந்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair.* THE HON. NADARAJAH RAVIRAJ *took the Chair.*

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
*(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)*
(The Hon. Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සාම ක්‍රියාදාමය පිළිබඳව විවිධ චෝදනා එක්සත් ජාතික පක්ෂයට සහ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාට කරනු ලැබුවා. සටන් විරාම ගිවිසුම 1815 අත්සන් කළ කන්ද උඩරට ගිවිසුමටත් වඩා භයානක දේශ ද්‍රෝහී, ජාති ද්‍රෝහී ගිවිසුමක් හැටියට හඳුන්වා දුන්නා. රනිල් වික්‍රමසිංහ කියන්නේ නූතන දොන් ජුවන් ධර්මපාල කියා පෙළපාළි ගියා. බලයට පත් වුණු ගමන් මේ සටන් විරාම ගිවිසුම කෑලි කෑලිවලට ඉරා විසි කරනවා කියා ජනතාවට පොරොන්දුවක් දුන්නා; ප්‍රතිඥාවක් දුන්නා නෝර්වේ "සුදුකොටි" කියා කිව්වා, සුදු කොටි එලවනවා කිව්වා; නෝර්වේ එලවනවා කියා කිව්වා; සටන් විරාම ගිවිසම අහෝසි කරනවා කියවා කිව්වා. මේ සියලුම චෝදනා මැද අද මොකද වෙලා තිබෙන්නේ? අද සාම ක්‍රියාදාමය අනාරක්ෂිත තත්ත්වයට, අවාසනාවන්ත තත්ත්වයට පත් වෙලා තිබෙනවා. කැබිතිගොල්ලෑවේ අහිංසක මිනිස් ඝාතන සිදු වුණා. ජීවිත ආරක්ෂාව සඳහා මන්නාරම පේසාලේ කතෝලික දේවස්ථානයකට ගිය අහිංසක ද්‍රවිඩ ජනතාව අඩු අමුවේ මැරුම් කෑවා. උතුරු නැඟෙනහිර සිංහල මායිම් ගම්මානවල සිටින ජනතාව අද ගම් අත හැර දමා යනවා. මට ප්‍රථම කථා කළ අපේ හිතවත් නියෝජ්‍ය අමාත්‍යතුමා, නැඟෙනහිර පළාතේ මුස්ලිම් ජනතාව අද මොන තරම් බියෙන් සැකෙන් ජීවත් වෙනවාද, මන්ත්‍රීවරයකු හැටියට මහජන නියෝජිතයකු හැටියට අද එතුමා මොන තරම් තර්ජන ගර්ජන මැද ජීවත් වෙනවාද කියන කාරණය ගැන මේ ගරු සභාවේදී දැන් ප්‍රකාශ කළා. ඒ වාගේම, උතුරේ, අහිංසක ද්‍රවිඩ සරණාගතයෝ සිය දහස් ගණනක් අද තමුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න තමුන්ගේ අඹු දරුවොත් සමඟ දකුණු ඉන්දියාවේ තමිල්නාඩුවට පලා යනවා. පසුගිය මාස හයක වාගේ කාල සීමාවක් තුළ සිය දහස් ගණනක් අහිංසක ද්‍රවිඩ සරණාගතයින් දකුණු ඉන්දියාවට පැන ගිහින් සිටිනවා. නැඟෙනිහර පළාතේ සිටින මුස්ලිම් ජනතාව, නැඟෙනහිර පළාතේ මායිමේ සිටින සිංහල ජනතාව අද ගම්බිම් අතහැර යනවා. මේක ඉතාමත්ම ශෝචනීය තත්ත්වයක්.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා සර්ව පාක්ෂික සමුළුවක් කැඳවුවා. වග කිය යුතු විපක්ෂයක් හැටියට, අන්තවාදී ජාතිවාදී නොවන විපක්ෂයකද් හැටියට මේ රටේ සාමය උදා වීම අවංකව ප්‍රාර්ථන කරන පක්ෂයක් හැටියට, එක්සත් ශ්‍රී ලංකාවක් තුළ වර්ගවාදී අර්බුදයට තිරසාර දේශපාලන විසඳුමක් ලැබිය යුතුයි; ලබා ගත යුතුයි; යුද්ධය නොවෙයි, මේ වර්ගවාදී අර්බුදයට වි සඳුමක් අවශ්‍යයි කියන මතය දරන පක්ෂයක් හැටියට අපි සර්ව පාක්ෂික සමුළුවට සහභාගි වුණා. අද උපදේශක කමුටුවක්, නියොජිත කමුටුවක් පත් කිරීම පිළිබඳව කථා කරනවා. මේ පිළිබඳව අපේ පක්ෂයේ ස්ථාවරය ජනාධිපතිවරයාටත්, රටටත් පැහැදිලි කර තිබෙනවා. ඒ මොකක්ද? අද පවත්නා මේ වර්ගවාදී අර්බුදයට දේශපාලන විසඳුමක් සොයා ගත යුතුයි කියන ස්ථාවරය මත අද එක්සත් ජාතික පක්ෂය සිටිනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සිටිනවා. ජනතා විමුක්ති පෙරමුණෙත්, ජාතික හෙළ උරුමයත් ඔවුන්ගේ මැතිවරණ ප්‍රකාශනවල සඳහන් කර තිබෙනවා, මේ වර්ගවාදී අර්බුදයට පිළිතුර දේශපාලන මිසඳුමයි, යුද්ධය නොවෙයි කියා. එහෙම නම් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය තම ස්ථාවරය ජනතාවට පැහැදිලි කරන් ඕනෑ. වි රුද්ධ පක්ෂයක් හැටියට එක්සත් ජාතික පක්ෂයටත් අද මේ ස්ථාවරය හෙළි කරන්න ඕනෑ. අවසාන විසඳුමක් ඉදිරිපත් කළ යුතුයි කියා අපි කියන්නේ නැහැ. නමුත් මොන රාමුව තුළ ද මේ විසඳුම සොයන්නේ කියන එක රජය අද ප්‍රකාශ කරන්න ඕනෑ. මේ ස්ථාවරය ප්‍රකාශ කරන ගමන් අපි රජයට යෝජනා කළා, නැවත වරක් සාම සාකච්ඡා ආරම්භ කරන්න, ටෝකියෝ ප්‍රකාශනය හොඳ ආරම්භයක් කියා. ඇයි, අපි ටෝකියෝ ප්‍රකාශනය හොඳ ආරම්භයක් කියා කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටෝකියෝ ප්‍රකාශනයෙන් රජයටත් එල්ටීටීඊ සංවිධානයටත් පැහැදිලිවම දැනුම් දීමක් කර තිබෙනවා, ශ්‍රී ලිකාවේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා වන තිරසාර දේශපාලන විසඳුමක් සොයා ගත යුතුයි කියා. මේ ටෝකියෝ ප්‍රකාශනයේ තිබෙන ඊළඟ වැදගත්කම මොකක්ද? මේ ටෝකියෝ ප්‍රකාශනය ලෝකයේ බලවත් රටවල් 53ක් -

[ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා]

ඇමෙරිකා එක්සත් ජනපදය, නෝර්වේ, ජපානය, යුරෝපා සංගමය පමණක් නොවෙයි, ලෝකයේ රටවල් 53ක් පිළිගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, පොදු රාජ්‍ය මණ්ඩලය, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ආසියානු සංවර්ධන බැංකුව, ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සියලුම සවිධාන ටෝකියෝ ප්‍රකාශනය පිළිගෙන තිබෙනවා. මේ ටෝකියෝ ප්‍රකාශනයේ තිබෙන ඊළඟ වැදගත්කම මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටෝකියෝ ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් කරනවා, මේ වර්ගවාදී අර්බුදයට දේශපාලන විසඳුමක් සොයා ගැනීමේදී මේ රටේ සියලුම ජන වර්ගයන්හි ජනතාවගේ මානව හිමිකම් ආරක්ෂා විය යුතුයි කියා. නැගෙනහිර ප්‍රශ්නය ගැන කථා කරන විට අනිවාර්යයෙන්ම මුස්ලිම් නියෝජනයක් සහභාගී කර ගත යුතුයි. ඒ වාගේම, ක්‍රමානුකූලව නිර්යුදමය තත්ත්වයක් ඇති කිරීම පිළිබඳව අවිහරණය පිළිබඳව – de-escalation කියා අපි ඉංග්‍රීසියෙන් කියනවා. - ටෝකියෝ ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් වෙනවා. අද රජය අවංක නම්, අද ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා අවංක නම්, සත්‍යවාදී නම්, ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා වන ආකාරයෙන් මේ වර්ගවාදී අර්බුදය විසඳීම සඳහා අද අවශ්‍ය වන්නේ දේශපාලන විසඳුමක් නම්, අද සාම සාකච්ඡා ආරම්භ කිරීම සඳහා ටෝකියෝ ප්‍රකාශනය පදනම් කර ගත යුතුයි කියන එක පැහැදිලිව මා මේ අවස්ථාවේදී කියනවා.

අද දේශපාලන යථාර්ථයට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ රජය වෙනුවෙන් ජිනීවා ගිය රජයේ දූත කණ්ඩායම අවසානයේදී ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කළා. මොකක්ද ඒ ප්‍රකාශය? එක්සත් ජාතික පක්ෂය ආරම්භ කරපු සටන් විරාම ගිවිසුම ආරක්ෂා කරන්න, ශක්තිමත් කරන්න අද ඔවුන් එකඟ වෙනවාය කියලයි ඒ ප්‍රකාශයෙන් කියවුණේ. ඒ වාගේම, මේ සඳහා නෝර්වේ රජයේ මැදිහත් වීම අද ඔවුන් පිළිගෙන තිබෙනවා. වර්තමාන රජයේ විදේශ කටයුතු අමාත්‍යවරයා - මංගල සමරවීර මහත්මයා - අද ගිහිල්ලා ජාත්‍යන්තර ප්‍රජාවට මොනවාද කියන්නේ? මේ සාම ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න නෝර්වේ රජය පාර්ශ්වකරුවන් හැටියට ඉදිරියටත් අප පිළිගන්නවාය කියලයි. අන්න ඒක තමයි අද යථාර්ථය බවට පත්වෙලා තිබෙන්නේ.

රජයේ සාම දූත කණ්ඩායමේ නායක අමාත්‍ය නිමල සිරිපාලද සිල්වා මහත්මයා පසු ගිය සතියේ මා සමඟ තුලාව වැඩ සටහනට සහභාගී වුණා. එතුමා දැන් මේ සභා ගර්භයේ සිටියා නම් මා සතුටු වෙනවා. එතුමා පැහැදිලිව කිව්වේ මොකක්ද? "මේ වර්ගවාදී අර්බුදයට යුධමය විසඳුමක් නැහැ. සාමකාමී විසඳුමක් පමණයි තිබෙන්නේ " කියලයි. එතුමා කිව්වේ ඒ විසඳුම සොයා ගන්න ජාත්‍යන්තර ප්‍රජාවගේ ආරක්ෂාව, ජාත්‍යන්තර ප්‍රජාවගේ මැදිහත්කම, ජාත්‍යන්තර ප්‍රජාවගේ රැකවරණය අවශ්‍ය වෙනවා. ඒ වාගේම, මේ වර්ගවාදී අර්බුදයට දේශපාලන විසඳුමක් සොයා ගැනීම ඒ තරම් ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. විවිධ බාධක, කම්කටොලු මැද මේ ගමන යා යුතුයි කියලා අද නිමල් සිරිපාල ද සිල්වා මහත්මයා කියනවා. ඒ විතරක් නොවෙයි. එතුමා කියනවා, 'එක්සත්' 'ඒකීය' කියන වචනවලට, මේ හරඹවලට අප කොටු වෙලා අද මේ ප්‍රශ්නය විසඳන්න බැහැ කියලා. එහෙම නම් එදා එක්සත් ජාතික පක්ෂය දරපු ස්ථාවරය, ඒ දේශපාලන යථාර්ථය අද වර්තමාන රජයට මනාව පැහැදිලි වෙලා තිබෙනවා ය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කර දෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
*(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
Hon. Member, you have one minute more.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
*(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)*
(The Hon. (Dr.)Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන රජය දැන් නොබෙදුණු ශ්‍රී ලංකාවක් ගැන කථා කරන්න පටන් අරන් තිබෙනවා. එක්සත් ශ්‍රී ලංකාවක් ගැන කථා කරන කොට නොබෙදුණු ශ්‍රී ලංකාවක් ගැන කථා කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අවසාන වරට පැවතුනු වාර්ෂික සම්මේලනයේදී ඒකමතිකව යෝජනාවක් සම්මත කරගෙන තිබෙනවා. ඒ යෝජනාව තමයි, එක්සත් ශ්‍රී ලංකාවක් තුළ මේ ජාතික අර්බුදයට දේශපාලන විසඳුමක් සොයා ගත යුතුය කියන එක. එක්සත් ශ්‍රී ලංකාවක් ගැන කවුද ඉස්සර වෙලාම කථා කළේ? එක්සත් ජාතික පක්ෂය නොවෙයි. 2000 වර්ෂයේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිවරිය මේ පාර්ලිමේන්තුවට ගෙනාපු යෝජිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ තමයි එක්සත් ශ්‍රී ලංකාවක් ගැන United Sri Lanka ගැන කථා කළේ. එහෙම නම් අපි අද හෘදය සාක්ෂියට අවංක වෙමු..

රජීව් ගාන්ධි - ජේ. ආර්. ජයවර්ධන ගිවිසුම ගැන අද කථා කළා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කළා. අප අතීතයේ ජීවත් වෙනවාද? අතීතයේ මැරී මැරී ඉපදෙනවාද, අප ඉදිරියට යනවාද කියක එක තමයි අද තිබෙන ප්‍රශ්නය. අද ඉන්දියාව ප්‍රබල සාධකයක් බවට පත් වෙලා තිබෙනවා. එදත් අප කල්පනා කළේ එක්සත් ජාතික පක්ෂයක් හැටියටයි. වගකිව යුතු දේශපාලන පක්ෂයක් හැටියටයි මේ රටට නිදහස ගෙනත් දුන්නු දේශපාලන පක්ෂය හැටියටයි. එදත් මේ ප්‍රශ්නය විසඳීමේදී ඉන්දියාව ප්‍රබල සාධකයක් වෙලා තිබුණා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි දේශපාලන යථාර්ථය

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
*(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
Hon. Member, please sit down.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
*(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)*
(The Hon. (Dr.)Jayalath Jayawardana)

මේ තත්ත්වය අප අවබෝධ කර ගත්තා. මේ තත්ත්වය අප එදා අවබෝධ කරගෙන හිටියා. ඒ නිසා මා අවසාන වශයෙන් කියන්නේ මේකයි. එදා එක්සත් ජාතික පක්ෂය රැගෙන ගිය සාම වැඩ පිළිවෙළ සියයට සියයක් අද දේශපාලන යථාර්ථයක් බවට පත් වී තිබෙන බව දැන්වත් මේ රජය පිළිගන්න ඕනෑ. ජිනීවා නුවරට ගිහිල්ලා ඒකාබද්ධ ප්‍රකාශය කරද්දී තමුන්නාන්සේලාට කියන්න පිළිගන්න සිද්ධ වුණේ එකඟ වෙන්න සිදු වුණේ එක්සත් ජාතික පක්ෂය අත්සන් කරපු සටන් විරාම ගිවිසුම අප ආරක්ෂා කරනවාය, අප ඒක ශක්තිමත් කරනවාය කියලයි. මෙන්න මේ දේශපාලන යථාර්ථය දැන්වත් තේරුම් අරගෙන, දැන්වත් එකඟ වෙලා කරුණාකරලා මේ අන්තවාදයට ඉඩ දෙන්නේ නැතුව, ජාතිවාදයට ඉඩ දෙන්නේ නැතුව අපේ ජීවිත කාල සීමාව තුලදීවත් මේ ප්‍රශ්නය සදාකාලිකව විසඳන්නට අප පියවර ගත යුතුව තිබෙනවා. මේ රට වෙන් කරන්න නොවෙයි. මේ රට තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවන්න නොවෙයි. එක රටක් තුළ ඉන්නයි අප විසින් අවශ්‍ය පියවර ගත යුතු වන්නේ. දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා මේ රටේ ජීවත් වන සිංහල, දෙමළ මුස්ලිම් හැම ජන කොටසකටම එක හා සමාන අයිතිවාසිකම්, උරුමයන් ලබා දෙන අප කාටත් පිළිගත හැකි දේශපාලන විසඳුමක් ලබා ගන්නයි. අපි කටයුතු කළ යුතු වන්නේ. බලය විමධ්‍යගත කිරීම තුළිනුයි - එක්සත් ශ්‍රී ලංකාවක් තුළිනුයි - අප එය කළ යුතු වන්නේ. අද මේ 'ඒකීය' කියන එක මිථ්‍යාවක් බවට පත් වෙලා තිබෙනවා. එය දේශපාලන යථාර්ථයක් බවට පත් වෙලා නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
*(தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)*
(The Presiding Member)
Hon. Member, please wind up.

**ගරු වෛද්‍ය ජයලත් ජයවර්ධන මහතා**
*(மாண்புமிகு வைத்திய கலாநிதி ஜயலத் ஜயவர்தன)*
(The Hon. Jayalath Jayawardana)

එක්සත් ශ්‍රී ලංකාවක් තුළ - **united** ශ්‍රී ලංකාවක් තුළ - අපට මේ ප්‍රශ්නය විසඳා ගන්නට පුළුවන්. ඒ සඳහා පාලක පක්ෂයේ තමුන්නාන්සේලාත් අපිත් සියලු දෙනා එකතු වෙලා කටයුතු කරමුයි. කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.57]

**ගරු එම්. එම්. එම්. මුස්තාපා මහතා**
*(மாண்புமிகு எம். எம். எம். முஸ்தபா)*
(The Hon. M. M. M. Musthaffa)

*"பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்"*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையிலே நடைபெறுகின்ற வடக்கு - கிழக்கு நிலைமைகள் பற்றிய விவாதத்தில் கலந்துகொண்டு பேசுவதில் மகிழ்ச்சியடைகின்றேன்.

இன்று அரச தரப்பினராலும், எதிர்த்தரப்பினராலும் வடக்கு, கிழக்கின் இன்றைய நிலைமைகள் பற்றி முற்றிலும் முரணான விதத்தில் பேசப்பட்டது. ஐக்கிய தேசியக் கட்சியின் பாராளுமன்றப் பிரதிநிதியாகவிருக்கும் நான், இந்த நாட்டின் கிழக்கு மாகாணத்தில் பிறந்தவன்; நாட்டுப்பற்றுக் கொண்டவன்; தமிழ் பேசுகின்றவன்; இந்த நாட்டின் நலனில் அக்கறைகொண்டவன். இந்த நாட்டின் இனப்பிரச்சினை தீர்க்கப்படுமேயானால், நாட்டிலுள்ள சகல சமூகங்களும் ஒன்று சேர்ந்து சிறப்பாகவும், சந்தோஷமாகவும் வாழமுடியுமென்ற அறிவைப் பெற்றுக்கொண்டவன். உலக நாடுகள் பலவற்றுக்கும் விஜயம் செய்கின்றபொழுது, எமது நாட்டின் பெறுமதி எவ்வளவு உயர்வானதென்பது பற்றி உணர்ந்துகொண்டவன். இங்கு இரு தரப்பினராலும், வடக்கு - கிழக்கிலேயுள்ள தமிழ் மக்களுக்கு நடக்கின்ற கொடூரங்கள், தமிழ் மக்கள் மற்றும் அப்பாவிச் சிங்கள மக்கள் படுகொலை செய்யப்படுகின்ற நிலைமைகள் பற்றியெல்லாம் எடுத்துக் கூறப்பட்டது.

**ගරු නඩරාජා රවිරාජ් මහතා**
*(மாண்புமிகு நடராஜா இரவிராஜ்)*
(The Hon. Nadarajah Rraviraj)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව, ගරු නඩරාජා රවිරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, மாண்புமிகு நடராஜா இரவிராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. NADARAJAH RAVIRAJ *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු එම්. එම්. එම්. මුස්තාපා මහතා**
*(மாண்புமிகு எம். எம். எம். முஸ்தபா)*
(The Hon. M. M. M. Musthaffa)

அதே போன்று, இந்தப் பிணக்குகளில் எந்தவிதமான சம்பந்தமுமில்லாத அப்பாவி முஸ்லிம் மக்களும் படுகொலை செய்யப்படுகின்ற நிலைமையை நாங்கள் காண்கின்றோம். இவற்றுக்குக் காரணகர்த்தாக்கள் யார் என்பதை நாங்கள் இப்போதாவது சிந்திக்கக்கூடாதா? கடந்த 59 வருட காலமாகத் தொடர்கின்ற இந்தப்பிரச்சினையின் கொடூரத்தை 2002 ஆம் ஆண்டில் ஐக்கிய தேசிய முன்னணி அரசாங்கம் விடுதலைப் புலிகளுடன் செய்து கொண்ட ஒப்பந்தத்தின் ஊடாகத் தணித்து, இந்த நாட்டில் ஒரு தற்காலிகமான அமைதியை ஏற்படுத்தி, மக்கள் சாதாரணமாக, சுதந்திரமாக காற்றைச் சுவாசிக்கக்கூடிய சூழ்நிலையை ஏற்படுத்தியது. இன்று அந்த நிலைமை மீண்டும் மாறி வருகின்றது. வடக்கு - கிழக்கில் மாத்திரமன்றி, அதற்கப்பாலும் இந்த யுத்தம் படர்ந்து கொண்டு செல்கின்றது. எல்லைக் கிராமங்களில் வாழ்கின்ற அப்பாவித் தமிழ், சிங்கள, முஸ்லிம் மக்களுக்கு ஏற்படுத்தப்படும் கொடுமைகளைப்பற்றி இங்கு பேசப்பட்டது. அந்த மக்கள் கடந்த நான்கு வருட காலமாக ஓரளவு நிம்மதியாகத் தாங்கள் குடியிருந்த நிலங்களிலேயே வாழ்ந்து கொண்டிருந்தார்கள். ஆனால், இன்று இலங்கை முழுவதுமே இந்த யுத்தம் படர்ந்துள்ளது. இலங்கையின் சகல இடங்களிலும் ஆட்கடத்தல்களும் படுகொலைகளும், நடத்துகின்றவர்கள் யார்? கொலை செய்கின்றவர்கள் யார்? என்று தெரிந்து கொள்ள முடியாதளவில் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. மறுபுறம் நாட்டின் பொருளாதாரம் மிகவும் மோசமாக வீழ்ச்சியடைந்து செல்கின்ற நிலைமை காணப்படுகிறது. அரசாங்கம் இன்று கடன்களைத் திருப்பிச் செலுத்த முடியாத நிலையிலுள்ளது. இன்று IOC நிறுவனத்துக்கு அரசாங்கம் கொடுக்க வேண்டிய கொடுப்பனவை கொடுக்காமல் இருப்பதனால் இந்த நிலையங்கள் பெற்றோல் விநியோகிக்க முடியாமல் இருந்து கொண்டிருக்கின்றன. இன்று துறைமுக அதிகார சபையில் வேலை செய்கின்றவர்கள் சம்பள அதிகரிப்புக்கோரி 'றோட்'டிலே இறங்கியிருக்கின்றார்கள். இன்று பணவீக்கம் அதிகரித்துக் கொண்டிருக்கின்றது, பொருள்களின் விலை மிகவும் அதிகமாக இருக்கின்றது. இதனால் மக்கள் தங்களுடைய வாழ்க்கைச் செலவைச் சமாளித்துக் கொள்ள முடியாமல் திண்டாடிக் கொண்டிருக் கின்றார்கள். விவசாயிகள் பாதிக்கப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். அவர்கள் தாம் உற்பத்தி செய்த நெல்லை விற்க முடியாமலிருப் பதனால், பல்லாயிரக் கணக்கான ஏக்கர் நெற் காணிகள் செய்கை பண்ணப்படாமல் இருக்கின்றன. ஐயோ! இவற்றுக்கெல்லாம் காரணம் என்ன? இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர் நாங்கள் இவற்றை எல்லாம் எதிர்பார்த்தோம். கடந்த ஜனாதிபதித் தேர்தலின்போது இப்படியான ஒரு நிலைமை ஏற்படப் போகின்றது என்று நாங்கள் எதிர்வு கூறினோம்.

இன்று எங்களுடைய நாட்டின் மேதகு ஜனாதிபதி அவர்கள் ஓர் இக்கட்டான நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றார். இனவாதச் சக்திகளின் நெருக்குதல்களுக்குட்பட்டிருக்கின்றார். இன்று அவர் எவ்வாறு அந்தச் சக்திகளிடமிருந்து விடுபட முடியும் என்று சிந்தித்துக் கொண்டிருக்கின்றார். ஆனால், காலம் கடந்து செல்கின்றது. அவர் எப்பொழுது அது சம்பந்தமாக முடிவெடுக்கப் போகின்றார்? எவ்வாறு இந்தச் சிங்கள பௌத்த இனவாதச் சக்திகளை தூக்கியெறியப் போகின்றார்? அவர் அதற்கான முயற்சியை எடுத்துக் கொண்டிருக்கின்றார். அவர், இன்று ஐக்கிய தேசியக் கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் ஒவ்வொருவரையும் தன் பக்கம் சேர்த்துக் கொண்டிருப்பதன் நோக்கம் எங்களுக்குப் புரிகின்றது. அவருடன் சேர்ந்து நிற்கின்ற அந்த இரண்டு சிறிய கட்சிகளையும் எவ்வாறு தூக்கியெறிவது என்று அவர் இன்று யோசித்துக் கொண்டிருக்கின்றபோதிலும், அதைச் செய்ய முடியாதவராகத் தத்தளித்துக் கொண்டிருக்கின்றார்.

2002 ஆம் ஆண்டு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் செய்து கொண்ட ஒப்பந்தத்தைப் பற்றி எவ்வளவோ விமர்சனம் செய்தவர்கள் இன்று என்ன செய்து கொண்டிருக்கின்றார்கள்? இன்றும் அதே ஒப்பந்தம்! அதே மத்தியஸ்தம்! அதில் எந்த மாற்றமும் செய்ய முடியாதுள்ளது. அதில் மாற்றம் செய்யச் சம்பந்தப்பட்டவர்கள் முயற்சிக்கவுமில்லை. அப்படி என்றால், அவர்கள் இந்த நாட்டு மக்களுக்குப் பொய் கூறி, அவர்களைத் திசை திருப்பியிருக்கின்றார்கள். அப்படியென்றால், இந்த நாட்டினுடைய எதிர்கால அபிவிருத்தி, எதிர்காலச் சுபிட்சம் பின்தள்ளப்பட்டமைக்குப் பொறுப்பானவர்கள் யார் என்பதை நாங்கள் அறிய வேண்டும். முதலில் இதற்குக் காரணமானவர் இந்த நாட்டின் முன்னாள் ஜனாதிபதி சந்திரிகா அம்மையார் அவர்கள். 2001 ஆம் ஆண்டு ஆட்சிக்கு வந்த ஐக்கிய தேசிய முன்னணி அரசாங்கத்தினுடைய மூன்று அமைச்சர்களின் அமைச்சுப் பதவிகளைப் பறித்தெடுத்து, மீண்டும் ஒரு பொதுத் தேர்தலை நடத்தியது இந்த நாட்டினுடைய சரித்திரத்தில் அந்த அம்மையார் செய்த ஒரு தவறு. இரண்டாவது தவறென்பது, இந்த நாட்டின் ஜனாதிபதியாக இருக்கின்ற மஹிந்த ராஜபக்ஷ அவர்கள் 'இந்த இனவாதச் சக்திகளுடன் சேர்ந்து செய்துகொண்ட ஒப்பந்தம் என்பது தெளிவாகத் தெரிகிறது. மூன்றாவது தவறுக்காக விடுதலைப் புலிகளை நாங்கள் குறை கூற வேண்டும். அதாவது, ஜனாதிபதித் தேர்தலில் ஐக்கிய தேசிய முன்னணியின் பொது வேட்பாளர் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுடைய தெரிவைத் தடுத்து நிறுத்தியது விடுதலைப் புலிகளே!

இன்று கிழக்கிலே ஒரு பிரிவினர் தமிழ் மக்களின் விடுதலைப் போராட்டத்தில் ஒரு வெடிப்பை ஏற்படுத்திக் கொண்டிருக்கிறார்கள். 'கருணா குழு' என்ற ஒரு பிரிவு ஏற்படுத்தப்பட்ட மூலமாக இன்று இந்த யுத்தம் வேறு திசையில் போய்க்கொண்டிருக்கிறது. இன்று, இனவாதச் சக்திகள் வடக்கையும் கிழக்கையும் பிரிக்க வேண்டுமென்று நீதிமன்றத்துக்குச் சென்றிருக்கின்றன. பாராளுமன்றம் இது சம்பந்தமான ஒரு பிரேரணையை நிறைவேற்ற வேண்டுமென்று கூறிக்கொண்டிருக்கிறார்கள், 'ஹெல உருமய' கட்சியினர். தற்காலிகமாக இணைக்கப்பட்டுள்ள வடக்கு, கிழக்கு மாகாணங்களின் இணைப்புத் தொடர்பாக ஜனாதிபதி அவர்கள் நவம்பர் மாதம் என்ன செய்யப் போகிறார் என்பதை மக்கள் எதிர்பார்த்திருக்கிறார்கள். அங்கே வாழ்கின்ற முஸ்லிம்கள் வடக்கையும் கிழக்கையும் பிரிப்பதற்கு ஆதரவு கொடுப்பதா அல்லது அதை எதிர்ப்பதா என்ற இக்கட்டான சூழ்நிலையில் இருந்துகொண்டிருக்கிறார்கள்.

[ගරු එම්. එම්. එම්. මුස්තාපා මහතා]

கிழக்கு மாகாணத்திலே முஸ்லிம்கள் அதிகமாக வாழ்ந்து கொண்டிருக்கின்றார்கள் என்பது உங்களுக்குத் தெரியும். திருமலை மாவட்டத்திலும் அம்பாறை மாவட்டத்திலும் அதிகமான முஸ்லிம்கள் வாழ்கிறார்கள். மட்டக்களப்பு மாவட்டத்தில்தான் 20-22 வீதமான முஸ்லிம்கள் வாழ்கிறார்கள். எனவே, இந்தச் சூழ்நிலையில் முஸ்லிம்களுக்கு எவரிலும் நம்பிக்கையில்லாத நிலை ஏற்பட்டிருக்கிறது. விடுதலைப் புலிகளையும் நம்ப முடியாத, அவர்களுக்கு அனுசரணையாக இயங்குகின்ற தமிழ் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்றப் பிரதிநிதிகளையும் நம்பமுடியாத சூழ்நிலையில் அவர்கள் இருக்கிறார்கள். ஏன், அரசாங்கத்தை நம்ப முடியுமா? அரசாங்கப் படையினரை நம்பமுடியுமா? இப்படியான சூழ்நிலையில் எமது இளைஞர்கள் எந்தத் திசையில் சென்று, எந்தத் தீர்மானத்தை எடுக்கப் போகின்றார்கள்? பாராளுமன்றத்தில் இந்தப் பிரச்சினை எடுக்கப்படுகின்றபோது, நீதிமன்றத்தில் இந்தப் பிரச்சினை எடுக்கப்படுகின்றபோது, அல்லது இப்படியான ஒரு போராட்டத்தில் ஈடுபடுகின்றபோது எங்களுடைய முஸ்லிம் சமூகம் நெருக்குதலுக் குள்ளாகப்போகிறது. ஆயுதம் ஏந்தாத, எந்தக் கோரிக்கையும் வைக்காத, தாங்களாக எந்தச் சுயாட்சியும் கேட்காத இந்தச் சமூகம், இன்று ஓர் இக்கட்டான நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறது. வடக்கு - கிழக்கைப் பிரிக்க வேண்டும் என்று கிழக்கிலிருந்து சொன்ன அமைச்சர்கள் எங்கே? இன்று இந்த அமைச்சர்கள் ஏன், இந்த விவாதத்தில் கலந்துகொள்ளவில்லை? அவர்கள் எங்கே சென்றுவிட்டார்கள்? அன்று செய்துகொண்ட இந்தப் புரிந்துணர்வு ஒப்பந்தத்தை எதிர்த்தவர்கள், அதில் மாற்றம் செய்ய வேண்டுமென்று சொன்னவர்கள், வடக்கு - கிழக்கில் ஒரு தனியான நிர்வாக அலகை முஸ்லிம்களுக்குப் பெற்றுக் கொடுப்போம் என்று கூறியவர்கள் - குறிப்பாக, கௌரவ பிரதியமைச்சர் சேகு இஸ்ஸதீன் போன்றோர் - எங்கே சென்றுவிட்டார்கள்? இன்று முஸ்லிம் அரசியல்வாதிகள் தங்களுக்கு வசதியான அரசியலைச் செய்து கொண்டிருக்கிறார்கள். தாங்கள் சேர்ந்திருக்கின்ற அரசியல் கட்சிக்காக, கட்சியின் சாதக பாதகங்களைப் பார்த்து, தங்களுடைய அரசியலைச் செய்து கொண்டிருக்கிறார்கள். இன்று முஸ்லிம் காங்கிரஸ் தலைவர் எங்கே? மிக முக்கியமான இந்த விவாதத்தில் கௌரவ பஷீர் சேகுதாவூத் அவர்களைக் கலந்துகொள்ளச் செய்துவிட்டு அவர் இலாவகமாக நழுவிவிட்டார்.

இன்று உலக நாடுகளில் முஸ்லிம்களுக்கு நெருக்கடி ஏற்பட்டிருக்கிறது. லெபனானில் முஸ்லிம்கள் கொல்லப்பட்டுக் கொண்டிருக்கிறார்கள். அங்கே இளைஞர்கள் மாத்திரமல்ல, குழந்தைகள், வயதானவர்கள் என்று அப்பாவி மக்கள் கொல்லப்பட்டுக் கொண்டிருக்கிறார்கள். இன்று இஸ்ரேல், தான் விரும்பியபடி காஸாவிலும் பலஸ்தீனத்திலும் மக்களைக் கொலை செய்து கொண்டிருக்கிறது. இந்தச் சந்தர்ப்பத்தில் முஸ்லிம் தலைவர்கள் அதற்கெதிராக ஏன் குரல் கொடுக்கக் கூடாது? ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் Sri Lanka Palestine Friendship Association என்ற இயக்கத்தின் தலைவராக இருக்கிறார். ஜனாதிபதியின் சார்பாக அரசாங்க அமைச்சர்களில் யாராவது இந்தக் குண்டுத் தாக்குதல்களுக்கு ஏன் எதிர்ப்புத் தெரிவிக்கக் கூடாது? இங்கு வந்து எல்லோரும் அமைதியாக இருந்துவிட்டுப் போகிறார்கள். முஸ்லிம்களைப் பொறுத்தவரையில், அவர்கள் சமாதானத்தை விரும்புபவர்கள். இரு சமூகங்களுடனும் மிகவும் அந்நியோன்யமாக வாழ விரும்புபவர்கள். இதுதான் அவர்களுடைய நிலைப்பாடு.

**ගරු එම්. කේ. සිවාජිලිංගම් මහතා**
*(மாண்புமிகு எம். கே. சிவாஜிலிங்கம்)*
(The Hon. M. K. Shivajilingam)

லெபனானில் இஸ்ரேல் நடத்திய தாக்குதல்களுக்கு நாங்கள் எதிர்ப்புக் குரல் கொடுத்திருக்கிறோம்.

**ගරු එම්. එම්. එම්. මුස්තාපා මහතා**
*(மாண்புமிகு எம். எம். எம். முஸ்தபா)*
(The Hon. M. M. M. Musthaffa)

Thank you. கௌரவ சிவாஜிலிங்கம் அவர்களே, தற்போது நாட்டில் நிலவும் சூழ்நிலை உங்களுக்குத் தெரியும். வடக்கு - கிழக்கில் வாழ்கின்ற தமிழர், முஸ்லிம்கள் ஆகிய தமிழ் பேசும் மக்கள் எல்லோரும் நல்லுறவாக வாழ வேண்டுமென்று நினைக்கிறோம். "எங்களை நம்புங்கள்! நாங்கள் தனியான ஓர் அலகுக்குள் வாழ்வோம்!" என்று நீங்கள் கூறுகிறீர்கள். அந்த அலகு எவ்வாறு அமையும் என்பதை யாராவது கூறுகிறீர்களா? நீங்கள் அதற்காக ஏதாவது நடவடிக்கை எடுத்திருக்கிறீர்களா? அல்லது உங்களைக் கட்டுப்படுத்துகின்ற விடுதலைப் புலிகள்கூட, இப்படித்தான் நாங்கள் உங்களை நடாத்துவோம் என்று கூறுகின்றார்களா? இந்தச் சூழ்நிலையிலே, வடக்கு - கிழக்கு இணைப்பைத் தீர்மானிப்பதற்கான வாக்கெடுப்பு நடத்தப்பட்டால், வடக்கிலிருந்து கிழக்கைப் பிரிப்பதற்கு ஆதரவாகவே நான் வாக்களிப்பேன். ஏனென்றால், கிழக்கிலே உள்ள முஸ்லிம் மக்களும் அந்த நிலைப்பாட்டில்தான் இருக்கின்றார்கள். அவ்வாறு நடைபெறக் கூடாது என்பதற்காகத்தான் எங்களுக்கிடையிலுள்ள உறவை மிகவும் அன்னியோன்யமாகப் பேணுவதற்கு ஏன் நீங்கள் நடவடிக்கை எடுக்கக் கூடாது என்று நாங்கள் கேட்கின்றோம். அங்கிருக்கின்ற மக்கள் எதிர்நோக்கும் பிரச்சினைகளை அலசி ஆராய்ந்து அவைகளைத் தீர்ப்பதற்கு ஏன் முயலக் கூடாது? தமிழ், முஸ்லிம் சமூகத்தினர்களாகிய நாங்கள் ஒற்றுமையாக இருக்கின்றபொழுது, எங்களுக்கிடையே பிளவினை ஏற்படுத்த எடுக்கப் படுகின்ற முயற்சிகளைத் தோற்கடிக்கலாம்தானே! இதுதான் எங்களுடைய வாதம். எந்தவித விடுதலைப் போராட்டத்திலும் ஈடுபடாத, ஆயுதம் ஏந்தாத, தங்களுக்குத் தனிநாடு வேண்டுமென்ற கோரிக்கையை விடுக்காத ஒரு சமூகம்தான் எங்களுடைய முஸ்லிம் சமூகம். ஆனால், போரில் ஈடுபட்டிருக்கின்ற இரண்டு சாராராலுமே நெருக்கடிகளுக்கு உட்படுத்தப்படுகின்ற, நசுக்கப்படுகின்ற, கொலை செய்யப்படுகின்ற மிகவும் இக்கட்டான ஒரு காலகட்டத்தில்தான் இன்று அந்தச் சமூகம் இருந்துகொண்டிருக்கின்றது. வடக்கு - கிழக்கைத் தனித்தனியாகப் பிரிப்பதற்காக ஜே. வி. பீ. யினர் நீதிமன்றம்வரை சென்றிருக்கின்றனர். அதேபோன்று, 'ஹெல உறுமய'வினர் அது சம்பந்தமான தனிநபர் பிரேரணையொன்றைப் பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்திருக்கின் றார்கள். அது விவாதத்திற்கு எடுக்கப்படுகின்ற பட்சத்தில் நாங்கள் மிகவும் இக்கட்டானதொரு நிலைக்குத் தள்ளப்படக்போகின்றோம்.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

Hon Member, you can now bring your speech to a conclusion, please.

**ගරු එම්. එම්. එම්. මුස්තාපා මහතා**
*(மாண்புமிகு எம். எம். எம். முஸ்தபா)*
(The Hon. M. M. M. Musthaffa)

I will conclude, Sir. இதுதான் எங்களுடைய நிலைமை. இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்ற பொருளாதாரப் பிரச்சினைகளை வைத்துக் கொண்டு, நன்றாகப் பேசத் தெரிந்த இனவாதிகள் தங்களுடைய மக்களை ஏமாற்றி வருகின்றார்கள். கடந்த ஐம்பத்தெட்டு வருடகாலப் பிரச்சினை மீண்டும் புது வியூகம் எடுத்திருக்கின்றது; புது வடிவம் எடுத்திருக்கின்றது. இன்று இந்த அரசாங்கம், ஐக்கிய தேசியக் கட்சிப் பாராளுமன்றப் பிரதிநிதிகளைத் தன்பக்கம் ஈர்ப்பதனால் மட்டும் எதுவும் நடக்கப் போவதில்லை. இந்த நாட்டின் இனப்பிரச்சினை தீர்க்கப்பட வேண்டுமென்றால், இந்த இனவாத சக்திகளையெல்லாம் தூக்கியெறிந்துவிட்டு, பிரதான கட்சிகள் இரண்டும் ஒன்றுசேர வேண்டும். அப்படி ஒன்றுசேர்ந்து, இனப்பிரச்சினைக்கு என்ன தீர்வு? பொருளாதாரப் பிரச்சினைக்கு என்ன தீர்வு? நாட்டுக்கு என்ன தேவை? என்பதையெல்லாம் தீர்மானித்து நல்லவற்றை நடைமுறைப் படுத்துகின்றபொழுதுதான் இந்த நாடு சுபிட்சமடையும். அப்போது சகல சமூகங்களினதும் பிரச்சினைகளையும் தீர்த்துக்கொண்டு முன்னேற்றப் பாதையில் நமது பிரயாணத்தை ஆரம்பிக்கலாம் என்று கூறி, சந்தர்ப்பமளித்தமைக்கு நன்றி தெரிவித்து விடை பெறுகின்றேன். வஸ்ஸலாம்.

[අ. භා. 4.10]

### ගරු පී. අරියනේත්‍රන් මහතා
*(மாண்புமிகு பீ. அரியநேத்திரன்)*
(The Hon. P. Ariyanethran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று வடக்கு - கிழக்கு மக்களின் துன்பியல் நிலைமை, மற்றும் அரச பயங்கரவாதம் - அட்டூழியங்கள் - தொடர்பாக எமது பாராளுமன்றக் குழுவின் தலைவர் மாண்புமிகு இரா. சம்பந்தன் அவர்களால் முன்மொழியப்பட்ட இந்த ஒத்திவைப்புப் பிரேரணையின் மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன். இங்கே எனக்கு முன்பு அமைச்சர் அன்வர் இஸ்மாயில், ஜே. வி. பீ. பாராளுமன்ற உறுப்பினரான விஜித ஹேரத் போன்றவர்கள் உரையாற்றினார்கள். அன்வர் இஸ்மாயில் அவர்கள் பேசும்பொழுது, வடக்கு - கிழக்கைப் பிரிப்பதற்கு கிழக்கிலேயுள்ள முஸ்லிம் மக்கள் தயாராக இருப்பதாகக் கூறினார். அப்படிப் பிரிக்க வேண்டுமென்பதற்காக, விமல் வீரவங்ச அவர்களின் கட்சி நீதிமன்றம்வரை சென்றிருக்கின்றது; வண. எல்லாவல மேதானந்த தேரர் அவர்களால் அது சம்பந்தமான ஒரு பிரேரணை பாராளுமன்றத்திலே சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. நான் ஒன்றை மட்டும் இவ்விடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். அன்வர் இஸ்மாயில் அவர்கள் கூறுவதாலோ, விமல் வீரவங்ச அவர்கள் கூறுவதாலோ, வண. எல்லாவல மேதானந்த தேரர் அவர்கள் கூறுவதாலோ வடக்கு - கிழக்கு இணைப்பைப் பிரிக்க முடியாது. அவ்வாறு பிரித்தால் அன்றே தமிழீழம் மலரும் என்பதைத்தான் நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இனவாதம் இவ்வாறு இருக்கின்றபோது, எவ்வாறு தமிழ் மக்களுக்கான தீர்வை நீங்கள் முன்வைப்பீர்கள் என்பதை முதலில் தெரிவிக்க வேண்டும். 1947 ஆம் ஆண்டு ஆகஸ்ட் மாதம் 23 ஆம் திகதிதான் முதலாவது பொதுத்தேர்தல் இடம்பெற்றது. அந்தத் தேர்தலிலே டீ. எஸ். சேனாநாயக்க அவர்கள் எடுத்த அந்த இனவாதத் தடி, டட்லி சேனாநாயக்க, எஸ். டபிள்யூ. ஆர். டீ. பண்டாரநாயக்க, சிறிமாவோ பண்டாரநாயக்க, ஜே. ஆர். ஜயவர்தன, ரணசிங்க பிரேமதாச, சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க என இவ்வாறாக தொடர்ந்து கைமாற்றப்பட்டு, அது இப்பொழுது மஹிந்த ராஜபக்ஷ அவர்களுக்குக் கிடைத்திருக்கின்றது. ஆனால், அந்தத் தடியிலே எந்தவொரு மாற்றமும் இல்லை; தடியை எடுத்தவர்கள்தான் மாறியிருக்கின்றார்கள். இதுதான் இங்கு நாம் காணும் அரசியல் வரலாறு. நீங்கள் சர்வகட்சி மாநாட்டைக் கூட்டுகின்றீர்கள்; புத்திஜீவிகளைக் கொண்ட குழுவை அமைக்கின்றீர்கள். ஆனால், இந்த இனவாதத் தடியை வைத்துக்கொண்டு எவ்வாறு தமிழருக்கு சுய நிருணய உரிமையைக் கொடுக்கப் போகின்றீர்கள் என்பதை நீங்கள் வெளிப்படுத்த வேண்டும். எனவேதான் எங்கள் கட்சி, அந்த சர்வகட்சி மாநாட்டை, ஒரு 'தொலைக்காட்சி நாடகம்' என்றும் 'தெருக்கூத்து' என்றும் வர்ணிக்கின்றது. இந்தத் தெருக் கூத்தின் மூலமாகவும் தொலைக்காட்சி நாடகத்தின் மூலமாகவும் நீங்கள் சர்வதேசத்தைச் சந்தோஷப்படுத்தலாமே தவிர, வடக்கு - கிழக்கிலே வாழ்கின்ற தமிழ் மக்களுக்கு எந்தவொரு தீர்வுத் திட்டத்தையும் முன் வைக்க முடியாது என்பதை நான் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன்.

எனக்கு முன்பு இங்கு பேசிய விஜித ஹேரத் அவர்கள் திருகோணமலை மாவட்டத்திலே கடந்த தேர்தலிலே 69 ஆயிரம் வாக்குகள் தமிழ் தேசியக் கூட்டமைப்புக்குக் கிடைத்தன என்றும் அங்கு 65 ஆயிரம் முஸ்லிம் வாக்காளர்களும் 30 ஆயிரம் சிங்கள வாக்காளர்களும் இருக்கின்றார்கள் என்றும் கூறியிருந்தார். 1981 ஆம் ஆண்டுக்கு முன்பு இருந்த புள்ளிவிபரத்தை நீங்கள் எடுத்துப் பாருங்கள்! அங்கே கல்லோயா திட்டம், கந்தளாய்த் திட்டம் என்கின்ற திட்டங்களின் கீழ் சிங்கள மக்கள் பலவந்தமாகக் குடியேற்றப்பட்டதன் விளைவாகவே, எங்கள் நிலம் அந்த வந்தேறு குடிகளால் சூறையாடப்பட்டதன் விளைவாகவே இந்த வாக்குப் பலத்தை நீங்கள் பெற்றிருக்கின்றீர்கள் என்பதை நான் இந்த இடத்திலே சுட்டிக் காட்ட விரும்புகின்றேன்.

எனக்கு முன்பு இங்கு பேசிய அன்வர் இஸ்மாயில் அவர்கள் இப்பொழுது யாழ்ப்பாணத்திலே ஒரு முஸ்லிம் குடும்பங்கூடக் குடியேற்றப்படவில்லை என்ற ஒரு கருத்தையும் கூறியிருந்தார். கேவலம்! அமைச்சராக இருக்கின்ற ஒருவருக்கு இப்பொழுது எத்தனை குடும்பங்கள் யாழ்ப்பாணத்திலே குடியேறி இருக்கின்றன என்ற வரலாறே தெரியாமல் இருக்கின்றது. ஐயா! இந்தப் புரிந்துணர்வு ஒப்பந்தத்துக்குப் பிறகு யாழ்ப்பாணத்திலே 1253 குடும்பங்கள் குடியேறியிருக்கின்றமை உங்களுக்குத் தெரியுமா? முல்லைத்தீவிலே 500 குடும்பங்கள் குடியேறியிருக்கின்றமை உங்களுக்குத் தெரியுமா? மன்னாரிலே 400 க்கும் மேற்பட்ட குடும்பங்கள் குடியேறியிருக்கின்றமை உங்களுக்குத் தெரியுமா ? இவ்வாறான புள்ளிவிபரங்களைத் தெரிந்து கொள்ளாமல் இன்னும் யாழ்ப்பாணத்திலே ஒரு முஸ்லிம் குடும்பங்கூட குடியேறவில்லை என்கின்ற ஓர் இனவாதக் கருத்தை அவர் கக்கியிருக்கின்றார். அதுபோல் நாட்டை யுத்தத்திற்கு இட்டுச் செல்லக் கூடிய வகையில் செயற்படுகின்ற JVP யினரும் காவியுடையைப் போர்த்திக் கொண்டு இருக்கின்ற "ஜாதிக ஹெல உறுமய"

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
***[Expunged on the order of the Chair]***

சிலரும் இங்கு இனவாதத்தைக் கக்கிக் கொண்டிருக்கின்றார்கள். இதுதான் ஸ்ரீ லங்கா பாராளுமன்றத்திலே நிலவுகின்ற ஒரு கேவலமான நிலைமை என்பதை நான் இவ்விடத்திலே தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன்.

இன்று நீங்கள் வடக்கு - கிழக்கில் குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துப் பாருங்கள்! இன்று அங்கு நடக்கின்ற அபிவிருத்தியைப் பற்றிக் கூறுகின்றீர்கள்! வடக்கு - கிழக்கை அபிவிருத்தி செய்வதற்கு ஆயிரம் மில்லியன் டொலர் நிதியை ஒதுக்கியதாக கூறுகின்றீர்கள்! அது யாருடைய நிதி ஐயா? சர்வதேசத்தில் இருந்து பெற்ற நிதியையே வடக்கு - கிழக்கிற்கு ஒதுக்குகின்றீர்கள். அவ்வாறு ஒதுக்குகின்ற நிதியை நீங்கள் சரியாகச் செலவிடு கின்றீர்களா? வடக்கு - கிழக்கிலே மட்டக்களப்பு மாவட்டத்திலே விடுதலைப் புலிகளின் கட்டுப்பாட்டின் கீழே இருக்கின்ற படுவான்கரை பகுதிக்கு வீட்டுத் தளபாடப் பொருட்களைக் கூட எடுத்துச் செல்ல முடியாமல், எரிபொருள்களைக் கொண்டு செல்ல முடியாமல், கனரக வாகனங்களைக் கொண்டு செல்ல முடியாமல் உங்கள் படையினர் தடை விதிக்கின்றார்கள். காத்தான்குடியிலேயும் ஏறாவூரிலேயும் இருக்கின்ற எமது சகோதர இனமான முஸ்லிம் மக்களுக்கு உன்னிச்சைக் குளத்திலிருந்து நீர் விநியோகிப்பதற்கான பாரிய நீர்விநியோகத் திட்டத்திற்கு கனரக வாகனங்களைக் கொண்டு செல்ல முடியாமலும் படையினர் தடை விதித்துக் கொண்டிருக்கின்றார்கள். இதுதான் ஐயா வரலாறு! நீங்கள் அபிவிருத்தி என்று கூறிக் கொண்டு அங்கு குடியேற்றங்களின் மூலமாக எமது நிலங்களை அபகரிப்புச் செய்கின்றீர்கள். அங்கே இருக்கின்ற மக்களுக்கு எந்தவொரு நிவாரணப் பொருட்களும் செல்ல முடியாமல் தடுத்துக் கொண்டிருக்கின்றீர்கள். இந்த வரலாறு நீண்ட காலமாகத் தொடர்கின்றது.

தற்போது அரசியலமைப்பில் நிபுணத்துவம் வாய்ந்தவர்களைக் கொண்ட ஒரு குழுவை அமைத்திருக்கின்றீர்கள். கடந்த கால அரசியல் வரலாற்றை ஒரு முறை புரட்டிப் பாருங்கள்! பண்டா - செல்வா ஒப்பந்தத்திற்கு என்ன நடந்தது? டட்லி - செல்வா ஒப்பந்தத்திற்கு என்ன நடந்தது? ஸ்ரீ மா - சாஸ்திரி ஒப்பந்தத்திற்கு என்ன நடந்தது? இலங்கை - இந்திய ஒப்பந்தத்திற்கு என்ன நடந்தது? ஆனால், இன்று நீங்கள் இனப் பிரச்சினைத் தீர்வுக்குப் புத்திஜீவிகளைக் கொண்ட ஒரு குழுவை நியமித்திருப்பதாகக் கூறுகின்றீர்கள். அந்தக் குழுவில் இருக்கின்ற புத்திஜீவிகள் யார்? ஒரு சட்டத்தரணியைத் தவிர, அதில் இருக்கின்ற அனைத்துச் சட்டதரணிகளுமே இனவாதத்தைக் கக்கக்கூடியவர்கள் என்பதை நான் இவ்விடத்திலே உங்களுக்குச் சுட்டிக் காட்ட விரும்புகின்றேன். ஆனால், ஒன்றை மட்டும் நான் கூறுகின்றேன். அதாவது, நீங்கள் ஸ்ரீ லங்கா நீதிமன்றத்திற்குச் சென்று வடக்கு - கிழக்கைப் பிரிப்பதற்கான தீர்ப்பைப் பெற்றாலும் சரி, அல்லது இந்த ஸ்ரீ லங்கா பாராளுமன்றத்திலே வடக்கு - கிழக்கைப் பிரிக்க வேண்டும் என்று தீர்மானித்தாலும் சரி, அல்லது கிழக்கு மக்கள் வடக்கில் இருந்து பிரியப் போகின்றார்கள் என்று கூறினாலும் சரி, நிச்சயமாக அது முடியாது. மஹிந்த ராஜபக்ஷ அவர்கள் சந்திர மண்டலத்திற்குச் செல்வார் என்று கூறுகின்ற ஒரு கூற்றைப் போல்தான் நாங்கள் இதையும் கருதுகின்றோம்.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)

Hon. Member, can you bring your speech to a conclusion?
ගරු මන්ත්‍රීතුමනි, ඔබේ කථාව අවසානයකට ගෙන එන්න.

**ගරු පී. අරියනේත්‍රන් මහත්මිය**
*(மாண்புமிகு பீ. அரியநேத்திரன்)*
(The Hon. P. Ariyanethran)

*இறுதியாக, ஒரு விடயத்தை மாத்திரம் கூறி எனது பேச்சை முடிக்கலாம் என்று நினைக்கின்றேன். அதாவது, கடந்த 7 ஆந் திகதிய 'தினக் குரல்' பத்திரிகையிலே வெளிவந்த "இளிச்ச வாயர்கள் என இலங்கை அரசு இனியும் தமிழர்களை நினைத்தால் இலங்கை மீண்டும் எரியும்" என்ற கவிதையை இங்கு நினைவூட்டி விடை பெறுகின்றேன். நன்றி. வணக்கம்.*

[අ. භා. 4.17]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
*(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)*
(The Hon. Rohitha Abeygunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී විවාදය සඳහා ගනු ලැබූ උතුරු නැගෙනහිර වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් වූ මෙම යෝජනාව පිළිබඳව අවසාන වශයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මාගේ අවංක ආදර ස්තුතිය මා පුද කරනවා. ඒ සමගම මේ විවාදය පවත්වන මොහොතේ විශේෂයෙන් නියෝජ්‍ය කථානායකතුමා හැටියට ඔබතුමා මේ මූලාසනයට ඒමට පෙර අපේ හිතවත් සහෝදර රවිරාජ් මන්ත්‍රීතුමා මූලාසනය අරගෙන, මේ උත්තරීතර සභාව මෙහෙයවීම සම්බන්ධයෙන් මාගේ සතුට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙනම රාජ්‍යයන් ගැන කථා කරන, ඊළාම් – නිජ බිම – ගැන කථා කරන, එවැනි නිජ බිම් ඊළාම් ගොඩ නඟන අය වෙනුවෙන් කැප වීමෙන් කථා කරන රවිරාජ් මන්ත්‍රීතුමා, එවැනි මොහොතක එවැනි සන්ධානයක ඉඳගෙන හරි මේ උත්තරීතර සභාවේ මූලාසනය දැරීම අනාගතයට සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ කියන මේ සියලුම ජාතීන්ට එක තැනක ඉඳගෙන, මේ රට අපි ඔක්කොටම අයිති රටක් හැටියට, ඒකීය ශ්‍රී ලංකාවක් හැටියට ඉදිරියට ගෙන යාමට පෙර නිමිත්තක්ය කියන එක මේ අවස්ථාවේදී මා මතක් කළ යුතුයි. ඒ වාගේම මෙම යෝජනාව ගෙනාපු ගරු ආර්. සම්පන්දන් මන්ත්‍රීතුමාට වගකිව යුතු රජයක් හැටියට අප පැහැදිලිව කිව යුතුයි, අද තමුන්නාන්සේ මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේ සිට ආණ්ඩුව නියෝජනය කරමින්, ඒ වාගේම පොදු විපක්ෂය නියෝජනය කරමින්, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ වුණු බව. ඒ වාගේම ද්‍රවිඩ ජනතාව නියෝජනය කරන, ද්‍රවිඩ ජනතාවගේ අයිතිවාසිකම් ගැන කතා කරන ඔබතුමා ද්‍රවිඩ ජනතාවට ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා නම් ඒ ප්‍රශ්නය ගැන කථා කරන්නට තිබෙන එකම ස්ථානය වන මේ උත්තරීතර සභාවට මේ වාගේ යෝජනාවක් ගෙන ඒම තුළින් මේ උත්තරීතර සභාව තුළදී තමුන්නාන්සේලාගේ අදහස් රජයක් හැටියට අපට දැන ගන්නට සැලැස්වීම ගැන අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ උත්තරීතර පාර්ලිමේන්තුව දීර්ඝ කාලයක් තිස්සේ නියෝජනය කරන ඔබ වැනි මන්ත්‍රීවරයකුගෙන් මේ ගරු සභාව තුළදී කරන යෝජනාවකින් අපි බලාපොරොත්තු වන්නේ ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමයි සැබෑ ලෙස මේ යුද්ධයෙන් අවතැන් වුණු, සැබෑ ලෙස මේ යුද්ධය තුළ දශක ගණනාවක් දුක් විඳපු, සැබෑ ලෙස කාත් කවුරුවකගේවත් පිහිටක් නැති ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න තමයි මේ උත්තරීතර පාර්ලිමේන්තුවට තමුන්නාන්සේලාගේ හඬින් එක් විය යුත්තේ. එහෙම නැතිව එල්ටීටීඊ ත්‍රස්තවාදයේ හස්තයක් ලෙස එහි හඬක් ලෙස අද මේ ගරු සභාව නියෝජනය වෙනවා නම් ඒක අපට පිළිගන්නට බැහැයි කියන එක තමයි අප මතක් කළ යුත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර රජයන් එල්ටීටීඊ සංවිධානය සමග මේ ප්‍රශ්නය සාමයෙන් විසඳා ගන්නට උත්සාහ කළා. තවත් සමහර රජයන් යුද්ධය ආශ්‍රයෙන් මේ ප්‍රශ්නය විසඳන්නට උත්සාහ කළා. නමුත් අද වර්තමානයේ නොයෙක් විධියට සර්ව පාක්ෂික සමුළු කැඳවලා මේ සියලු දේවල් කරන අවස්ථාවේත් කොටි සංවිධානයේත් හැසිරීම් විලාසය තුළ, රජයයක් හැටියට අප රජයේ ක්‍රියාවලිය ගැන අපි පැහැදිලි කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උතුරු නැගෙනහිර මේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට වැඩියෙන් එහි ජීවත් වන විශේෂයෙන් ද්‍රවිඩ ජනතාව, මුස්ලිම් ජනතාව සහ සිංහල ජනතාවගේ වැඩි ඉල්ලීමක් තිබෙන්නේ අද මේ ප්‍රදේශවල සංවර්ධනය ඇති කිරීම බව මා පැහැදිලිව කියන්නට ඕනෑ. මේ ප්‍රදේශවලටත්, රටේ අනෙකුත් ප්‍රදේශවලට ලබා දෙන සම්පත් ලබා දෙන්නය කියන එක තමයි, වැඩි බහුතරයකින් අපිට දැන ගන්නට ලැබෙන පණිවුඩ හැටියට තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මා එක් කරුණක් ගැන පැහැදිලිව කියනවා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා පසු ගිය දිනවල මේ ප්‍රශ්නයත් එක්ක අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් හැටියට අපිට කථා කරලා කිව්වේ, දකුණගැන විතරක් බලා ගෙන මා තමුන්නාන්සේලාව ඇමැතිවරුන් කරලා නැහැ කියලයි; යන්න, උතුරට; නැගෙනහිරට; ඒ ප්‍රශ්නයට හරි හැටි හොයා බලන්න, අමාත්‍යවරයා හැටියට ඒ ප්‍රශ්නයට තමන්ගේ විෂයයෙන් දෙන්න පුළුවන් යටිතල පහසුකමක් – ඒ විෂය ධාරාවට අදාළව – තිබෙනවා නම් ඒ ප්‍රදේශයේ ජනතාවගේ සංවර්ධනය සඳහා ලබා දෙන්නය කියලායි. අද ඒකට පිළිතුරු හැටියට ජාතික සවිය වැඩ සටහන උතුරු නැගෙනහිර ප්‍රදේශයට වෙන් කර තිබෙනවා. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමාගේ පක්ෂය නියෝජනය කරන අය මේ ජාතික සවිය වැඩ පිළිවෙළ විවේචනය කරමින් කථා කළා මා අහගෙන හිටියා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වවුනියාවට ගිය අවස්ථාවේ ඒ මන්ත්‍රීවරුන් ඒ සභාව නියෝජනය කළා. ඒ සභාව නියෝජනය කරලා ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්නය කිව්වා. එක වෙලාවකට එක පැත්තකින් ඒ තැන නියෝජනය කරනවා. අනික් පැත්තෙන් උත්තරීතර පාර්ලිමේන්තුව තුළ දී ඒක විවේචනය කරමින් කථා කරනවා. ඒ තැන්වලදී අවශ්‍ය කරන බස් රථය ඉල්ලනවා. ඒ තැන්වලදී අවශ්‍ය කරන දුරකථන පහසුකම ඉල්ලනවා. ඒ තැන්වලදී විදුලිය ඉල්ලනවා. ඒ තැන්වලදී ඔවුන්ගේ ආරක්ෂාව ගැන කථා කරනවා. නමුත් උත්තරීතර පාර්ලිමේන්තුවේ දී ඒක විවේචනය කර කථා කරනවා. මේ සභාව නියෝජනය කරන **225** දෙනෙක් වුණු අපි පුරුදු පුහුණු වෙන්න ඕනෑ ඇත්ත ඇති සැටියෙන් කථා කරන්න. වැරදි ඇති කාගේත්. ආණ්ඩුවේ වැරදි ඇති. විපක්ෂයේ වැරදි ඇති. එල්ටීටීඊ සංවිධානයේ වැරදි ඇති. නමුත් අපි බලාපොරොත්තු විය යුත්තේ ඉදිරි කාලය තුළදී මේ ප්‍රශ්නයට නියමිත විසඳුමක් ලබා දෙන ක්‍රමය හොයන්නයි. එහෙම නම් ඒ ක්‍රමය තුළ අද පැහැදිලි වැඩ පිළිවෙළක පළමු වැනි අදියර හැටියට මේ ජාතික සවිය වැඩ පිළිවෙළ අපි ආරම්භ කර තිබෙනවා. අපි ඇමතිවරුන් හැටියට එක් එක් දිස්ත්‍රික්ක වග කීමකින් භාර ගෙන තිබෙනවා. ඒවා නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අපි පැහැදිලිව කථා කරලා, ඒ දිස්ත්‍රික්කවලට ගිහින්, ඒ දිස්ත්‍රික්කවලට අනාරක්ෂිත ගම්වල ජීවත් වන සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් මේ සියලු ජනතාවට ජතිවාදයකින් තොරව, පක්ෂ භේදයකින් තොරව, මේ සියලු අවශ්‍යතා ඉටු කරන්න අද අපි සූදානම් වෙලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ සවස අපි ජාතික සවිය වැඩ පිළිවෙළේ ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වූවා. යාපනය ප්‍රදේශයට ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ 20ක් යවන්න ඊයේ තීන්දු කළා. නමුත් අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේ බස් රථ 20 යාපනයේ අහිංසක ද්‍රවිඩ ජනතාවට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා යවනවා වෙනුවට, ඒ යවන බස් රථයේ ආරක්ෂාව සම්බන්ධයෙන් අපට දෙවරක් හිතන්නට වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්පන්දන් මන්ත්‍රීතමන්ලාගෙන් අපි බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. මේ සාකච්ඡාවලට තමුන්නාන්සේලා පැමිණිලා, මේ යවන බස් රථ, මේ ලබා දෙන විදුලිය, මේ ලබා දෙන අනෙකුත් සියලු පහසුකම් හරියාකාරව තමන්ගේ ද්‍රවිඩ ජනතාව අතරට ක්‍රමවේදයක් අනුව ගලාගෙන යන්න, ඒක ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් තමයි අපි තමුන්නාන්සේලාගෙන් බලාපොරොත්තු වන්නේ. නමුත් ඒක නොවෙයි. අද තමුන්නාන්සේලාගෙන් අපට ලැබෙන්නේ. තමුන්නාන්සේලාට එල්ටීටීඊ සංවිධානයේ රූකඩ බවට පත් වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. යථාර්ථය ඒක තමයි. එහෙම නොවුණොත් තමුන්නාන්සේලාට අර ඉතිහාසයේ සිද්ධ වුණා වාගේ, අමිර්තලිංගම්, නීලන් තිරුචෙල්වම්, තුරෙ අප්පා වැනි දේශපාලන නායකයන්ට ගිය කල තමයි තමුන්නාන්සේලාටත් යන්නේ. මේකයි යථාර්ථය. මේක අපි පැහැදිලිව පිළිගන්න ඕනෑ. එහෙම නම් අද පැහැදිලි ලෙස මෙන්න මේ එල්ටීටීඊ සංවිධානයේ ඒ රුදුරු හස්තයට යට වෙලා දේශපාලන නායකයන් හැටියට ඉදිරියට යනවාද, එහෙම නැත්නම් ඉදිරියේදී ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් කථා කරන නායකයන් හැටියට එල්ටීටීඊ සංවිධානයටත් ඇඟිල්ල දික් කරලා තමුන්නාන්සේලා කොන්ද කෙළින් තබා ගෙන කථා කරනවාද කියන

ප්‍රශ්නාර්ථය අද තමුන්නාන්සේලා ඉදිරියේ තිබෙනවා. එහෙම නම් ඒ ප්‍රශ්නාර්ථය ඉදිරියේ, ඒ ප්‍රදේශයේ ද්‍රවිඩ ජනතාව තමුන්නාන්සේලා යම් මහජන ඡන්දයකින් මේ පාර්ලිමේන්තුවට එවා තිබෙනවා නම්, ඒ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට, ඒ ද්‍රවිඩ ජනතාවගේ ඉල්ලීම් වෙනුවෙන් කථා කරන මන්ත්‍රීවරුන් හැටියට තමුන්නාන්සේලා මෙන්න මේ වැඩ පිළිවෙළට අපිත් එක්ක ඒකරාශී වෙලා මේ වැඩ පිළිවෙළ තුළ තමුන්නාන්සේලාගේ යෝජනා සහ අදහස් ඉදිරිපත් කරලා මේක හරියාකාරව කරගෙන යන්න අත දෙනවා නම් අපි කැමතියි. මේක තමයි ඉල්ලන්නේ. මේක තමයි, මේ වර්ගවාදයට මූලික වෙලා තිබෙන්නේ.

එල්ටීටීඊ සංවිධානයක් ගොඩ නැඟුණේ මොකද කියා අපි ඇහැව්වාම ඒකට මූලික වශයෙන් ලැබෙන පිළිතුර එල්ටීටීඊ සංවිධානයක් ගොඩ නැඟුණේ අපට වෙනම සලකනවා, මේක සිංහල රටක්, මේකේ සිංහල නායකයන් බිහි වෙලා සිටින්නේ, ද්‍රවිඩ මිනිසුන් කොන් කරනවා. ඒ මිනිසුන්ට සංවර්ධනයක් නැහැ, ඒ මිනිසුන් පළ පෙළා වැඩ කරනවාය කියන පළිවිඩය තමයි ලැබිලා තිබෙන්නේ. එහෙම නම් ඒකට පිළිතුර විය යුත්තේ ඒ ද්‍රවිඩ ජනතාව ජීවත් වන උතුරු-නැඟෙනහිර ප්‍රදේශවලත් සංවර්ධන දකුණ හා සමානව අරගෙන යන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්න කොපමණ තිබුණත් අද දකුණු පළාත් සභාව, බස්නාහිර පළාත් සභාව, ඌව පළාත් සභාව යන මේ පළාත් සභාවල බැකෝ යන්ත්‍ර, ඩෝසර් මේ කියන යන්ත්‍ර ටික අද උතුරු-නැඟෙනහිර ප්‍රදේශවල ටගිහින් තිබෙන බව අද අපි සන්තෝෂයෙන් කියනවා. අපේ ප්‍රදේශවලත් පාරවල් කපන්න තිබෙනවා. දකුණේත් පාරවල් කැපෙන්න තිබෙනවා. මේ ප්‍රදේශවලත් සංවර්ධන කටයුතු කෙරෙන්න තිබෙනවා. නමුත් අද දකුණේ අලුතින් පත් වුණු මහජන නියෝජිතයෝ ඔවුන්ගේ කැමැත්තෙන්ම කියලා තිබෙනවා, අපේ පළාත් පාලන ආයතනවල තිබෙන ඒ සියලු යන්ත්‍රෝපකරණ අපි දෙන්නම්, අපි ඒවා අර ගෙන යන්නම්, අපට කියන්න ගම්මානය මොකක්ද කියලා, අපි ඒ ගම්මානයට ගිහිල්ලා ඒ අය වෙනුවෙන් අපේ යුතුකම්, වගකීම් ඉටු කරන්නම් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපටත් ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ ප්‍රදේශවලට ගියොත් අපේ ජීවිත ගැනත් විශ්වාසයක් නැහැ. එල්ටීටීඊ සංවිධානයේ මරා ගෙන මැරෙන පුද්ගලයන් ගැන කොයිම වෙලාවකවත් අපට කියන්න පුළුවන්කමක් නැහැ. අපි යන්නේ අනාරක්ෂිත ගම්වලට. ඒ පුද්ගලයේ ඇවිල්ලා අපිව බදා ගත්තොත් අවසානයේ දී අපටත් සිද්ධ වෙන්නේ ජීවිතය අහිමි කර ගන්නටයි. නමුත් ඒ තර්ජනය අපි භාර ගෙන තිබෙනවා. ඒ අභියෝගය අපි භාර ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒ අභියෝගය භාර ගන්තේ, අපි ඒ අභියෝගය භාර ගත්තේ නැත්නම් මේ ප්‍රශ්නයට විසඳුමක් නැති නිසායි. අපි මේ ආකාරයෙන් ඒ අභියෝගය භාර ගන්නවා නම්, තමුන්නාන්සේලාටත් සිද්ධ වෙනවා මේ අභියෝගය භාර ගන්න. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, අපිත් අභියෝගයක් භාර ගෙන තිබෙන අවස්ථාවේදී තමුන්නාන්සේලාගේ ජීවිතවලටත් අභියෝගයක් භාර ගන්න සිද්ධ වෙනවා. ඒ අභියෝගය තමයි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට තමුන්නාන්සේලා කොන්ද කෙළින් තබා ගෙන එල්ටීටීඊ සංවිධානයට කථා කරන එක. එල්ටීටීඊ සංවිධානයට කථා කරලා කියන්න බැරි ඇයි? මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මෙ කරන හැම දෙයක් ගැනම කථා කරනවා වාගේ එල්ටීටීඊ සංවිධානය කරන දේවල් ගැන කථා කරන්නත් තමුන්නාන්සේලාට පුළුවන්කමක් තිබෙනවාද?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர் அவர்கள்)*
(The Deputy Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක් තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
*(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)*
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "රජය උතුරු-නැඟෙනහිර වෙනුවෙන් වෙන් කළ මුදලින් සියයට 20ක් කොටි කොල්ලකති" යනුවෙන් "ලංකාදීප" පත්‍රයේ වාර්තා කරනවා. රජය විසින් උතුරු-නැඟෙනහිර වෙනුවෙන් ලබා දෙන මුදලින් සියයට 20ක් - බදු ගෙවනවා වාගේ - එල්ටීටීඊ සංවිධානයට ලබා දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ උතුරු-නැඟෙනහිරට දෙන සල්ලි කාටද දෙන්නේ? මේ ප්‍රදේශයේ ජීවත් වන අහිංසක මිනිසුන්ගේ සුභසාධනය වෙනුවෙන්? අහිංසක මිනිසුන්ගේ යටිතල පහසුකම් වෙනුවෙන්. දෙමළ ජනතාවගේ අයිතිය රකින නායකයෝය කියන අය ඒකෙන් සියයට 20ක් උදුරා ගන්නවා නම්, එල්ටීටීඊ සංවිධානය දෙමළ ජනතාවට කරන නියම ආදරය මේකද කියන එක අපි තමුන්නාන්සේලාගෙන් අහනවා. ඒක ආදරය නොවෙයි. ඒක ඔවුන්ගේ පැවැත්ම වෙනුවෙනුයි කරන්නේ. ඔවුන්ට විරුද්ධව යන ඕනෑම කෙනකුට මරණීය දණ්ඩනය දෙනවා. ඔවුන්ට විරුද්ධව කථා කරන ඕනෑම කෙනකුට මරණීය දණ්ඩනය දෙනවා. ඔවුන්ට විරුද්ධව කථා කරන ඕනෑම කෙනකුට ඉතිහාසය ගැන මතක් කරලා පෙන්වනවා. ඉතිහාසයේ අපි මරා තිබෙන ක්‍රමයට තමයි, අනාගතයේදී වුණත් අපට විරුද්ධව කථා කරන අයට දඬුවම් දෙන්නේ කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සම්පන්දන් මන්ත්‍රීතුමා අද මේ යෝජනාව ඉදිරිපත් කළා වාගේ, අපට වඩා පළපුරුදු දේශපාලනඥයෙක් හැටියට, මේ පාර්ලිමේන්තුව ගැන අපට වඩා දන්නා දේශපාලනඥයෙක් හැටියට, උතුරු-නැඟෙනහිර ගැන අපට වඩා දන්නා දේශපාලනඥයෙක් හැටියට එතුමාට පුළුවන්, මේ ප්‍රශ්නයේ සියයට 50ක වි සඳුමකට මූලික ඉලක්කකරුවා බවට පරිවර්තනය වෙන්න. හැබැයි, එහෙම පරිවර්තනය වන කොට එතුමාගේ ආරක්ෂාවට ප්‍රශ්නයක් වෙයි. ඒ ආරක්ෂාවට ප්‍රශ්නයක් වන වෙලාවට රජය හැටියට අපි බැඳී ඉන්නවා, එතුමා ආරක්ෂා කරන්න. මේ ප්‍රශ්නයට නියම විසඳුමක් දෙන්න රජයත් සමඟ එකතු වෙලා කටයුතු කරන්න තමුන්නාන්සේලා අත ඔසවනවා නම්, තමුන්නාන්සේලා සමඟ එකට ඒකරාශී වෙලා ද්‍රවිඩ, මුස්ලිම්, සිංහල කියන මේ ජාතීන් තුනේම අයිතිය ආරක්ෂා කර ගෙන, වසර 50ක් තිස්සේ එල්ටීටීඊ සංවිධානයේ තුවක්කුවට හයේ මිරිකිච්ච මිනිසුන්ට නියම විසඳුමක් ලබා දීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න අපි කැමැතියි. ඒකට තමුන්නාන්සේලාට ආරාධනා කරමින්, මේ වෙනුවෙන් අපි ඉදිරියේදී කරන්න තිබෙන ජාතික සවිය වැඩ පිළිවෙළ ඉතා හොඳින් කර ගෙන යන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

*එකල්හි වේලාව අ. භා. **4.30** වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව **2006** ජූලි මස **20** වන බ්‍රහස්පතින්දා පූ. භා. **9.30** වන තෙක් කල් ගියේය.*

*அப்பொழுது, பி. ப. 4.30 மணியாகிவிடவே , பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்கள்.*

*அதன்படி, பாராளுமன்றம், 2006 யூலை 20, வியாழக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்தி வைக்கப்பட்டது.*

*It being 4.30 p.m. MR. DEPUTY SPEAKER adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 9.30 a.m. on Thursday, 20th July, 2006.*

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

***குறிப்பு***

*உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் ஹன்சாட் பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.*

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | **:** | **From 9.30 a.m. to 4.30 p.m. on 19.07.2006** |
| **Final set of manuscripts received from Parliament** | **:** | **4.45 p.m. on 24.07.2006** |
| **Printed copies despatched** | **:** | **26.07.2006 Morning** |

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිළ රු. **2,178**කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. **18.15**කි. තැපැල් ගාස්තුව රු. **2.50**කි. කොළඹ 1, ලෝටස් පාර, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, අංක **32**, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් **30**දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15 தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக* ***அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 32, டிரான்ஸ்வேர்க்ஸ் இல்லம், லோட்டஸ் வீதி, கொழும்பு 1*** *என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப் பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

Subscription : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATION BUREAU, No. 32, Transworks House, Lotus Road, Colombo 1. The fee should reach him on or bvefore November 30 each year. Late application for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.